ප්‍රභාස්වර

රාජ්‍ය සේවක නිර්මාණ එකතුව - 2021

ප්‍රභාස්වර

අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලියෙහි

සිංහල ජයග්‍රාහී නිර්මාණ එකතුව

2021

ප්‍රකාශනය

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු

අමාත්‍යාංශය

ප්‍රභාස්වර - 2021

අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලියෙහි සිංහල ජයග්‍රාහී නිර්මාණ

ප්‍රකාශනය

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

මෙම කෘතියේ ඇතුළත් කෙටි කතා, කාව්‍ය, ගීත ආදියෙහි අයිතිය මෙන්ම ඒවායේ අන්තර්ගතය පිළිබඳ වගකීම එම ලේඛක ලේඛිකාවන් සතු වන අතර බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ඒ පිළිබඳ කිසිම වගකීමක් නොරදන බව ද කරුණාවෙන් සලකන්න. ඔවුන්ගේ පුද්ගලික අවසරයකින් තොරව එකී නිර්මාණ කවරාකාරයෙන් හෝ භාවිතයට ගැනීම සපුරා තහනම් ය.

පළමු මුද්‍රණය - 2021 පෙබරවාරි

ISBN – 9 786245 557011

පිදුම

ප්‍රභාස්වර - 2021

උපදේශකත්වය
දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අධීක්ෂණය
ටී.එන්.හෙට්ටිආරච්චි
අතිරේක ලේකම් ( ප්‍රවර්ධන )

ආචාර්ය ප්‍රසාද් රණසිංහ
අධ්‍යක්ෂ ( ප්‍රවර්ධන )

සජීවනී චන්දිමා වික්‍රම
සහකාර ලේකම් ( ප්‍රවර්ධන )

සංස්කරණය
මහේෂා ඒකනායක

සෝදුපත් පරීක්ෂාව
හර්ෂ රංගන පෙරේරා
නිරාශා ප්‍රනාන්දු
පියුමි සෙව්වන්දි

පිටකවරය
නලින් සම්පත් කරුණාසේන

පරිගණක පිටු සැකසුම හා මුද්‍රණය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ශුභාශිංසන පණිවිඩය

2021 වර්ෂයේ අන්තර් රාජ්‍ය සේවා නිර්මාණ තරගාවලියෙහි ජයග්‍රාහී නිර්මාණ එකතුව " ප්‍රභාස්වර " කෘතියට ශුභාශිංසන පණිවිඩයක් එක් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

රාජ්‍ය සේවය තුළ සිය වගකීම් නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කරමින් ඉන් ලද විවේකයේ ලාංකේය සාහිත්‍ය කෙත සිය ඉහළ පරිකල්පන ශක්තියෙන් පෝෂණය කළ නිර්මාණකරුවන් බොහෝ දෙනෙක් අතීතයේ සිටි බව අපේ මතකයේ ඇත. එම පරම්පරාවේ නූතන පුරුක් අදත් ලක්ෂ ගණනක් වූ මෙරට රාජ්‍ය සේවයේ අප අතර සිටියි. ඔවුන් තෝරා බේරා ගෙන විසල් නිර්මාණකරුවන් ලෙස සමාජගත කිරීමට මෙබඳු තරගාවලි විශාල පිටුවහලක් සපයයි.


සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී රාජ්‍ය අංශයේ දායකත්වය සුවිශේෂී වේ. අප දේශය මුහුණ දෙන කවර හෝ අභියෝග ශමුවේ නොනැවතී ඉදිරියට යාමට ශක්තිය ලබා දෙන රාජ්‍ය සේවකයිනගේ කාර්යභාරය කෘතවේදීව අගය කරමි.

රට වෙනුවෙන් සිය අමිල සේවය නිමාකර අද සිය ජීවිතයේ සැදෑසමය විශ්‍රාම සුවයෙන් ගෙවා දමන විශ්‍රාමික රාජ්‍ය සේවකයින් ද අමතක නොකිරීම අතිශය වැදගත් යැයි හගිමි.

ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, චක්‍රලේඛනවලට රාජ්‍ය සේවය සීමා නොකර ඔවුන් තුළ ඇති නිසග නිර්මාණ හැකියාවන් පද්‍ය රචනා, ගීත රචනා, කෙටි කතා, චිත්‍ර, ළමා නිර්මාණ, කෙටි චිත්‍රපට, හා කෙටි නාට්‍ය ආදී විවධ ඉසව් ඔස්සේ අගයමින් ජයග්‍රහනය ලැබූ විශිෂ්ඨ නිර්මාණ " ප්‍රභාස්වර " නමින් මුද්‍රණද්වාරයෙන් එළි දැක්වීම ප්‍රශස්ථ වෑයමක් බව තරයේම විශ්වාස කරමි.

මහින්ද රාජපක්ෂ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය



ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය, එහි ආරම්භය සනිටුහන් වන බ්‍රිතාන්‍ය පාලන සමයේ සිට අද දක්වාම සමකාලීන සමාජයේ බුද්ධිමය හා නිර්මාණශීලීභාවයෙන් ඉහළම පුරවැසියන් ආකර්ශනය කර ගත් සමාජ ඒකකයක් විය. සිය රාජකාරී වගකීම නිසි ලෙස ඉටු කරන අතරේම තම නිර්මාණශීලීත්වය හා චින්තනය යොදවා කලා නිර්මාණ, ශාස්ත්‍රීය ලේඛන, ජාතික උරුම සංරක්ෂණය, දාර්ශනික චින්තනය, විද්‍යාත්මක පර්යේෂණ හා ප්‍රබන්ධ ආදී අනේකවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයට රාජ්‍ය සේවකයන් දායකත්වය සපයා ඇත. රාජ්‍ය සේවයේ මෙම සුවිශේෂී අනන්‍යතාවය ඉදිරියට පවත්වා ගෙන යාම වර්තමාන රාජ්‍ය සේවකයාගේ වගකීමක් වේ. ඒ සඳහා අවශ්‍ය යහපත් පරිසරය රාජ්‍ය සේවය තුළ ගොඩ නැංවීම රජයේ ද යුතුකමක් වන අතර, ඒ අනුව රාජ්‍ය සේවයේ නිරත වූවන්ගේ කලා හා සෞන්දර්යාත්මක කුසලතාවයන් අගයා ඔවුන් දිරි ගැන්වීම සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය සංවිධානය කරනු ලබයි.

2021 අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය වඩාත් පුළුල් කෙරෙමින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් සිටින ජ්‍යෙෂ්ඨ රාජ්‍ය සේවකයන් වෙනුවෙන් ද තරග අංශ ඇතුලත් කර ඇත. මේ තුළින් ඔවුන්ගේ දීර්ඝ කාලීන රාජ්‍ය සේවයේ අත්දැකීම්

නිර්මාණශීලී ප්‍රකාශනයක් ලෙස එළි දැක්වීමට අවස්ථාව උදා කෙරී ඇත.

2021 වර්ෂයේදී පවත්වනු ලැබූ අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලියේ දී ප්‍රශස්ත ඇගයීමට ලක් වූ නිර්මාණයන් " ප්‍රභාස්වර" නමින් ග්‍රන්ථයක් ලෙසින් ඉදිරිපත් කෙරෙන්නේ එම නිර්මාණයන් බහුතර ප්‍රජාවකට රසවිඳීමට අවස්ථාව උදාකර දීම උදෙසාය. මෙම ග්‍රන්ථය ඉදිරියේදී වඩාත් නිර්මාණශීලී කෘතීන් බිහි කිරීමට රාජ්‍ය සේවයේ නිරත වූවනට මහත් උත්තේජනයක් වනු ඇතැයි විශ්වාස කරමි.

සෞන්දර්යාත්මක නිර්මාණකරණයන්ට යොමු වීම තුළින් වඩාත් සංවේදී හා සහකම්පනයෙන් යුත් රාජ්‍ය සේවයක් නිර්මාණය වනු දැකීම මෙම අමාත්‍යාංශයේ අපේක්ෂාවයි. ඒ තුළින් හිතවාදී කාර්යක්ෂම රාජ්‍ය සේවයක් තවදුරටත් ශක්තිමත් වී අපගේ මව්බිම සෞභාග්‍ය කරා රැගෙන යාමට රාජ්‍ය සේවයේ උපරිම දායකත්වයක් ලැබෙනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## නිර්මාණ පෙළගැස්ම

### පද්‍ය රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )

| නිර්මාණයෙහි නම | රචකයාගේ නම | පිටුව |
|---|---|---|
| පරණ බඩු එකතු කරන<br>සැමියාට බිරිඳ කී | ඩබ්.එම්.සී.ආර්.විජේවර්ධන | |
| නැති හෙටක් | එච්.එම්.ආර්.පීරිස් | |
| පෙට්ටියෙන් බැස | එස්.එච්.ඩී.පී.විමලසේන | |
| හද (ඳ ) රිදුම | එච්.ඒ.පතිරණ | |
| ප්‍රභාතයට පෙර වදනක් | එන්.ජී.පී.සඳමාලි | |
| බාරි | ආර්.ජී.ඩී.එස්.රන්කොත් | |
| අවාරෙට ඉඳලෝලු පිපිලා | ඒ.ඒ.එල්.එම්.අමරසිංහ | |
| අවසාන රාත්‍රිය | ඩී.ඒ.වීරසිංහ | |

### පද්‍ය රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

| නිර්මාණයෙහි නම | රචකයාගේ නම | පිටුව |
|---|---|---|
| සඳමාලී, ඉඩෝරය ඇවිත් | කේ.එල්.පී.ඒ.රබ්බිඩිගල | |
| සිරකාර සිත්තරාගේ<br>චිත්‍ර ප්‍රදර්ශනය | ඩබ්.ආර්.ඒ.එස්.එල්.රණසිංහ | |
| නැවතුමක අසිරිය | ඒ.එස්.ජයසිංහ | |

| | |
|---|---|
| මල් හැඟුම් | බී.ආර්.එස්.ආර්.පෙරේරා |
| පසුතැවිල්ල | ඩබ්.යූ.එම්.එම්.ටී.රාජකරුණා |
| පැලයක් සිටවමු | කේ.ඒ.කුමාරසිංහ |
| ගින්නෙන් ම හදට | |
| සිසිල ගෙනේ | ඩබ්.ජේ.ජයවර්ධන |
| ධූම රාක්ෂස | ඩබ්.මිහිඳුකුලසූරිය |

**ගීත රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )**

| **නිර්මාණයෙහි නම** | **රචකයාගේ නම** | **පිටුව** |
|---|---|---|
| යුග ගීතයකි | ආර්.එම්.චාන්දනී | |
| පතිනි | කේ.පී.ඒ.එස්.මධුතිසරු | |
| අබිනික්මණ | ඩී.යූ.එන්.කුමාර | |
| වීණිවී | ඒ.ඩී.ඩබ්.එස්.එන්.ද සිල්වා | |
| කපුගල සඳ | ඩී.එම්.එස්.එල්.රාජරත්න | |
| නූතන ගුරු ගීතය | ජී.ජී.නන්දනී | |
| කිඳුරු වැළපුම | එස්.ධනුෂ්ක | |
| මගෙ මන්ද්‍රි දේවියේ | සී.එන්.සරෝජනී | |

**ගීත රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )**

| **නිර්මාණයෙහි නම** | **රචකයාගේ නම** | **පිටුව** |
|---|---|---|
| නුඹ නොවෙද අම්මා | ජයතිලක කරුණාරත්න | |
| ලෙන බිද ආවෙමි | කේ.එල්.පී.ඒ.රබ්බිඩිගල | |
| සෙනෙහස තාමත් | එච්.එම්.එස්.හේරත් | |
| සඳ ගින්දරී නුඹ දන්නෙ නෑ | නෙල්සන් දේමුණි | |
| මුලාවුණු පුතු නොදුටු පිය | ඩබ්.කේ.මිහිඳුකුලසූරිය | |
| සුසර නොවන වීණාවේ | කේ.ජී.එන්.විජේවර්ධන | |
| ඉරක් සේ ඔබ එන්න | ඊ.එම්.ටී.කේ.ඊරියගම | |
| සඳ එළිය ගලයි | ඩබ්.ආර්.ඒ.එස්.එල්.රණසිංහ | |

**කෙටි කතා ( රාජ්‍ය සේවයේ නියුතු )**

| **නිර්මාණයෙහි නම** | **රචකයාගේ නම** | **පිටුව** |
|---|---|---|
| අලුත් මලක් පිපුණා | කේ.සී.මුදලිගේ | |
| ක්ෂණික | සී.ඒ.එච්.එම්.ඒ.චන්ද්‍රසේකර | |
| කලු මීච්චි | ඩබ්.ඒ.එම්.එන්.සොලෝකාර | |
| කරදිය කඩිති | ඒ.ආර්.ආර්.ඩී.ෆොන්සේකා | |
| ඇඳුම ( නිළමේ) | එච්.ඒ.පතිරණ | |

| | |
|---|---|
| රඟ මඩල | ඩබ්.ආර්.ඩී.කුමාරි |
| කොළඹ ගමන | ඩී.ජී.චින්තක |
| කරත්ත ගොනා | එච්.සී.නිශ්ශංක |

**කෙටි කතා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )**

| **නිර්මාණයෙහි නම** | **රචකයාගේ නම** | **පිටුව** |
|---|---|---|
| ගනුදෙනු | පී.බී.ධනපාල | |
| හෘද ශාක්ෂිය | වී.වී.ඒ.එස්.ස්වර්ණලතා | |
| අන්තෝජටා | සුසිල් කුලතුංග | |
| කටු ඉඹුල | රංජිත් මල්ලියාවඩු | |
| විරසකය නිමා විය | නාලනී හෙට්ටිආරච්චි | |
| රතනපාල සහ රත්නපාල | ජයතිලක කරුණාරත්න | |
| සිරකරුවෝ නිදහස් | ඩබ්.ආර්.ඒ.එස්.එල්.රණසිංහ | |
| ජීවිතේ අරුමයකි | කේ.එල්.නාරංගොඩ | |

**ළමා නිර්මාණ ජයග්‍රහණ ලද්දෝ**

**ළමා නිර්මාණ කුසලතා ඇගයීම් ලද්දෝ**

**චිත්‍ර නිර්මාණ ජයග්‍රහණ ලද්දෝ**

චිත්‍ර නිර්මාණ කුසලතා ඇගයීම් ලද්දෝ

කෙටි නාට්‍ය තරගාවලිය ජයග්‍රහණය කරන ලද්දෝ

කෙටි නාට්‍ය තරගාවලිය කුසලතා ඇගයීම් ලද්දෝ


කෙටි චිත්‍රපට තරගාවලිය ජයග්‍රහණ ලද්දෝ

කෙටි චිත්‍රපට තරගාවලිය කුසලතා ඇගයීම් ලද්දෝ

ඡායාරූප තරගාවලිය ජයග්‍රහණ ලද්දෝ

ඡායාරූප තරගාවලිය කුසලතා ඇගයීම් ලද්දෝ

## පද්‍ය රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )



**ප්‍රථම ස්ථානය**
ඩබ්.එම්.සී.ආර්.විජේවර්ධන
ජාතික රෝහල, මහනුවර

### "පරණ බඩු එකතු කරන සැමියාට බිරිඳ කී කවි"

ළිපේ ගල් උඩ හට්ටි වළඳේ
අඩියෙ හිල දැන් හුඟක් දවසක්..
අළු යටින් තම්බලා කෑවත්
වැල් අලේ ඇති තියා කොටහක්..
දුර ගියොත් ලෙඩ අහක තියලා
හොයා ගත්තැකි අතට පනමක්..
නොයන පණ අපෙ රැකල දෙන්නේ
ඔහොම අහුලපු බෙලෙක් කබලක්..

වරු ගනන් අතගගා කෙඳිරුව
ඉඳහිටක තිබු පපුවෙ ඇවිලුම..
බින්න බැස්සට බිච්චි පඩියේ
තිබ්බ තෙල් බෝතලේ පතුලෙම..
උගුර නොදැකපු, ලියපු පෙති ඇති
තවම කිලිනික් පොතේ ඇතුලෙම..
එහෙම තිබිලත් ඔහේ උරයක්
කිහිලි ගහගෙන ගියේ තනියම..

ගෙයක් ගානේ කෑ ගහද්දී
උගුර කට ලේ රහ දැනෙනවද..
තහඩු මලකඩ කාපු ඇණ කොට
ඇනී දෝතම ඇදුං දෙනවද..
හූල්ලා එනකංම අඬනා
ගෙදර  ටකරම මතක් වෙනවද..
අනේ මට බය වමේ අත දිග
එහෙව් විට කැක්කුමක් එනවද..

වනේ කොයි ගෙඩි උනත් අහුලන්
බැරියැ මට රහ කර උයන්නට..
මලේ පිරිවර පතා මොකටද
මැස්සො මදුරුවො මදැයි තනියට..
අනෙ මගෙ දැහැටම පණ නෑ
දකිනකන් වැල් ඇඳේ හරහට..
තහඩු, ටින් ,ඔය බෙලෙක් , පැනපන්
මගේ දෙයියගෙ අතට විගහට..

**පද්‍ය රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )**



**දෙවන ස්ථානය**
එච්.එම්.ආර්.පීරිස්
ශ්‍රී ලංකා දුම්රිය
දෙපාර්තමේන්තුව, පානදුර

**නැති හෙටක්**

අඹුට බිජුලනු මැදුර තැනුමට සොයනු හොඳ මෝරපු ගහක්
දසත පියඹයි සිංහරාජේ මායිමේ එක කැරලෙක්

පාට පාටින් ප්ලාස්ටික් ඉටි පැටලවෙන්නේ නැති දොළක්
සොයා දුර පිහිනන්න හදනවා සීත ගඟුලේ මාලුවෙක්

කුසේ ගින්නට සොයා ගන්නට වහ වෙලා නැති පස් පිඬක්
ලොවෙහි පතුලට ගුලක් හාරන් යන්න හදනව ගැඩවිලෙක්

නළා හඬවන හඬට පැරදී වසා රැහැනක මෙන් තිතක්
මියුරු ස්වර හිර කරන් ඉන්නවා කොළඹ එක පොල්කිච්චියක්

කම්හලේ දුම් බටෙන් නික්මෙන කාල දුම් දුටු ළහිණියෙක්
තුටින් පියඹයි සිතා මේ නම් වැස්ස ගෙන එන
මේඝයක්

තෙරක් නොපෙනෙන සයුර විස වී නිසා එහි ගිය එක් නැවක්
අහෝ හෙට දින ගොඩට එන්නද යන්න තැන නැති
තල්මහෙක්

## පද්‍ය රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )



**තෙවන ස්ථානය**
එස්.එච්.ඩී.පී.විමලසේන
නාවික සාගරික විද්‍යාපීඨය,
ත්‍රිකුණාමලය

### පෙට්ටියෙන් බැස

ලතෝ මදයි ඉකි ගැහුවා දවස් දෙකක් තිස්සේ
තිරේ කොටද තෙල් ඉවරද පහනේ සිල ගැස්සේ
දෙපා වාරු නැති ගත එල්ලාගෙන උළුවස්සේ
හෙණේ යදින් මාරයාට වැටුනට මගෙ පස්සේ

පැටවු තාම මහ පොළවෙන් ඉස්සිල නැහැ උඩට
නහින්ඩ වෙනවා කොහොමත් හෙට හිට තනි උඹට
කනේ කොහොම වක්කරාවි සනුහරේම ජයට
මම මැරුණේ නුඹේ නොවෙයි මගෙ මූසල කොමට

මද්දුමීගෙ වැටිච්ච දත වහලට විසි කරලා
ලේනට මං කිව්ව කැකුළු දතක් දෙන්න කියලා
රැජිණ අපේ උන්ඩි වෙලා නිදි ඇති ඔහෙ වැටිලා
ඇහේ තියන් මැණික් වාගෙ රකින්ඩෝනෙ දුවලා

ලොකු පුතාට තේරෙනවා උඟ ඩිංගක් පැහිලා
කොල්ල උන්නෙ එදා ඉඳන් ඔයා ළගම ඇළිලා
පුතා තමයි තාත්තාගෙ ආත්මයම කියලා
දුවට හොරෙන් කියල දෙන්න ලතෝ මතක් කරලා

මලක් නොවේ ගලක් වෙන්න විය යුතු තැන් දන්න
මෙළෙක් වෙන් බැරි තැන් වල හැපින්නියක් වෙන්න
හුඟක් හයිය නැතත් හයිය ඇති වග පෙන්වන්න
කළවැන්දූම් හිතයි මගේ මිනියයි වළලන්න

වැටුනු තැනම ලැගලා බැහැ ලතෝ නැගිට ගන්න
ඔයැයි ඉරයි හඳයි ගෙදර ඕනේ කෙලින් ඉන්න
අපිත් හීනමයි දැක්කේ එකටම මියැදෙන්න
දුවගේ මදුරුවෙක් කාලද අඩනවා බලන්න

## පද්‍ය රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )

**කුසලතා ස්ථානය**
එච්.ඒ.පතිරණ
බප/ජය/තලාහේන මහා
විද්‍යාලය



### හද(ඳ) රිදුම්

රන් තැටියකට දුක අරගෙන ආවාට
අඬන්නෙපා පුතුණේ හිත රිදුණාට
අවසර නැතිව නුඹ කුස වෙත ආ රෑට
ඔච්චම් කළා හද අහසේ සිට ඊට

මද කිපී ඇතුන් ගෙයි පැල්පත් දොර සින්දා
නෑඹුල් මලේ මල්පෙති වල සිල් බින්දා
මා දුන් විළාපය ඔහෙ සවනත රන්දා
සළු ඉනු වතේ රස හඳ මාමත් වින්දා

සියැසින් දුටු එවුන් කවුරුත් සිටිනවද
කියමින් උසාවීය ගිගුරුම් නගන සද
නෑසූ කන්ව සැඩ හිරුගේ මැදට වැද
නිහඬව සැගවුණෙත් අද ඔය ඉන්න හඳ

හිස්කම නුඹේ දිවියේ හැමතැන තිබුණු
මගෙ සෝ සුසුම් දුක් කඳුළින් බිම හැළුණු
දැක ලෝකයට සඳ නිල් අහසේ ඇඳුණු
අමාවකම දුන්නා කළුවර බැඳුණු

නිල් ආකහෙන් ඉදහිට බැලුවත් එබිලා
පුතු රවටන්න ආවෙත් ඔය හිත බිදිලා
හිනැහෙන්නෙපා පුතුනේ නුඹ හඳ දැකලා
අම්මා ඉන්නෙ ඔය සඳුගෙන් හිත රිදිලා

## පද්‍ය රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )

**කුසලතා ස්ථානය**
එන්.ජී.පී.සඳමාලී
ලංකා බැංකුව,කටුවන



### ප්‍රභාතයට පෙර වදනක්

විමසනු රිසින් සැප දුක මිහිළියට හිමී
බිමටම නෙතු යොමා හිරු ගිය ගමන නිමී
පමණකි අඳුර දැන දැන වුව දැත දෙමී
කුමරිය නිශායම සැනෙකින් වැළඳ ගමී

සිසි කොමළියට මුළු නුබ ගැබ අයිති රිසින්
විසි කොට වළා සළු ඇත දඟ ළියක ලෙසින්
කිසිවෙකු තබා ගියපසු සා කළල කුසින්
ලැසි ගමනකය ගැබ්බර සඳ කඳුළු ඇසින්

තරඟෙකි වවුල් කජු පුහුලන් හප කරන
පිරිසකි රෑහැයි කම්හල මෙන් හඬ තලන
එළියකි කණාමැදිරියො දල්වන නිවන
නගරෙකි කුඩා මුළු රෑය ඇහැරී තිබෙන

හන්දියෙ කඩේ ණය පොත් පිටු රවන හැටී
අන්තිම හැන්ද හඬදෙයි ටින් කබලෙ ගැටී
කුන්දෙන් වගේ යන වැටුපෙහි ගමන කෙටී
නින්දට පියන ඇස සරණක් සොයන හැටී

රතු ඉරි චක්‍රලේඛණ රෙගුලාසි මත
උතුරන ළැම කිරට වරපට බැඳෙනු ඇත
පැතුවත් නින්ද මැදියම තෙක් නොපියු නෙත
මතු මතුවටත් ගැහැණියකට උරුම ඇත

හැම කළු වළාවක සොයමින රිදී ඉරී
ඉම නොම දැන නොයා ඉන්නට කිමද බැරී
පමණට වඩා පැතුමන් ඇත සිතෙහි පිරී
හිමකර සනසවයි සිත සිහිනයට හැරී

සදහට යමක් නැතියෙන් කිසිවෙකුට හිමී
උදයෙම ළහිරු මුදවයි කළු අඳුරු බැමී
උදයද රැයද දෙක එක අහසටය හිමී
මඳහස නඟා හිමිදිරියද වැළඳ ගමී

## පද්‍ය රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )

### කුසලතා ස්ථානය



ආර්.ජී.ඩී.එස්.රන්කොත්
ව/ම/පොපි/ටී.බී.විජේසූරිය ක.වි
මා එළිය

### බාරි

සඳුන් තුරෙක සදිසි ගුණැති ලියක තනන සිරි විමන්
නඳුන් සුවෙක සසරි හදැති වැලක සිරිය පෑ සමන්
ළඳුන් ළයෙක සපිරි පෙමැති හැගුම් නිවන ගත ගිමන්
මවුන් ගුණෙක අසිරි පෑව බිරිය සදන පෙර ගමන්

පහන් ටැඹෙක විසිරි කැල්ම රැඳුන කෝල නිල් නුවන්
සහන් වතෙක පැතිරි ළතෙත් මෙලෙක මුදන හද ගුවන්
යහන් ගැඹෙක රුසිරි නිසැක මවන තෙපුල් බැඳි ලවන්
පහන් හදෙක යසිරි රඳන සකී බිරිය සත් රුවන්

රුවින් සිළෙක විහිදි සිරිය ගෙනෙන දේහ දුළ කැළුම්
මුවින් රසෙක ඇමිණි තෙපුල් නිවන ළසෝ ගිනි හෙළුම්
සොවින් ඇදෙක වැතිරි හිමිට සවිය ගෙනෙන නෙත් බැළුම්
ලොවින් මිණෙක සදිසි හගිනි බාරි පැලට පිපි නෙළුම්

බිඳන් ගෙයෙක ගෙහිමි බලය කාලි වෙසින් රඳ යදම්
බැඳන් කුසෙක මිහිරි අවුල් තවත් සොයන රස ගුදම්
රදන් විලෙක කෙකිනි විලස ගුණන වනන යුරු සුදම්
සිඳන් තුරෙක මුලිනි මුදුන් අරිය බිරිය ඔද රදම්

නිතින් පයෙක වැසිනි දූලි වෙසින් විඳින හද රිදුම්
ගතින් නොයෙක ඇඳිරි රැඳුණු ළයෙක පතිනි ගුණ සැදුම්
බැතින් සිලෙක ලෙසිනි නොසැළි හිමිට පුදන දිවි පිදුම්
සිතින් හෙළක වැතිරි දාසි ගෘහයේ සෝක දුක් බැඳුම්

හිඳන් සෙරෙක ලෙසිනි හිමිගේ බිඳයි චිත්ත රන් බඳුන්
රඳන් කුළෙක රජිනි තෙදින් පෙළයි මිතුරු අත් බැඳුන්
සදන් ළයෙක දැඩිනි රුවක් මුවින් දෙසයි පලි යැදුන්
නොදන් කලෙක බැඳුනි චෝර බාරි කොහිද රත් සඳුන්

වදන් තුඩෙක රැඳිනි හීය බිඳයි හදෙහි තුටු කුසුම්
මුදන් නොයෙක දොසිනි නිගා රඳයි ගෙපැලේ සෝ සුසුම්
බිඳන් හදෙක ලෙයිනි පවා සොයයි මිහිරි රස මුසුම්
නිදන් පුරෙක යකිනි වෙසිනි වදක බාරි නිති විසුම්

## පද්‍ය රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )



**කුසලතා ස්ථානය**

ඒ.ඒ.එල්.එම්.අමරසිංහ
නීති ආධාර කොමිෂන් සභාව,
කොළඹ 12

### අවාරෙට ඉඳලෝලු පිපිලා

අවේලාවට පැළලි අහසක
කිරි සිනාවක් පායලා
කුරුළු පැංචිය සිඟිති පා අඩි
නියරෙ එක දෙක තබ තබා

අවාරෙට ඉඳලෝලු පිපුණම
හීල්ලෙන ලස්සන නිසා
දුවේ මම උඹ හදා ගත්තෙම
ඇහේ මූණේ තිය තියා

එන්න එන්නම රතින් රන්වන්
බණ්ඩි ගොයමත් මෝරලා
කන්න හත අට සාර වෙනකොට
බිළිඳු බාලොලි හැංගිලා

ගාට ගාටා පුරුදු සක්මන්
ගමනෙ අපි හේනට ගියා
පැලේ අත්වැට සොයන ඉඟි ඇගෙ
ඇහේ ඇඳිලා සේදුණා
හැම සැරේකම රිදෙන දෙනෙතින්
මුනිවතත් රැක ගත්තෙ මා

හෙන්දිරික්කා පුසුඹ මූසල
උඹේ සුවඳත් ගඳ කළා

ටිකක් දවසක් ඔහොම යනකොට
ළයේ පිළිලය ලියලලා
මටයි දුවටයි රොඩු හරිම දුන්
කොරියෙ පාරත් ඇහිරුවා

තලිය නුහුරට අල්ලාන ඇය
දිවියෙ උඩුගං පීනුවා
බුර බුරා දිව ආපු මැර රළ
ගිජුව මුදු හිත තෙරපුවා


රකුසු රතු ඇස් ගිනි බටෙන් ඈ
බේරගන්නම බැරි වුණා
මකර දෙපයක් උඩින් ඇවිදින්

පැදුර පෑගුවෙ තල තලා

දිනක් අහසට හොරෙන් දියණිය
කළුව අරගෙන නික්මිලා
නියර ළඟ මැසි තෙල් විලෙක බොර
කුරුළු තටු තිබුණිය හලා

ඇගෙ ගවුම් පොඩි මොට්ටු බෝතල්
එකින් එක එළියට දමා
කඹය විගසින් සොයා ගන්නෙමි
හිඳියි දුව අත වන වනා

**පද්‍ය රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )**



**කුසලතා ස්ථානය**
ඩී.ඒ.වීරසිංහ
සේවා නියුක්ති භාර අරමුදල්
මණ්ඩලය,
කොළඹ 5

**අවසාන රාත්‍රිය**

කළුපාට සායමක් දස අතම පැතිරී
මලානික හිරු දවා දහවලක් ගෙවුනී
කුමුදු කැකුලුද සෙමෙන් නිරුවතින් ඇහැරී
විලිබියෙන් සඳ සෙමෙන් වලාවේ සැඟවී

අඳුරෙ කෙඳිරිලි හඬට වන වදුලු බියවී
සරාගික වියරුවට තණමල්ද පොඩිවී
තුරු වදුල හැර දමා සුළං රැල් ගොලුවී
හඬයි විකසිත මලක් උරහිසට යටවී

සල්ලාල ඔබරෙකුට රයක් සන්තකවී
රක්ක මල් හීනයක් පුපුරුවා හැරිනී
සාක්කිත් හංගාන සඳක් ඉකිබිඳිනී
එළිසොයා අඳුරේම අඳුර අත ගැටුනී

ලය පුලුස්සා නැගුනු කඳුලු නෙත දිලිසී
නාඳුනන සිරුරයට නෙත් අහසෙ ගැටුනී
මහපොළොවෙ පිහිට යැද ඇඟිලි තුඩු පැලුනී
සිර වෙවී හෙලු හුස්මට දිරිය බිඳුනී
අවජාත බීජයක් ගැබට විත් පැලවී

අවමාන පෙරහැරේ නුඹට දෙස්          දේවී
සුපිවිතුරු කුසුම මත වසුරු කල          සොවිනී
හඬා ලත් වී පලක් නොවේ මා          මැණී

සරද්දී ආකහේ දෑස නුඹෙ          පෙනුනී
මෙ පිරිපත සුදුසු කල ආ බවක්          හැඟුනී
ගන්දබ්බ අවධියට සමුදෙන්න          තිබුනී
පාව එන්නට ගැබට නුඹ වෙතට          හැරුනී

අයාලේ පිපෙන්නට නුඹ කුසේ          හැඩවී
සැතක් වී රුදුරු සිත් නසන්නට          මුල් වී
අමාවක වූ නුඹට පුරපසක          සඳවී
ශාපලත් කලුවරට එළිය දෙමි          පේවී

## පද්‍ය රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**ප්‍රථම ස්ථානය**
කේ.එල්.පී.ඒ.රබ්බිඩිගල
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
යටිනුවර

### සඳමලී, ඉඩෝරය ඇවිත් ....!

දෑස් හැරගෙන ඉන්න බැරිව ඉර ගිනියමේ
මම මෙහෙම නිදන්නෙත් කැමැත්තෙන් හෙම නෙමේ
මටත් හරි තෙහෙට්ටුයි, මේ ඉඩෝරය සමේ
පුංචි සඳමලී ඇයි, ගොළු වෙලා මොකද මේ?

තෙතක් නැති අහසකට නොකියාම අවලාද
වැහිලිහිණි සිඟිත්තන් නිදන හැටි දුටුවාද?
ගෙඹි පැටවු දොරකඩට, අද ඇවිත් නැහැනේද?
යාළුවන් කතා නැති නිසා දුක හිතුණාද?

කවුරුවත් නැවතිලා ඉන්නවද ආවොතින්?
හැමදාම, හැමදේම එක වගේ නෑ ඉතින්
එපා තරහෙන් ඉන්න කඳුළු බරවූ නෙතින්
සඳමලී, වැරැද්දක් වෙලා නෑ මා අතින් !

සුදු පිපුණ කෙකටියා යාය දැන් කළුවරයි
තනි කකුල උඩ ඉඳන්, කණ කොකෙක් නිදි කිරයි

මේ ඉතින්, කවදටත් මට පුරුදු කරදරයි
ඒ වුණත් ඒ කඳුළු, මගෙ වගෙයි මට බරයි !

ඔන්න ඔය නෙළුම් මල, කෙට්ටු සුදුමැලි පාට
තියාගෙන හිටියෙ නම්, පුංචි මී මැස්සාට
බය නැතිව ළං වෙන්න, නටුවෙ කටු තිබුණාට
නටුව අමනාප නෑ, මල ඔබට දෙනවාට !

නිවා සරතැස සැණින්, සොඳුරු වැසි ඇද හැලී
සියොළඟම දරාගෙන, සුදු සේද දිය රැලී
පිපෙන පළවෙනි මලම, සුමුදු සියපත් සැලී
ඔයාටයි දෙන්නෙ මම, ඇහුණාද සඳමලී?

දැන් ඉතින් ගෙට ගිහින්, හිතේ දුක නැති වෙන්න
"වැසි වසින දිනක් " ගැන සිතුවමක් ඇඳ ගන්න
හැබැයි වැහි කළුව මත, එපා කළු තවරන්න
සුදුපාට වැස්ස දෙස, බලාගෙන ඔබ ඉන්න !

## පද්‍ය රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**දෙවන ස්ථානය**
ඩබ්.ආර්.ඒ.එස්.එල්.රණසිංහ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ගම්පහ

### සිරකාර සිත්තරාගේ චිත්‍ර ප්‍රදර්ශනය

ප්‍රේක්ෂකයෙක් -

භාවනාවක් වගේ තුන් සිත ම නිවාලන
කොයි තරම් සුන්දර ද අන්න අර චිත්‍රය
ඉන්නවලු සිත්තරා සිරගත ව සිර ගෙදර
කොහොම නිදහස් වී ද ඔහුගෙ පින්සල මෙහෙම

සිත්තරා -

අවසරයි කියන්නට සිත්තමක මංහසර
මෙහි එන්න කලින් මගෙ වැඩබිමයි මහපාර
තාර උණු වෙන ලිපේ ගිනිය ඔය රතු පාට
ගැලූ දහදිය තමයි පසුබිමේ අළු පාට

විඩාපත් දවස නිම කර එබෙන හැන්දෑව
මග බලන පුතුගෙ සිනහවෙ සොඳුරු සුදු පාට
ගෑ වලාකුළේ එක තැනක අර කළු පාට
පණුවො කෑ පුංචි දත හිනා වෙන කොට පේන

මැදියමේ පෑල දොර හඬවනා හඳපාන වැදී කලඑළි බහින
මගේ ගෑනිගෙ මූණ වගෙයි අර ගිනි ගෑනී වියරු වුණු ඉරපාන
ඉරේ රැස් කැරැල්ලක් නොවෙයි ඒ පිහිපාර

## පද්‍ය රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**තෙවන ස්ථානය**

ඒ.එස්.ජයසිංහ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ඉබ්බාගමුව

**නැවතුමක අසිරිය**

කොතැන සිට කොයි තැනක යාවිද
නොදැන ඉපදෙන මිනිස්සු
ආව කාරණ නිමා නොකරම
යන්න ඉඩකඩ සැලැස්සූ
එදා ඉදලම සිටිය යුතු අය
යනවමයි හිත හිනැස්සූ
දෛවයේ සරදමද නැතිනම්
සොබා දහමද තිගැස්සු

මළක් මිලිනව පෙති හැළෙනු දැක
අනියතය සිහි කරද්දී
ඉපදුනොත් මිය දෙනා බව දැන
නෙතින් කඳුලැලි සලද්දී
යුතු අයුතුකම් අකාරුණිකව
මුදලකින් මැන බලද්දී
ජීවිතය විදිනවා සිතමින්
විඳවමින් කල් මරද්දී

සත්පුරුෂ කම් ගොසින් දිය වී
අමන දුසිරිත් වැඩෙද්දී
තිරිසනුන් රඟනා අපූරුව
මිනිස් වෙසකට අරුත් දී
ඉඳුකිලක් පවනට නොසෙල්වෙන
මොනර කොළ යට සැළෙද්දී
අහෝ ! ඉපදුන කුමන මනු ලොව
නිරයටම අත වනද්දී

කරණ කල කී දෑ සියල්ලම
දිරන කය තුළ නිදද්දී
මහා බියකරු සසර ගමනක
නිසරු කෙම් බිම සරද්දී
නිවුනි නම් සිත හමුව වෙන්වන
නියත ලෝ දම දකිද්දී
තුෂර බිඳ සුන්දරය තණ අග
මහපොළව සිප ගනිද්දී

## පද්‍ය රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

**කුසලතා ස්ථානය**
බී.ආර්.එස්.ආර්.පෙරේරා
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
රත්මුතුගල,කඩවත



**<u>මල් හැඟුම්</u>**

පඳුරු අස්සේ හැංගි හැංගි හිරුට හොරෙන් පිපිලා
සොඳුරු ලෙසට පිබිදුනාට කවුරුත් නැහැ දැකලා
පොකුරු පොකුරු උස අතු අග නෙක මායම් පාලා
සමහර මල් හිනහුනාට කවුද ගන්නේ නෙලලා.

මලට යටින් කටු ඇත්තේ රැකගන්නයි මල්
ඒ වුනාට ඒ මලටත් සෙමෙන් වැදෙයි ගල්
සියුමැලි පෙති මත ලියැවේ මනහර කවි වැල්
කවි ගොතනා ඒ සිත් නම් සොඳුරුයි හැමකල්

පුසුඹ සමග රුව බබලන මල් පිපෙනා විල්
අතලොස්සක් ඇතත් අනේ! තියේද දිගු කල්
හිරුගෙ එළිය ඩිංගක් හෝ තියෙන තාක් කල්
දෙපා මුලත් පෑගි පෑගි පිපේවි පොඩි මල්

ඉහට උඩින් ගුවන පුරා නැතුවට පැහැ තිල්
නැටුම් පෑවෙ නැතත් මයුර විහිදාලා පිල්
සඳ එළියට හාදු දීදී ඇහැරුණාම මල්
ඒ සුවඳින් ඔකඳ වෙලා වනයම සුරතල්

රෑ ජාමෙට-හිමිදිරියට අහස් වියනෙ හිල්
පිනි හැලුවට සට සට ගා ඒ සේරම බොල්
පුංචි වුණත් ඇස් ඇරියම සුදු පැහැයට මල්
නිසන්සලයි පරිසරයම ගත්ත වගේ සිල්

දෙව් මැදුරේ උස් බඳුනක දෙවිඳු පුදන මල්
බුදු මැදුරේ නටු නැතිවම මුනි පාමුල මල්
කිසි විටෙකත් මිනිස් අතක පහස නොලත් මල්
සමහරවිට, හොඳ ඵලයක් ලොවට බෙදන මල්

සැපට - දුකට අවමගුලට මුල්තැනගෙන මල්
රස සමගම විස මුසුවුනු හිත රවටන මල්
තුරු මුදුනක - කටු අකුලක රහසෙ පිපෙන මල්
කොහෙ රැඳුනත් පරවුණාම පොළව සිඹින මල්

අනියත බව පසක් කරන හොඳ නිදසුන මල්
ජීවිතයත් ඔබ වාගෙයි, මොහොතයි මනකල්
නොලැබුණාට රැඳී ඉන්න මෙලොව සදාකල්
නිදන සොහොන් බිමට එන්න තනියට මිනිමල්...!

## පද්‍ය රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

**කුසලතා ස්ථානය**
ඩබ්.යූ.එම්.එම්.ටී.රාජකරුණා
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
කළුතර



### පසුතැවිල්ල

වෙනත් මවකගෙ දුක අහනවිට අපේ අම්මට දුක හිතෙන්නැති
උනත් වරදක් ඇයට පුතුගෙන් හිත හදන්නට වෙහෙස වෙන්නැති
කළත් උගතෙකු මෙලෙස වන්නට කුමන නම් හෝ පාපයක් ඇති
නමුත් තම පුතු එලෙස නැති බව අපේ අම්මා කියන්නට ඇති

තලා පෙළමින් වැදූ මවුපිය දෙදෙන ගෙදරින් එළවනා විට
බලා සිටිනට කාට නම් හැකිවේද ඔවුනට රිදවනා විට
පලා නොකියා පලා බෙදෙනා මෙවන් දරුවන් විඳවනා විට
සලා කඳුළැලි පිහිට වන්නෙත් මවුපියන්මයි ලොව බොහෝ විට

අතැර දා  මා වෙන්ව ආ දින නුඹ  තනිවෙලා    හඬන්නට ඇති
නිතර නිතරම මගේ කටහඬ දැන් ඇහේ යැයි    සිතන්නට ඇති
වසර ගණනක සොඳුරු  මතකය නුඹේ සිත තුළ        රැව් නැගෙන්නැති
නතර වන්නට නුඹෙ දෙපා ළඟ මගේ හිත  මට        ඉඩ නොදෙන්නැති

බදාගෙන මා තුරුල්ලට  ගෙන ලබාදුන්නේ       උණුහුමයි මට
බෙදාගන්නට හැකිද  හද තුළ  දරා සිටිනා  සෙනේ   නුඹ මට
එදා මා ඇතිදැඩි  කෙරූ මව  හැර දමා මා          වෙන්ව ආවට
සදා  නොවෙනස් එකම ගැහැනිය  නුඹයි එය    තේරුණේ නෑ මට


ඇගේ රුහිරය කිරට හරවා මගේ බඩ කට          පුරවන්න ඇති
අගේ කරමින් ඇගේ පුතු ගැන පැතුම්  දහසක්          මවා ඉන්නැති
"මගේ පුතු නුඹ  මගේ ලෝකය "කියා මා ගත       වැළඳ ගන්නැති
"මගේ අම්මා මගේ ලෝකය" කියන්නට මට            හිත් නොදෙන්නැති

දුකක් මට කිසිදිනක නොම දී බලාගත් හැටි මතක් වන විට
සිතක් කෙලෙසක වාවගන්නේ නුඹේ පුතු නුඹ අතැර ආ විට
පසක් වනවිට පමා වී ඇත සමා දෙනවද නුඹේ පුතු හට
වරක් නොව මා දහස් වර නුඹෙ පා වඳින්නම් සමාවෙනු මට

ඇහැට පේනා මානයේ සිට හැදූ හැටි සිහියට නැගෙන්නැති
රසට බත් ටික අනා කැව් හැටි මතක්වෙද්දී දුක හිතෙන්නැති
මෙමට අසනීපයක් වූ විට දිවා රෑ නුඹ නිදි මරන්නැති
පවට මාගේ මෙවන් දුක් නුඹ දැරූ බව මට නොතේරෙන්නැති

කලක් ගතවූ පසුව දැනුණා නුඹේ සෙනෙහේ අරුත මා හට
වරක් ඇවිදින් යන්න හිතුණා නුඹේ රස බත් කටක් කන්නට
හිතක් පපුවක් නොමැති මිනිසෙකු ලෙසින් මා හැසිරුණත් පවකට
ඉඩක් දෙනවද නැවත ආවොත් නුඹේ උණුහුම යළි ලබන්නට

## පද්‍ය රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**කුසලතා ස්ථානය**

කේ.ඒ.කුමාරසිංහ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
කුරුවිට

### පැලයක් සිටවමු

හිරු එබී බලන විට යනෙන අය වෙත රචා
තරු පෙනෙන බව දනිමු තරුණයින් හට පවා
අරු මයකි ගත මෙන්ම ගත හැකිය හිත නිවා
තුරු ගහනෙ වැඩි කරමු මග දෙපස තුරු වවා

ඇස් පියන් ගස් කපා මුඩු බිම් ය වැව් බඩ
පස් ගසාගෙන අවුත් වැව් පතුලෙ රොන් මඩ
හිස් නොකර ඇල වේලි නතර කර ගොන් වැඩ
ගස් වවා රකිමු වැව් තාවුල්ලෙ බිම් කඩ

වන වගා නොමැති තැන වැහි පොදක් වැටුන විට
වුණ සෝද පාළු දැක නොහෙල උණු කඳුළු කැට
තැනල පොහොරල ජලය ඈ ලබාදී පැලය කට
යන පාර වසාලමු කතරකට අපගෙ රට


වල් ගහනෙ නැති වුවොත් මතු දිනෙක කළි යුගේ
සල් ලි දී අම්ල්කර ගෙන වෙනත් බඩු වගේ
එල් ලගෙන ඔක්සිජන් සිලින්ඩර පිට දිගේ
කෙල් ලොල කොල්ලන් යාවි වැඩපළට මහ මගේ

ලන්   දල දියල ගුවන හිම් පරිසරයෙ වැසි   ජීවි
ඉන්   දුවොත් ගසක් කුස පුරා කා සැන   සේවි
දන්   න අය කියන දේ නොඇසුවොත් සිට   පේවි
කන්   න නැති පරපුරක් මතු දිනක බිහි   වේවි

අද   හසින් සන්නද්ද වී ගසක් සිට   වන
අද   අදම ගත යුතුය පියවරද රට   ගැන
නිද   හසේ දිවි ගෙවන්නට හුස්ම ටික   ගෙන
හොඳ රටක් හදමු දරුවන්ට හෙට උප   දින

## පද්‍ය රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

**කුසලතා ස්ථානය**
ඩබ්.ජේ.ජයවර්ධන
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ගාල්ල



### ගින්නෙන් ම'හදට සිසිල ගෙනේ...!

දෑත් - දෙපා - හද - ඇස් නැතියකු මෙනි මා මෙතුවක් ජීවත්
වූවේ
කාත් කවුරුත් කිසිවිටෙකදි නැත මේ ගැන පොඩියක් විමසූවේ
ගේත් දැවී යද්දිත් නැහැ කිසිවෙකු නිකමටවත් සිත සැනසූවේ
ඒත් කමක් නෑ ඇයි අවටින් ඉඳ තව කුණු රොඩු ගින්නට
ලෑවේ ?

හිරු එළියෙන් නෙක කොළ රොඩු වියළී නැගෙනා ගින්නට
මුසුවෙනවා
වැසි දියරෙන් අළු සේ දී යන විට අඟුරු පුරු තව දිළිසෙනවා
මඳ සුළඟින් යලි නිවී තිබුණු ගිනි මොහොතින් මොහොතට
උපදිනවා
හදවතකින කිව්වට බැරි ගිනි මැද දැවී මළත් සැනසුම දෙනවා

දැවුණු හදට සිසිලක් දුන් දිය වැල මටත් හොරා වෙනතක
ඇදුනා
ගෙවුණු තරම් කල දියවැල සෙවුමට මුළු ගත ඉන් වෙහෙසව
රිදුනා
නිවුන ගින්න යලි පණ ගැන්වීලා දිවියට ගිනි දැල් රැස් වැදුනා
තැවුණු හැටිත් නෙත් දෙකටම පෙනිලත් උන් ඔවුනගෙ වැඩ
වල යෙදුනා

වැටෙන කෙනෙකු ඔසවන කිසිවෙකු නැත මේ මුළු දිවියේදි මුණ ගැසිලා
වැඩෙන කෙනෙකු දියුණට ගෙන යන්නකු නැත මේ බවයේදි මා දැකලා
හඬන කෙනෙකු සනසන අය ගැන නැත මේ වනතුරු දෙසවන වැටිලා
නැගෙන ගිනිත් කිවුවට කිසිවෙකු නැත මේ ලෝකෙට තව බිහි කරලා

ගින්න නිමුණ මුත් රුදු කොටි - වලසුන් පරිසරයේ සැරිසරණු පෙනේ
වෙන්න තිබුන දේ සිදු වූ පසුවත් කිම බිහිසුණු ගති ඉතිරි වුනේ
කන්න හදන දෙය තැටියක ලාගෙන ආවත් සැකයත් හිතට දැනේ
දන්න කියන අය මොනවා කීවත් ගින්නෙන් මහදට සිසිල ගෙනේ


පුන්සඳ ඕනෑ නෑ හිනැහෙන්නට ගන'දුර මට සැනසුම දේවී
රන්තරු වල ඔය මුකුළු මොටද මට කණාමැදිරියො එළිගෙන ඒවී
හැංගෙනු කෙකටිය - කුමුදු සමන් පෙති ඔබෙ රුව දුක වැඩි කරලාවී
සැන්දෑවේ එන සීත සුළඟ මට එපා එයින් ගිනි ඇවිලේවී

විලාප නගමින් මුහුදු වෙරළ හැඬුවත් හදවත ගිනි නිවුනා දෝ ?
පළාත යටකොට ගංගා - ඇළි - දොළ ගැළුවත් ඒ ගිනි නිමුනා දෝ ?
වෙලාව නොතකා ඉර - හඳ එළිගෙන ආවත් ඒ ගිනි නිමුනා දෝ ?
මළාණිකව ගත දැවී යනු දැකත් ඒ දැල්වුන ගිනි නිමුනා දෝ ?

සතුට - සැපය දෙක ගැන මතු නොසොයමි තව තව
කරදර පැටලෙද්දෙන්
අතට අසුව තිබු මිණි - මුතු ඈ හැම දැල්වෙන ගින්නට මුසු වෙද්දෙන්
සිතට පැමිණි දුක ගතේ නහර තුළ ලෙයට මුසුව විසිරී යද්දෙන්
රතට නැගෙන ගිනි නිමුනොත් කිසිවෙකු පලයක් ලැබතොත් ලැබගද්දෙන්

## පද්‍ය රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

**කුසලතා ස්ථානය**
විජයසිරි මිහිඳුකුලසූරිය
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
කැස්බෑව



### ධූම රාක්ෂස

සුද ඉරූ කොපුල් තල ඇස් පියන්_අඩවන් ව
විලිකුන් රතැස් පල ඉරි තැළුණු වියළි තොල්
තුරුණු නුඹ අකල් විලි පිලි දකින පව් පිරූ
රිදුම් දෙයි පුත මගේ ඇට මිදුලු කිලිපොළා
හද පිරූ සිහින යයි දෑස් අග බොඳ වෙලා

ආයාස පා නළල් තලය රැළි ගස්සවා
නුඹේ පිපිහළු දෑස් පියන් යට ගිය කිඳී
ගිලන් වූ රතැස් එළියට එබෙන කල සෙමින්
දැනෙයි නුඹ නිරතුරුව විඳවනා අපා දුක
ගිජු සිතට ආසක්ත ධූමයට බැඳි පෙමින්

වියවුල් ව ගිය මුහුළ පාළු වී තැනින් තැන
දුර්වර්ණ වී වැනෙයි හමන සුළඟේ ඔහේ
කසාවන් පර්ණයකි දැන් ඉතින් නුඹ අකල්
මහ රුකින් ගිලිහිලා පතිත වනු කල් බලන
නුඹ නමින් දෙඩුව ඕරම් ගිලෙයි වා තලේ

මහද පිරි සෙනෙහසට අසන්නායක වෙමින්
පිය සෙනෙහෙ බැහැර කළෙහිය ඉතා පිළිකුලින්
කිරිවැදුණු සරු කෙතක් හළු කළෙ ද පාවකය

වෙහෙසෙනා කම් නුහුරු වැහැරෙනා අලස ගත
ධූමයට ලොබ බැඳී එදෙසටම ඇදෙයි සිත

මුදු දෑත විදා හැර එදා නුඹ සෙනෙහසින්
ඈත නිල් ගුවන් ගැබ වලාකුළු දෙන රැගුම්
නිශා නුබ දිලෙන සඳ සමග දොඩමළු වෙමින්
සුදෝ සුදු දසන් පා හිනැහෙමින් නුඹ එදා
වින්ද දිව වරම දැන් පලා ගොස් ඈත නුඹෙන්

අප්පච්චි අප්පච්චි නිතොර මුව ගැවසිලා
මා බදා දෑස දෙස බලා උන් හැටි එදා
නිබඳ චුම්බන මහා මේඝයක් ලද මගෙන්
කෝ එදා නුඹ සතු වූ නිමල පබසර උවන
නිරතුරුව දෑස් මගහරිනු ඉවසම් කෙසේ ?

අභිනීල කාන්තිය සැඟව ගොස් ගනඳුරේ
නිබඳ මා ඔකඳ කළ දෑසෙ සොමි රැස් කිඳී
ඈත අපුල පිරී ගිය කෙවෙනි නාවර රැඳී
නොපෙනේද මෙ පිරිපත තිදස දෙවි සුරන් හට
හුණු නො වෙද සුරිඳ නුඹ නිදි ද ඔය සලසුනේ?

යම් වහා නුඹ රැගෙන වෙත පුණ්‍ය තීර්ථය
දුරැර ලනු පිණිස වස් දොස් නහා සුවඳ පැන්

මෙත් සිතින් කොට බැහැර නුඹ සිතේ බැඳි පරණ
පුතේ දුම් රොටු දුරැර අතීතෙට පැන යන්න
මා බදා සිඟින සුරතලෙකු වී යළි එන්න

සැපක් යැයි සිතා නුඹ මුලා වී දිය කෙළින
නො වේ ඔය නුඹ පතන සීදන්ත සාගරය
සර්කයකි බිහිසුණු ය වහ වහා දිය සිඳෙන
අපට ආගන්තුකයි එසැණ සුව නුඹ විඳින
සරදමක් නොවෙද පුත අප මහරු සර දමට!.

## ගීත රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )



**ප්‍රථම ස්ථානය**
ආර්.එම්.චාන්දනී
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මාලිම්බඩ

**යුග ගීතයකි**

පියා - කිරි මුහුද කළඹලා
සොයාගෙන කිරි පබළු .....
අම්ම අහසට ඒවි
අපි බලා ගෙන හිඳිමු........

දියණිය - අම්මි වහගෙන ඉන්න
කළුම කළු වළාකුළු.....
ඔක්කොමලා එක්ක අද
අපි දෙන්නා තරහ වෙමු........

පියා - දූගේ කඳුළුත් එක්ක
මගෙ සුසුම් පා කරමු.......
කණාමැදිරියන් අතේ
තවත් පණිවිඩ යවමු.........

දියණිය - මිදුලෙ බංකුවට වී
බලාගෙන අපි හිඳිමු.....
අම්මි හැංගිලා නම්
හැංගි මුත්තන් කරමු.......

පියා - සුළඟ රහසක් කිව්වා
දුවේ අමාවක අඳුරු.....
අම්මි අද එන්නෙ නෑ
ගෙට ගිහින් අපි නිදමු......

**ගීත රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )**



**දෙවන ස්ථානය**
කේ.පී.ජ්.එස්.මධුතිසරු
ආරක්ෂක මූලස්ථානය,
කෝට්ටේ


**පතිනි**
සිබිනවා රැළි
නග්න උරතල
ලපැත්තේ තවරා
පීන පීනා නීළ යුග්මය
ප්‍රේමයම සෙව්වා

දුහුලු බරණෙන් වැසුනු රන්පට
සරාගින් ලිහුණා
බමන තුඩගේ රැඳුණු මදලස
රන් හුයෙන් බැඳුනා

නිසල දීගේ පයෝදර තුඩු
සළෙල ගත රවටා
පාන ගිනියට හීත උනුවෙන
සුරවි නෙත මැකුණා

යවට දඬුවක මිහිර තැවරූ
සිරුර සිප සනසා
තිමද ගලනා මදන ඇතෙකුගෙ
පතිනි වී පෙමිනා

## ගීත රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )



තෙවන ස්ථානය
ඩී.යූ.එන්.කුමාර
පශු වෛද්‍ය කාර්යාලය,
කොස්ගම

### අභිනික්මණ

හඳ පායලා තිබුණත් රැයේ
ඇයි තාම කළුවර මා වටේ
කණමැදිරියෙකු ලෙස හාමතේ
මග වැරදිලා යන මාවතේ

දුන ගියත් සූ සැට කලා
ඉන් කිමද මට ඇති කාරණා
තුරු වදුලකට හිත බර තියා
නෙතු පියාගමි නුඹ එනතුරා

එතෙර කරනට පරපුරක්
මට නික්ම යන්නට ඉඩ දියන්
වඩදියට පැන උඩුගං ගියත්
මට එතෙර වන්නට මග කියන්

ගීත රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )

**කුසලතා ස්ථානය**
ඒ.ඩී.ඩබ්.එස්.එන්.ද සිල්වා
ජාතික තරුණ සේවා සභාව,
බදුල්ල



**වීණාවී**


හෙමි හෙමිට ස්වර අමුණන වීණාවී
හදතත් වස්දඬු හඬ කම්පිත වේවී
සඳේ මුදුන් කවුළුව ළඟ හිඳ සාවී
රැහියි හඬින් ගී ගයපන් මගෙ දේවී

කන්දක් උස කන්දක් නුඹ නමින් පෙමින් නැගුනු
ඇල්ලක් දිය ඇල්ලක් නුඹ නැතිව ගැලූ කඳුළු
මල්ලක් තරු මල්ලක් තරමට සඳ වට එතුනු
නායගියා ඒ හිත අද හීන හඬනු හැසුනු

තැල්ලක් රන් තැල්ලක් බඳිනට හිත දින ගැනපු
රැල්ලක් රළ රැල්ලක් ගෙන ගියා හදපු මැදුරු
කිල්ලක් මොන කිල්ලක් අසුවූවා දැයි නොදුටු
වස්සානෙත් ගිම්හානෙත් නුඹයි අකුරු කරපු

ꩯꩯꩯꩯꩯꩯ

## ගීත රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )



**කුසලතා ස්ථානය**

ඩී.එම්.එස්.එල්.රාජරත්න
බ/තල්දෙන ම.වි, බදුල්ල

**කපුගල සඳ**

කපුගල සඳ පූදින සඳ
අරුන්දතී තරු ඇස් අග
පළිඟු කඳුළු සඟවාගෙන
ඔබ දිව එනවා මම දිව එනවා
වස්සානය එනවා සිහිනය දළුලනවා //

පීඋං වංගුවේ මත හිඳ
මණ්ඩපයේ රෑ අහසක //
කවියක තුන් පද බැඳගෙන
ඔබව සොයනවා මම ඔබව සොයනවා
සරසවි සුවඳ දැනෙනවා
වස්සානය එනවා සිහිනය දළුලනවා....

කපුගල තවමත් තරුණයි
වැලපුම් කණුවත් නිහඬයි
මියගිය සිහිනය තුරුලුව
මම බැස යනවා - ඔබ බැස යනවා
සිවු වසරක් ගෙවිලා
වස්සානය එනවා සිහිනය දළුලනවා //

## ගීත රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )



**කුසලතා ස්ථානය**

ජී.ජී.නන්දනී
මාප/මා/විද්‍යාදර්ශී ප්‍රා.වි.
මාතලේ

### නූතන ගුරු ගීතය

අන්න පුතුනේ දිසාපාමොක්
තක්සලාවෙන් ඇවිල්ලා දෙන්න

වීදුරුවක් සිසිල් පැන්

සඳැල්ලෙන් බැස ගිහිල්ලා

අග සිසුට තම එකම දියණිය

සරණ දී අසරණ වෙලා

අස්වාමිකව ඇවිත් කුමරිය වැදි

රජුන්ටත් රැවටිලා

විදිනු නොරිසිය බැංකු පිරිපත
රෝග පීඩා පොලියකී
ගෙවී ගියෙ ජීවිතේ පමණකි
ණය තුරුස් එලෙසම වෙතී !

## ගීත රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )

### කුසලතා ස්ථානය



එස්.ධනුෂ්ක
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තලාව

**කිඳුරු වැළපුම**
සඳ කිඳුරියේ හෝපලු වන පෙතේ
අපෙ දරු පැටවු උන් හාමතේ
සඳ කිඳුරු දා කව මතක අතහැර
නාඬා ඉඳපන් ජීවිතේ
ඉඩෝරේ බිම රළු වැඩියි
හුස්ම සොයනා සාගතේ

ලනු මෝලෙ ඇඹරෙන දුක මැදින්
අවපස වෙලා චන්ද්‍ර මණ්ඩලේ
අතමිට තියෙන බ්‍රහ්මදත්තලා
පාන කරුණා අකුණු ගුගුරාවී
තිත්ත කළුවර මාරුතේ
උඹෙන් සනහස යදීවී
ඉරුණු වහලේ ඇස් අගින්
වැටෙන කඳුළැලි බිංදු සීතලේ
චිත්තේ මල් සුවඳ උත්පලා
ගේන උණුහුම සීත පොපියාවී
සංසාර දිගු මාවතේ
අක්වැස්ස යළි වැටේවී

**ගීත රචනා ( රාජ්‍ය සේවයේ නියුතු )**



**කුසලතා ස්ථානය**
සී.එන්.සරෝජනීපලාත්
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
කුලියාපිටිය

**මගෙ මන්ද්‍රි දේවියේ**

හීන් අඳුර දොරකඩට එබෙයි
ඉර මල නිදිගන්නට කලියෙන්
රෑන ගිරව් ගෙට උඩින් ඉගිලුනා
රෑං කියා පණිවිඩය අරන්
පොඩි උන් දොරකඩ ඇස් මානයි
හෙන්දිරික්කා මල් පිපි වෙලේ ඉඳන්
අත මිට රන් මසු නැතුවාට කමක් නෑ
මගෙ මන්ද්‍රි දේවියේ ගෙදර වරෙන්

පය සවි කහ ඉර උඩ රැක උන්
මග මරු උදුරන් ගිය දවසේ පටන්
ජූකී මැසිමෙ තාලයට කැරකුනා
ජීවිත හතරක් පිරූ පැතුම්
ගේ දොර උගසට දුන්නත් දන්
නෑ මතු සසරක පුරනා පෙරුමන්
මා නොවුනත් වෙසතුරු නිරිඳුන්
මන්ද්‍රි දේවී නුඹ වේය උතුම්

කොන්ක්‍රීට් වනේ ජූජක බමුණන්

දේවතා වෙසින් එයි ඇත් අසුන් පිටින්
රෑ නොනිමී දැල්වෙන මග එළි අඳුරේ
වංගගිරියෙ දොර ඇරෙයි ඉතින්
පය පැකිලී මහ මන්දිර අතරේ
ගෙට එන මග වරදින්නට කලියෙන්
අත මිට රන් මසු නැතුවාට කමක් නෑ
මගෙ මන්ද්‍රි දේවියේ ගෙදර වරෙන්

## ගීත රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**ප්‍රථම ස්ථානය**
ජයතිලක කරුණාරත්න
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මධ්‍යම නුවරගම් පළාත

### නුඹ නොවෙද අම්මා

පටාචාරාවන්ට බැරිවුනි
කිසාගෝතමියටත් බැරි වුනි
මන්ද්‍රි දේවියටත් බැරි වුනි
දරුවො රැකගන්ටා
දරුවො රැකගන්ටා
ඒත් අපෙ අම්මා
අපිව රැක ගත්තා ...

උකුසු ඇස නුඹෙ ඇසට පැරදුනි
ගඟෙහි සැඩ රළ නුඹට නතුවුනි
සොයා අඹ මිට ගියේ නෑ නුඹ
අපිව රැක ගත්තා
නුඹ නොවෙද අම්මා ...

නෙලා පල වැල අපට ගෙන දුනි
නුඹට මග වරදන්ට බැරිවුනි
වංකගිරියේ මග සොයාගෙන
අපිව රැක ගත්තා
නුඹ නොවෙද අම්මා ...

## ගීත රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

**දෙවන ස්ථානය**



කේ.එල්.පී.ඒ.රබ්බිඩිගල
ප්‍රාදේශීය ලේකම්
කාර්යාලය
යටිනුවර


### ලෙන බිඳ ආවෙමි...!

සුප්පා දේවිය මං, ආපහු ආවා මං...
මගේ තාත්තේ
ලෙන් දොර බිඳින තුරුම, එළියට එන්න බැරුව
රෑ තුන්යම පුරාම, ඉකිබිඳ ඇඬුවා මං
මගේ තාත්තේ...

උඹ, බැරැක්කයෙන් පැනල ආපු උමතු සිංහයෙක්
නෑ, සිංහ හමක් පොරෝගත්ත නපුරු කැණහිලෙක්
කේසර සෙයියාවට, තවරපු ළෙන්ගතුවට
මං රැවටුණා තාත්තේ
බඩගිනි නරි රැළකට, උන් අටවපු උගුලට
මං කොටුවුණා තාත්තේ

මා නුඹ හැර ගියදා, පපුවෙන් ලේ ගැලුවලු
ඒ ලෙය එකතුවෙලා, ඔය ඇස් දෙක වැහුණාලු
ආපහු ආවා මං, හුරතල් දෝණිය මං
මට සමාවෙලා
ඇස් අරින්න මගේ තාත්තේ...

## ගීත රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**තෙවන ස්ථානය**
එච්.එම්.එස්.හේරත්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මාස්පොත

**සෙනෙහස තාමත්**
රන් මැණිකේ මගේ හිතේ
නුඹට බැඳුණු පෙම
කවදාවත් අමතක නෑ ඒ
ලෙන්ගතුකම...

ගල් කිරියා කන්ද වගෙයි
නොසැලෙන අප පෙම
ඒත් කොහොම හමුවන්නද
තාමත් තහනම....//

කරඹ මලේ නොසැලෙයි නුඹ
දුක - සැප දෙකෙහිම...//
පිපුණත් මල් සුවඳ නැතත්
දුෂ්කර ඒ ගම
මට සුවඳයි කරඹ මලේ
නුඹ හැමදාකම...//

හමු නොවුනත් සංසාරේ
මේ කතර පුරා...//
වෙන් කරන්න බැහැ කිසිදා
දිවි තිබෙන තුරා
හමු වෙමු - එක් වෙමු උපදින හැම භවය පුරා........

**ගීත රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )**



**කුසලතා ස්ථානය**
නෙල්සන් දේමුණි
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
කළුතර

**සඳ ගින්දරී නුඹ දන්නෙ නෑ**
සඳ ගින්දරී නුඹ දන්නෙ නෑ
නුඹෙ හිත අරන් මං ඉගිලුනා
නුඹ සමඟ හොඳ හැටි පියැඹුවා
සඳ ගින්දරී නුඹ දන්නෙ නෑ

ඇස් පෙති හිනාවෙන හීනයේ
දුකැ'ති කළුවර හිත ඔබා
නුඹ ගැනම කඳුලින් ලියා
නුඹෙ හිතබඩින් තබලා ගියා
සඳ ගින්දරී නුඹ දන්නෙ නෑ
සඳ ගින්දරී නුඹ දන්නෙ නෑ

කළුවර කපා හඳ පායනා
කළු රැයක දුරකින් ඉන්නවා
බුබුළු නැග එන ප්‍රේමයේ
අදටත් ඉතින් මං ගිලෙනවා
සඳ ගින්දරී නුඹ දන්නෙ නෑ
සඳ ගින්දරී නුඹ දන්නෙ නෑ

**ගීත රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )**

**කුසලතා ස්ථානය**
ඩබ්.කේ.මිහිඳුකුලසූරිය
ප්‍රාදේශීය ලේකම්
කාර්යාලය
මාකොළ



**මුලාවුණු පුතු නොදුටු පිය**

පිතු කඳුළු බිඳු එදා ඉහිරී කලා වැව් පතුලේ නිවී
මුතු පබුළු සේ නැගී විසිරී දරු සෙනේ රැලි නගාවී

සලා මුදු බඳ ගලා යන මග මහා ඇළකින් කියා දී
මුළා වුණු පුතු එපා කී පෙම රන් කරල් වී පැහේවී

කලා වැව සිප සිහිල බිව් ඇල් පවන් බෝ දුර හමාවී
බලා සිහගිර ගිමන් හරිනා පුතුන් දාහය නිවාවී

ශශශශශශ

**ගීත රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )**



**කුසලතා ස්ථානය**
කේ.ජී.එන්.විජේවර්ධන
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
පූජාපිටිය

**සුසර නොවන වීණාවේ**
සුසර නොවන වීණාවේ
සත්සර නිදියා ඉන්නේ
තත් සුමටව සුසර කළත්
නෑ ගී සර මුමුණන්නේ

නුරා බැලුම් හෙළන සඳේ
මැදියම් යාමේ
සීත සුළං ගත දැවටී
කිතියක් දැනුණේ
තුරුළු කරන් වීණා තත්
නියගින් වැයුණේ
සත්සර සඟවා ඇයි නුඹ
ගොළුවී ඉන්නේ

වීණා සිප් පරතෙරටම
තරණය කෙරුවේ
හදේ සිය දහස් ගී තනු
මිලිනව ඉන්නේ
වීණා තත් සුසර නොවන
හේතුව නොදැනේ
නිදි දැහැණින් අවදි වෙයන්
මගේ වීණාවේ

## ගීත රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**කුසලතා ස්ථානය**
ඊ.එම්.ටී.කේ.ඊරියගම
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ගඟවටකෝරළය,

### ඉරක් සේ ඔබ එන්න

ඉරක් සේ ඔබ එන්න
දිවි අඳුර දුරලන්න
නමුදු සැඩ රැස් දහර
එපා මා හට දෙන්න
මා සැණෙන් මිය යාවි
දරාගෙන බෑ ඉන්න

සඳක් සේ ඔබ එනන්
තැවුල් සිත පිසලන්න
මුදු පියළි මාවතේ
දෙපා හඩවා යන්න
ලොවට රහසේ ඉතින්
සඳ වතුරෙ කිමිදෙන්න

සමුගන්න නොසිතන්න
එපා නෝක්කඩු දෙන්න
නොහැකි නම් යළි එන්න
සිහිනයක දැවටෙන්න
ජීවිතෙට සමුනොදී
අලුත් හුස්මක් ගන්න

## ගීත රචනා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**කුසලතා ස්ථානය**
ඩබ්.ආර්.ඒ.එස්.එල්.රණසිංහ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ගම්පහ

### සඳ එළිය ගලයි

සඳ එළිය ගලයි අර බලන්න ප්‍රමිලා
සෙන්කඩගල අහසේ
මඳ පවන වගේ මම නුඹ වෙත ළං වෙමි
මල් සුවඳ සොයා රහසේ

සෙල්ලම් නිරිඳුට හිමි නැතිදෝ
සහිලස සඳ එළියේ
කොල්ලම් ගස් සෙවණේ අපි සැතපෙමු
තරු පිරුණු නිශා යහනේ

කුමුදු මලකි මට නම් නුඹ සුවඳැති
පිපි සීතල විල් ජලයේ
හිරු ගිලිහුණු සඳ - සඳපාන වගේ එන
දස්කොන් මම ළඳුනේ

## කෙටි කතා ( රාජ්‍ය සේවයේ නියුතු )



**ප්‍රථම ස්ථානය**
කේ.සී.මුදලිගේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
හෝමාගම

### අලුත් මලක් පිපුණා

ෂ්......මිගාර කට මදක් පහත් කර තමන්ගේ බෙල්ලට කටින් සුළං පාරක් පිඹගත්තේ හැඳ සිටි කමිසයේ උඩ බොත්තම් දෙක ගලවමින්ය.

රමණී......රමණී..... යැයි කෑගසමින් ඔහු සාලයට ගොඩවී ඉස්තෝප්පුවේ තිබූ පුටුවෙහි වාඩි වුවේය.

ම්......මේ ගෑනි කොහෙ ගිහින්ද

රමණියෝ.....රමණී..... යැයි කෑ ගසමින් ඔහු නිවස තුළට ගියේය.

''ඔබයි රම්‍ය සඳ කිරණ ගණ අන්ධකාරේ.....ඔබයි සෞම්‍ය තරු එළිය ගිම්හාන කාලේ.....ආ....ආ....හහා.....''

කාමරය තුළින් හීනියට සින්දුවක් මුමුණනු ඇසුණු හෙයින් මිගාර කුස්සියට නොගොස් කාමරයේ දොර රෙද්ද මෑත් කර බැලුවේය.

රමණී කණ්ණාඩි මේසය ළඟ වාඩි වී සෙමෙන් සෙමෙන් හිස පීරමින් සිටියාය. ඇය මුහුණ දෙපසට වනමින් මුහුණේ හැඩ බලමින් සිටියාය.

''කං බීරි වෙලාද? මං කොච්චර කෑ ගැහුවද ?'' මිගාර ගිගිරුවේය.''

''අහ් .... ඔයා ආවද?'' ඇය වහ වහා කොණ්ඩය බඳිමින් ඔහුත් පෙරළගෙන කඩිමුඩියේ කුස්සියට දිව ගියාය.

මිගාරද දබරැගිල්ලෙන් හිස මුදුන කසමින් මඳක් තුෂ්ණිම්භූත වූ ස්වරූපයෙන් කල්පනා කරමින් ඇය පසු පසින් කුස්සියට ගියේය.

''මිගාර, හෙට අපේ අම්මා එනවලු. අර බඩුවත් එක්ක ඉන්න බැරුව ඇති. පවු අනේ අපේ මල්ලි අමාරුවේ වැටුණා.

''ඉතින් වෙනදටත් අම්මා එන්නේ.....'' මිගාර කිව්වේ තේ උගුරක් බොන ගමන්ය.

''මං හිතන්නේ මාස දෙකතුනක් ඉන්න බලාගෙන ද කොහෙ ද එන්නේ. වෙනදට දවස් දෙකක් තුනක් ඉඳලා ආපහු දුවනවනේ. ''

ම්.......ම්......ඒකයි මේ.....''

ඇය මෙතරම් ප්‍රබෝධයකින් සිටිනු මිගාර මෑතකදී නම් දැක නැත.

බලාපොරොත්තුවෙන් සිටි තමන්ගේ ආදරණීය අම්මා පැමිණියාය.

''අම්මේ එන්න අම්මේ ඇතුළට. තේකත් බීලම කතා කරමු. අම්මා මාස ගාණක් ඉන්න බලාගෙන ආපු එක නම් ලොකු දෙයක්. මං හරිම පාළුවෙන් හිටියේ අම්මේ...''

''ඇයි බං යස කෙල්ලො තුනදෙනෙක් ඉන්නැද්දි මොන පාළුවක් ද බං. දැන් කීය වසරද උන් ටික ඉගෙන ගන්නේ?''

''ලොකු දුව දොළහ වසර. දෙවනියා නමය වසරේ. පොඩ්ඩා තාම හතර වසරෙනේ..''

''හරි හරි ....''

දින සති ගෙවී ගියේය. රමණී ඉතා සැහැල්ලුවෙන් සතුටින් ගත කරන හැටි දුටු මිගාරටද හිතේ අමුතු සතුටක් වැනි දෙයක් දැණුනි. නිතරම සින්දුවක් මුමුණමින් සිටින ඇය කලින්ට වඩා මදක් පැහැපත් වී ඇතිදෝ යි මිගාරට සිතුණේය.

දිනක් රමණී මිගාර ළඟට පැමිණියාය. ඔහු සිටියේ පුවත්පත බලමින්ය.

''මිගාර...''

''ම්....''

'' මට ෂොපිං යන්න ඕනෙ''

''ම්....ඉතිං ගිහිං එන්න. මං ඉන්නවනේ අම්මත් ඉන්නවනේ.''

රමණී අසල තිබෙන පුටුවෙන් වාඩි වුවාය.

''ම්..... මට යන්න ඕනෙ ඔයත් එක්ක. ඇඳුම් ගන්නයි. තව පොඩි පොඩි බඩු වගයක් ගන්නත් එක්කයි. දවසක්ම යයි මං හිතන්නෙ.''

ඇය මිගාර දෙස හොරැහින් බැලුවාය. මිගාර ඇය දෙස යම් ප්‍රශ්නකාරී බැල්මක් හෙළාගෙන සිටි අතර ඇය ඔහු දෙස බැලූ විට ඔහු නැවත පත්තරය දෙස බලා ගත්තේය.

''එහෙනං ඉතින් ලොකු වියදමක් යයි'' ඔහු හිමිහිට මිමිණුවේය.

''ලොකු වියදමක් යන් නෑ අනේ. බයිසිකලයට පැට්‍රල් ටිකක් ගහගෙන යමු.''

ඔහු ඇය දෙය ඇස් ලොකු කරගෙන බලාගෙන හිටියේය.

''යමුකෝ..... අනේ.....ඇය මිගාරගේ අතින් අල්ලා හෙල්ලුවාය.''

මේ මොන කෝලමක් දැයි කියන්නාක් මෙන් ඇය දෙස බැලූ මිගාර,

''එහෙනම් විසිපහෙන් පස්සෙ එන ඉරිදටවත් ගිහිං එමු.'' යැයි කීවේ පත්තරය දෙස බලාගෙනමය.

''මට තව ටිකක් ඉගෙන ගන්නයි තිබ්බෙ. ඩිග්‍රියකුත් කර ගත්තනම් ජොබ් එක අතේ...'' රමණී වේගයෙන් කියාගෙන ගියාය.

''ඒකනෙ. ඒකනෙ ඔයාට කිව්වට ඇහුවෙ නැනෙ. ඒ ලෙවල් ඉවර උණා විතරයි මඟුල් විසේ ගැහුවා...'' මිගාර එය අනුමත කරමින් කීවේ දෑස මදක් ලොකු කරගෙනය.

''ඔව් ඔව් මට විතරයි විසේ ගැහුවෙ. අනික ළමයි තුන්දෙනා එක්ක ජොබ් කරන්න පුලුවංකමක් තිබ්බද අපි දෙන්නටම ?'' ඇය රවාගෙන ඔහු දෙස බලා සිටියාය.

''ඇහ්...'' යැයි පවසා ඇය දෙස බැලූ මිගාර ඇගේ මුහුණෙ හැකිළුණු ඇහිබැම දුටුවේය.

''ඔව් හැබෑටම. ඒකත් ඇත්ත නේන්නම් '' යැයි පවසා මිගාර ගෙතුළට ගියේය.

ෂොපිං යන දිනය උදාවිය.

උදේම නැගිට දරුවන් පාසල් යැවීමට අවශ්‍ය කටයුතු සිදු කළ රමණී වහ වහා ලොකු බත් මුලක් බැඳ ගත්තාය. ලොකු වතුර බෝතලයක්ද පුරවාගත් ඇය උදයේම තමන් පෙරුම් පුරමින් සිටි ගමන යන්නට කඩිමුඩියේ ලක ලෑස්ති වුවාය.

''මිගා.....ර.....'' ඔයා ලෑස්ති වුණාද ? ඔය බත් එකයි වතුර බෝතලෙයි දාගන්නකෝ....''
''ම්.... කෝ මෙතන එක බත් මුලයිනෙ තියෙන්නේ...''
''හරි හරි අපි දෙන්නටම තමයි ඔය'' රමණී කෑගැසුවාය.

බත් බැඳගෙන පොදි ගහගෙන යන්න තරම් බඩු තොගයක් ගන්න තියෙනවද. මේ ගෑනිට මොන යකෙක් වැහිලද මන් දන්නෑ. හීන් දාඩිය දාන වැඩමයි කරන්නේ. ඇඳන් ඉන්න කලිසමත් විකුණලා එන්න වෙයිද මන්දා... යැයි හිතමින් ඔහු වතුර බෝතලය සහ බත්මුල ටියුලිප් බෑගයක දමාගෙන ඉස්තෝප්පුවේ පුටුවක වාඩි වී සිටියේය.

ලස්සනට කොණ්ඩය පීරා පෝනිටේල් එකක් දමා සායක් හැට්ටයක් පිළිවෙළට හැඳ පැමිණි රමණීගේ යම් සුන්දරත්වයක් තවමත් ඉතිරිවී ඇති බව මිගාරට පෙනුණි.

මිගාර ඇය දෙස බලා සිටියේ ප්‍රථම වරට දකපු කෙනෙක් දෙස බලා සිටින්නාක් මෙන්ය.

''මොකද ඔහොම බලාගෙන ඉන්නේ. යං පරක්කු උණා හොඳටම''

''ඔය නිකට ගාව පවුඩර් ටිකක් වැඩියි වගේ...'' මිගාර කිව්වේය. ඇය නිකට ගාව අත්ලෙන් පිසදාගත්තාය.
''ම්... යං යං පරක්කු උණා...' ඇය වහ වහා ඉදිරියට ගියාය.

''අම්මේ, අපි එනකං දුවලා ටික බලා ගන්න. ලොකු දුවට හවස පන්ති පොඩ් දෙන්නත් දෙක හමාර වෙනකොට ගේට්ටුව ළඟින් බහීවි''

''හරි හරි බං බලා ගන්නම්.... උඹලා යන දේවාලෙක ගිහිං ඉක්මනට වරෙන්. මං අද ඊයෙ ළමයි හදපු එකක් යෑ''

ගමන ආරම්භ විය. ටික වේලාවක් ගියා පමණි.. ''අර...අර.. යැයි රමණී කෑ ගැසුවාය.

ඒ සද්දයට තිගැස්සුණු මිගාර ඈ..... මොකද්ද?.....කෝ.......කෝ......යැයි වටපිට බැලුවේය.

''අර....අර... අනේ...'' තම දෑතින් මිගාරගේ උරහිස සෙලවූ ඇය ගස් සෙවණක තටු සුද්ද කරමින් සිටි දෙමලිච්චන් දෙදෙනෙක් දෙසට අත දිගු කරමින් කෑ ගැසුවාය.

''මං බය වෙච්ච තරමක්.... මං හිතුවෙ කවුරු හරි වාහනේකට හැප්පිලා කියලා...''

ඔහු පැති කණ්ණාඩියෙන් රමණීගේ මුහුණ බැලුවේය. ඇය දෑස් පුංචි කරගෙන මුහුණට සුළඟ වැදෙන සේ මුහුණ සුළඟට විවෘත කරගෙන සිටියාය. ඇයගේ මුහුණේ තිබුණු ඒ නිදහස් මද සිනහව ඔහු දුටුවේ මීට අවුරුදු ගණනාවකට පෙර ය.

ඔහු බයිසිකලයේ වේගය මඳක් අඩු කළේය. ඇය ඔහුගේ බඳ වටා අත දමාගෙන ඔහුව අල්ලාගෙන සිටින බව ඔහුට දැනුණේ එවිට ය. සුළඟ විත් මිගාරගේ මුහුණද සිප ගන්නාක් මෙන් ඔහුට දැනිණි.

''රමණී...''

''ම්....''

''දැං මොනවද ගන්න යන්නේ...'' මඳක් ලයාන්විතව මිගාර ඇසුවේය.

''අපි ටව්මේ ඇඳුම් කඩ දෙක තුනකට යමු බලන්න මුලින්ම''

''හ්ම්...''

ඔවුහු ඇඳුම් කඩ තුනකට ගියෝය.

''දැං කඩ තුනකටම ආවනේ.... ගන්න දෙයක් ගන්නකො..... කීයක් නං ඇඳලා බැලුවද සෙරෙප්පු කුට්ටම් බර ගානක් දාලා බැලුවනෙ. මොකක් හරි ගන්නකෝ....'' මිගාර කියාගෙන කියාගෙන ගියේය.

''ම්.... මොකද හදිස්සි? ඇය මිගාරගේ කම්මුලට තට්ටුවක් දමා සුරතල් ලෙස ඔහු දෙස බලා ගස්සාගෙන ගොස් තමාගේ අතේ තිබූ හැට්ටය තිබ්බ තැනින්ම ගොස් එල්ලුවාය.

ඇයගේ මළ කෝලම් ගැන ලැජ්ජා හිතුණු මිගාර දන්න හඳුනන කවුරුන් හෝ සිටී දැයි හොරෙකු මෙන් වටපිට බැලුවේය.

''හ්ම්....දැන් නම් හරි මහන්සියි. අපි මේ කොණ්ඩ කටු ටික ගමු. දුවටයි අම්මටයි මටයි ඔක්කොටම. ඔයාටත් ඕනිද?..'' ඇය නිකට දික්කර මිගාරගෙන් ඇසුවාය.

''ඔය කට්ට ගන්නද මෙච්චර රස්තියාදු වුණේ...''මිගාර ඇසුවේ මඳක් කේන්තියෙන් මෙන් ය.

ඇය කවුන්ටරය වෙත ගියාය. මිගාර ඇය පසුපස ගියේය.

ඒ ටිකත් රැගෙන එළියට පැමිණි පසු ''හරි දැං කොහෙද අපි යන්නේ ?'' යැයි මිගාර යම් ප්‍රශ්නකාරී ස්වරූපයකින් ඇසුවේය.

''දැන් නං හරිම බඩගිනියි. අර වැව ළඟ තියෙන්නෙ බෙන්චර්ස් ගහලා. අපි එතන්ට ගිහිල්ලා කාලා යමුද ? එච්චර දුරක නෙවෙයිනෙ. ඉන්න බෑ මහන්සියි. ''

''කඩයක් අස්සට ගිහිං කෑවනම් මොකද ? මිගාර ඇසුවේය.

රමණීගේ මුහුණේ සිනාව වියැකෙනු දුටු මිගාර ''ම්......කමක් නෑ යං යං'' යැයි කීවේය.

බංකුව උඩින් බත් එක තැබූ රමණී අත සේදීමට වතුර බෝතලය ඇරියාය. රමණී අත සෝදාගත් පසු මිගාරද වතුර බෝතලයට අත දිගු කළේය. රමණී වතුර බෝතලය වසා පැත්තකින් තැබුවාය.

''ඇයි මං කන් නැද්ද?'' ඒ මිගාරයි.

''කනවා කනවා...''

ඉතිං අත සෝදන් නැතුව?''

''ඇයි දැං මං සේදුවේ...''

''ඈහ්.....''

''වතුර ටික ඉවර වෙයි. මං කවන්නම්'' රමණී කීවාය.

කට ඇරගෙන රමණී දෙස බලා සිටි මිගාර බත් එක දෙස බලන්නට වූවේය.

රමණී බත් කටක් අනා මිගාරගේ කට ළඟට කළාය.

''කව්රු හරි දැක්කොත්. ලැජ්ජාවේ බෑ...'' ඔහු හිමිහිට වටපිට බැලුවේය.

''ඉතිං දැක්ක දෙං. මං පිට මනුස්සයෙකුට බත් කැව්වෙ නැනෙ. මං ඔයාටනෙ බත් කවන්නේ.''

ඔහු කට ඇර බත් කට කා වටපිට බැලුවේ යම් සොරකමක් කළ පුද්ගලයෙක් හැසිරෙන පරිද්දෙන්ය.

'' වෙනදට වඩා අද බත් ටික හරිම රසයි'' මිගාර කිව්වේය.

'' ඔයාට මතකද අන්තිමට ඔයාට මං බත් කැව්වේ කවද්ද කියලා...?''

''ම්....ඇයි අවුරුද්ද දවසෙ කැව්වෙ කිරිබත්.'' ඔහු කිවේය.

''මීට අවුරුදු පහළොවකට කලින් ඔයාගෙ උපන්දිනේ දවසෙ.ඔයාට මං බත් කැව්වෙ. හරියටම අවුරුදු පහළොවයි මාස හතරයි දවස් විසි හතයි අදට.'' මිගාරගේ කතාව නෑසුනාක් මෙන් රමණී කියාගෙන ගියාය.

මිගාර ඇය දෙස මඳක් බලා සිට නැවත බත් එක දෙස බලා ගත්තේය.

දෙදෙනා කෑම කා අවසන් කළ පසු මඳක් වාඩි වී වැව් දිය දෙස බලා සිටියේය. සුළඟට වැව් දිය රැලි නංවයි. එහි ඇති සුන්දරත්වය හදවතේ සියුම් සතුටක් හා සැනසීමක් ඇති කළේය.

''රමණී ඔයා ඉස්සර ගහපු පර්ෆියුම් එකකුත් ගමු අපි. ඔයා බේබි ක්‍රීම්, ඕඩිකොලොන්නෙ ගාන්නේ.''

''ඕනි නෑ අනේ. ඕවා ගහගෙන කොහෙ යන්නද ?''

''නෑ නෑ..... අපි එකක් ගමු''

ඇය ඔහු දෙස බලා සිටියා පමණි.

''අපි ගෝල්ෆේස් යමුද? ටික දුරයිනෙ තව. ගොඩ කාලෙකින් අපි දෙන්න එහෙ ගියෙත් නෑනෙ'' රමණී කීවාය.

''ඇයි අපි කට්ටියම ගිය අවුරුද්දෙත් ගියේ. දැන් නං තුනටත් කිට්ටුයි.'' මිගාර ඔරලෝසු දෙස බලමින් කීවේය.

රමණී ඇහිබැම හකුළා දුක්මුසු ස්වරූපයෙන් සිටිනු දුටු මිගාර ''එහෙනම් යමුකෝ. ගිහිං ඉක්නමට එමු.'' යැයි පැවසුවේය.

දෙදෙනාම ගෝල්ෆේස් බලා පිටත් වුවෝය. මහා වැස්සක් වැටීමට ද අසන්නය.

''මේ ඉස්සො වඩේ. ඉස්සො වඩේ...මතකද? මං ගිහිං අරං එන්නම්.'' මිගාර අසල තිබූ පෙට්ටි කඩේකින් ඉස්සො වඩේ මිලදී ගත්තේය.

''ඔයාට මතකයි නේද එහෙනම්. ඉස්සර අපි දෙන්නා ආවාම ඉස්සො වඩෙයි කඩචෝරුයි කකා දවසම හිටියා. ඒ කාලෙ කෙටි උණාට හරිම සුන්දරයි නේද මිගාර?

''හ්ම්...අපි දෙන්නා වැඩි හරියක් හිටියෙ අන්න අර බෙන්ච් එකේ....'' මිගාර බංකුවක් දෙසට අත දිගු කළේය.

ඒ දෙස බැලූ ඇය ''හොර ගෙඩියා....'' යැයි පවසමින් ඔහුගේ අතට පහරක් ගැසුවාය.

''කෝ මටත් දෙන්න'' මිගාර කිව්වේය.

''බෑ''

''අනේ කෑල්ලක් දෙන්න''

''බෑ....බෑ....''

මිගාර පැනපු ගමන් රමණීගේ අතේ තිබු වඩේ එකෙන් කෑල්ලක් කඩාගෙන කෑවේය.

''හොර ගෙඩියා....''

''ආ..එකක් දෙන්නම්...'' රමණී ඔහු දෙසට වඩේ එකක් දිගු කළාය.

'' වහින්න වගේ....'' මිගාර කිවේය.

''එහෙනම් රැල්ල ටිකක් පාගල ඉක්මනට යමු'' රමණී කීවාය.

මුහුදු රැල්ල පාගමින් සිටින විට පොද ගැසීමට පටන් ගත්තේය.

''අපි අයිස්පලම් දෙකක් ගමුද? චොක්ලට් ඒවා..?'' රමණී කීවාය.

''ඇහ්...මොකක් කිව්වා...? මේ වැස්සෙ ?''

ඔහු කට ඇරගෙන රමණී දෙස බලා සිටියේය.

වැහි බිංදුවක් නාසය මතට වැටී කට තුළට රූරා ගිය හෙයින් ඔහු කට වසා ගත්තේය.

''ඔවු. හැබැයි ඒකත් හොඳයි තමයි. වැස්සට ඉක්මනට දිය වෙන්නෙත් නැනෙ. අපි කමු.''

ඔවුන් අයිස්පලම් දෙකක් කමින් වෙරළේ එහා මෙහා ඇවිදිමින් සිටියේ හිරිපොද වැස්සේය.

ඔය අතර ගෝල්ෆේස් එකේ තවත් පැත්තකින් කොල්ලො කෙල්ලො රංචුවක් පැමිණියෝය.

''අද ක්ලාස් නෑ කියලා කිව්ව නම් එන්නැතුව ඉන්න තිබ්බනෙ.'' කව්දෝ ගෑනු ළමයෙක් කීවාය.

''අනේ මේ....එහෙනම් මේ වගේ ජොලියක් ගන්න පුළුවන්ද ?'' තවත් පිරිමි ළමයෙක් කීවේය.

''හැමදාම නෑනේ....'' ඒ තව එකෙකි.

''ඒයි....ඒයි...අර බලහංකො අර ජෝඩුව. වැස්සෙ තෙමි තෙමී අයිස්ක්‍රීම් කකා රැල්ල පාග පාග ඉන්නේ...'' කොල්ලෙක් කෑ ගැසුවේය.

''ෂුවර් එකට සයිඩ් ලයින් ඩබලක් තමයි. නැත්නම් ඔය වයසට බැඳල ළමයිනුත් ඉන්න එපැයි'' තවත් ළමයෙක් බැරෑරුම් ලෙස කීවේ දැඩි විශ්වාසයකිනි.

ඔය රංචුවේ සිටි රමණී හා මිගාරගේ ලොකු දුව වන පැතුම් එදෙස බැලුවාය.

තම පියා විගසින් අත තිබූ කුඩය ඉහලුවේය. අම්මා එය උදුරා ගත්තාය. ඉන්පසු ලොකු සුළඟක් එනවිට ඇය එය අතහැරියාය.

''අයියෝ කෑවා.....කෑවා....'' යැයි කියමින් තම පියා කුඩය පිටුපස දිව්වේය. එකවරට රැල්ලක් විත් පියා වැල්ල මත ඇද වැටිණි. කුඩය ගෙන ආවත් වැලි නාගෙන පැමිණි පියා දෙස බලමින් අම්මා සිනාසෙනු ඇය දුටුවාය.

වැස්ස තව ටිකක් වැඩි කළේය. අම්මා මඳක් හයියෙන් දිව යනු පෙනිණි. තාත්තා ඒ පසුපස දිව්වේය. ඇයව අල්ලා ගත්තේය. දෙදෙනාම දෑත් පටලවාගෙන වැස්සේ තෙමී තෙමී යති.

අම්මා හිටි හැටියේ අනෙක් පැත්තට දිව්ව බැවින් තාත්තා පැමිණ නැවත ඇයව අල්ලා ගත්තේය.

ඔවුන්ගේ ලොකු දුව පුදුමයෙන් මෙන් ඔවුන් දෙස බලාගෙන සිටියාය.

මිගාරගේ දෑසේ කඳුළක් මතු වූ හෙයින් ඔහු මුහුණ ඉහළට හරවා වැහි බිංදුවලට නිදහසේ මුහුණට වැටීමට ඉඩ සැලැස්වුවේය. වැහි බිංදු කඳුළුවලට කැටිවී රූරා වැටුණේය.

පැතුම්ගේ හදවත මහා අනුකම්පාවකින් හා වේදනාවකින් පිරුණේය. පපුව තුළ යමක් හිර වුණාක් මෙන් හදවත රිදෙන්නට විය.

''මං යනවා ගෙදර.'' පැතුම් පිටත් වීමට සැරසුනාය. සියල්ලෝම තුෂ්ණිම්භූතව බලා සිටියෝය.

''ආවා විතරයිනෙ. තව ටිකක් ඉඳලා යමු.'' යෙහෙළියක් කීවාය.

''බෑ...බෑ.... ලබන අවුරුද්දේ ඒ ලෙවල්. මෙහෙම රවුම් ගගහා හිටියම හරිද? සර් කියලා තියෙන්නෙ ආවෙ නැත්නම් පාඩම් කරන්න කියලා නේද ? අම්මල තාත්තාල දන්නවනම් කොච්චර දුක හිතෙයිද?''

තවත් සිටියොත් ඇයට ඇඬේවි යන බිය නිසා ඇය නැවත හැරී දුවන්නට වුවාය. ඇයගේ ළඟම යෙහෙළිය පැතුම්ගේ දෙමාපියන්ව දන්නා බැවින් ඇය ද පැතුම් පසුපස දිව ගියාය.

මිගාර සහ රමණී වැස්සේ තෙමි තෙමී තම බයිසිකලය වෙතට ගියෝය. වැස්සේම නිවස බලා පිටත් වුවෝය.

ටික දුරක් පාවි පාවී මද වේගයෙන් බයිසිකලය ගමන් කරයි.

''මිගාර''

''ම්....''


''දැං හතටත් ළඟයි''

''ඉතිං... මොකද? ඇයි හදිස්සි ?''

ලොකු දුව ආවද දන් නෑ ක්ලාස් ගිහිං. පොඩි දුව නිදිද දන්නෑ කන්නෙත් නැතුව. කන්නෙත් නෑනෙ ගොඩක් වෙලාවට මං නැතුව. බඩගින්නෙම නින්ද ගිහින්ද දන් නෑ.''

මිගාර බයිසිකලයේ වේගය වැඩි කළේය. වේගයෙන් අඳුර හා සුළඟ කපාගෙන බයිසිකලය ඉදිරියට ඇදුණේය. රමණී මිගාරව තදින් අල්ලා ගත්තාය.

කෙටි කතා ( රාජ්‍ය සේවයේ නියුතු )



**දෙවන ස්ථානය**
සී.ඒ.එච්.එම්.ඒ.චන්ද්‍රසේකර
නික/සංඝබෝධි ම.වි.
අවුගේගම

## ක්ෂණික

සාරධාගේ ඉග වටා දකුණත යැවූ සුසිල් ඇයගේ නළලත සිම්බේ ය. සුසිල්ට අවශ්‍ය වූයේ දෑතින් ම සාරධා බදාගෙන ඇගේ පිරුණු ළැම තම පපුවට තෙරපෙන සේ වැරෙන් ඈ වැළඳ ගැනීමටයි. එසේ වැලඳගෙන අතොරක් නොමැතිව ඇගේ දෙකම්මුල් සිප ගැනීමටයි. එහෙත් සුසිල්ගේ එම හැඟීම් මැඬලීමට අවශ්‍ය හේතු කාරණා සිය ගණනක් ඔහුගේ උඩු සිත මගින් ඔහු මත පැටවීය. එහෙයින් සිදු වූයේ වසර ගණනාවක් යටි සිතේ තෙරපෙමින් තිබූ හැඟීම් දහරාවක් තව දුරටත් මැඬ පවත්වා ගනිමින් ඉතා සියුම් ලෙස ඇගේ නළලත සිප ගැනීම පමණකි. එසේ වුවත් තත්පරයකටත් අඩු කාලයක දී සිදු වූ එම ක්‍රියාවලිය තුළ තමා ප්‍රමාණවත් තරම් සරාගී ස්පර්ශයක් ඇගේ ශරීරයට ලබා දුන් බව ට විශ්වාසයක් සුසිල් ගේ සිත තුළ ඇතිවිණි.

ඒ උත්කෘෂ්ට සිදුවීමෙන් ක්ෂණයකට පසු පියවරක් පසුපසට පැනගත් සාරධා විසල් කරගත් දෑසින් යුතුව සුසිල් දෙස බැලුවා ය. වැඩි හඬක් නොනැඟෙන සේ "ඔයා ඇයි එහෙම කළේ" යනුවෙන් චෝදනාත්මක පැනයක් නැගුවා ය.

එහෙත් තමා නැඟූ පැනය තුළ සුසිල්ගේ ක්‍රියාවට සියයට සියයක විරෝධයක් ප්‍රකාශ නොවූ බව සාරධා දනී.

සාරධාට මෙතරම් සිහින් හඬින් කතා කිරීමට අවශ්‍යතාවක් නොමැත. මේ මොහොත නිවසේ කිසිවෙකුත්

නැති මොහොතකි. එහෙයින් සිත තුළ උපන් වරදකාරී හැඟීම සහිතව සුසිල් සාරධාට පිළිතුරු සැපයීමට විය.

"නෑ චූටි මේක මට ගොඩක් කාලෙක ඉඳන් කරන්න හිතුණ දෙයක්. අද නම් ඉවසගෙන ඉන්නම බැරි වුණා. ඒකයි මොන දේ උනත් අද නම් මම ඔයාව කිස් කරනව කියල හිතුවෙ."

නිවස පිටුපස රෙදි වැලේ වේලෙන්නට දමා තිබූ ඇඳුම් කැබලි කිහිපයක් උරහිසේ දමාගෙන කුස්සිය පැත්තෙන් ගෙට ගොඩ වී කොරිඩෝව දිගේ තම කාමරයට යමින් සිටි සාරධාට තම සහෝදරියගේ සැමියා සුසිල් හමු වූයේ නාන කාමරය අසල දී ය. මීට පෙර සිය දහස් වතාවක් මෙම පටු කොරිඩෝවෙන් ගමන් කරද්දී තම මස්සිනා තමා පසුකර ගොස් ඇතත් එම කිසිම අවස්ථාවක මෙවැන්නක් සිදු වී නොතිබිණි. එසේ අතරමග හමුවන විට එක්කෝ සුසිල් නැවතී පසෙකට හැරී සාරධාට ගමන් කිරීමට ඉඩ සලසයි. නැතිනම් සාරධා නැවතී ඔහුට ගමන් කිරීමට ඉඩ දෙයි. දෙදෙනෙකු ට පහසුවෙන් දෙපසට ගමන් කිරීමට තරම් එම කොරිඩෝව පුළුල් නැත.

"මම මෙහෙම කරන්න වෙන කිසිම හේතුවක් නෑ. ඔයා දකින හැම වෙලාවකම මට ඔයාව කිස් කරන්න හිතෙනවා. ඔයා ඉස්සරලම දැක්ක දවසෙත් මට එහෙම හිතුණා. අද වෙනතුරුත් ඒ ආශාව හිතේ හිරවෙලා තිබුණෙ. මේ කොරිඩෝ එකේ දී ඔයා මාව පහුකරල ගිය හැම දවසකම මම කල්පනා කරනවා ඇයි මම ඔයාව ඇදල අරගෙන ඉම්බෙ නැත්තෙ කියලා. ඔයා මාව පහුකරගෙන ගියාම මේ කොරිඩෝ එක පුරාම ඔයාගෙ සුවඳ මට දැනෙනවා. මගෙ හදවතේ ගැස්ම වැඩි වෙනවා. මග හැරිච්ච මොහොත ගැන මගේ හිත ම මට දොස් කියනව. ඔයාට වෙන බලහත්කාරකමක් කරන්න අදහසක් මට නෑ. හිතේ තිබුණ එකම දේ ඔයාව ඉඹින එක විතරයි".

එක හුස්මට කියවාගෙන යන සුසිල්ගේ වාග් මාලාව අවසන් වන විටත් සාරධා සුසිල්ගේ සුසුම් පොද ස්පර්ශ වන තරමට ඔහුට සමීප වී අවසන් ය. සුසිල්ගේ ගෙල වටා පැතිර

ගිය යම් උණුසුමක් සමග ගෙලේ රැලි අතරින් සිහින් ඩා බිඳු නැගී පපුව හරහා ගලා යන ආකාරය සුසිල්ට දැනුණේ සාරධාගේ සුසුමක් වැදී එම ඩා බිඳු සිසිල් වූ හෙයිනි.

තම බිරිඳ සිතාරා මව සමඟ හංදියේ ඩිස්පෙන්සරියට ගියේ ඇගේ මවට නිරන්තරයෙන් වද දෙන කොන්දෙ අමාරුවට බෙහෙත් ගෙන ඒමටයි. මිතුරෙකුගේ සාදයකට ගොස් ඉතා සුළුවෙන් මධුවිතක් පානය කර පැමිණි දිනෙක අතුරු පාරකින් අපරික්ෂාකාරී ලෙස ප්‍රධාන පාරට දැමූ නවීන මෝටර් රථයක යතුරු පැදිය ගැටීම නිසා සුසිල්ගේ රියදුරු බලපත්‍රය ද හය මසකට අත්හිටුවා තිබෙන බැවින් සියලු කටයුතු සඳහා ස්කූටිය පදවාගෙන යාමට සිදුව තිබෙන්නේ සිතාරාට යි. වෛද්‍ය රත්නායකගේ ඩිස්පෙන්සරියට ගිය සිතාරාත් මවත් පැමිණීමට තව පැයක්වත් ගත වේ. සාරධාගේ සැමියා වන සුනෙත් විනෝදකාමී තරුණයෙකි. සුසිල් හා ඔහු විවාහයට පෙර සිටම සමීප මිතුරන් ය. විවාහ වී වසර ගණනාවක් ගත ව ඇතත් ඔවුන්ගේ මිතුරුදම වෙනස් වී නැත. ස්ථිර වශයෙන් රැකියාවක් නොකරන නමුත් කාගේ හෝ වාහනයක රියදුරු තනතුර සඳහා ඔහුට දිනපතාම ටැම්පරි ජොබ් එකක් ලැබේ. එසේ ගිය පසු ඔහු නිවසට පැමිණෙන වෙලාවක් හරියටම කියන්නට නොහැකි ය.

සාරධාගේ සුසුමින් සිසිල් වූ නිරුවත් පපුව දෙස තම දෑස් යොමු වන විටත් ඇයගේ අතැඟිලි තම ඇඟිලි අතර පැටලී ඇති බවක් සුසිල් ට දැනුණි.

මේ මොහොත සාරධා කිසි දිනක අපේක්ෂා කළ මොහොතක් නොවේ. සුනෙත්ගෙන් තොර ස්පර්ශයක් පිළිබඳව ඇයට කිසිදු අපේක්ෂාවක් තිබී නැත. තම සොයුරිය සිතාරා සුසිල් සමඟ විවාහ වූ දවසේ දෙවැනි මනාලයා ලෙස පැමිණි සුනෙත් ඊට පෙර ද අවස්ථා කිහිපයක දී හමුව තිබිණි. තම සොයුරියගේ දෙවන මනාලිය ලෙස පෙනී සිටි සාරධාට සුනෙත් සමඟ සමීපව කතා කරන්නට ලැබුණේ විවාහය දවසේ ඡායාරූප ගන්නා අතරතුරයි. ඉතා විනෝදකාමී තරුණයෙකු වන සුනෙත්

සෑම සිදුවීමක් දෙසම සැහැල්ලුවෙන් බලන ආකාරයත් හැම මොහොතකම සමීපයේ සිටින සියල්ලන් සිනහවක ගිල්වීමට ඇති කුසලතාවත් නිසා ඔහු කෙරෙහි ප්‍රසාදයක් ඇති විය. අක්කාගේ විවාහයෙන් මාස කිහිපයකට පසු උත්සවයක් නොමැතිවම සාරධාගේ විවාහය සිදු වූයේ සියලු පාර්ශවයන්ගේ පූර්ණ කැමැත්ත මතයි. සමීපතම මිතුරන් සමඟ විවාහ වූ දෙසොහොයුරියන්ට මහ ගෙදරින් පිටව යාමට අවශ්‍යතාවයක් නොවිණි. ව්‍යාපාරිකයෙකු වූ සාරධාගේ පියාට  තම දියණියන් වෙනුවෙන් නිවෙස් දෙකක් ඉදි කිරීමට එතරම් අපහසුවක් නොවුණි. එහෙත් දෙමාපියන්ගේ කැමැත්ත වූයේ තම දියණියන් දෙදෙනාම තමා සමීපයේ රඳවා ගැනීමටයි. අද මේ මොහොත වන තෙක් ම එම තීරණය පිළිබඳව පසුතැවිල්ලක් ඇතිවන ආකාරයේ කිසිදු සිදුවීමක් හෝ වචන හුවමාරුවක් නිවස තුළ සිදුව නැත.

බොහෝ දිනවල හවසට නිවසට පැමිණෙන සුනෙත්, " මචං පොඩි ෂොට් එකක් දාමු. මම බාගයක් ගෙනල්ල එළියෙ කාමරේ තියල තියෙන්නෙ" කියා සංඥාවක් දෙයි. ඇතැම් දිනක සුනෙත් නිවසට පැමිණීමට පෙර දුරකතන ඇමතුමක් ලබා දෙන සුසිල් "මචං එන ගමන් මොනව හරි අරං වරෙං" යැයි දන්වයි. එතරම් විශාල නොවන නිදන කාමර හතරක් ඇති නිවසේ කාර්යාල කාමරය දෙමිතුරන්ට මෙන්ම මාමණ්ඩියට ද තම මිතුරන් මුණගස්වන සොඳුරු අවකාශයයි. දෙමිතුරෝ තම විවාහ ජීවිතයන් පිළිබඳ හැර විශ්වයේ පවතින අනෙක් සියල්ල පිළිබඳව සාකච්ඡා කරති. එහෙත් කිසිදු විටෙක තම භාර්යාවන් වූ දෙසොහොයුරියන් පිළිබඳව අදහස් හුවමාරු කර නොගනිති. විවාහ වී වසර හයක් පමණ ගතව එකම නිවසේ ජීවත්ව සිටියදීත් කිසිදු හිත් අමනාපයක් ගැටුමක් ඇති නොවන්නට මෙය හේතු වූවාද විය හැකි ය.

වසර හතක් පමණ කොරියාවේ සේවය කළ සුසිල් තමා උපයාගත් සියලු මුදල් ඉතා මැනවින් කළමනාකරණය කර තම

මිතුරන්ගේ ව්‍යාපාර කිහිපයක ආයෝජනය කර තිබේ. එහෙත් එම ව්‍යාපාරවලට සුසිල්ගේ මැදිහත්වීමක් නැත. මාසය අවසානයේ ඔහුගේ කොටස නියාමාකාරව ලැබෙන බැවින් කාර්ය බහුල නොවී සැහැල්ලුවෙන් ජීවත් වීමට ඔහුට අවකාශය සැලසී තිබේ. සුසිල් නිවසින් පිටව යන්නේ නිවසේ අවශ්‍යතාවකට පමණි. රියදුරු බලපත්‍රය අහිමි වීම නිසා දැන් අත්‍යවශ්‍ය ගමනකට වුවත් ඔහුට සුනෙත්ගේ හෝ සිතාරාගේ සහය පැතීමට සිදු ව තිබේ.

තම අතැඟිලි අතර පැටලුණු සාරධාගේ අතැඟිලි කිටි කිටියේ තද වන අයුරු සුසිල්ට දැනේ. සාරධාගේ දකුණු කම්මුල තම පපුතුරෙහි සපර්ශ වී තිබේ. ඇගේ සිරුර ගිනගන්නා තරමට රත් වී ඇති බව සුසිල් හඳුනාගත්තේ ඇගේ කම්මුල සපර්ශ වූ පපු පෙදෙසට දැනුණ උණුසුම හේතුවෙනි.

සිතාරාත් සුසිල්ගේත් අඹුසැමි සම්බන්ධය නීරස එකක් නොවේ. විවිධත්වයන්ට කැමති සිතාරා සුසිල්ගේ සතුට පිළිබඳව සෑම මොහොතකම සැලකිලිමත් වේ. තම මව පියාට සැලකුවාක් මෙන් ඉතා ගෞරවයෙන් සුසිල්ට සලකන සිතාරා විවෘත ජීවිතයේ දී සාරධා තරම් දඟකාර නොවුණ ද සයනයේ දී ඉතා කෙළිලොල් ය. යම් වෙහෙසකාරී කටයුත්තක නිරත වූ දිනෙක හෝ යම් සමාජ ප්‍රශ්නයක් දේශපාලන ප්‍රශ්නයක් හේතුවෙන් සුසිලගේ මානසික සුවය බිඳ වැටුණු දිනෙක ඔහු සන්සුන් වන්නේ තමාගේ පහසින් බව සිතාරා දැන සිටියා ය. එබැවින් ඇතැම් දිනවල දෙමිතුරන්ගේ මධු සාදය අතර කෙරෙන කතා බහට වරින් වර ඇහුම්කන් දීම සිතාරාගේ පුරුද්දකි. රටේ දේශපාලනය පිළිබඳව කතාව ඇදුණු දිනෙක සුසිල්ගේ හඬ උස් වෙයි. ඔහුගේ සංයමය බිඳ වැටෙයි. පක්ෂ විපක්ෂ සියලු දේශපාලකයන්ට ශාප කරමින් බැන වදියි. එවැනි දිනෙක සිතාරා කරන්නේ තමා අතින් සැදූ කටගැස්මක් නැගණිය අත කාර්යාල කාමරයට යැවීමයි. සාරාධාගේ අතින් ටීපෝව උඩට එන බයිට් දීසිය තම බිරිඳගේ පණිවිඩයක් බව දන්නා සුසිල් තමා කලබල

වී ඇති බවත් හඬ උස්ව ඇති බවත් තේරුම් ගනී. මොහොතකින් තම සුපුරුදු සංයමය නැවත ගොඩනඟා ගැනීමට ඔහුට එය මහ උපස්ථම්නයකි.

බයිට් දීසිය පිටත් කර හරින සිතාරා කෙළින්ම යන්නේ නිදන කාමරයට යි. එදින තම යහනට අලුතින්ම ඇතිරිලි කොට්ට උර සහ පොරෝනා යොදයි. පිච්චමල් සුවඳ එයාර් ෆ්‍රෙෂ්නර් ටිකක් වැඩිපුර කාමරය පුරා ස්ප්‍රේ කරන සිතාරා තම සැමියා කැමතිම සුවඳ විලවුන් බෝතලයෙන් ටිකක් කොට්ට උර මත තවරයි.

සුසිල් පසු දින අවදි වන්නේ අලුතින්ම උපන් මිනිසෙකු ලෙසයි. ඒ දවස බොහෝ විට සිතාරාට තම ගමන් බිමන් සඳහා සුසිල්ගේ අනුමැතිය ලබා ගැනීමත් කිසිදු පසුබෑමකින් තොරව ඒ ගමන් බිමන් වලට ඔහු කැඳවාගෙන යාම සඳහාත් වැදගත් වේ.

සුනෙත් සහ සාරධා අතර අඹුසැමි සම්බන්ධය මිතුරුකමට එහා ගිය එකක් නොවේ. සාරධාට අවශ්‍ය සෑම මොහොතකම සුනෙත් හා දූවටෙමින් සිටීමටයි. කෑම මේසයේ දී පවුලේ සියලු දෙනා එක්ව ආහාර ගත්ත ද සාරධා සුනෙත් හා දූවටෙමින් කෙළිදෙලෙන් කටයුතු කරයි. උයන පිහන විට පවා ඇ කැමති තම මව හෝ සහෝදරිය තමා අසල සිටිනවාට නොවේ. සුනෙත් තමා අසල සිටිනවාටයි. සුනෙත් ද සාරධාගෙන් බලාපොරොත්තු වන්නේ මිතුරන් අතර හෝ පවුලේ සාමාජිකයින් අතර කතා බහක දී පවා සාරධා තමා අසල සිටිනවාටයි. එක්කෝ ඇය ඔහුගේ හිස සම්බාහනය කරයි. නැත්නම් සැටියේ වාඩි වී සිටින සුනෙත් අසල බිම හිඳ ගන්නා සාරධා ගේ හිස සුනෙත් විසින් පිරිමදියි. මව පියා කවුරු සිටිය ද ඔවුන් දෙදෙනාගේ ආලිංගනයේ වෙනසක් නැත. ඔවුන් දෙදෙනා නින්දට යන්නේ ද සියල්ලන් නින්දට ගියාට ද පසුව ය. මධ්‍යම රාත්‍රිය වන තෙක් එක්කෝ සිනමා පට නරඹයි. එසේ නැතිනම් සංගීත වැඩසටහන් නරඹයි. වැඩකට ඇති නැති රූපවාහිනී වැඩසටහන් නරඹමින් සිට මධ්‍යම රාත්‍රියේ දී නින්දට

වැටෙයි. එහෙත් පසුදින අලුයම කුස්සියේ විදුලි පහන දැල්වෙන විට කිසිදු කුසීත බවකින් තොරව සාරධා මව අසල පෙනී සිටියි.

ඉතින් බැලූ බැල්මට මෙම නිවස තුළ ඇත්තේ ඉතා සාධාරණ සාමකාමීත්වයකි. මංගල යෝජනාවකින් විවාහය සිදු කරගත් සුසිල් සිතාරාගේ නිවසට ගිය පළමු දවසේ ම සාරධා දුටුවේ පාසල් නිලඇඳුම පිටිනි. ඈ දුටු මොහොතේ ම දැඩි සෙනෙහසක් ඈ කෙරෙහි ඇති විය. ඇය සමීපයට ගොස් හිස අතගා පාසලේ විස්තර අසන විටත් සාරධා සුසිල්ගේ ඇගේ දෑවටෙමින් ඒ සියල්ලට පිළිතුරු දුන්නේ කිසිදු පැකිලීමකින් තොරවයි. ඇගේ හිස සිප ගැනීමට ආශාවක් සුසිල්ගේ සිත තුළ උපන්නත් ඔහු ඒ අදහස මැඩ ගත්තේ ය. විවාහය තීන්දු වූ නමුත් සුසිල්ට නැවත වරක් විදේශ ගතවීමට සිදු වූයේ තම සේවා ස්ථානයෙන් ලබා දෙන විශේෂ දීමනාව ලබා ගැනීමට නම් තවත් වසර දෙකක් සේවය කළ යුතු බැවිනි. එම කටයුතු අවසන්ව වසර දෙකහමාරකින් පමණ විවාහය සිදු වන විට සාරධා පාසල් අධ්‍යාපනය අවසන් කර තිබිණි.

සාරධා තම ශරීරයේ මුළු බරම සුසිල්ගේ පපුව මත මුදා හැර තිබේ. සාරධාගේ මෙතරම් අනුකූලතාවයක් අපේක්ෂා නොකළ සුසිල් අනපේක්ෂිත අයුරින් සාරධා තම සිරුරට බර වීම නිසා කොරිඩෝ බිත්තියට පිට දී ඇගේ බර දරා ගැනීමට අවශ්‍ය රැකුල සපයා ගැනීමට සමත් විය.

අවස්ථා ගණනාවක දී සාරධාගේ මුහුණ සිපගැනීමට තමා තුළ ඇති වූ හැඟීම් සුසිල්ගේ සිත තුළ මැවේ. අලුත් අවුරුදු දා බුලත් හුරුල්ලක් දී වඳින මොහොතේ හිස අතගා ඇගේ දෙවුරෙන් අල්ලා සිටවූ මොහොතේ ඇගේ කම්මුල් සිප ගැනීමට ඔහු තුළ උපන් ආශාව සුසිල් විසින් යටපත් කර ගත්තේ පවුලේ අය වරදවා සිතනු ඇතැයි සිතා ය. සාරධාගේ විවාහය දවසේ තම දෙපා නමදින විට ද එම ආශාව ඒ අයුරින්ම උපන් නමුත් මංගල සභාවේ විශාල පිරිස මැද සුසිල් තම හැඟීම යටපත් කර ගත් මෙවැනි අවස්ථා ගණනාවකි. ඒ සෑම විටම සුසිල්ගේ

සංස්කෘතික සිත ඔහු වැළකී ය. අද උදා වී ඇත්තේ යටපත් කර ගති ඒ සියලු හැඟීම් පුපුරා යන අවස්ථාවකි. සාරධා සුසිල්ට අවශ්‍ය ඕනෑම ස්පර්ශයකට අනුමැතිය නිහඬවම ප්‍රකාශ කර තිබේ.

සුනෙත් තමාගෙන් සයනයේ දී අපේක්ෂා කරන සපර්ශය එතරම් උණුසුම් එකක් නොවන බව සාරධා දනී. හැඩ වැඩ ඇති සිරුරක් හිමි තමා වෙත පාසලේ දී කොතරම් ප්‍රේම ආරාධනා ලැබුණත් ඒ එකක්වත් සාරධා විසින් පිළිගත්තේ නැත. ඒ ආඩම්බර කම නිසා නොවේ. පිරිමි ළමුන් දුටු විට තම මිතුරියන් ප්‍රකාශ කරන ආකාරයේ කාමුක හැඟීම් තමා තුළ පහළ නොවීම නිසා ය. තමා කැමති පිරිමි ළමුන් කීප දෙනෙකුගෙන් ම ආරාධනා ලැබුණ ද සාරධාට සිතුණේ ඔවුන්ට කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් තමා කර ගන්නේ වරදක් බවයි. ප්‍රේම කරනවා නම් තම මිතුරියන් කියන ආකාරයට විවිධ ක්‍රමවලින් තම පෙම්වතා සතුටු කළ යුතුය. එහෙත් සාරධාට තරුණයන් කෙරෙහි එවැනි හැඟීමක් ඇති නොවේ. එවැනි තත්ත්වයක් තුළ තමා කැමති තරුණයාගේ ප්‍රේම ආරාධනාව පිළිගැනීම ඔහුට කරන අසාධාරණයක් බව ඈ සිතුවා ය. පාසල් බසයේ දී දිනක් පිරිමි පාසල් සිසුවෙක් තමා පසුපසින් සිටගෙන අනවශ්‍ය පරිදි ස්පර්ශ වන බවක් දැනුණ මොහොතේ ඇයට කෙල්ලන් කියන කතා සිහි විය.

"මම නම් කවකටුව අතේ තියගෙන යන්නෙ. අයිනට කකුල හිල් වෙන්න."

"මම දවසක් එකෙක්ගෙ කකුල පෑගුවා තරු විසිවෙන්න."

"ඒයි අහපල්ලකො බං. මෙන්න මේකි අද බස් එකේ දි ජැක් ගහපු කොල්ලෙක්ගෙ අත කොනිත්තල. හමේ කෑල්ලක් කැඩිලා ඇවිත් තාම නියපොත්ත අස්සේ. මම දැක්ක උගෙ අතින් ලේ ගලනව. මේකි නං කොටි දෙනක්."

මෙවැනි විවිධ සංවාද සිහි වුවද සාරධා කළේ ඔහුට ඒ ආකාරයෙන් ඉන්නට දීමයි. තමාගේ කිසිදු විරෝධතාවයක් එල්ල

නොවීම නිසා උද්යෝගයට පත් ඔහු තව තවත් තම ශරීරයට තෙරපෙන ආකාරය සාරධාට දැනුණි. බස් රථය සෙනඟින් පිරී තිබුණ නිසා කොල්ලාට වැඩේ ලේසි වී ඇති බව සිහි වී සාරධාගේ මුහුණේ සිහින් සිනාවක් ඇඳිනි. ඒ දුටු කොල්ලා තමාගේ පිරුණු හැඩැති පශ්චාත් පෙදෙසට තවත් සමීප වන බව ඇයට දැනිණ. කෙල්ලන් සතුව නැති කොල්ලන්ට හිමි සවිශක්තිය ඇය හඳුනා ගත්තේ එදා ය.

ස්ත්‍රී සිරුරත් පිරිමි සිරුරත් අතර වෙනස ඇයට අවබෝධ වූයේ එදා ය. සාරධාගේ අනුබලයෙන් කොල්ලා නිවී සැනසී ගිය ආකාරය ඇයට හොඳින්ම දැනුණි. බස් රියෙන් බැස්ස කොල්ලා පොත් බෑගය කරෙන් ගලවා තම ඉදිරිපසින් තබා ගෙන ගමන් කරන ආකාරය දුටු සාරධාට තම මිතුරියක් තම පෙම්වතා ගැන කී කතාව මනාව අවබෝධ විය. අද වනතුරුත් ඈ එම සිදුවීම වරින් වර සිහි කරමින් සතුටු වෙයි.

සතියකට දෙකකට වරක් සුනෙත් සයනයේ දී අමුතු රංගනයන් ඉදිරිපත් කරයි. සාරධාට එය විනෝදයකි. තම සිරුරු ස්පර්ශ වන මොහොතේ සාරධාට සතුටක් දැනේ. එහෙත් ඒ සතුට පසුදාත් විඳින්නට තරම් ගිජු හැඟීමක් ඈ තුළ උපදින්නේ නැත. සුනෙත්ට ද එවැනි අවශ්‍යතාවයක් ඇති බවක් ඔහු කෙරෙන් ප්‍රකාශ නොවෙයි. කුස්සියේ දී වැඩ කරමින් සිටින ඇතැම් දිනෙක පුංචි විහිළුවක් කර සුනෙත් තරහ ගස්වා මොහොතකින් ඔහු වැලඳගෙන ප්‍රේමය හුවමාරුකරගත් දිනෙක රාත්‍රියේ දී සුනෙත් තම සවනට ළං වී රහසින් කියන ආදර වැකි සාරධාගේ සිත මෙන් ම ගත ද උණුසුම් කරයි. එවැනි දිනෙක සුනෙත් සාරධාගේ සතුට ගැන කෙතරම් සැලකිලිමත් දැයි ඈ දැන ගන්නේ ඔහු ඒ වෙනුවෙන් කරන පරිත්‍යාගශීලිත්වය හේතුවෙනි. ඔහුට ඔහුගේ සතුටට වඩා සාරධාගේ සතුට ගැන වැදගත් බව ඈ දනී. සෑම දිනකම නිවසට පැමිණෙන විට සාරධා වෙනුවෙන් රසවත් කෑමක් රැගෙන ඒම සුනෙත් කිසි විටෙක අතපසු නොකරයි.

සුසිල් තමා වැළඳගත් මොහොතේ දැනුණ සිහින් කිතිය සමඟ ශරීරය පුරා විහිදී ගිය විදුලි සරය සාරධාට දැනුණේ ජීවිතයේ පළමු වතාවටයි. පාසලේදී කෙල්ලන් තම පෙම්වතුන් ගැන කී කතා සත්‍ය බව සාරධාට ජීවිතයේ පළමු වතාවට අවබෝධ වී තිබේ. ඇයට අවශ්‍ය වූයේ මේ මොහොතින් පසු මොන දේ සිදු වුණත් පිරිමි සිරුර පිළිබඳව කෙල්ලන් කී කතා සියල්ල සත්‍යදැයි බැලීමටයි. එහෙයින්ම ඈ වඩ වඩාත් සුසිල්ගේ සිරුරට සමීප විය.

සාරධාගේ මෙම අනුමැතිය සුසිල් කිසිසේත් අපේක්ෂා නොකළ එකකි. ඇගේ අතැඟිලිවලින් තම දෑත් මුදාගත් සුසිල් සාරධා අල්ලාගෙන තම සිරුරට වැරෙන් තෙරපා ගනී. බතික් සරමක් හැඳ සිටි සුසිල්ගේ සිරුරට තෙරපෙන සාරධාට එදා බස් එකේ කොල්ලා සිහි වෙයි. සුනෙත්ගෙන් කිසිදා බලාපොරොත්තු නොවූ ස්පර්ශයක් සුසිල්ගෙන් තමා අපේක්ෂා කරමින් සිටින බව සාරධාට අවබෝධ වෙයි. ඇගේ සියුමැලි දෑත් ඔහුගේ සිරුර පුරා දුවයි. ගෙල මත දමාගෙන සිටි ටේප්ප ඇඳුම් ටික බිම විසිරෙයි. සුසිල්ගේ මවිල් පිරුණ පපුව මත තිබුණ තම දෑත් සාරධා සෙමෙන් පහළට ගෙන යයි. අර එදා බස් එකේ කොල්ලා තමාට තෙරපෙන විට දැනුණ පිරිමි සිරුරේ වෙනස සාරධාට යළි දැනේ. තවත් මොහොතකින් සාරධාට මැවී පෙනුනේ එදා තමා ළඟ සිට බස් රථයෙන් බැස ගිය කොල්ලාගේ මුහුණය. ඔහු එසේ බැස ගියේ තෘප්තිමත් මුහුණින් නමුත් සුසිල්ගේ මුහුණේ මොහොතකින් ඇඳි මැකුණ පරාජිත හැඟීම සාරධාට අවබෝධ වූයේ ය.

තමා තවමත් ගිනි ගනී. ඒ උණුසුම දෙකනින් පිට වෙයි. තම කන් දෙකෙන් දුම් පිට වන බවක් සාරධාට හැඟෙයි. මේ ගින්න නිවා දැමීමට හැක්කේ සුසිල්ට පමණි. එම නිවීම අපේක්ෂාවෙන් ඈ ඇගේ සර්වාංගය සුසිල් වෙනුවෙන් විවෘත කළා ය. එහෙත් සාරධාගේ දෑත් තම පපුතුරේ සිට නාඹිය පහුකර පහළට ගමන් කරන විටත් සුසිල් නිවී සැනසී ගොසිනි. වසර

ගණනක් පුරා ඔහු සිත පතුලේ තෙරපී තිබූ ආශාව දෙපතුල් සිඹිමින් ගලා යමින් තිබිණි. සාරධා තවමත් ගිනි ගනී. තම ශරීරය මත රැඳුණ සාරධාගේ දෑත් දෙපසට තල්ලු කර ඇගේ ග්‍රහණයෙන් මිදුණ සුසිල් මහත් පරාජිත හැඟීමකින් නිදන කාමරයට වැදී දොර වසා ගති.

ꩡꩡꩡꩡꩡꩡ

කෙටි කතා ( රාජ්‍ය සේවයේ නියුතු )

**තෙවන ස්ථානය**

ඩබ්.ඒ.එම්.එන්.සොලෝකාර
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වාරියපොල



## කළු මීච්චි

අද ඉර එළිය ආයුබෝවන් කීවේ අමුතු විදිහට. පුංචි පුංචි මුතුඇට අහුරු පිටින් උස්සා ගත්තු ළපටි වැහි කෝඩෙකුත් තනියට අඬගහගෙන ඇවිදිල්ලානෙ. ඒ වැහි කෝඩෙන් වැහි බිංදු හතරක් පහක් පිහාටු අස්සේ හංගාගෙන කළු මීච්චියක් පියාඹාගෙන ඇවිත්, සාරදාගේ හුරුබුහුටි දෙමහල් නිවසේ බැල්කනියේ සමන් පිච්ච පඳුර උඩින් ඉඳ ගත්තා. හික්මීච්...... චීක් චීක් ගාමින් දිග කතාවකට මුල පුරන්නයි ලක ලැහැත්තිය. ''හපොයි ඔක්කෝටම කලින් මේ මුතු මුතු වැහි බිංදු ටික පරිස්සමින් බිමින් තියන්ඩ එපැයි'' කියමින් කළු මීච්චි පිහාටු විහිදලා මුතුඇට ටික සමන් පිච්ච මල් දෙකක් උඩින් තිබ්බා.

සාරදා මේ සියලු විස්තරේ බලන් හිටියේ හැලහොල්මනක් නැතිව. අද නිවාඩු දවස නිසා ඔෆිස් එකේ වැඩවලින් ටිකක් මිදිලා පුංචි නිදහසකට මග පාදා ගන්නයි සාරදා හිතුවේ.නිදහස් වෙලාවට පොතක් බලන්න, නන්දා මාලනියගෙ අමරදේවයන්ගේ ගී පහනක ආලෝකය විඳගන්න, බැල්කනියෙ ඉඳන් කොළපාට ගහ වැල කුරුලු පොඩිත්තො දිහා, වැහිබිංදු දිහා බලන් ඉන්න තමයි සාරදා කැමති. ඔෆිස් එකේ ප්‍රශ්න තමන්ගේ පෞද්ගලික ඔෆිස් කාමරයට දාලා ලොක් කරලා ඔෆිස් එකෙන් එළියට බහින්නේ නිදහස් කිරිල්ලියක් වගේ. රියදුරු චමින්දත් සාරදා මැඩම් ගැන දන්න නිසා, එක එක්කෙනාගේ කුණු, කේලම් මලු දිගාරිනවා වෙනුවට මිහිරි ගීතයක් වාදනය කරනවා වාහනයෙ රේඩියෝවෙ. ඇවිදින ගස් දිහා බලාගෙන කුඩා ළදැරියක් සේ සන්තෝස වන සාරදා මැඩම් අච්චර විශාල

ඔෆිස් එකක් තනියම පාලනය කරන්නේ කොහොමද කියලත් වෙලාවකට චමින්දට ප්‍රශ්නයක්. මැඩම් කොහොමත් බුද්ධිමත් කෙනෙක්; චමින්ද හිතුවෙ එහෙම.

''අනේ මීච්චියේ අම්මාහෙම දැක්කනම උඹට විසුමක් වෙන් නෑ''

සාරදා මීච්චිට ඇහෙන්නම කියපු හින්දා මීච්චි කෙලින්ම සාරදාගේ මූණ බැලුවා. තව අඩියක් ඉස්සරහට ගියත් මීච්චි ඉගිල්ලුණේ නෑ. සාරදාට පුදුම හිතුණා. කළු මීච්චි දෙපාරක් චීක් චීක් ගාලා කියපු කතාව සාරදාට ඇහුණේ

''යමුද සාරදෝ පොඩි ගමනක් අපි....'' කියනවා වගේ. සාරදත් පදවි තානාන්තර ඔටුන්න ගලවලා පුටුව උඩින් තියලා කළු මීච්චි එක්ක ගමනක් යන්න පිටත් වුණා.

සාරදාගෙ ඇගේ සීතලම සීතල වලාකුළු තැවරෙද්දී වලා අහුරක් මිට මොලවගන්න හිතුණත් එහෙම කළේ නෑ. සාරදාට පළමු වතාවට දැනුණා අහසෙ ඉඳන් දකින මහපොළොවෙ ලස්සන. වලාකුළුවල රැඳුණු මුතුඇට වැහි බිංදුවලින් සාරදාගේ ළා රෝසපාට ගවුමේ වාටියේ පබළු වැල් වගේ හැඩවුණා.

ගස් මුදුන්වල ගෑවී නොගෑවී යද්දී හිතට දැනෙන කියාගත නොහැකි හැඟීම සාරදාට දැනුණා. කොරකහ මල් ගස් දෙපැත්තේ තියාන පුංචි ඇළ පාරක් සිංදුවක් මුමුණනවා. දම්පාට කොරකහ මල් සිංදුවේ ලස්සනට ඇළ පාරට මල් පෙති ඉහිනවා. හරියට පුංචි මල් වැස්සක් වගේ. යකිනාරං, දෙමට, බක් මී, බොකල, හී බෝවිටියා මල් එක යායට පිපිලා. ඒ අස්සේ හුඹහක් උඩ ඉඳලෝලුත් හිටගෙන. සාරදාට පහත් වෙලා දෑත බදලා ඉඳලෝලු මිටක් වඩාගන්නම හිතුණා. ඉඳලෝලු අස්සේ සුදට සුදේ හා පැටව් ජෝඩුවක් උඳුපියලිය ගොල්ලේ සෙල්ලම් කරනවා. ඇයි ඇළ අයිනෙ දං ගහ... සාරදාට මොනවදෝ පේනවා. වෙලාවකට ගහ උඩ කුරුල්ලෝ, ගහ යට ළමා කැළ. වෙලාවකට ගහ යට කුරුල්ලෝ, ගහ උඩ ළමා කැළ.. එක තත්පරේට, චිත්‍රපටියක් වගේ.

සාරදාට කළුමීච්චි මතක් උණේ දැන්. මොනා උනත් මීච්චි සාරදාව හරිපාරෙ තමා එක්ක ගියේ. දං ගහ උඩ ඉන්න කුඩා කලු කෙල්ල දිහා නොබලා වගේ මීච්චි ඉක්මනින්ම එතනින් පියාඹාන ගියා. සාරදාට ඒ කලු කෙල්ලගෙ හුරුපුරුදු බවක් දැනුනත් මීච්චි නතර වෙන්න බෑ කියපු හින්දා මීච්චි පස්සෙන්ම ගියා

කුඩා කුඩා පොල්අතු වහලවල්, සමහර තැන්වල තැඹිලි පාට වහලවල් පහුකරගෙන මීච්චි ගියේ කැලෑවක් මැද්දෙන් හීං අඩිපාරක් දිගේ. මීච්චි වේගෙ බාල කරගෙන දමුන ගස් දෙකක් මැදින්, මයිල ගහක්, වෙලං ගහක්, අඹ ගහක් පහුකරගෙන අඩිපාර කෙළවර වන පොල් අතු ගෙපැලක් ළඟ නතර වුණා. සාරදාත් හෙමිහිට බිමට බැස්සා. පොල්ලතු පැළැල්ල මෑත් කරමින් හැරමිටි වාරුවෙන් වයසක උන්දෙක් එළියට ආවා. ගෙපැලේ ඉස්තෝප්පු කැල්ලේ බූරු ඇඳක කවුදෝ පිරිමි කෙනෙක් ඉඳගෙන හිටියේ. ''බංඩෝ උඹේ කුළුඳුලේ එකී කළු මීච්චියක් වගේ. කැතේ බෑ. කොලු පැංචෙක් උනානම් කළු උනත් මක්ක වෙනවද?... මොකද්ද බොල ඒකිගෙ නම..''

''සාරදා'' ''මොනවා..... සාරදා...?

එතකොට මේ මමද දෙයියනේ? එතකොට මේ බූරු ඇඳේ ඉන්නේ මගේ අප්පච්චිද? මගෙ පුංචි කාලෙ නේද මේ.'' දිග හුස්මක් එක්ක සාරදා අප්පච්චිගෙ මූණ දිහා ඈත ඉඳන් බලන් හිටියා. ''කමක් නෑ අම්මෙ දරුවොනෙ''

අප්පච්චි ඒ වචන ටික කියද්දි අඳුරත් එක්ක අමුතු ආලෝකයකින් මූණ එළිය වැටිලා වගේ සාරදාට ඈත ඉඳන් පෙනුණේ.

''හික් හික් හික්..... උඹට හොඳනම් මට මොකෝ. සුනංගු උණා

මං යඤ්ඤං''

''අම්මේ ඔහොම පොඩියක් හිටියනන් තේ කහට උගුරක් බීල යන්ඩ''

''ඕනැන්නෙ නෑ, මං එද්දි හේරබ්බංඩලෑ දිහැං තේ උගුරක් සප්පායං උණා. සුමනා කෙල්ල හදා දුන්නා. මං යනෝ...''

''හ්ම්ම්ම්ම්''

හේරත්බංඩා කියන්නේ අප්පච්චිගෙ එක කුස උපන් මල්ලි. කිරිඅම්මා එහෙ ගිහින් තමයි ඇවිත් තියෙන්නෙ. මං ඉපදිලා මාස ගාණක් යනකන් කිරිඅම්මා පැත්ත පළාතෙ පස් පාගන්න ආවෙ නැති බවත් අම්මටත් සෑහෙන්න වෙනස්කම් කළ බවත්, දැනුම් තේරුම් ඇති කාලෙ අම්මා කියල තිබුණ බව සාරදාට මතක් උණා. කළු මීච්චි කියපු එකට තමයි අම්මට ගොඩක් දුක හිතිල තියෙන්නෙ.

අම්මා කුඩා සාරදාව වඩාගෙන එළියට ආවා. මගෙ පුතා කියල අප්පච්චි සාරදාගේ නළල සිපගද්දි ඈත උන් සාරදාට හැඬුම් ආවා. අප්පච්චිගෙ සෙනෙහස මහමෙරක් වගේ මේ තරම් කාලයක් නොදැනුණු ආත්මීය බැඳීමක් සාරදාට දැනුණා.

''ඔහේගෙ අම්මානම් මහපුදුම මනුස්සයෙක් මටත් ඇනුම්පද කීවා ආව ටිකට.''

''ඕවා ගනන් ගන්න එපා. මොනා උණත් ඒ මගෙ අම්මනෙ..... මට දැන් මොකක් හරි ඉස්තීර රස්සාවක් තමයි හොයාගන්න ඕනෙ. නැත්තම් මේ දරුවා එක්ක කාලා ඇඳලවත් ජීවත් වෙන්නෙ කොහොමද?''

අප්පච්චි කටුමැටි බිත්තියේ ඇඳුණු කටුමැටි චිත්‍ර දිහා බලාගෙන හැඬුම්බරව කීවා.

කළු මීච්චි ඇවිත් චීක් චීක් ගාලා යං යං කියද්දි සාරදා ඊට අවනත උණේ ගමනේ මඟ පෙන්වන්නා කලුමීච්චි හින්දා. කළු

මීච්චි ලොකු රවුම් කීපයක් කැරකිලා ආයෙත් රූං ගාලා තණකොල බිස්සක් උඩට පාත් උණා. හුරුපුරුදු තැනක්.

''මොනවා....... ආයෙත් මාව අරං ඇවිත් තියෙන්නෙ මගේ පුංචි කාලයටමනෙ.''

සාරදා සද්දෙට කියද්දි මීච්චි චික් චික් චීක් ගෑවා. කෑ නොගහ ඉන්න කියනවා වගේ සාරදාට ඇහුණේ.

අම්මා කුඩා සාරදාව කරපින්නාගෙන ඉකි ගහ ගහ දොරපැලැල්ල ඇරගෙන එළියට ආවා. කාකිදිග කලිසමයි සුදුපාට කමිසෙකුයි ඇඳගෙන බෑග් එකකුත් එල්ලගෙන අප්පච්චිත් එළියට ආවා. ඒ ඇස්වල කඳුළු. ඇත හිඳපු සාරදාට දිස්නෙට පෙනුණා.

''කරන්නම දෙයක් නැතිව යනවා මිසක් කැමැත්තකින් යන ගමනක් නෙමේ මැනිකේ. ගල් ඔය ස්ටේශන් එක..... හප්පේ හැතැප්ම කීයක්ද. මේ දරුපැටියා දාලා මොන හිතකින් යන්නද.''

අප්පච්චිගෙ ඇස්වලින් වැටෙන කඳුළුවල සට සට සද්දෙ සාරදාට ඇහුණා.

''මේ කැලෑව මැද්දෙ පොල් අතු පැලක හරි හමන් දොර කැල්ලක්වත් නැතිව පොල් අතු පැලැල්ලක් අහුරගෙන ඔහේ මේ පැලේ තට්ට තනියම කොහොම ඉන්නද''

අප්පච්චි අඬන සද්දෙට සාරදාගෙ පපුව ගැහෙන්න ගත්තා. සාරදාත් මහ හයියෙන් ඇඬුවා.

''කමක් නෑ, මේ දරුපැටියා වෙනුවෙන් ඔයා මේ ගමන යන්ඩෝනැ. අනික රජයේ රස්සාවක් ආයෙ කොහෙන් හොයන්ඩද. මං ඉන්නම්. අයියලත් අල්ලපු වැටේ ඉන්නවනෙ. යායේ ජෑසිං අයියලෑ දුවට කීවා රෑට අපේ තනියට එන්ඩයි කියලා. ඒ ළමයා එයි. මං බය නෑ. ඔයා පරිස්සමෙන් ගිහින් එන්නකො. මං මේවා බලාගන්නම්.''

අම්මා යකඩ ගෑනියක් වගේ ඒ කියපු වචන සාරදාගේ හදවත පතුලටම කිඳා බැස්සා.

කනත්ත අල්ලපු වැටේ. තට්ට තනියම තරුණ අම්මෙක් මාස අටක පොඩි දරුවෙක් එක්ක හරි හමන් දොරක්වත් නැති ගෙපැලක ජීවත් වෙන්නෙ කොහොමද. කියලා ඇත ඉඳපු සාරදා ආයෙ ආයෙත් අනන්තෙටම හිතුවා. ඒත් ඒ මගේ අම්මයි පුංචි මමයි නේද. සාරදා ඇස් ලොකු කරන් බලන් උන්නා මේ සිදුවීම දිහා. අප්පච්චිගෙ සී.ජී.ආර් මුල් පත්වීම ගල් ඔය ස්ටේශන් එකට.

''උදේ පාන්දර මඩකළපු කෝච්චියෙන් ගිහින් රෑට ආපහු කොහොමහරි මං එනවා.'' අප්පච්චිගෙ කටහඬ ඈතින් වගේ ඇහුණා.

''දරු දුක උහුලා තනිව වැළපෙනා බුදුබව පතනා පියවරු වෙසෙනා''

කියලා සාරදාට ඉබේම කියවුණා. අප්පච්චි කුඩා සාරදාගෙ හිස සිඹලා අම්මගෙ ඔළුවත් අත ගාලා කඩුල්ල ළඟට ගිහින් බයිසිකලේට ගොඩ වෙලා ආපහු බැලුවා. අම්මා හිනාවෙලා අත වැනුවා.

''පරිස්සමෙන් ගිහින් එන්න මගෙ දෙයියෝ බුදුසරණයි''

අම්මගෙ කටින් පිටවුණු වචන සාරදාට විතරයි ඇහුණේ. හිතේ හිරකරගෙන උන්නු මහගල පැත්තකට විසි කරලා අම්මා ඉකි ගහ ගහ ඇඬුවා. පුංචි සාරදා මොකුත් නොදැනම ඇඬුවා.

මං හදන්න අම්මයි අප්පච්චියි කොච්චර වද විඳලා තියනවද. සාරදාත් ඉකි ගහ ගහ හැඬුවා.

මීච්චි මොකුත් නොකියා ඉස්සරහට ගිහින් නටන්න පටන් ගත්තා අනෝද අත්තකට වෙලා. මීච්චි මොකද්ද ඒ පාර නටන්න හදන නාඩගම. ගමන ඉවරයි වගේ. ගමන් විඩාවක් නොදැණුනට හදවතේ සියුම් තත් වේගයෙන් කම්පනය වෙන

හඬ පමණක් හොඳ හැටි ඇයටම ඇසුණා. මයිල ගහ යට අඹ කොටේක සාරදා හරි බරි ගැහිලා ඉඳ ගත්තා විතරයි. මීච්චි නැටුම නවත්තලා ජෙට් එකක් වගේ අහසට පැන්නා.

හ්ම්ම්ම්ම්.... මට මීච්චිත් එක්ක එන කේන්තිය. එයාට ඕනෙ විදියටයි හැම වැඩේම. සාරදා හිතුවෙ මීච්චිට අවනත වෙලා යන අතරේයි. ඒ පාර වැඩිදුරක් ගියෙ නෑ.

සුදු මල් සාරියක් ඇඳගෙන උජාරුවෙන් හිටගෙන ඉන්න අරලිය ගහක් යට මීච්චි නැවතුණා. සාරදාගෙ ස්කෝලෙ එලිමහන් පන්ති කාමරයටයි ඇවිත් ඉන්නෙ. කවුද මිටි මහත ගෑනු කෙනා. වේ වැලකුත් අරගෙන; හප්පේ..... දැන් මේක දකිද්දිත් බයේ බෑ. තුන වසරට උගන්වන කන්දෙගෙදර මිස්. සාරදාට ඉබේම කියවුණා. දකුණු අල්ල රත්වෙලා පුපුරු ගහනවා වගේ දැනුණා.

''කළු මීච්චි වගේ පිටිපස්සෙම පේළියෙ ඉඳගෙන. කෝ මේ පොතේ ගණන් හදලා. කෝ මේ පොත පෙන්නලා. කිසිදෙයක් හරියට ලියලා නෑ. ගණං පොතට තටු ඇවිදින් වගේ කුඩා සාරදාගේ හිසට ඉහළින් අරලිය ඉත්තකට උඩින් අරලිය මලකුත් කඩාගෙනම මුනින් අතට දඩස් ගාලා වැටෙනවත් එක්කම එකේ ඉඳන් දහය වෙනකන් ඉලක්කම් ටික රෝල් වෙලා ළඟම කානුවකට වැටුණා.

අල්ලනවා අත කවදාවත් අම්මා අප්පච්චිගෙන්වත් ගුටියක් කාලා නැති පුංචි අතට සැර වේවැල් පාරක් වැදෙනවත් එක්කම කකුල් දෙක දිගේ මොනවද ගලාගෙන යන හැටි ඇත හිටන්ම සාරදාට පෙනුණා. පුංචි සාරදාගෙ ඇස්වල කඳුළුත් හෝ ගාල ගලනවා. කළු මීච්චි උඹ ආයෙ ස්කෝලෙ නාවට කමක් නෑ. ගණන් හදන්නැතිව හතරට පාස් කරන් නෑ...

තව මොනවද මිස් කීවා. පන්තියේ ළමයි කලුමීච්චි හූ හූ කියල සමච්චලේට කෑ ගහද්දි තමයි සාරදාට ස්කෝලෙ ගමන එපා උණේ. ගණන් මිස් යක්ෂණියක් වගෙයි සාරදාට පෙනුණේ. ගණන් අප්පිරියම උණා. ගණන් මිස් සුදු ළමයින්ට ආදරෙන්

කියාදෙද්දී ඇයි සාරදාට විතරක් බනින්නේ? පුංචි සාරදාට කොටුරුල් අරහංම උණා. වැඩිපුරම කතිරයි බිංදුයි වැටුණු කොටු රුල් පොත අස්සේ වේළුණු සමන් පිච්ච මල්................... හ්ම්ම්ම්ම්ම්

ඇත ඉඳන් සාරදා මීච්චිත් එක්ක බලන් හිටියෙ මේ ඔක්කොම. හරි හතරැස් කරගන්න බැරි වුණ තැන් ජීවිතේ කොච්චර නම් තියනවද.

මීච්චි අහසට නැගලා සාරදාට අත වැනුවා. ආයෙත් ගමනෙ. තවත් කොළපාට ලෝකයක්. හාත්පස කළුවර වැටීගෙන එනවා. අඳුරෙන් එළියට නෙමෙයි, මොකද මේ මීච්චි මාව එළියෙන් අඳුරට අරං යන්නෙ.

තැං තැංවල කහපාට එළි ඇවිදිනවා. නෑ.. ඒ හුළුඅතු බැඳගත්තු මිනිස්සු; කලබලෙන් වගේ. ආයෙත් කුඩා කුප්පි ලාම්පු එළියක් ළඟ මීච්චි නැවතුණා. පුතේ ඔය රතිඤ්ඤා පෙට්ටිය ගේන්ඩෝ. අලි ඇවිත් සද්දෙ ඇහෙනවා.

දෙයියනේ..... ඒ අම්මගෙ කටහඬ. සාරදා ගල් ගැහිලා නතර වුණා. අම්මා කුප්පි ලාම්පුව උඩට කරලා අල්ලගෙන පාර පැත්තට යනවා.

අම්මට අඩි කීපයකට ඉස්සරහිං සද්දන්ත අලියෙක්. ඒත් අම්මට ලාම්පු එළියට පේන් නෑ. අනේ අම්මේ යන්ඩ එපා ඉස්සරහ අලියා...... යන්ඩ එපා... සාරදා කෑ ගැහුවා. මීච්චි සාරදාගෙ මූණ බැලුවා. ආ අම්මේ රතිඤ්ඤා. නංගියි කුඩා සාරදයි අම්මා ළඟටම දුවගෙන ඇවිත්.

අලිය ඉස්සරහ බව කවුරුත් දන් නෑ. අම්මා තුම්මුල ලාම්පුවෙන්ම ගිනිතියල ඉස්සරහට දැම්මා. පටෝං.... තුම්මුලේ සද්දෙට සාරදාගෙ හදවත පුපුරා ගියා වගේ දැනුණා. ජරබරාස් ගාමින් අලිහාමි දිව්වා. අම්මයි කුඩා සාරදයි නංගියි ගේ පැත්තට දිව්වා. බිහිසුණු අත්දැකීමක්.

අපි රකින්න  අම්ම අප්පච්චි ජීවිතත් පරදුවට තියල කොච්චර කැපකිරීම් කරලද. සාරදා ආයෙමත් හිතුවා.

පුතේ  දැං සද්දයක් නෑ  වගේ. පල්ලෙහාට යන්ඩ ඇති.

පුතා නංගිත් එක්ක ගෙට යන්ඩ. ගිහින් පාඩම් කරන්ඩ. හෙට ශිෂ්‍යත්වෙනෙ.  කොහොමහරි මගෙ පුතා ශිෂ්‍යත්වෙ  හොඳට ලියන්න එපැයි. මං ඉන්නෙ ඇහැරලාමයි. බය වෙන්ඩ කාරියක් නෑ. අම්මගෙ අත්වල තැවරුණු වෙඩි බෙහෙත් ගඳ කිරි සුවඳක් වී ඇත උන්නු සාරදාට දැනුණා. අම්මා පාරෙ ඇන තියාගත්තා, ලාම්පු කුප්පියයි ගිනිපෙට්ටියයි රතිඤ්ඤා පෙට්ටියයි ළඟින් තියාගෙන. නංගියි කුඩා සාරදයි ඉස්තෝප්පුවට ඇවිත් ඉඳ ගත්තා විතරයි; පොළොව පෙරළෙනවා වගේ මහ විශාල ශබ්දයක්, හරියටම විස්තර කරන්න බැරි බිහිසුණු මොහොතක්. කුඩා සාරදයි නංගියි අම්මගෙ අතේ එල්ලුණා වෙව්ල වෙව්ලා.

''අම්මේ මොකද්ද ඒ සද්දෙ?''

''අලි.... කු..ල..ප්..පු.. වෙලා.. වගේ.. පාරෙ එහාට මෙහාට දුවන සද්දෙ තමයි ඔය ඇහෙන්නෙ පුතේ'' අම්මගෙ කටහඬේ තිබුණු වෙව්ලන ස්වරය මීච්චි සමඟ සිටි සාරදාට දැනුණා.

ජීවිත පිළිබඳ විශ්වාසය බොඳ වෙමින් පවතින මොහොතක කුඩා නැගණිය හඬමින් ''ඒ අලියෝ මෙහෙටත් එයිද  අම්මේ'' කියල අම්මගෙන් ඇහුව.  අම්මා උත්තර දෙනවා වෙනුවට දෑත නළලේ තබාගෙන  මොනවදෝ  හයියෙන් මැතිරුවා. කුඩා සාරදාද දෑත නළලේ තබා හිතට එන හැමදේම කියන හැටි.... අනේ අලි හාමිලා ඔයාල මෙහෙට එන්ඩ එපා අපිට අප්පච්චියි අම්මයි විතරයි ඉන්නෙ. අප්පච්චිත් අද රෑ වැඩට ගිහින්. අපි තනියෙන්. හෙට ශිෂ්‍යත්වෙත් තියනවා. අනේ අපේ ගෙදරටනම් එන්ඩ එපා.. එපා.. එපා..

පැය බාගයක් විතර යම යුද්දය,  කුංචනාද හඬ, පොරපස් දාන හඬ, නොනැවතීම ඇහුණා. හදවත් තුනක් එක පොදියට ගැහි ගැහී උන්නෙ. අම්මා හඬ අවදි කරා.

''තුණුරුවන් සරණයි, සියලු දෙයියන්ගෙ පිහිටයි, ගම්භාර දෙයියොම මේ දරු පැටව් බලාගන්ඩෝනැ.''

අම්මාගේ ඇස්වලින් වැටුණු කඳුළු තරමටම සාරදාගේ ඇස් වලින්ද කඳුළුවැල් බිම වැටී කුඩා දිය පහරවල් සෑදී ඔහේ ගලා ගියේය. මීච්චි අපි යමු. මට තවත් මේ දුක් බලන් ඉන්න බෑ. අපි යමු මීච්චියේ... සාරදා මීච්චිටත් කලින් අහසට පියෑඹුවා. ඒත් චීක් චීක් චීක් ගාමින් දුක ප්‍රකාශ කරමින් මීච්චි ඉස්සර වුණා.

එදා අලි යුද්දයෙන් පස්සෙ ශිෂ්‍යත්වෙ ලියලා ගමේ ස්කෝලෙන් පළමු වතාවට පාස් වුණේ සාරදා. ඊට කලින් කවුරුත් ඒ ස්කෝලෙන් ශිෂ්‍යත්වෙ පාස් වෙලා නෑ. සාරදාට පස්සෙවත් අවුරුදු ගාණක් යනකන් පාස් වෙලා නෑ.

කළු මීච්චි වේගයෙන් පියෑඹුවා. කළු පාට දෙබෑකරගෙන ගල් මුල්, බොරළු කඳු, දිරාපු ගස්, ඇළ දොළවල්, විශාල වැව් උඩින්, හුළු එළි අතරින් ඇවිත් කහපාට විදුලු බුබුළු, උස් ගොඩනැගිලි, හයිබ්‍රිඩ් කාර්, පසුකරගෙන වේගයෙන් පියෑඹුවා. අවසානෙ ලස්සන හුරුබුරුටි ගෙදර බැල්කනියෙ සමන් පිච්ච පඳුර ළඟටම මීච්චි පියාඹලා ආවා.

''සාරදා.. සාරදා.. පුතේ.. මොකද උදේ පාන්දර පොත් කියවනවද? නිදිද?'' සාරදා ගැස්සුණා.

''අම්මා.. අම්මා.. ඔයා හොඳින්ද? කෝ නංගී... අප්පච්චී.. අලි.. අලි.. කෝ ගියාද? අම්මේ.. අම්මේ.. එතකොට කෝ මාත් එක්ක ගිය කළු මීච්චි?''

''මොන මීච්චියක්ද? මොන අලියෙක්ද? ඔයාට උදේටත් පුදුම හීන පේන්නෙ. ඔය තේක බොන්න.''

සාරදා අම්මා දෙස ආදරණීය බැල්මක් හෙළුවා.

මං කොහෙද ගියේ? ඇත්තටම ඒක හීනයක්ද? එතකොට කළු මීච්චි කෝ? සාරදා සමන් පිච්ච පඳුර දෙසට ඇවිදගෙන ගියා.

සමන් පිච්ච මලක් උඩ වැටුණ කලුපාට කුඩා පිහාටුවක්. සාරදා කුඩා දැරියක සේ කුරුළු පිහාටුව සිපගත්තාය.

කෙටි කතා ( රාජ්‍ය සේවයේ නියුතු )

**කුසලතා ස්ථානය**

ඒ.ආර්.ආර්.ඩී.ෆොන්සේකා
ශ්‍රී ලංකා පොලීසිය,
යාපනය



## කරදිය කඩිති

දහවල් දහය නිවාලමින් පරිසරය සිසිලසින් සනහාලන මඳ අඳුර පැතිරෙද්දී මම මහපාරෙන් මල් දෙවැටට හැරුණෙමි. පිපෙන්නට ඔන්න මෙන්න වූ ගැටපිච්ච පොහොට්ටු මා එනතුරු මඟ බලා සිටියා යැයි කියන්නට මෙන් වැනෙයි. මම පිච්ච පොහොට්ටු පොකුරක් ඇඟිලි තුඩුවලින් ගෙන නෙත් පියා සුවඳ බැලුවෙමි. නෑඹුල් සුවඳ යන්තමට දැනේ. "හිමීට පිපෙන්න කෝ...... මම එනවා නෙළාගෙන යන්න......" යැයි මුමුනමින් එය සුමුදුව අතහැර මෑත් වුණෙමි. හා හා කියන්නාක් මෙන් එය සැලුණි. නිවසට ගොඩ වීමට ඇති පඩි තුන හතර හනික නැග පාවහන් ඉවත් කර උඳුපියලියා පලස මත පා තබත්ම දැනුණු පුදුමාකාර සනීපය කියන්නට මට වචන නැත. හවස් වරුවේ ඇද හැලුණු වැහි පිනි බිඳු තවමත් පියලි මත රැඳී තිබුණි.

හාන්සි පුටුවේ දිගා වී සිටි අප්පච්චී මා දුටුවා විය යුතුය. සුපුරුදුවෙන් දිවගොස් පාවහන් හා බෑගය පසෙකලා ඔහුගේ දෙපා නැමැදි මම දණහිසෙන් රූටමින් ගොස් මගේ හිස අතගෑමට ඉදිරියට නැමුණු ඔහුව නැවත පුටුවට හාන්සි කර

ඔහුගේ පපුවට මුහුණ තබා තුරුලු වුණෙමි. ඔහු සිය දකුණතින් හිමිහිට මගේ හිස පිරිමදියි. මුළු දවස පුරාම වූ මගේ මහන්සිය  අතුරුදන් විය.

මම හිස ඔසවා ඔහුගේ මුහුණ දෙස බලා සිනාසුනෙමි. ඔහු ඒ වන විටත් මඳ සිනාවක් මුව පුරා අතුරා ඝන ඇහි බැම යට ගිලුණු කරුණාව උතුරන නෙතින් මදෙස බලා සිටියේය. ඔහු බී අවසන් කළ තේ කෝප්පය  පුටුව පාමුල විය. එහි තවමත් උණුහුමක් ඉතිරිව ඇත. එය ද මගේ අඩුම කුඩුම ද රැගෙන මම ගෙතුළට ගියෙමි. අම්මා කුස්සියේ  බව සද්දබද්ද වලින් දැනේ. බෑගයත් සපත්තුත් කාමරයට කළ මා අප්පච්චිගේ තේ කෝප්පයේ ඉතිරි වූ තේ ඩිංගක් තොල ගෑවෙමි.

පැණිසුරුට්ටු සුවඳ හා මුසු වූ තේ බිඳුවේ රසය හද පත්ලටම දැනෙන්නකි. පයැඟිලි තුඩුවලින් කුස්සියට එබිකම් කර තේ කෝප්පය හිමිහිට පැන්ට්‍රිය මත තබා මට පිටුපා සිටි අම්මාව තුරුල් කර ගතිමි.

" හ්...හ්...ම් මම බයවුණු තරමක්...... අද පරක්කුයි නේද දුවේ " ඇය නැවත වැඩෙහි යෙදේ.

" චුට්ටක්...." මම නෙතු පියා තවත් ඈ තුරුල් කර ගෙන සිටිමි. ඒ උණුසුමෙහි සුව කියා නිම කළ නොහැක. "එනකල් බලාන ඉඳලා ප්‍රමාද නිසා අපි තේ බිව්වා.... ඉන්න...... මම ඔයාට තේකක් හදන්න......"

"හ්ම්" කියමින් ඇය මුදාහල මම කාමරයට පැමිණ සාරියත් හැට්ටයත් ලිහා දමා යට ඇඳුම් පිටින්ම ඇඳේ ඇල වුණෙමි...... විශාල බරකින් නිදහස් වුණා වැනිය. කිටි කිටියේ හිරව තිබූ

පපුවෙන් සැහැල්ලු සුසුමක් පිටවිය. සාරියට කැපී දැවෙමින් තිබූ ඉඟටිය ඉහිල්ව සැනසේ. මම දෙනෙත පියා ගතිමි.

එක්වරම මැනේජර්ගේ රුව මැවිනි. වහා ඇස් ඇරිණි. දෑත ගෙන බැලුවෙමි. ඇඟිලි දිගුය. සිහින්ය. සුමුදුය. රත්පැහැතිය.... මා දිගු කළ ෆයිල් එකෙහි පැත්තට වූ කෙළවර නාල්ලා මං අල්ලාගෙන සිටි තැනටම අත ගෙනැවිත් මගේ අත ඇල්ලූ මැනේජර් අප්පච්චිට වඩා මඳක් බාල විය හැකි අයෙකි. මම එක එල්ලේ ඔහුගේ මුහුණ දෙස බලා සිටියෙමි. තරහකින් නොව හැඟීමකින් තොරවය. ඔහු දෑස් කුඩා කරමින් "ගුඩ් මෝනින් මිස්...." කීය. මගේ වචන ගොළු වී ඇත. මම ආපසු හැරී මගේ පුටුවට ආවෙමි.

"තේ බොන්න එනවද...... නැත්නම් ගේන්නද මැඩම්" කියමින් නංගා ඇඳේ වාඩි වී අසන තෙක් දෑස් ඇර සිටියද මම නොදැක්කෙමි. ඇය මට අවුරුදු දහයකට බාලය. සාමාන්‍ය පෙළට සූදානම් වෙමින් සිටි ඇගේ හිස සිට දෙපතුල දෙසටම මම ක්‍රමිකව බැල්මක් හෙළුවෙමි. ඇයද සුන්දර යුවතියක වී ගෙන ඒ. ඇගේ සිහින් දිගටි ඇඟිලි මත වූ කෙළවර උල් වූ දිගටි නිය පාට කර ඇත. මගේ නෙතෙහි ප්‍රශ්නය ඇ දනී.

"හෙට සෙනසුරාදනෙ හලෝ. මම ඔයාගෙ කියුටෙක්ස් එකකින් පාට කළා......" මම ඇගේ ඉඟටිය කෙනිත්තුවෙමි. ඇයට කිතිකැවිණි. "මහ නරකයි ඔයා.... මම තේ එක ගේන්නම්.... ඔයා වොෂ් එකක් දාගන්න" කියමින් ඇ පැන ගියාය.

නැගිට කැඩපත අසලට ගොස් මදෙස බලා සිටියෙමි..... හීන්දෑරි උස් සිරුර..... මඳරැළි දිගු කොණ්ඩය..... දේදුනු හැඩ සන ඇහි දෙබැම..... රවුම් රත් කොපුල්..... තද කළු පැහැ ඉංගිරියාව ඇති දීප්තිමත් දිගැටි ඇස්..... ඉදිරියට දිගුව ඉහළට වක් වූ

බෝනික්කෙකුගේ මෙන් වූ ඇසිපිය..... ලොවි රත් පැහැ පිරුණු දෙතොල්..... සිහින් ගෙල..... නොපටු උරපතු..... දිගු ලතාවන් දෑත්..... අහසට විහිදුණු කුඩා රවුම් පියයුරු..... සිහින් ඉඟ කෙළවර පිරුණු උකුළ..... සුදු යටසාය විනිවිද දිලෙන රන්පැහැ දෙකලව..... සැබැවින්ම සුන්දරය.

තිසර පටයෙහි බැම් ලිහිල් කිරීමට දෑත පිට දෙසට යොමුකළේ කැඩපතින් දෑස් ඉවත් නොකරමින්මය. පසුපසට හොඳින් විහිදුණු පිරුණු තට්ටම් කලාකරුවකුගේ නිමැවුමකි. සැබැවින්ම ඒ රුව ආකස්මිකය. කාර්යාලයේදී මා ඔබ මොබ යන විට නොයෙක් දෑස් මගේ සිරුරේ තැනින් තැන පැටලී ඇති බව මගේ යටැසට පෙනේ. මා එය නොදැක්කා සේ පියමනිමි. සිරුර පුරා විහිදී යන ලජ්ජාව විදුලි කාන්දුවක් මෙන් මා පෙළයි.... සුන්දර දෙයක් නැරඹුම කාට නම් වැළකිය හැකිද......

"අක්කා......" කියමින් නංගා දොරට තට්ටු කරද්දී මම යට සාය ඉහළට නංවා නග්න පියයුරු පියවා ස්ටූලය මත වාඩි වුණෙමි.

"මේං තේ......." මම එය ගතිමි.

"තාම වොෂ් දැම්මෙ නැද්ද...... හලෝ...... ඊරි........."

කොණ්ඩ කරල් දෙකක් ගොතා සිටින ඇය මා මගේ පාසල් කාලයට ගෙන ගියා .......

"ඔයා බිව්වද"
"බීපුවයෙ කැලිත් නෑ..... මොකෝ තාම ඔහොම ..... ඔෆිස් එකේ ප්‍රශ්නයක්ද..... නැත්නං මගේ අනාගත මස්සිනාව අදවත් හම්බ වුණාද ........."

මම නෙතුපියා තේ කෝප්පය රස විඳිමිනි. නංගා තොරතෝංචියක් නැතිව කියවයි. මා සාමාන්‍යයෙන් මෙතරම් ප්‍රමාද නොවේ. ආ විගහින් ඇඟ සෝදා ගැනීම මගේ පුරුද්දයි. අද එය මගෙන් බැහැරව ඇත. ඒකිත් කෙල්ලක්නෙ..... ඒකිටත් ඉව තියෙනවා.....

"ඔව්..... සතුටුයිද? "

"හම්මේ කෝ කෝ බලනවකෝ..... ෆොටෝ එකක් තියෙනවද ෆෝන් එකේ."

"මං කිව්වෙ ඔෆිස් එකේ ප්‍රශ්නෙ ගැන"

"යනව යන්න අක්කි තමුසෙ හරි නරකයි. මං යනවා....." කියමින් යන්නට නැගිටින විට ඇගේ කොණ්ඩ කරලකින් ළගට ඇද මා ඇගේ නෙත් විනිවිදිමි.

"ඇත්තට හලෝ ඔය ඇස් දෙකම ඇති කොල්ලො සීයක් වැටෙන්න...... මට මස්සිනාලා කීයක් දැනට ඉන්නවද....." කියමින් බක බක ගා ඈ සිනාසෙන්නට විය.

"ඉල්ලන ගානක් දෙන්න පුළුවන් "

මෙහෙමත් දඟකාරියක් ..... යැයි ඇය දෙස සරදම් බැල්මකින් මා බලා සිටියෙමි. ඈ මට ඔච්චම් කරමින් පැන දිව්වාය.

මම පාසල් මතකයන් නිරුවත් කරමින් නාන කාමරයට ගියෙමි. නංගා මෙන් මා දඟකාරියක් නොවීමි. නිහඬ ශාන්ත බවක් මට විය.

" නේත්‍රගෙ ඇස් හරිම ලස්සනයි......." සැර බාල වූ ලයාන්විත පිරිමි කටහඬකි.

"ඒවා හරියට කතා කරනව වගේ "

මගේ ගණිත පොත ඉල්ලා එවා තිබූ පණිවිඩය අනුව එය රැගෙන ගොස් මගේ ගණිත ගුරුවරයාට දීමේදී මගේ අතද ස්පර්ශ වන සේ පොත ලබා ගත්තේ එලෙස පවසමිනි. මේ මගේ ගුරුවරයායි. මම කුමක් කියන්නද...... ඔහු තරුණය ..... හින්දි නළුවකු මෙන් කඩවසම්ය..... ඒත් මා ගෝලයෙකි..... පාසල් දරුවෙකි..... ඔහු හැරුණු විට කිසිදු ගුරුවරයෙකු ගුරු විවේකාගාරයේ නැත. මම මගේ කොණ්ඩ කරලක් තදින් අල්ලාගෙන ආපසු හැරී පංතියට ගියෙමි. හැම ගුරුවරයෙකුටම මම අප්පච්චීට මෙන්ද හැම ගුරුවරියකටම මම අම්මාට මෙන්ද ගරු කළෙමි. ඒ ගෞරවය ගණිත ගුරුවරයාටද වෙනස් නොකළෙමි. එහෙත් ඔහුගේ ප්‍රතිචාර වෙනස්ය.

මම කරාමය විවෘත කර නෙත් පියා ගතිමි. සීතල දිය බිංදු විසිරෙමින් හිස හා සිරුර මත වැටී පහළට රූටාගෙන යයි. මෙතෙක් වූ සිතුවිලි ඒ දිය පහස හා සේදිණි. දහය තරමක් නිවුණු පසු දියමල නැවැත්වූයෙන් මගේ රුව යළි කැඩපතෙහි මතුවිය. සිරුර පුරා දිය බිඳිති විසිරී දිලිසේ. නෙත් තවමත් කාන්තිමත් වී, ලා රත් පැහැ වී අලුත පිපුණු පිනි විසුළ පිච්ච මලක් මෙන් රුව දෙගුණ වී ඇත. මගේ මල්වර මඟුල් දා දුටු නෑඹුල් රුවමය. ඥාතීන් පමණක් සහභාගි වී තිබුණි. මා දණහිස් රිදෙන තුරු ඔවුන්ට වැන්දෙමි. මාමාට වැඳීමට ගොස් බුලත් අත දී ඔහු දෙස බැලූ මට පෙනුණේ අප්පච්චිගේ කරුණා පිරි බැල්ම, කුඩප්පච්චිගේ නපුරු බැල්ම, සීයාගේ සෙනේ පිරි බැල්ම හෝ

නොවේ. මගේ කාර්යාලයේ කළමනාකාර තැන මගේ අත ඇල්ලූ මොහොතේ වූ බැල්මය.

කහපාට පුංචි මල් වැටුණු රතු චීත්ත ගවුමින් සැරසී තෙත කොණ්ඩය නිදහසේ මුදහැර මම සාලයට පැමිණියෙමි. අප්පච්චී ඇඳි පුටුවේ නැත. කාමරයට ගොස් විය යුතුය. මම බුදු ගෙය දෙසට පිය මැන්නෙමි. එහි වූ පරමල් ඉවත් කර මල් වට්ටිය සෝද පිච්ච නෙළුමට ගියෙමි. තෙත කොණ්ඩය තට්ටම් වල තාලයට වදී. කාර්යාලය තුළ ඇවිදින මගේ ඔසරි නෙරිය මත පිරිමි නෙත් නැවතීමේ පුදුමය එයද.....

මවිසින් නඩත්තු කරන පිච්ච යාය මලින් බරව ඇත. එහි සුවඳ මා මනමත් කරයි. මම පිච්ච සුවඳට දැඩිව ඇලුම් කරමි. සුවඳ විලවුන් තෝරා ගැනීමේදී ද මේ සුවඳ සොයා බලමි...... වට්ටිය පිරෙන්නට පිච්ච මලින් සරසා මැදට නිල් කටරොළු මලක් ගැවසීමි. අප නිවසේ හොඳින් ඉඩකඩ ඇති බැවින් බුදුමැදුරට වෙනම කාමරයක් වෙන්කර තිබේ. එහි පන්සලක මෙන් හිතේ හැටියට වැතිරී බුදුන් වැඳිය හැකිය. මා ප්‍රමාද බැවින් අම්මා පහන් පත්තු කළා විය යුතුය. මම එයට තව තෙල් ටිකක් වත් කර තිර සැකසුවෙමි. දැන් යළිත් ඒවා හොඳින් දැල්වේ. කුටිය පුරා පිච්ච සුවඳය. පසෙක ඉඳගෙන නෙත් පියා සිත් සේ බුදුන් වඳින්නට වීමි. බුදුරුව, මල් පහන්, බෝ රුක චෛත්‍ය මෙන්ම මා ද ගණිත ගුරුවරයාද කළමනාකරුවන් කීප දෙනෙකුද බස් කොන්දොස්තරද ඇතැම් මගීන් ද සිතෙහි තැන තැන ඇඳී මැකී යයි. මා ඒ සියල්ලෙන් හිත හිස් කර ගැනීමට වෑයම් කරමි.

එම වෑයම දිනයි.... පරදී.... යළි දිනයි.... මඳවෙලා ගතවෙමින් හිත හිස්ව ශාන්ත වේ. මම වැඳුම අහවර කර හඳුන්කූරු දැල්වීමි.

මුලින් එය නොදැල්වූයේ ඒ කෘතිම සුවඳින් පිච්ච මල්වල ස්වාභාවික සුවඳ මැඬී යනවාට මා අකමැති බැවිණි.

බුදුමැදුරෙන් මෑත් වී මම කුස්සියට පිය මනින්නට වීමි. ඒ යන අතරතුර නංගාගේ කාමරයේ දොර මඳක් මෑත් කර බැලීමි. ඇය පාඩම් කරමින් සිටී. මම නැවත කුස්සියට යන්නට වීමි. අම්මා කෑම පිස හමාර වී බඳුන් සෝදමින් සිටී.
"ඉන්න අම්මා මම සෝදන්නං....."
"ආ ඔයා ආවද......" කියමින් මදෙස හැරුණ ඇගේ නෙත් නැවතුණේ මුදුහළ තෙත කොණ්ඩය මතය.
"ඇයි දරුවො මේ හැන්දෑකරේ නෑවේ"

උදේට නාලා එක පීත්ත පටියකින් කොණ්ඩය ගැට ගහගෙන පිට දිගට මුදාහැරගෙන යද්දි මිනිස්සු ඇස්වලින් මාව ගිලිනවා කියලා අම්මට කොහොම කියන්නද........ සමහර පිරිමි උදේ පාන්දර රස්සාවල් පැත්තක දාලා මගෙ පස්සෙන් මගෙ ඔෆිස් එක ළඟට වෙනකල් පහත් යෝජනා කර කර එනව කියල කොහොම කටක් ඇරල කියන්නද අම්මෙ.......

"වැඩ ඇරිලා එද්දි හරි මහන්සියි අම්මා..... ඒකයි නා ගත්තේ...."

මම අම්මා හෙමිහිට මෑත් කරමින් භාජන සේදීම බාර ගතිමි. ඇය මගේ කොණ්ඩය අත ගා බැලුවාය. "තාම තෙතයි......" කියමින් පිටව ගියාය. ඈ උදේ සිට වැඩෙහි යෙදේ. විවේකයක් ලැබෙන්නේ මා ආ පසුය. මම බඳුන් එකිනෙක සෝදා රාක්කයේ අසුරන්නට වීමි. වීදුරු බඳුන් එකිනෙකට නොගැටීමට ඒවා තනි තනිව ගෙන පිසදා හෙමිහිට අඩුක් කළෙමි. ලස්සන මල්කම් රටා ඒ බඳුන් හැම එකකම වෙයි. එක්වනම කවුදෝ මා පසුපසින් විත් දෙවුර මත වූ කොණ්ඩය ඇල්ලීය. මම ගැස්සී ගියෙමි.
"මොකද ළමයො බය වුණේ"
අම්මා සාලුවක් ගෙන මගේ කොණ්ඩය පිස දමන්නට පටන් ගත්තාය.
"අම්ම එනව මට ඇහුණෙ නෑනේ"

"හා.... ඔයත් මීයා වගේ ඇවිත් මාව බයගන්වනවා... දැන් තේරෙනවද....." කියමින් අම්මා හිනැහුණාය.

මේ සෙනෙහස මේ ගෙයි උළුවස්සෙන් එළිපත්තේ මට දැනෙන්නැත්තෙ ඇයි දෙයියනේ...

"නේත්‍රා...."

"අම්මා...."

"ඔය ළමයගෙ පෙළවහ කටයුතු ගැන අප්පච්චි අහනව. ඔයා කෙනෙක් හොයාගෙන නැත්නං අප්පච්චි හොයන්නද කියල ඔයාගෙන් අහන්න කිව්වා"

බඳුන් සෝදා අවසන්ව ඇති බැවින් මම අම්මා දෙසට හැරී සාලුව ඇගෙන් මා අතට ගතිමි. කොණ්ඩය වම් උරහිස මත්තෙන් ඉදිරියට ගෙන පිස දමන්නට ගත් මා නෙත අම්මා දෙස හැඟීමෙන් තොරවත් අම්මාගේ නෙත් ප්‍රශ්නාර්ථයකිනුත් හමු වී තිබේ.

"නංගිට තියෙන්නෙත් අම්මගෙ ඇස්මයි. දඟයි. ලස්සනයි. අම්මත් පුංචි කාලෙ හරි දඟයිලු නේද"

"නේත්‍රා.... හැමදාම ඔයා මගෙන් පැනලා යනව වගේ අප්පච්චිගෙ ප්‍රශ්නෙන් මට පැනල යන්න බෑ දරුවො....."

මම අම්මාගේ නේත්‍ර යුග්මය දෙස තවමත් බලා සිටිමි. එහි කළු ඉංගිරියාව මගේ නෙත් තුළ දුවමින් උත්තරයක් සොයයි. මා මුවඟට මඳහසක් නැගිණි. මගේ මුව දෙපසට ඇදී, දසන් නොමදිසී කොපුල් ඉහිල් වී නෙත් යුග සිහින් වනු මට දැනේ. අම්මා ඉවත බලා ගත්තාය. මගේ මදහස් බැල්ම තුළ නොයිවසිය හැකි සුන්දරත්වයක් ඇති බව මටද වැටහී හමාරය.

"ඇයි අම්මා අහක බලා ගත්තේ.... තරහද?"

"නෑ මයෙ දුව.... උඹට මගෙවත් ඇස්වහ නොවදින්ට.... ලස්සන කඩා හැලෙන දුවක් ඉන්න එක අම්මෙකුට සතුටක් වගේම බයක්..."

මම අම්මාගේ උරමත හිස තබා බඳ වට දෑත් යවා තුරුලු වීමි. ඇය මගේ හිස හිමිහිට පිරිමදී.

"අම්මා...."

"හ්ම්...."

"අප්පච්චි වගේ...ම කෙනෙක් මට හොයලා දෙන්න කියන්න"

"ඔයා කැමති පිරිමි දරුවෙක් නැද්ද ළමයො" මම සුසුමක් මුදාහළෙමි.... ඇගේ ළය මත වැදී එය බිඳෙන්නට ඇත.

"තාම හම්බවුණේ නෑ අම්ම...."

"ආ... ආ... මාවත් තුරුල් කර ගන්න" කියමින් දිව ආ නංගා අම්මාගේ අත යටින් රිංගා අප දෙදෙනාම බද ගත්තාය.

"ඕං ආවා දංගලේ...." කියමින් අම්මාද ඇය අනෙක් අතින් තුරුල් කර ගත්තාය.

"මෙයා නං මට ආම්බාන් කරන්න බෑ නේත්‍රා"

"අප්පච්චිට බාර දීලා තියන්න වෙයි අම්මා" මම නංගා දෙස සරදමින් බලා කිව්වෙමි. ඇය මට විරිත්තයි.

"අම්මා දන්නවද...." මම කියන්නට පටන් ගත්වනම

"ඔව් අම්ම දන්නව.... අප්පච්චිගෙ රැවුල ඉදිල කියලනෙ" කියමින් ඇය අම්මට නොපෙනී මට රැව්වාය. මට සිනහව වළකා ගත නොහැකි විය.

"රන්.... උඹේ කට හොඳටම වැඩී.... තලනව මම... ගිහින් අප්පච්චිට කෑමට එන්න කියනව" අම්මා ඇය මැත් කොට ඇඟිල්ල උරුක් කරමින් කීවාය.

"අනේ ඇයි අම්ම මටම කියන්නෙ....." මේ දඟමල්ලට සැරවැර ගාණක්වත් නැත.

"ඉන්න අම්මා මම අප්පච්චි එක්ක එන්නං"

"රන් එහෙනං මට මේ කෑම ටික මේසෙට අරින්න උදව් වෙන්න."

නංගී කෙඳිරි ගාමින් මැසිවිලි නගන හඬ මට ඇසේ.

අප්පච්චි වාඩි වී මේස ලාම්පුවෙන් පුස්කොළයක් කියවමින් සිටී. මම දොරකොඩට වී සිටිනවාවත් ඔහුට නොදැනිණි. ඔහු පුස්කොළය තුළ නිමග්නව ගල් රුවක් බඳුව හිඳී. ඒ නිසල තේජ පිරිමි රුවට මම කැමැත්තෙමි. ඔහු මඳක් හෙලවෙන තුරු මා උළුවස්සට බර වී ඔහුගේ රූ සිරි වින්දෙමි. උර අත් බාහු තවම ශක්තිය පිරුණකි. ඒ පුරාද රෝම ගැවසී ඇත. පුළුල් පපුතුරය සුදු කළු මිශ්‍ර රෝම තලාවකි. ඝන ඇහි බැම ඉහළට එසවී විසල් නේත්‍ර යුග්මය පහළට නැඹුරු වී අපූරු කල්පනාබරිත මූර්තියක් මවයි. මඳ මුදු ගැහුණු ඉදුණු කෙහෙරැලි හොඳින් තෙල් ගා පසුපසට පීරා ගෙලට වැටීමට සලසා තිබේ. මට පිහිටා ඇත්තේ ඔහුගේ හිසකෙස් රටාවය. පපුව පුම්බා ලොකු හුස්මක් ගත් ඔහු හෙමින් එය පහළ දැම්මේය.

"අප්පච්චී...." මම තෙපලීමි. ඔහු හිමින් සීරුවේ දොර දෙස බැලීය.

"හ්ම්.... නේත්‍රා දුවේ"

"යමු කෑම කන්න" කියමින් මම ඔහු දෙසට ගියෙමි. ඔහු නැගිට කමිසයක් ගන්නට සැරසුණි. "ඕන නෑ ඔහොම යං" මම ඔහු වළකාලන්න උත්සාහ කළෙමි. එහෙත් ඔහු එය නැවැත්වූයේ නැත. මදෙස බලා උඩුරැවුල දෙපසට ඇදෙන ඔහුගේ මඳහස පා කමිසය ඇඟලා ගත්තේය.

"ගෑනු පරාණම ඉන්න ගෙදරක්නෙ දුවේ. මම කමිසයක් නැතුව යන එක හොඳ මදි"

මම අප්පච්චිගේ වමතේ එල්ලුණෙමි. ඔහු පුරුදු ශාන්ත ගමනින් කෑම කාමරය වෙත පිය නගයි.

අප්පච්චිගේ කාමරයට යාබද කාමරය දෙස මට ආපසු හැරී බැලිණි... එය සදහටම වසා දැමිය හැකි නම් යැයි මට සිතුණි. පසුපස බැලූ වේගයට වඩා වැඩි වේගයෙන් එම දසුනින් මම නෙත ඉවත් කරගෙන අප්පච්චිගේ උරහිසට හිමින් වාරු වී ඔහු සමඟ ගමන් කළෙමි.

යටිතොල හපාගෙන නංගා මා දෙස බලා සිටී. ඇය කටමැත නොදොඩන්නේ අප්පච්චී ඇති තැන පමණි. පණිවිඩකාරයාට අද වේලපහ බඩගිනි වෙලාදැයි නංගාට කියමින් අප්පච්චී වාඩි විය.

"ඔව් අප්පච්චී. අද වේලාසන පංති පටන් ගත්ත නිසා වේලාසනම කන්න වුනාණෙ."

"හ්ම් හ්ම්... හැමෝම කමු එහෙනම්"

කාමරයේ සිටින අප්පච්චීට පුරුදු පරිදි පණිවිඩ ගෙන යන්නේ රන්මදරාය. මම එදෙසට යාම අත්හලේ රන්මදරාගේ වයස තරමේදීය. ඊට කළින් කෑම පණිවිඩය රැගෙන යෑම මට බාර වූ කටයුත්තකි. මම අප්පච්චීටත් ඊට යාබඳ කාමරයේ සිටින මාමාටත් කෑමට එන්නට පණිවිඩ ගෙන ගියෙමි.

දිනක් අප්පච්චීට පණිවිඩය කියා මාමාගේ කාමරයේ දොරකොඩටද ගොස් එබිකම් කර බැලුවෙමි. කවුදෝ මා එක්වනම කාමරය දෙසට ඇදගන්නා ලදී. එවැනි විටෙකදී වෙන අයෙකු නම් කෑ ගසයි. මා ගොළුවේ. සාමාන්‍යයෙනුත් මා කතාබහ අඩුය. ඒ නිසාම දෝ මා ගල් ගැසේ. කතා කරන්නේ මගේ ඇස්ය. මාමා මාව පපුවට තදින් තුරුලු කර ඔහුගේ මුව මා මුවට ළං කරන්නට විය. එක්වනම මා මගේ අත්වලින් උපරිම වැර යොදා ඔහු තල්ලු කර මුහුණ ඔහුගෙන් ඈත් කර දෙනෙත

දැවුණු බැල්මක් හෙළිමි. ඔහුගේ ග්‍රහණය නොවෙනස්ය. "කෑ ගහන්න කලින් මාව අතාරින්න" මගේ ගොළුවත බිඳිණි. ඔහු භය වූ බවක් පෙනේ. එහෙත් ඒ වන විටත් ඔහුගේ උණුසුම් අඟපසඟ මගේ සිරුර පුරා ගෑවී හමාරය. ඔහු මා අත්හළේය.

"කාටවත් කියන්නෙපා නේත්‍රා"

මම දිව්වේ මගේ කාමරය තුළින් මගේ නාන කාමරයටය. අප්‍රසන්නතාව, ලජ්ජාව, තරහව, අසරණකම මේ සියල්ල එකතු වී මා ගිනියම්ව ඇත. නෙතු පුරා බුර බුරා හඬා වැටුණු ඒ ගිනි කඳුළු දිය මලෙන් ආ දියට මුසු කර හිත වත්තම් කර ගතිමි. දොරට තට්ටු කරනු ඇසේ.

"නේත්‍රාංජනා....." අම්මා කතා කරයි...

මම තවම අකුරු අමුණා ගත හැකි තත්වයක නැත. තවමත් කඳුළු කඩා හැලේ. දොර වැසිණි. අම්මාට මෙය කියන්නද නොකියන්නද? මා පසුවනුයේ මේ දේවල් නොදන්නා වයසක නොවේ. රන්මදුරාට තවම අවුරුදු 4 ක් පමණ වේ. ඇය අප්පච්චී ළඟත් මාමා ළඟත් හුරතල් වේ. අප්පච්චී ඇය ඔඩොක්කුවට ගන්නේ නැත. ඇය දුවවිත් ඔඩොක්කුවට පනී. මා කුඩා කාලයේද එසේ කළා යාන්තමට මතකය.

මාමා ඇය ඇදලාම ඔඩොක්කුවේ රුවා ගනී. අප්පච්චී අප තදින් තුරුලු කර නොගනී. මිරිකා නොදමයි. ඒත් මාමා රන්මදුරාව නිරුවත් පපුවට තුරුලු කර ගෙන තද කරගනී. කොපුල් තදින් සිපී. බඩද සිපී අප්පච්චිගේ කොපුලතට අප බලෙන් කොපුලක් හේත්තු කළද සිප ගන්නේ හිස මුදුනය. රන්මදුරා ගේ කාමර සියල්ල පුරා දුවයි. දෙවියනේ !!

මට මේක නොකියා බැහැ. අම්මාට මම හිමිහිට මේක කියනවා. අප්පච්චිට නොකියන පොරොන්දුව පිට. මේක දැන ගත්තොත් අප්පච්චිගේ පපුව පැළේවි. අපිව රකින්නේ මහා වස්තු දෙකක් රකිනවා වගේ. අපි නිසා එක රැයක් පිට නොනැවතී අප්පච්චී ගෙදර එනවා.

අම්මාට කතාව කියූ පසු ද සිටම මාමා දක්නට නොමැති විය. ඔහු යළිදු අප නිවසට නොපැමිණියේය. අම්මාගේ ඥාතියෙකු බැවින් අම්මාට සිදු වූ නින්දාවට ඔහුට හොඳටම දෙහි කපා ඇති සැටියකි. ඔහු සිටි කාමරය ඉබි යතුරු ලා අදටත් වසා දමා තිබේ. ඒ පැත්තට අදටත් යන්නට අකමැති ඒ අප්‍රසන්න සිද්ධිය මගේ සිතට තවමත් වදයක් බැවිනි. කළමනාකාරවරයාගේ ක්‍රියාව යළිත් මට මාමා සිහිගැන්වීය.

"නේත්‍රා තව බත් ටිකක් බෙදන්නද දුවේ" බත් පිඟාන ළඟට සිත යළි ඇඳ වැටුණේ අම්මාගේ හඬිනි. මා හිස වනා එපා කීවෙමි. අප්පච්චිත් නංගීත් කෑම කා අවසන්ව පිටත් වී ගොසිනි. අම්මා කෑම කන්නේ අප්පච්චී කා අහවර වූ පසුවයි. අප්පච්චී කොතරම් පෙරැත්ත කළත් අම්මා එම සිරිත නොකඩයි. ඒ සිරිත නම් එතරම් මා සිත් නොගත්තද ඔවුන්ගේ ආදරය නම් පුදුම සුන්දරය. කෙදිනකවත් නොහොඳ නෝක්කාඩුවක්, බහින්බස්වීමක් නැත. එහි රහස අප්පච්චිගේ නිවුණු ඉවසිලිවන්ත බවේත් අම්මාගේ ආදර භක්තියේත් මුසුවක් විය හැක.

පසුදින කාර්යාලයට යාමට ළා කහ පැහැති පසුබිමේ කළු පැහැයෙන් මෝස්තර වැටුණු බතික් ඔසරියකින් සැරසුණෙමි. මුතු හවඩියක් ඉණ ගවසා මුතුමාලය කර බැඳ රත්පැහැ ගලක් ඇල්ලූ ඔසරි කටුවෙන් ඔසරිපට රැඳවීමි. කොණ්ඩය තනි කරලට ගොතා අගිස්සට මඳක් උඩින් ඉටි රත්මල් පොහොට්ටු රවුමකින් ආයිත්තම් කළෙමි. කළු පැහැති පාවහන් යුවලක් සහ එම පැහැයෙන්ම අත්බෑගයද තෝරා ගතිමි. අම්මාටත් අප්පච්චීටත් වැඳ පඩිපෙළ බැස මහපාරට පියමැන්නෙමි. කොණ්ඩ කරල් කෙළවර මල් පොහොට්ටු තට්ටම් යුවලේ තාලෙට වදිමින් සිරි සිරි හඬක් නගයි. මට මඳසිනා පහළ විය.

කාර්යාලයේ රාජකාරි පොත අත්සන් කොට මගේ මේසය ළඟට මම ආවෙමි. මුණගැහෙන සියල්ලෝ උදෑසන සුභ පතයි. මම ද සුභ පැතුවෙමි. මේසය මත කහපාට දිග ලියුම් කවරයකි. අත්බෑගය මේසය මත තබා ලිපිය ගෙන බැලීමි. කවරය අලවා නොතිබිණි. මා වෙනත් අංශයකට මාරු කොට ඇත. ලිපිය අත්

බැගයට දමා එය නැවත උරමත එල්ලා ගතිමි. තවත් මෙහි රැඳෙන්නේ කුමට.... යාමට සැරසෙත්ම ඔසරිපොට යමක සිරවූවා සේ දැනිණි. ආපසු  බැලූ මා දුටුවේ සුචිත්තා එය අල්ලාගෙන සිටි බවයි.

"කියන කියන තැනට යන්නේ..... එක පාරක් හරි ආපසු හැරිලා නොගහන්නේ ඇයි නේත්‍රා...."

මෙම කාර්යාලයේ මා දුටු හොඳම මිතුරිය ඇයයි. මම ඇගේ අත අල්ලා ගතිමි.

"තාම මම නවතින හරි තැන ඇවිත් නෑ සුචී. මම යනවා... පුළුවන් විට මම කෝල් කරන්නම්..."

මම ඇයට සමු දී මගේ අලුත් ගමනට පිටත් වීමි. මේ වන විට කාර්යාල කීපයකට මා මාරු කරන ලදී. එසේ කිරීමට අඩු වැඩි වශයෙන් වෙනස් වුවද හේතුව එකමය! දිවිහිමියෙන් රැකි කරදිය කඩිතිය...

ෂෂෂෂෂෂ

## කෙටි කතා ( රාජ්‍ය සේවයේ නියුතු )

**කුසලතා ස්ථානය**
එච්.ඒ.පතිරණ
බප/ජය/තලාහේන ම.වි.



### <u>නිලමේ (ඇඳුම)</u>

මුන්ට මේ මගුල හදන්න වෙන තැනක් තිබුණෙ නැද්ද මංද....

රංවලතැන්න මහවලව්ව ඉදිරිපිට ඉඩමේ ඉදිවන මන්දිරය ඉදිවූයේ රංවලතැන්න නිලමේගේ දෑස් පියන් මතය. ඔහු ඒදෙස බලන්නට දෑස් විවර කළේ  ඒතරම් බරක් දරා සිටින තරමේ අසීරුවෙනි. ඒ මහ මැදුරේ බැඳෙන ගඩොලක් ගානේ තමා දෙස එක එල්ලේ බලා සිටිනා නෙත් දෙකකි. ඒවා රත්වූ යවටින් පිට කරන ගින්දර බඳු කෝපාග්නියකින් දැල්විණි.

අඳුරු මතකයන් හමුවේ ඔහු සිය සිත අස්වසා ගත්තේ තම ප්‍රතාපවත් පෙනුම අභිමානය සිහියට නගා ගනිමිනි. කුල මානයෙන් ඔද වැඩුණු වෛවර්ණයෙන් අලංකාර වූ ඉහළම ගණයේ මුල් ඇඳුමකින් සැරසුණු තමා පෙරහැරේ ගමන් ගන්නේ දුගී රට වැසියා මැදින් ගමන් ගන්නා අභිමානවත් නිරිඳෙකු සේය. තම ප්‍රතාපවත් සිරුරටත් කුලාභිමානයෙන් දැමුණු සිතටත් ගැළපෙනම ඇඳුම මුල් ඇඳුම වන බව නිලමේ සිහිපත් කළේ කුලගර්වයෙන් මාන්නක්කාර වූ මඳ සිනාවකින් ද යුතුවය. මුල් ඇඳුම ඇඳීමේ වරය කුලවතුන්ට පමණක් අයිතිවන ලෙස නීති පැනවීම රජයේ වගකීමකියි ඔහුට හැඟිණි. ඒ මුල් ඇඳුම

විලාසිතාවක් වනවා දැකීම ඔහු තරයේ ප්‍රතික්ෂේප කළ නිසාය. සඳලුතලයේ හාන්සි වී සිටි හාන්සි පුටුව සිරුරේ බරට ද වඩා සිය දහස් ගුණයකින් වැඩි ඔහුගේ කුලගර්වයෙන් පිරී ගිය හිස් ගෙඩියෙහි බර දරාගැනීමට නොහැකිව චිරි බිරි ගෑවා මිස නැතිනම් එය තවත් පරම්පරා දෙක තුනක රන්වලතැන්නලා දරා ගැනීමට තරම් සවි ශක්තියෙන් යුතු වූවකි.

යළිත් තමා හමුවේ අර කරදරකාර දෑස්ය, නිලමේගේ සිත එහි අයිතිකාරයා හඹාගෙන අතීතයට ගමන් කළේය.
ඒයි ඔහොම නැවතියන්...
මොනාද තෝ මාව දැකල හංගගත්තේ
කොලුවා දෑත් පිටුපසට කර යමක් සඟවාගෙන සිටියේය
ගනින් ඕක මෙහාට උඹ හොරකම් කළා නේද
නිලමේ ගිගිරුවේය.
නෑ මේ පොතක්
පොතක් උඹ හොරකම් කළා නේද පුංචි හාමුගෙන්
කියපිය ...කෝ කතා කරපිය.
පුංචි හාමුයි දුන්නේ හාමු මහත්තයා.
මගෙන් මැරුම් නොකා තෝ ඔය පොත දීල පල

කිසිවක් කතා නොකළ කොලුවා රත්වූ යකඩයක් සේ ගිනියම් වූ ඇසින් නිලමේ දෙස බලා සිට පොත ඔහුගේ දෙපා මුලට වීසි කර පසුනොබලා වලව් වත්තෙන් පිටතට දිව ගියේය. නිලමේ වික්ෂිප්තව මොහතකට ගල් ගැසුණි. තම හතර මායිමේ තබා අහල ගම් හතකවත් තමාගේ ඇස් දෙස කෙළින් බලා කතා කරන්නට සමත් කිසිවෙක් මින් පෙර තමාට හමුවී නැත. එහෙත් මේ කජුකිරි කොල්ලා තමා දෙස අභියෝගාත්මකව හෙළූ බැල්ම දරා ගත නොහැකි නිලමේ මොහොතක් අසාමාන්‍ය නිහඬතාවක් ඉසිලූ මුහුද කල්වේලා ගෙන චණ්ඩ වූවාක් සේ රංකිරා අමතා ගුගුරන්නට විය.

රංකිරා............රංකිරා................වරෙන් මෙහාට බල්ලො.......

රංකිරාගේ කකුල් දෙක ඇසිපියට වඩා වේගයෙන් නිලමේ අසලය. රංකිරාගේ හත්මුතු පරම්පරාවම රන්වල තැන්නලාගේ කැඳවුම් හඬට යන්ත්‍රානුසාරයෙන් මෙසේ දිවගිය උන්ය.

උඹේ නොසණ්ඩාලයා මගෙ අතින් මැරුම් කන දවස බොහොම ළගයි රංකිරෝ.....නිලමේ ගුගුළේය.

අනේ හාන්දුරුවනෙ මගෙ එකාගෙ නොදන්න කමට කමා කරන්න හාන්දුරුවනෙ... මං උෟට දඬුවම් කරන්නන් හාන්දුරුවනේ

එම බයාදු යැදීමේ රිද්මයෙහි වූ පාරම්පරික වලව් භක්තියේ නාද මාලාවට නිලමේගේ කුප්පවනු ලැබූ සිත මඳක් සංසිඳූවන්නට හැකි විය.

ඒ කෙසේ වෙතත් එදිනින් පසු රංකිරාගේ කොලුවා යළි කිසිදු දිනක වලව්වේ හතරමායිමේදී තමාට මුණ නොගැසුණු අයුරැත් ඒ නිසාම තමා ඒ පිළිබඳව රංකිරාගෙන් විමසූ අවස්ථාවේ ඔහු දුන් පිළිතුරත් නිලමේට සිහිපත් විය.

ඈ රංකිරා කෝ උඹේ කොලුවා....දැන් මාස ගාණකින් මං දැක්කෙ නෑනෙ...

උෟව අපේ නංගිලෑ ගෙදර ගිහින් දැම්ම අපේ හාමුදුරුවනේ...

රංකිරාගේ හිස මේ රංවලතැන්න වලව්වේදීම කොයි මොහොතේ හෝ කඳෙන් වෙන්වී යනු ඇතැයි සිතෙන තරමට කතා බහේදි ඔහු හිස ඇල කරයි.

ඈ රංකිරෝ උඹ හිතුව නේද මං උඹේ කොලුව මගෙ අතින් මැරුම් කයි කියල. ඒකෙන උඹ උෟව ගමෙන් පිට කළේ....

නිලමේ මහ හඬින් සිනාසෙද්දී ද ඔහුට සිහිපත් වූයේ ද අර කෝපාග්නියෙන් දැවෙන රත්වූ නෙත් යුවළයි.

අපොයි නෑ හාන්දුරුවනෙ අපේ හත්මුතු පරම්පරාව කුස පුරෝගත්තු මේ වලව්වෙ උත්තමයො නිසා..එහෙව් එකේ උඟ කළ වරදට උඟට හරිහමන් දඬුවමක් නොදුන්නොත් මං මහ ගුණමකු එකෙක් වෙනවනෙ අපේ හාන්දුරුවනේ රංකිරා කියවන්නට වූවේය.

රංකිරා එසේ වුව ද කොලුවා එසේ නොවීය.තරුණ වියට එළඹෙමින් සිටි කොලුවා ඉඳහිට ගමට පැමිණෙන අවස්ථාවක ඔය රංවලතැන්නෙව මං ළඟ දණ ගස්සනවා යැයි කටමැත දොඩා නිලමේට දැනගන්නට ලැබුණු අවස්ථාවක අනපේක්ෂිත ලෙස පුපුරා ගිය ගිනි කන්දක් මෙන් කෝපයෙන් දැවුණු නිලමේ ගේ හිත සංසිඳුණේ රංකිරාගේ අතිශය බැගෑපත් වචනවලිනි.

අතීත මතක පිටුවලට වඩා බර වර්තමානය යළිත් නෙත් මානයේය. කලින්ට වඩා නෙත් වෙහෙසට පත් කරන තමාගේ උපැස් යුවළ මාරු කර ගත යුතුයැයි නිලමේට සිතුණි. ඒ තරමට ගෙයි ඉදිරිපස දෙස බැලීම මේ ඉදිවන ගොඩනැගිල්ල නිසා අසීරු එකක් බවට පත්ව ඇත.

සිය සිත වෙහෙසට පත්වන සෑම විටම නිලමේ ඇඳුමින් සැරසුණු තමාගේ ගාම්භීර විලාසය සිහිපත් කරමින් තමා අස්වසා ගන්නට වෑයම් කිරීම නිලමේගේ පුරුද්දක් බවට පත්ව තිබුණි.මේ ගොඩනැගිල්ල ඉදිරියේ නිලමේ ඇඳුමින් සැරසුණු තමා සිටගත්තේ නම් තමාගේ ප්‍රතාපවත්බවේ රැස් දහරින් මෙය වසා ගිල ගනු ඇතැයි සිතූ නිලමෙගේ සිත අඳුරු සිතුවිලි මකා දමමින් උද්දාමයට පත් විය.

ලොකු හාමු තේක .....

ගුණපාලගේ ඇමතීම් රංකිරාගේ තරම් හෘදයංගම නැත.

තියල පලයන්..

රංකිරා වලව්ව අතහැර ගොස් පස් අවුරුද්දකට වඩා වැඩිය.

රන්වලතැන්න හාමුගේ ආනුභාවයෙන් ගම් රටවල් පවා අහිමි වූ රංකිරාගේ කොලුවාගේ මතුවීම සිදුවූයේ කෙමෙන් වැඩී අතු ඉති දලු ලන පැළයක් ලෙස නොව පොළෝ කුහරය තුළ මහ පොළව බදා වැළඳ වැඩෙමින් සිට හදිසියේ මහ රූස්ස ගසක්ව පොළෝ පළාගෙන ආ  සාරවත් වෘක්ෂයක් ලෙසය. ගසෙහි පැළ කාලය මුල් ඇදීම රන්වලතැන්න හාමුගෙන් හිතමතාම සැඟවූවා ද ඉබේම සැඟව ගියාදැයි පැහැදිලි නැති මුත් ඒ නැඟී සිටීම හමුවේ රන්වලතැන්න මහ වලව්වේ නිලමේ මහත් සේ විපිළිසර විය.

අපේ හාන්දුරුවනේ අපේ කොලුවට ඌ ඉගෙන ගත්ත විස්ස විජ්ජාලෙම රස්සාවක් ලැබිල.ලබන මාසෙ දිහාට මටත් එන්නයි කියනවා ඌත් එක්ක එහෙ යන්න. අනේ අපේ පරම්පරාවට පිටු පානව හෙම  නෙවෙයි අපේ හාමුදුරුවනේ ...හරියට හයිය හත්තියකුත් නැතිව මෙතන වැටිල ඉන්න එක ඔය උත්තමයටත් බරක් නෙව. අපේ අත්තල මුත්තලගේ ඉදන් කාපු බීපු මේ මහ වලව්ව දාල යන්න හිත හදා ගත්තෙ පුළුවන් කමකට නෙවෙයි අපේ හාන්දුරුවනේ.......කොලුගේ වචනෙට පිටුපාන්න බැරිකමටයි..

රන්කිරාගේ කියවිල්ල එදා  විලාපයක් බඳු විය. ප්‍රතාපවත්  මහ නිලමේ විලාප නොදුන්න ද බෝතලයක දමා තමාගේ ඇස් මායිමේ තියා ගත යුතු සර්ප පැටියා ඈත කැලෑවටකට අතහැර දමා බලා සිට තමා කර ඇත්තේ අනුවණකමකැයි නිලමේට හැඟුණි. අද ඌ කුඩු කළ නොහැකි තරම් උසින් කදින් බඩින් වැඩි මහත්ව ඇත්තේය.

අප්පච්චි ...මං කලම්බො යනවා අද..මගෙ අලුත් බිස්නස් එකේ පොඩි වැඩ වගේකට....ඒ නිලමේගේ එකම පුතු අකිල රන්වලතැන්නය.

හරි පුතා පරිස්සමින් ගිහින් එන්න. පුතා කිව්වෙත් නැනෙ අලුත් බිස්නස් එක ගැන තාම හරි විස්තරයක් මට....

බටහිර රටක උසස් අධ්‍යාපන කටයුතු හමාර කර ලංකාවට පැමිණ නව ව්‍යාපාර කිහිපයක්ම ඉතා සාර්ථකව පවත්වාගෙන යන අකිල රංවලතැන්න නමැති නිදහස්කාමී තරුණයා මදක් පැකිලෙන බවක් පෙනුණි.

මං ඒක වෙලාවක් අරන් අප්පච්චිට පැහැදිලි කරල දෙන්නම්කො....

පාරෙන් එහා පැත්තේ වලව්වට මුහුණ ලා ඉදිකිරීම් කටයුතු කෙරෙන ගොඩනැගිල්ල දෙසින් මහා යන්ත්‍රයක් ක්‍රියාත්මක වන හඬ එක්වරම ඇසුණි.

මුන්ගේ මළ කරච්චලේ ඉවරයක් නෑ...අනේ ඇත්තටම මේ නැන්දත් කරපු අපරාධයක් පුතා...හත්මුතු පරම්පරාවක ඉඩම් මං රටේ නැති ටිකට මේකි විකුණුවනේ ...මං හිටියනම් කීයටවත් මේ අපරාදෙ වෙන්න දෙන්නෑ..

මේ ඉඩම් විකිණීමේ ආරවුල නිසාම දැන් තමාගේ මුහුණ නොබලන තම නැගණිය හදිසියේ වූ අසනීප තත්ත්වය නිසා තමාට කිරීමට සිදුවූ වකුගඩු බද්ධ කිරීමේ ශෛල්‍ය කර්මයට ඉන්දියාව බලා ගිය තමා නැවත පැමිණෙන්නට සිදුවූ ප්‍රමාදයෙන් ඉක්මන් වූ නැගණිය පවත්වා ඇත්තේ පරම්පරාවේ මළගමයැයි ඔහු හිතින් ශාප කළේය.

මං නම් හිතන්නෑ නැන්ද වරදක් කළා කියල අප්පච්චි...නැන්දලට තිබුණු ප්‍රශ්නවලින් ගොඩක් විසඳගත්තනෙ ඔය ඉඩම් විකුණලා..අනික නැන්දල පටන් ගත්තු බිස්නස් උණත් හොඳට

ඩිවලොප් කරල ගන්න පුළුවන් ඒවා  අප්පච්චි.....ඒ අකිලගේ හඬය....

සුබ කටයුත්තක් සඳහා නිවසින් පිට දුර බැහැරට යාමට සැරෙසන මොහුගේ හිත නොරිදිය යුතුයැයි සිතූ නිලමේ  හා හා ඒ ගැන පස්සෙ කතා කරන්න බැරියැ දැන් ඉතිං යන්න හදපු ගමන ගිහින් එන්නකො පුතා....යැයි කීවේ සිත තුළ උපන් නොරිස්සුම ආයාසයෙන් සඟවා ගනිමිනි...

ගිහිං එන්නම් අප්පච්චි.... මේ අරෝහ පරිණාහ දේහදාරී තරුණයා ද තමා තරම්ම ප්‍රතාපතවත්යැයි නිලමේට හැඟුණි. ඔහු ඔහුට ද සිතින් නිලමේ ඇඳුම අන්දවා බැලීය.අකිලගේ කඩවසම් තරුණ සිරුර එම අභිමානවත් ඇඳුමින් ඔද තෙද වැඩෙන ආකාරය සිතින් විදිමින් හේ ප්‍රමෝදයට පත් විය. බිය වන්නට කිසිදු කාරණාවක් නැත රක්ත වර්ණ ඇස් යුගළයට දවා හළු කළ නොහැකි තරම් තම පුත්‍රයා බලසම්පන්නය .ඒ නිසා රන්වලතැන්න වලව්වේ අනාගත සුරක්ෂිතභාවය පිළිබඳ තවත් සහතික උවමනා නැති බව සිහිපත් කරමින් නිලමේ තම හිත අස්වසා ගත්තේය.

එහෙත් සිදු නොවිය යුතු බොහෝ දේ සිදුවී ඇති බව ද සිදුවෙමින් පවතින බව ද සිහිපත් කළ ඔහු තුළ වූයේ මඳ කනගාටුවකි. ශෛල්‍යකර්මයෙන් අනතුරුව ලංකාවට පැමිණ වලව්වේ කෙළවර ඒ.සී කාමරයක මාස හත අටක් සියල්ලන්ගෙන් වෙන්ව සිට එළියට ආ පළමු දිනයේම තමා අත්දුටු ඒ අම්හිරි අත්විඳීම නිලමේ සිහිපත් කළේ කම්පාවෙනි.
ආ ගුණපාල මොකක්ද බං අර...
ඔය අර අපේ මැණිකෙ විකුණපු ඉඩමනේ ලොකු හාමු ....ලැන්ඩ් සේල් කාරෙයක් අරන් කැලිකඩල විකුණුව ....ඒ ඉඩම් කැලි ඔක්කොම ලොකු හාමු...

ඒ නංගිගේ ඉඩම් බව උඹ මට කියන්න ඕනද බං ...මං අහන්නෙ අර වලව්වට මූණ දාලා බංගලාවක් ගහන එකා කවුද කියල.. ඔතන ඔය ඉඩම් කෑලි දෙකම අරන් තියෙන්නෙ ඒ මහත්තයා..අර මෙහ වැඩ කරපු රංකිරා මාමගෙ පුතා කියල තමයි කියන්නෙ..ඒත් ඒ මහත්තයා ඔතෙන්ට වැඩිය යනව එනවා මං දැකල නෑ....

මොකක්.....

තමා ඇසූයේ එම වචනය පමණක්ම බව නිලමේට මතකය. හිස පිටුපසට එක් වනම එල්ල වූ පොලු පහරකින් නිලංකාරව ගිය දෑස පැහැදිලිව පෙනෙන්නට පටන් ගන්නා විට මුලින්ම දුටුවේ අර රක්ත වර්ණ ඇස් දෙකය. ඉන්දියාවේදී තමා මිය ගියා නම් මීට වඩා හොඳ යැයි ඔහුට සිතුණි.

උඹ හිතාගෙන ඇති උඹ දිනුවා කියල නොසණ්ඩාලයා

ඇහැට පෙනෙන්ට නොඑන සතුරකු සමග සටන් කරමින් තමා මේ හෙම්බත් වන්නේ ඇයි? තවමත් තමා ඉදිරියේ වචනයකින්වත් අභියෝග නොකළ ඔහු සටන් වදින්නට තරම් කෙනෙක්ද? වසර ගණනාවක් තිස්සේ කජුකිරි කොල්ලෙක් හා හිතින් ඔට්ටුවන නිලමේ තමා කොතරම් අඥානයෙක්දැයි විටෙක සිතන්නේය.

අතීත අඳුරෙහි ගිලී සිටි නිලමේ ඇතින් වලව්වත්තට ඇතුළු වූ වාහනයක හඬින් යළි අවදිවිය. අලුතින් හදන ගොඩනැගිල්ල පියාපත් යුගලක් කොට ගනිමින් කුඩා කුරුලු බඳක් සේ එම ගොඩනැගිල් හරි මැදින් වෙන්කර ඇඳි රේඛාවක් සේ ඈතට දිස්වන මාවත දිගේ තිතක්ව කෙමෙන් විශාල වෙමින් ආ අධි සුඛෝපභෝගී දැවැන්ත මෝටර් රථයක් වලව්වේ පෝටිකෝව ආක්‍රමණය කළේය. නිලමේ සඳලුතලයෙන් බිමට බැස්සේ මෝටර් රථයේ දූත ලක්ෂණ අනුව තමා හමුවීමට කිසියම් ප්‍රභූවරයෙක් පැමිණෙමින් සිටින බව ඉඳුරාම දත් නිසාය.

මඳ සිනාවකින් මුව සරසා ගෙන නිලමේ ඉදිරියට ගියේ අතට අත දී එන තැනැත්තා සාදරයෙන් පිළිගැනීමේ අපේක්ෂාවෙනි. පරිසරය ද ගූඪය නිහඬය ඉදිරි අසුනින් බැස ගත්තේ සිංහයෙකුගෙන් කුළියට ගත් මාළිගාවකින් එළියට එන කුරා කුහුඹුකුවන් රංකිරාය.තමා මෙතෙක් සිටගෙන සිටි සඳලුතලය දැන් තමාගේ හිස මත ඉඳුරාම සිටගෙන සිටින බව නිලමේට දැනුණි. රථයෙන් බැස නිලමේගේ දෙපා මත වැටුණු රංකිරාගෙ හඬ එදා තරමටම නැතත් අදට ද වැඩි වෙනසක් නොවීය.

අනේ හාන්දුරුවනේ හාන්දුරුවන්ට දැන් හොඳටම සනීපයි නේද

පිටපත කටපාඩම් නොකළ නළුවකු සේ දෙබස් හොයමින් සිටි නිලමේ ඊට පිළිතුරු නොදුන්නේය.

මොකෝ රංකිරා මේ පැත්තෙ...කාලෙකින්....

තවමත් රියදුරු අසුනේ සිටින තැනැත්තා රන්වලතැන්න වලව්වත්තට පය නොතිබ්බේය. රංකිරා බිමට බහින ලෙස ඔහුට හිසින් සං කළ විට රථයෙන් බිමට බට තරුණයා නැවත රංකිරාගේ අණින් නිලමේගේ දෙපා දෙසට පහත්ව වැන්දේය.

මෙය සිහිනයකි. තමා ඉදිරිපිට මේ වැඳ වැටෙන්නේ තමා මෙතෙක් කල් මනසින් සටන් වැදි ප්‍රතිමල්ලවයාය. ඉදිරියේ වූ දැවැන්ත මන්දිරයේ මේ අධි සුඛෝපභෝගී රථයේ හිමිකරුවාය. ද්වේශය වෙනුවට කුලමාන්නයෙන් හිත පිරී ගිය නිලමේ රංකිරා දෙස පමණක් බැලීමට ප්‍රවේශම් විය.

අපේ පුතා ලබන මාසේ කසාද බඳිනවා හාන්දුරුවනේ ...අපේ අත්තල මුත්තලෑ ඉදන් කාල වැටිල හිටිය තැන් මේවා..හාන්දුරුවන්ට පුළුවන්නම් එදාට ගොඩවෙලා යන්න එන්න අපේ හාන්දුරුවනේ...

බලමු ....

තරුණයා තවමත් හිස ඔසවා බැලුවේ නැත. බිමට නැඹුරුකරගත් නෙත්වලින් රන්වලතැන්න වලව්වත්තේ මහ පොළව සිප ගන්නේ තම කුල ගර්වයත් බල පරාක්‍රමයත් හමුවේ පරාජිත වූ ඔහුගේ නොහික්මුණු හිතුවක්කාරි හැඟීම් යැයි නිලමේ අමන්දානන්දයට පත්විය. තමා මෙතෙක් කල් අනියත බියකින් සටන් කොට ඇත්තේ තමා දෙස කෙලින් බැලීමට තරම්වත් පෞරුෂත්වයක් නොමැති පඟර නැට්ටෙක් ගැනය. පෝටිකෝව යට සිටම මංගල්‍යයේ විස්තර කියා ඊට ආරාධනා කිරීමෙන් අනතුරුව ඔවුන් පිටත්ව යන දෙස බලා සිටි නිලමේට පෙනුණේ තටු හකුළා ගත් කුරුල්ලෙක් බඳු වූ පෙර තරම් සුවිශාලව නොපෙනෙන ගොඩනැගිල්ල මැදින් සිරුර තුළම තම හිස සඟවා ගැනීමට වෑයම් කරන කුරුල්ලෙකුගේ කුරුලු බඳකි.

මුහන්දිරම් වලව්වේ වහලයෙන් වතුර වැටෙන බවට ගම්පෙරළියෙහි ලියූ මාර්ටින් වික්‍රමසිංහයන්ට හිතින් බැණ වැදුණු නිලමේ මේ සා වටිනාකමක් ඇති කුල ගර්වයට හානි පමුණුවන එවැනි කෘතීන් තහනම් කළ යුතු බවට සිතමින් රක්ත වර්ණ වූ දෑස් වෙනුවට බිමට නැඹුරු වූ තරුණයාගේ දෑස් තම සිත්හි සටහන් කරගනිද්දී කලක සිට පැවති භූත දෝෂයක් සංසිඳුණු ආතුරයෙකුගේ වන් සැනසිලිදායක බවක් ඔහුගේ මුහුණෙහි දක්නට ලැබිණි.

යම්දෝ නොයම්දෝයි සිතමින් සිටි නිලමේ සුපිරි හෝටලයක පැවති මංගල්‍යය සඳහා සූදානම් වූයේ තමා මෙතෙක් ගිය ඉහළම ප්‍රභූ මංගල්‍යයට සහභාගී වූ ඇඳුම් කට්ටලයෙන් සැරසෙමිනි. ආගන්තුක නිහැඬියාවකින් යුතු පරිසරය කුමක්දෝ ගූඪ බවකින් යුක්ත විය.

අකිල හදිසි ව්‍යාපාර කටයුත්තක් සඳහා සති කිහිපයකට විදේශ ගතවී සිටි අතර රියදුරා සමග තමා සතු හොඳම වාහනෙයන් සුපිරි හෝටලය වෙත ළඟා වන විටත් විවාහයට අත්සන් තැබීම

සඳහා පැමිණි අගමැතිතුමන්ගේ හා විපක්ෂ නායකතුමන්ගේ රැකවළුන් දැක හේ තරමක් පුදුමයට පත් විය. පුවක් ගස් නිකන් නිස්කාරණේ උස ගිය ද පොළව බදා වැළඳගත් මහ නුග රුකක් තරම් ව්‍යසනයන්ට ඔරොත්තු නොදෙයි.

රන්වලතැන්න වලව්වේ රාජකරුණා රාජපක්ෂ සෙනෙවිරත්න විජේකෝන මුදියන්සේලාගේ අකිල රන්වලතැන්න යනු රන්වලතැන්න වලව්වේ අනාගතයයි. නිලමේ ඇඳුමින් සැරසුණු ප්‍රතාපවත් අකිල රන්වලතැන්නගේ  අනාගත මංගල්‍යය  ඔහු සිතින් මවා ගත්තේය. ඔහු  හා සටන් වැදීමට තරම් රංකිරාගේ පඟර නැට්ටාට අක්මුල් නොමැති බව සිහිපත් කරමින් නිලමේ තමන් අස්වසා ගත්තේය.

ශාලාවට ඇතුළුවන දොරටවු අසල මොනරාගේ ඇඳුම කුලියට ඉල්ලා ගත් පොල්කිච්චෙකු සේ යුරෝපා ඇඳුම් කට්ටලයකින් සැරසුණු රංකිරා මඳක් ඉදිරියට විත් පහත් හඬින් යං අපේ හාන්දුරුවනේ ඇතුළට යයි කීය. ශාලාවට ගොස් අසුන්ගෙන තම ප්‍රතිමල්ලව මනාල මහතා ශාලාවේ එකොන මෙකොන බලමින් සෙවුව ද දහස් ගණනක් වූ ප්‍රභූන් අතර ඔහු පෙනෙන්නට සිටියේ නැත. ඈත සිට තමා කරා පැමිණෙමින් සිටි රංකිරා අත වූ ජංගම දුරකථනයට පැමිණි කිසියම් ඇමතුමක්  මනාල මහතා වෙත ලබා දෙන ලෙස කියා කිසිවෙක් අතට දුරකථනය පැවරූ රංකිරා හදිසියේ යෙදුණු වෙනත් වැඩකට යොමුවනු දක්නට ලැබුණි.

හාමු මහත්තයා.......තමා පිටුපසින් ඇසුණු ඒ ආගන්තුක හඬට නිලමේ පිටුපස හැරී බැලීය. දුරකථනයක් අතැතිව සිටි තරුණයෙකි. හේ ප්‍රතිමල්ලව මනාලයාය. කුලහීනයා තම පරම්පරාවට අනන්‍ය වූ මාහැඟි නිලමේ ඇඳුමින් සැරසී ප්‍රතාපතවත්ව සිටියේය.

මිස්ට අකිල තමයි දැන් කෝල කළේ ලංකාවේ නැති නිසා  මට විෂ් කරන්න. මං මේ ඇඳුම් හදාගත්තෙත් අකිල අලුතින්ම පටන් ගත්තු රන්වලතැන්න අභිෂේක මණ්ඩපයෙන්  සතුටුයි ඔබතුමා ආවට.....

ඔහුගේ ජයග්‍රාහී  ඇස් සෘජුවම නිලමේගේ ඇස පැහැර ගනිද්දී නිලමේ හිඳ සිටි පුටුව තදින් අල්ලාගෙන දෙඇස් බිමට නැඹුරු කර ගත්තේය.

## කෙටි කතා ( රාජ්‍ය සේවයේ නියුතු )

**කුසලතා ස්ථානය**
ඩබ්.ආර්.ඩී.කුමාරි
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය,
කොළඹ



### රඟමඬල

තුන්වෙනි සීනුව නාද වී ප්‍රේක්ෂකාගාරය සෙමෙන් අඳුරුවත් ම නන්දදේව නේපත්‍යාගාරයෙන් පිටවුණේ ය. ඔහු රඟහල් භූමිය සෙවණ කළ විසල් අඹ ගස යට වූ සිමෙන්ති බංකුවේ අසුන් ගත්තේ දුම්වැටියක් තොලග රඳවා ගනිමිනි. පෙරදී මෙන් නාට්‍යය අවසන් වනතුරු ප්‍රේක්ෂකාගාරයේ අසුනකට වී එය නැරඹීමට හෝ වේදිකාව පසුපසට වී පෙළ අසා සිටීමට හෝ දැන් ඔහුට ආසාවක් නැත.

මේ ඔහුගේ "එරන්දතී" නාට්‍යයේ නව නිෂ්පාදනයයි. මෙයට වසර විස්සකට විසිපහකට පමණ පෙර අර්ධ ශෛලිගත නාට්‍යයක් ලෙස ප්‍රවීණ මෙන්ම නවක නළු නිළි කැලක් ද සමග මුලින් ම වේදිකාගත වූ එය නගර ගම් දනව් පුරා නාට්‍ය ශාලා අතුරු සිදුරු නැතිව ප්‍රේක්ෂකයින්ගෙන් පිරවීමට සමත් වූයේ එම වසරේ රාජ්‍ය නාට්‍ය උළෙලේ ප්‍රමුඛත ම සම්මාන කිහිපයක් ද හිමිකර ගනිමිනි. එදා මෙදාතුර නන්දදේව විසින් නිෂ්පාදනය කළ සියලු ම වේදිකා නාට්‍ය අභිබවා අදටත් වඩාත් කතාබහට ලක්වෙන නාට්‍යය එරන්දතියයි. වෙනත් වෙනත් නළු කැල සමගින් නැවත නැවත එය නිෂ්පාදනය වන්නට හේතු වූ ප්‍රධානම කරුණ එයයි. නන්දදේවට ද හැඟුණේ තමන්ගේ කුටප්‍රාප්තිය එරන්දතිය බව ය. එරන්දතියට පසු ඔහු විසින්

නිපදවූ කිසිදු නාට්‍යයකට එහි සාර්ථකත්වය අසළටවත් ළං වීමට නොහැකි විය.

එහෙත් දැන් දැන් ඔහුට ඒ පිළිබඳව වුව ද දැනෙන්නේ උදාසීන හැඟීමකි. එරන්දතිය තුළ තිබූ ජීව ගුණය කෙමෙන් වියැකෙමින් යන අයුරු ඔහුට දැනෙන්නට වී ඇත්තේ කාලයක සිට ය. එදා මෙන් නොව අද නළු නිළියන්ගේ කැපවීම බෙහෙවින් ම අල්ප ය. ඔවුන් වේදිකාවට ගොඩවන්නේ මෙගා නාට්‍යයක හෝ චිත්‍රපටයක සුළු හෝ කොටසක් ලැබෙනතුරු කාලය ගෙවා ගන්නට ය. එවැන්නක් ලැබුණු පසු ඔවුන් නාට්‍යයට කැඳවා ගැනීම අසීරු කරුණකි. එවිට තවත් අලුත් මුහුණු සොයන්නට සිදුවේ. නන්දදේවට තවදුරටත් එවැනි කරදරවලට ඔරොත්තු දීමට හැකියාවක් හෝ කැමැත්තක් නොවී ය. අවසන අරවින්ද ඔහුගේ සියලු නාට්‍ය නව නිෂ්පාදන ලෙස කරළියට ගෙන ඒම කැමැත්තෙන් ම බාරගත්තේ නන්දදේවගෙන් ඉල්ලීමක් ද කරමිනි.

"පුළුවන් හැමවෙලේම සර් හැම ෂෝ එකකටම එන්න. අනිත් සේරම වැඩ මම බලාගන්නම්" අරවින්ද සියලු දේ ම මනාව කළමනාකරණය කරගනී. නන්දදේවට ගෙවිය යුතු ගාස්තු ද අඩු නැතිව ම ගෙවයි. අලුත් තාලයට ගැළපෙන තරුණයෙකි. අලෙවිකරණය හා ප්‍රවර්ධනය පිළිබඳ හොඳ ඉවක් ද ඇත. නන්දදේවට දැනෙන්නේ සැහැල්ලුවකි. අරවින්දට තරම් ගැටලුවලට සාර්ථකව මුහුණ දීමේ ඉවසීම නන්දදේවට නැත. අද දර්ශනය පටන් ගන්නට පෙර සිදු වූ දේ එයට හොඳ නිදසුනකි. නාට්‍යයේ උප ප්‍රධාන චරිතයක් වූ එරන්දතියගේ සේවිකාව, පුන්නා ලෙස රඟපාන නවක නිළිය පණිවිඩයක් නොතබා ම නැවිත් සිටියා ය. ඇගේ ජංගම දුරකතනය ද නිහඬ ය. අවසන් මොහොත වනතුරුත් ඇය එනතුරු බලා සිටි අරවින්ද තවත් සුළු චරිතයක් රඟපෑ නිළියකට පුන්නාගේ රංග වස්ත්‍ර ලබාදුන්නේ ය.

"විනාඩි පහයි ලෑස්ති වෙන්න දෙන්නෙ. හරියට කළොත් අද ඉඳන් ඔයා තමයි පුන්නා. හරි දැන් ඉක්මන් කරන්න"

නන්දදේව දුටුවේ තරුණිය සතුටින් පිනායන අයුරු ය.

"මට ඩයලොග්ස් හරියටම මතක නෑ සර්"

"ඒකට කමක් නෑ. චතුර දෙබස් මතක් කරනවා, ඒ ගැන පොඩ්ඩක් අවධානෙ යොමු කරන්න. නිරංජලාත් ඔයාට උදව් කරයි. මම එයාට කියන්නම්. ඉක්මන් කරන්න"

අරවින්ද සැහැල්ලුවෙන් ගැටලුව බාරගත් අයුරු අපූරු ය.

"මේ කෙල්ල හරියට කරයිද? පොඩි දෙයක් නෙමෙයිනෙ, ටිකක් බැරෑරුම් චරිතයක්"

"සර් බයවෙන්න එපා. මම ෂේප් කරගන්නම්. කලින් පුන්නාගෙ චරිතෙ කළේ නිරංජලානේ මම කියන්නම් එයාට උදව් කරන්න කියලා. අනික එයාගෙ කැරැක්ටර් එක වැටෙනවා පුන්නා හරියට නොකළොත්. ගෑනි එහෙම වෙන්න දෙන්නෙ නෑ කීයටවත්. ඒක මට හොඳටම ෂුවර්. අවුලක් වෙන්නෑ සර්" අරවින්ද පැවසුවේ සිනාසෙමිනි.

"අර ළමයට මොකද වෙලා තියෙන්නෙ? මුකුත් ප්‍රශ්නයක්ද?"

"කවුද සර්? එරන්දතී ද?" අහඹු ලෙස එරන්දතී නාට්‍යයේ පුන්නාගේ චරිතය රඟපෑ අලුත් නිළියගේ නම ද එරන්දතී විය.

නන්දදේව කිසිත් නොකියා හිස වැනී ය.

"කවුරු දන්නවද සර් වගකීමක් නැති නිළියො. ෆෝන් එකත් ඕෆ් කරගෙන. මොකක් හරි බොරුවක් කියාගෙන පස්සෙ කතා කරයි. සර්, දෙවෙනි සීනුවත් වැදුණා. මම යන්නද අර පැත්තට?" කියමින් අරවින්ද වෙන්ව ගියේ ය.

විනාඩි කීපයකට කලින් සිදුවූ දේ ගැන සිතමින් සිටි නන්දදේවගේ සිත නොදැනීම ඇදී ගියේ දුර ඈත අතීතයට ය. ඔහුගේ ස්වර්ණමය යුගයට ය. එරන්දතිය මුදුනින්ම බැබළුණ

කාලයට ය. එය ගෙයක් දොරක්, දරුවෙක් මල්ලෙක් ගැන නොසිතුණ නොදැනුණු කාලයකි. ඔහුගේ මුළු ජීවිතය ම වූයේ නාට්‍යය, වේදිකාව ය. එදවස ද මෙවැනිම කලබැගෑනියක් සිදු විය. අරුමයකි! ඒ ද පුන්නා වෙනුවෙනි. කවුද ඒ නිළිය..... නන්දදේව සිය මතක පොත අවුස්සමින් කල්පනා කළේ ය. යසෝදරා, ක්‍රිෂ්ණජිනා, දිසාලා - ඒ වගේ කුලකයකට දැමිය හැකි නමක්, මොකක්ද ඒ, නන්දදේව නළල රැලි ගස්වමින් කල්පනා කළේ ය. සකුන්තලා නේද? ඔව්, ඒ සකුන්තලා තමයි. ඇයගේ නම සිහිවත් ම, ඇයගේ රූපකාය සිහිකර ගන්නට ඔහුට එතරම් අසීරු වූයේ නැත. නොදන්වා නොපැමිණි ඇය නිසා නන්දදේව එදින දර්ශන වාර දෙක ම අවලංගු කළේ හිතුවක්කාර ලෙස ය. අද අරවින්ද සතු වූ මනා කළමනාකරණ හැකියාව එදා ඔහු සතු වූයේ නැත. වූයේ පුපුරා හැලෙන කෝපය පමණි. ඉන්පසු කීප දිනක් ම ඇය ඔහුව මුණ ගැසෙන්නට පැමිණිය ද ඔහු ඒ සඳහා ඇයට ඉඩක් දුන්නේ නැත. ඔහු අලුත් නිළියකට පුන්නාගේ චරිතය ලබා දුන්නේ ය. මාස කීපයකට පසු කෙසේ හෝ ඇය ඔහු අබිමුවට පැමිණියේ ඔහුට මගහැර යා නොහැකි ලෙසය. විඩාපත් වතින් හුන් ඇය "මට සර්ට කතාකරන්න ඕන" යි පැවසුවේ කලහකාරී ලෙසය.

නන්දදේවට ඇය හා වූ කතාබහ හරියට ම මතකයට නඟා ගත හැකි නොවී ය. ඇය ආයාචනා කරන්නට ඇත. කඳුළු හෙලන්නට ඇත. එහෙත් අනුකම්පාවෙන් හුණුව වැගිරෙනු වෙනුවට ඔහුගේ හදවත දිය වැදී සව්වන කොන්ක්‍රීට් තට්ටුවක් මෙන් ගල් විය. "මට කරන්න දෙයක් නෑ. පරෙස්සම් වෙන්න තිබුණනෙ" යි පැවසූ ඔහු සිය පසුම්බිය දිග හැර එහිවූ නෝට්ටු කිහිපයක් එළියට ගත්තේ ය. රුපියල් පන්සීයක් වූ නෝට්ටුවලින් පනහෙ කොළ දෙකක් වෙන්කර ගත් ඔහු ඉතිරි රුපියල් හාරසියය ඇයගේ අතේ මිට මෙළවූයේ ය. සිදුවූයේ කුමක්දැයි අදහා ගන්නට නොහැකිව ඇය වික්ෂිප්ත වන්නට ඇත. ඇයගේ

දෙනෙත් දිලිසුණේ කඳුළින් ද නොඑසේ නම් වෛරයෙන් ද යැයි දැනගැනීමට ඔහුට එවෙලේ උවමනාවූයේ නැත. සර්පයෙකු ඇඟ ගැවුණා සේ ගසා දමනු වෙනුවට නෝට්ටු කොළ කිහිපය ඇයගේ සුරතේ කිටි කිටියේ ගුලි වන්නට ඇතැයි ඔහුට සිතුනේ ඒවා බිමට නොවැටුණ බැවිනි. තමා හැසිරී ඇත්තේ නරුමයෙකු ලෙස නොවේද? ඔහුට පශ්චත්තාපී හැඟීමක් ඇති විය.

වෙලාව කෙමෙන් කෙමෙන් ගතවී යයි. නාට්‍ය දර්ශනය තව සුළු වෙලාවකින් අවසන් වනු ඇතැයි නන්දදේවට සිතුණි.

"හරි වැඩේ සර්, අර ළමයට කරදරයක් වෙලා" අරවින්ද නළල අතගාමින් පැමිණ ඔහු අසල නැවතිණි.

නන්දදේව ඔහු දෙස විමසුම් බැල්මක් හෙළුවේ උනන්දුවෙන් තොරව ය.

"එරන්දතීගෙ අම්මා නැතිවෙලා, දැන් ටිකකට කලින්. ඒ ළමයාට හිටියෙ අම්මා විතරයි, සර්. නාට්‍යය ඉවර වුණා ම මම හොස්පිට්ල් එකට යනවා. ඒක අපේ යුතුකමක්නෙ නේද?" අරවින්දගේ ස්වරයේ සිහින් වේදනාවක් ගැබ්ව තිබිණි. කිසිවක් නොබිණූ නන්දදේව හිස වැනුවේ කුමක් කියන්නදැයි හරිහැටි අවබෝධයක් නැතිව ය. මෙවැනි සමාජ යුතුකම් ගැන තමාට කිසි දිනෙකත් බරට හැඟී නැති බව ඒහාම ඔහුට සිතිණි.

"සර් ආපහු යන්නෙ කොහොමද මම කැබ් එකක් කතා කරලා දෙන්නද?"

"ඕන නෑ මට යන්න පුළුවන්" එහෙත් යමක් සිහිවූවෙකු සේ "නෑ, මාත් ඔයත් එක්ක එන්නං" යි නන්දදේව පැවසුවේ අරවින්ද විස්මයට පත් කරමිනි.

රෝගීන් බලන වෙලාවට තවත් පැය භාගයක් පමණ ඇති බැවින් රෝහල පුරා වූයේ නිහඬ බවකි. ඉඳහිට හෙදියක හෝ වෙනත් සේවකයෙකු කොරිඩෝරය දිගේ ඉක්මන් ගමනින් යනු නන්දදේව බලා සිටියේ වාට්ටුවෙන් පිටත වූ දිග බංකුවේ

හිඳගෙන ය. අපිළිවෙළට ඉදි වුණ ගොඩනැගිලි අතර වූ කුඩා තණතීරු ද මල් පෝච්චි ද පරිසරයේ වූ මලානික කර්කශ බව තරමක් මෙල්ල කරන්නට සමත් වී ඇතැයි නන්දදේවට සිතුණි. එරන්දතීගේ මවගේ දේහය රෝහලෙන් පිටකර ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා ඇයත් සමග පිටව ගිය අරවින්ද තවම නැත. නන්දදේව අරමුණකින් තොරව ඔහේ බලා සිටියේ ය. තමා පැමිණියේ අනවශ්‍ය ගමනක් දැයි ඔහුට වහා සිතුණි. නැත, එය එසේ නොවේ. පාළු නවාතැනට වී සුරා බඳුනක ගිලෙනු වෙනුවට මෙසේ පැමිණීම හොඳයැයි නන්දදේවට සිතුණි.

තවත් හෝරා කාලකට පමණ පසු අරවින්ද එරන්දතී ද සමග ඇතින් පැමිණෙනු නන්දදේව දිටී ය. තරුණිය සිටියේ හකුළාගත් උරහිස් ඇතිව බිමට බර කරගත් මුහුණිනි. අරවින්ද පැමිණියේ ඇයට ගැවෙන සේ ළංව යමක් පවසමිනි.

"සර් ආපු එක ලොකු දෙයක්. හැමෝම සර් හින්දා වැඩ ටික ඉක්මනට කරලා දුන්නා" අරවින්ද, නන්දදේවට පැවසුවේ කෘතඥපූර්වකව ය. ඉන්පසු "මං ඉතුරු වැඩ ටික කරගන්නකං. ඔයා සර් එක්ක ඔතනම ඉන්න" යැයි තරුණියට පැවසූ අරවින්ද "මං අර පැත්තට ගිහිං එන්නං සර්"යි පවසා නික්ම ගියේ ය.

වාඩිවී සිටි බංකුවේ තවත් ඉඩ තිබුණ ද තරුණියට හිඳගැනීමට ඉඟියක් ලෙස නන්දදේව බංකුවේ මඳක් දුරට තල්ලු වුණේ ය. තවත් ටික වෙලාවක් සිටි පියෙන්ම සිටි ඇය ඔහු අසලින් අසුන්ගත්තේ ඉකි ගසමිනි. කරේ වූ බෑගය උකුළ මතට ගත් ඈ ඉකිය මැඩලනු වස් එහි පටිය සිය දෑතින් තදින් අඹරවන්නට වූවා ය. මඳ වෙලාවක් ගතවූ පසු ඇය සිය බිඳුණු හඬ අවදි කළා ය.

"අපේ අම්මා පව් සර්. එයා හරි අහිංසකයි. හුඟක් දුක් වින්ඳා. මට එයාට සැපක් දෙන්න බැරි වුණා"

ඇයගේ සිත සනසමින් යමක් කියන්නට තිබිණි නම් හොඳ යැයි හැඟුණ ද මෙවැනි අවස්ථාවක කුමක් කිව යුතුදැයි අදහසක් නන්දදේවට නොවී ය. ඔහුගෙන් ප්‍රතිචාරයක් නොවුණු තැන යමක් සිහි වූවාසේ සිය බෑගය හැර එතුළින් තරමක් පොඩි වූ ලියුම් කවරයක් අතට ගත් එරන්දතී එය නන්දදේව අත තැබුවා ය.

"මට සර්ගෙ නාට්‍යයෙ රඟපාන්න ලැබුණා කිව්ව ම අම්මා හුඟක් සතුටු වුණා. කොච්චර සතුටු වුණාද කියනවා නම් ටික වෙලාවක් යනකං කතා කරගන්නත් බැරි වුණා. ඇස්වල කඳුළු පිරිලා තිබුණා. අම්මත් ඒ කාලෙ නාට්‍ය වල රඟපාලා තියෙනවා. එයා මේ නාට්‍යයට හරිම ආසයි. මට එරන්දතී කියලා නම තිබ්බෙත් ඒකලු. මගෙ අනාගතේ ගැන අම්මගෙ හිතේ ලොකු බරක් තිබුණා. ඊයෙ එයා මට ඔය ලියුම දුන්නෙ සර්ගෙ අතට ම දෙන්න කියලා. මොනවද ලියුවෙ කියලා ඇහුවට කිව්වෙ නෑ. අනේ සර් වැරදි දෙයක් ලියලා තිබුණොත් අමනාප වෙන්න එපා. මගෙ අම්මා හරි අහිංසකයි" ඇයගේ කතාව නැවතුණේ අරවින්දගේ පැමිණීමෙනි.

"පොඩ්ඩක් අර පැත්තට යමු එරන්දතී. ලියකියවිලි වගයක් අස්සං කරන්න තියෙනවා. ඔයානෙ ලෙඩාගෙ බාරකාරයා"

එයට අවනත වූ ඇය නික්ම යාමට පෙරාතුව නන්දදේව දෙස හැරී බැලුවේ 'යන්නම්'යි නිහඬව පවසමිනි. ඔහු ඇයගේ මුහුණ හරියටම දුටුවේ ඒ මොහොතේ දී ය. කලින් ඇය දැක තිබුණ ද ඒ නාට්‍ය අංග රචනා හා රංග වස්ත්‍ර ද සමගිනි. එහෙත් අද ඇයව පියවි ස්වරූපයෙන් දක්නා විට ඔහුට ඇයගේ වතෙහි යම් කිසි හුරු බවක් දැනෙන්නට විය. කඳුළු හෙළීමෙන් ලා රත් පැහැයට හැරුණ දෙනෙත ද පෙඟුණු දිගැටි ඇසිපිය ද සිතට යම්කිසි මතකයක් කැඳවන බව ඔහුට දැනුණි.

ඇයට දැන් හිමිවනු ඇත්තේ කෙබඳු ඉරණමක් ද? රුවලක් නැති ඔරුවක් මෙන් ඇගේ ජීවිතය ඔහේ පාවී යන්නට ඉඩ ඇතිවා නොවේද? තමන්ගේ කියා කියන්නට කෙනෙක් නැතිව ගෙවන හුදකලා ජීවිතයේ කටුක බව ඔහු හොඳ හැටි දනියි. ඇය වෙනුවෙන් යමක් කළ හැකිනම්. ඒ ගැන අරවින්ද සමඟ කතා කළ යුතු ය.

ඔවුන් දෙදෙනා ගිය පසු ඔහු සියතේ වූ ලිපිය දෙස බැලුවේ එහි කුමක් ලියා ඇතිදැයි අඩමාන කරමිනි. කවරයේ ඔහුගේ නම සිහින් දිගැටි හැඩයේ අකුරින් ඇලයට ලියා තිබිණි. *ආචාර්ය නන්දදේව සිරිතුංග.* ඔහු අලවා තිබූ කවරය පරෙස්සමින් ඉරා දැම්මේ ය. එතුළ වූ දෙය දුටු ඔහුගේ මුව සර්පයෙකු දෂ්ට කළාක් මෙන් විරූප ව ඇඹරී ගියේ කිසිදා කඳුළක් නොහෙළූ ඔහුගේ දෙනෙත තෙත් කරමිනි.

එහි වූයේ රුපියල් සියයේ නෝට්ටු කොළ හතරකි.

## කෙටි කතා ( රාජ්‍ය සේවයේ නියුතු )



**කුසලතා ස්ථානය**
ඩී.ජී.චින්තක
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
හබරාදූව

### කොළඹ ගමන

සඳ රැස් කවුළු දොරින් හෙමින් හෙමින් ගලා එන්නට විය. මධ්‍යම රාත්‍රියත් ඉක්ම යමින් තිබුණ ද රූපවාහිනී තිරය ඔස්සේ නැරඹූ වාර්තා චිත්‍රපටයෙන් පසු හදවත තුළ දරුණු තෙරපුමක් දැනෙන්නට විය. දෙවන ලෝක යුද්ධය පාදක කරගෙන නිර්මාණය වූ ඒ වාර්තා චිත්‍රපටයේ මතු කළ කරුණු යළි යළි හදවත රිදවන අතරතුර ආවර්ජනය වෙමින් මැවී පෙනෙන්ට විය. මා තනිකම, පාළුව, හුදෙකලාව නැතිකර දමන්නට චිත්‍රපට නරඹන්නට පුරුදු වූයේ බොහෝ කාලයකට පෙර සිට ය. අවුරුදු තිහකටත් මඳක් වැඩි කාලයක් හමුදා නිලධාරියෙක් ලෙස කටයුතු කළ කාලවකවානුවම මා ගත කළේ මිනිසෙකු නොදැරිය යුතු පීඩනයක් හිස දරාගෙන ය. දෛනික ව සිදුකරන ශාරීරික ව්‍යායායමයන් නොවන්නට මීට බොහෝ කලකට පෙර මා මිය යා යුතු ව තිබූ බව මගේ අදහසයි. විරැකියා පෝලිමේ හෙම්බත් වී සිටි අපට අත දිග මානයේ පෙනෙන්නට තිබූ එක ම විකල්පය මම තෝරා ගතිමි. විශ්වවිද්‍යාල ප්‍රවේශය පසෙක ලා මම හමුදා නිල ඇඳුම ඇඟලා ගැනීම දෛවයට කළ සරදමක් වැනි ය.

" කෙල්ලෝ ගාමන්ට්, කොල්ලො හමුදාවට, බොයිලර් කුකුල්ලු වගේ ".

හමුදා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන්නට පැමිණි සිටි පෝලිම දුටු අයෙක් පැවසූ අයුරු මට තවම මතක ය. හමුදා සේවයට එක් වූ පසු මා දන්නා අවධියේ පටන් තුළ සැඟවී සිටි කවියා මරා දැම්මෙමි. අසීමිත ව මනුෂ්‍යත්වයට ආදරය කළ සාහිත්‍ය රසකාමියා මරා දැම්මෙමි. හමුදා පුහුණුව මගේ ජීවිතය උඩු යටිකුරු කළේය.

" මේක නිකං මම මාව ම මරාගෙන කනවා වගේ වැඩක් නේ".

මම පීඩනය දරාගෙන ඉන්නට නොහැකි තැන මට ම මිමිනුවෙමි. රණබිමේ අත්දැකීම් තලු මරමින් සභා මැද දොඩවන මගේ මිත්‍රයන් මැද මම මුනිවත රැක්කෙමි. එවන් සභා මැද මම සිත වෙනතක යොමු කිරීමට උත්සාහ දැරුවෙමි.

"මොන උලව්වක් ද මේ රස්සාව. ඔයි තරම් පම්පෝරි කියවන්න දෙයක්ද? හමුදා සේවය කියන්නේ ඉහළ නිලධාරියාගේ අණ, වෙඩි තියන්න කිව්වොත් වෙඩි තියන්න ඕනෑ. පෙරළා ප්‍රශ්න කරන්න බෑ. තමන්ගේ ඉදිරිපිට ඉන්න කෙනා රෝගියෙක් උණත්, අසරණයෙක් උණත්, අබ්බගාතයෙක් උණත් වෙඩි තියන්න ඕනෑ. මොකද ඌ සතුරෙක්".

මම මට ම මිමිනුවෙමි. අතෘප්තිකර රැකියාවක් තුළ අවුරුදු ගණනාවක් නියුක්ත වීම මහා පීඩනයකි. දවසින් දවස ගෙවී යද්දී මට දැනුණේ මහත් සැහැල්ලුවකි. වසර විසිදෙකක් ඇවෑමෙන් විශ්‍රාම ලැබිය හැකි බව සක්සුදක් සේ පැහැදිලි නිසා දවසින් දවස ගෙවීයාම තෘප්තිකර හැඟීමක් යටි සිතට කාන්දු කළේය. මා යෙදී සිටිනා වෘත්තිය පිළිබඳව පශ්චත්තාපීව ගෙවා දමමින් සිටි ජීවිතයට බිරිඳක්, දියණියක්, පුතණුවෙක් එක් වීමෙන් ඔවුන්ගේ ජීවිත ආලෝකවත් කිරීමට අවැසි සම්පත් සෙවීමත් අලුතින් කරමත පැටවුණු වගකීම් ගොන්නත් නිසා තව දුරටත් මේ අපහසු දුෂ්කර වෘත්තිය කරගෙන යාමට සිදුවිය. අනේකවිධ වූ දුක්පීඩාවන්ට මුහුණ දෙමින් ඇදගෙන ගිය මේ රැකියාවේ කූටප්‍රාප්තිය වූයේ ත්‍රස්තවාදය මුලින් උපුටා දැමීමේ මෙහෙයුම හෙවත් මානුෂීය මෙහෙයුම් ලෙස නම්කර යුද්ධය තව දුරටත්

අධිවේගයෙන් ඉදිරියට ගෙන යෑමයි. දෑත් දෙපා, ඇස් ඉස් මස් ලේ අහිමි ව අවසානයේ මේ කුරිරුතර යුද්ධයේ අවසානයක් දකින්නට අපට හැකි විය. ඉන් අනතුරුව අපි නිදහසේ ගිමන් හැරියෙමු. යටත් වූ එල්.ටී.ටී. ඊ ත්‍රස්තවාදීන් පුනරුත්ථාපනය කිරීමේ යම් වගකිව යුතු තනතුරක් මට ලැබුණි. යුද්ධය පිළිබඳ වෙනස් කියවීමක සිටි මම මේ වගකීම දෙස අලුත් ඇසකින් බලන්නට පුරුදු වූයෙමි. මුලින් ම මම පුනරුත්ථාපනය කරන කණ්ඩායමත් අපත් අතර ඇති දුරස්ථ බව නැතිකරන්නට උත්සාහ දැරුවෙමි. පුනරුත්ථාපනය කොතරම් සාර්ථක ද අසාර්ථතක ද යන්නට වඩා මගේ පූර්ණ අවධානය යොමුකළේ මේ බිඳුණු හදවත් සුවපත් කිරීමට ය. මම මුලින් ම ඔවුනට සවන් දුන්නෙමි. තැතිගැන්මකින් මගේ පපුව හිරිවැටී යයි. දේශපාලනය විසින් බරපතල ලෙස කඩතොලුකර තිබූ බිඳුණු හදවත් සුවපත් කිරීමේ කටයුත්ත මට හැකි අයුරින් කළ යුතු යැයි මම සිතා ගත්තෙමි. සියලු නිලතල බලතල පසෙකලා අතිශයින් මිත්‍රශිලී ව මම ඔවුන් ඇමතීමි. මම කියවූ පොත පතෙහි අත්දැකීම් ඔවුන් හා බෙදා ගතිමි. අප හැම කෙනෙක් ම ජීවන යුද්ධයට පිවිසුණු කල්හි මුහුණ දෙන්නට සිදුවන්නේ එකම ගැටලු සංකීර්ණයකට බව අවබෝධ කරවන්නට මම උත්සාහ දැරීමි. සැලකිය යුතු කාලයක් ගතව යද්දී ඔවුනගේ සිත්වලට බොහෝසේ සමීප වෙන්නට හැකි වූ බව මගේ විශ්වාසයයි.

මධ්‍යම රාත්‍රිය ඉක්ම ගිය ද අතීත සිතුවිලි අතර කිමිදෙමින් සිටියෙමි. දෙවන ලෝක යුද්ධය පිළිබඳව නැරඹූ වාර්තා චිත්‍රපටය අවසානයට මතු කළ කරුණු යළි යළිත් හදවත ඉස්මත්තට පැන නගියි.

පළමු වැනි ලෝක යුද්ධයේ දී අහිමි වූ ජීවිත සංඛ්‍යාව මිලියන නවයේ සිට මිලියන දහසයක් පමණ වෙතැයි තක්සේරු කෙරුණි. පළමු ලෝක යුද්ධය නිසා අත්පා අහිමිවීම්, ශරීරික දුබල වූවන් ගණනය කළ නොහැකි තරම් ය. ඒවා ගණනය කළ ද ඒ සංඛ්‍යා ලේඛනයන්ට වඩා ප්‍රායෝගික තත්වය බරපතල බව

විශ්වාස ය. දෙවන ලෝක යුද්ධයේ දී සිදු වූ විනාශය සිතා ගන්නට නොහැකි තරම් දරුණු ය. දෙවන ලෝක යුද්ධයෙන් ලොවට අහිමි වූ ජීවිත සංඛ්‍යාත්මකව මිලියන විසි දෙකත්, මිලියන විසිපහත් අතර ගණනකි. ඇතැම් රටවල ජනගහනයෙන් ප්‍රතිශත වශයෙන් මිහිපිටින් අතුරුදහන් කෙරුණි. පෝලන්ත ජනගහනයෙන් සියයට දහයක් ඝාතනය වුණි. සෝවියට් සංගමයට සිය ජනගහනයෙන් සියයට දහහතරක් අහිමි විය. දෙවන ලෝක යුද්ධයේදී යුදෙව් ජාතිකයන් මිලියන හයක් ඝාතනය කෙරුණි. මෙවන් තත්වයක් තුළ තුන්වැනි ලෝක යුද්ධයක් ඇති වුවහොත්? තුන්වැනි ලෝක යුද්ධයක් ඇති නොවේයැයි අනුමාන කළ හැකි ද? පළමු වැනි ලෝක යුද්ධය අවසානයේ තවත් මෙවන් විනාශයක් ලෝකයේ ඇති නොවන්නට ජාතීන්ගේ සංගමය ආරම්භ කළ අතර ජාතීන්ගේ සංගමය නොබෝ කලකින්ම බිඳවැටුණේ ය. පළමු ලෝක යුද්ධයේ බියකරු පූර්වාදර්ශය දෙවන වරටත් ලෝකය අත්වින්දේ ය. දෙවන ලෝක යුද්ධය අවසානයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගත්තේ යළිත් මෙවන් රුදුරු විනාශයක් ලෝකයේ ඇති නොවන්නට ය. ගල්ෆ් යුද්ධය, සිරියානු යුද්ධය, ඇෆ්ගනිස්ථානු අර්බුදය, ඉන්දු පකිස්ථානු ගැටුම් ලෙස ලෝකය පුරා යළිත් තුන්වන ලෝක යුද්ධයක සෙවණැල්ලක් ඇඳී යයි. තුන්වන ලෝක යුද්ධයක් ඇති වුවහොත් ලෝක ජනගහනයෙන් අර්ධයකටත් වඩා මිහිතලයෙන් අතුගෑවී යනු ඒකාන්තය....."

වාර්තා චිත්‍රපටයෙන් මතු කළ කරුණු ලොමුදැහැ ගැන්වෙමින් මතකයට නඟා ගත්තෙමි.

එල්.ටී.ටී. ඊ ත්‍රස්තවාදින් ලෙස කාලයක් තිස්සේ යුධ අවි සමග පුහුණු වූ තරුණ තරුණියන් පිරිස යළිත් සිවිල් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ දුෂ්කර වූ වෑයමක අපි නියුක්තව උන්නෙමු. මිලිටරි වටපිටාවක් තුළ බිත්තියට ම හේත්තු වී සිටි මේ සුළු ජාතික තාරුණ්‍යයට ලබාදෙන ඊනියා පුනරුත්ථාපන

ක්‍රියාවලියට මා එකඟ නො වූව ද මගේ දේශන රටාව හරහා ඔවුනට වඩ වඩාත් සමීපවීමට උත්සාහ දැරීම හේතුවෙන් ඔවුන්ගේ විශ්වාසය මා වෙත තහවුරු වෙමින් පැවතුණි. සේවයෙන් මා විශ්‍රාම ලැබිය යුතු වූයෙන් මම අවසාන වතාවට ඔවුන් හමු වී මගේ පණිවිඩය ඔවුන් හමුවේ තැබුවෙමි. දැහැනකට සමවැදුනාක් මෙන් ඔවුහු මගේ දේශනය අසා සිටියෝ ය. ඔවුහු මා බදාගෙන වැලපුණහ. මගේ දියණිය ඒ වනවිටත් කැනඩාවේ කුලුඳුල් දරු ප්‍රසූතියට සූදානම් වෙමින් සිටි අතර බිරිඳ ද කැනඩාවට ගොස් දියණියගේ කටයුතු සඳහා උදව් කරමින් සිටියා ය. මගේ පුත්‍රයා රුසියාවේ උපාධිය හදාරමින් සිටියේ ය. මේ කාලවකවානුවේ දැඩි හුදෙකලාවක, පීඩාවක් විඳිමින් සිටි මම දරුවන් ලෙස සැලකූයේ පුනරුත්ථාපනය වෙමින් සිටි දරු කැල ය. මේ සිදුවීම් අතරතුර විශ්‍රාම ගන්නට සිදුවීම එක්තරා ආකාරයකට පීඩනය තවත් වැඩිවීමකි.

"ඇත්තට ම සර් අපිට තාත්තා කෙනෙක්. සංවිධානය අපේ සිත්වලට විස පෙව්වා. අපි ආවේශ වෙලා ඒකට බැඳුණේ. කාලයක් යනකොට තමයි තේරුණේ හොයන විමුක්තිය එතැන නැහැ කියලා. ඒත් ඒ වෙනකොට අපි හැරෙන්න බැරි තරම් දුරක් ඇවිත්. කවදාවත් අපිට සංවිධානය ප්‍රශ්න කරන්න බැහැ. අවනත වෙනවා විතරයි. සංවිධානය නම් සංවිධානය... නැතිනම් මරණය ".

මාධවන් මා වෙත සමීපවෙමින් පැවසීය. එල්. ටී. ටී. ඊ සංවිධානය සතුව සිටි දක්ෂත ම ස්නයිපර් වෙඩික්කරුවෙකු වූ මාධවන් ගේ ඉලක්කයට වෙඩි තැබීම මා සැබෑ ලෙසම විස්මයට පත් කළේය. ඔහුගේ අදහස් ද වෙඩි වගේ ය.

"අපේ ජීවිතේ හොඳම කාලේ නිකන් නාස්ති උණා සර්, මේ කාලකන්නි යුද්ධයකට, අන්තිමට මොනවාද ඉතිරි උණේ? වේදනාව, පසුතැවීම විතරයි. මම දැක්කා පත්තරේ තියනවා යුද්ධය නිසා වැන්දඹු වෙච්ච කාන්තාවෝ හතළිස් දෙදාහක්

උතුරු නැගෙනහිර ඉන්නවා කියලා. අන්තිමේ මේක ද ඉතිරි උණේ? මීට සමානයි නේ දකුණෙත් තත්වයත්"

මාධවන් කතා කළේ තොල් මැතිරීමක් තරමට පහත් හඬකින් ය. ඔහුගේ හදවතේ තිබූ වේදනාව හඬේ ගැබ්වී තිබුණි.

කාලය ගතවී ගියේ ය. පුනරුත්ථාපනය කළ තරුණ කැල සමාජ ගත කෙරුණි. ඔවුන් සමාජගත කිරීම වෙනුවෙන් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය විශාල ඉඩකඩක් වෙන් කළේය. හමුදා සේවයෙන් ඉසිඹු ලබා සිටින මා වැඩි කාලයක් ගත කරන්නේ ජනමාධ්‍ය ඇසුරෙහි ය. දවසේ පුවත්පත් කියවා නිමකිරීමෙන් පසු රූපවාහිනිය ක්‍රියාත්මක කර තිරය දෙස මම ඔහේ බලාගෙන සිටිමි. සැණෙකින් මට මාධවන් සිහියට නැගෙයි. ඔහු පුවත්පත් විශේෂාංග කිහිපයකට ම ප්‍රස්තුත වූයේ පුනරුත්ථාපනයෙන් සමාජ ගතවන අති දක්ෂ වෙඩික්කරුවෙකු වශයෙනි.

"සංවිධානය මට දුන්නා ඉලක්කයක්. මගේ අතින් සංවිධානය දීපු එකම ඉලක්කයක්වත් වැරදිලා නෑ. දැනුත් මට තියෙනවා ඉලක්කයක්. කවමදාවත් යුද්ධය කියන විනාශයට මගේ සහය දෙන්නේ නෑ කියන ඉලක්කය"

පුවත්පත් අරහයා මාධවන් දුන් සම්මුඛ සාකච්ඡාවේ කරුණු මම එකින් එක සිහිපත් කරමි.

"මොකද උඹ ඔය විදියට ටී.වී බල බල, පත්තර කියව කියව, ගේ ඇතුළට වෙලා ඉන්නේ? මට පුළුවන් උඹට ෆයිව් ස්ටාර් හොටෙල් එකක චීෆ් සිකියුරිටි ඔෆිසර් කරන්න. ට්‍රයි එකක් දුන්නොත් එම්බසියකට උනත් සෙට් වෙන්න පුළුවන්".

මිත්‍රයා මට සරදම් කරන්නේ දැයි මම මගෙන් ම අසමි.

"ආයෙත් ජොබක් කරන්න අදහසක් නෑ මට".

"එහෙනම් දුව ළඟට ගිහින් හිටපන්. මම කිව්වේ නිකන් අපරාදේ උඹගේ කාලය, උඹගේ එක්ස්පීරියන්ස්. රිටයර්මන්ට් එක ගෙයක් අස්සෙ ගෙවන හමුදාවේ උසස් නිලධාරියෙක් මම දැක්කාමයි ". මගේ මිත්‍රයා කොක් හඬලා සිනාසෙයි.

"අපේ දුවට දුවෙක් ලැබුණා. ඔයා දැන් සීයා කෙනෙක්. මට දැන් ම ලංකාවට එන්න වෙන්නේ නෑ".

"තාත්තා මම ඩිග්රිය කම්ප්ලීට් කළා. කොහොම හරි යුරෝප් කන්ට්‍රි එකකට පැනගන්න ඕනෑ. මම ට්‍රයි කරන්නේ ෆයිනෑන්ස් ෆීල්ඩ් එකේ ජොබ් එකක් සොයා ගන්න. ඒ වගේ ම පී.ආර්. හදාගන්න".

මගේ සිතට මඳ සහනයක් දැනේ. දියණියත්, පුතාත්, බිරිඳත් සුරක්ෂිත ගමන් මාර්ගයක ගමන් කරන්නේ යැයි මට සිතෙයි.

"සර් අපේ ට්‍රේනින් එක නම් ඉවරයි. අපි ගාමන්ට් ෆැක්ට්‍රි එකක වැඩට යනවා. මම ටේලරිං කළේ ".

මාධවන් මා දුරකතනයෙන් ඇමතූ අයුරු සිහියට නැගේ. විටින් විට ඔහු මා අමතා ඔහුගේ ජීවිතයේ විවිධ අවස්ථා මා සමග බෙදා ගත්තේය.

ෆැක්ට්‍රියේ වැඩට ගියාම, දවස ගෙවෙනවා දැනෙන්නේ නෑ. උදේ ඉඳලා හවස් වෙනකං වැඩ. සමහර කාලෙට ටාගට් කවර් කරන්න බැරි උණාම රෑටත් වැඩ. වැඩකරන ළමයි ක්ලාන්ත වෙනවා. සමහර දවසට ඉඳිකටුව අතේ ඇනිලා ඉස්පිරිතාලෙට ඇතුළත් කරනවා. සේවයට ඇවිත් මාස හයක් උනේ නැතිනම් සේවකයන්ට ප්‍රතිලාභයක් නෑ. නිකන් ඉස්පිරිතාලෙට ගිහින් දානවා විතරයි. අපිට දෙන කෑම කටේ තියන්න බෑ. ලුණු, මිරිස් රහක් නෑ. සමහර දවසට පිළුණු කෑම".

"අනේ සර් මගේත් ඇඟිල්ලක නීඩ්ල් එක ඇනිලා හොස්පිට්ල් එකේ හිටියා. හම්බ කරන සොච්චම මදි ජීවත්වෙන්න".

මම හදවතින් ම සුසුම්ලමි.

"මම සර් ගාමන්ට් ෆැක්ට්‍රි එකෙන් අයින්වෙන්න ඉන්නේ. මම ටවුන් එක කිට්ටුව කඩයක් බද්දට අරගෙන පොඩි ටේලර් ෂොප් එකක් දාන්න ඉන්නේ. මා ගාව ඉතුරු කරගත්තු සල්ලි ටිකක් තියනවා. ෆැක්ට්‍රි ජීවිතය අන්තිමට ම තිත්තවෙලා තියෙන්නේ".

මාධවන්ගේ හඬ දැඩි වෙහෙසකට භාජනය වූවෙකුගේ සේ ය. ඒ වන විටත් මා තීරණය කර තිබුණේ මගේ මිනිබිරියගේ දෙවන

උපන්දිනයට කැනඩාවේ ටොරෙන්ටො බලා ගුවන් ගතවීමට ය. මම මගේ සුබ පැතුම් ද සමගින් කිසියම් මුදලක් මා මාධවන් වෙත චෙක්පතකින් යැව්වෙමි.
සර්, මම කසාද බැන්දා. අපේ සංවිධානයේ ම ළමයෙක් තමයි. ඒත් හඳුනා ගත්තේ ගාමන්ට් ෆැක්ට්‍රියේ දී තමයි. දෙන්නා ම එකතුවෙලා කොහොම හරි මේ බිස්නස් එක දියුණු කර ගන්න එක තමයි බලාපොරොත්තුව".
"දැන් නම් බිස්නස් ටිකක් දියුණුයි සර්. අපි කරන්නේ ස්කූල් යුනිෆෝම් මහන එක. කොළඹින් රෙදි තොග මිලට ගේනවා. ස්කූල් යුනිෆෝම් මහනවා, සුළු ලාබයක් තියාගෙන කඩවලට දානවා. දැන් අපි ළඟ තව දෙන්නෙක් වැඩ කරනවා. බැටික්ලෝ, ට්‍රින්කෝ, ජැෆ්නා කඩ ගණනාවක් ම මගෙන් බඩු ගන්නවා. ස්කූල් ගණනාවක යුනිෆෝම් අපි මහනවා"
"සර්, අපිට දුවෙක් ලැබුණා. හුගාක් සංතෝෂයි. ජීවිතය ගැන අලුත් බලාපොරොත්තු ගොඩක් හිතට ඇතිවෙලා"
"සර්, මම ලීස් කරලා වාහනයක් ගත්තා, වැන් එකක්. අනුන්ගේ වාහනවලට කුලී ගෙවලා ම ඇති වෙලා, දැන් හුඟක් පහසුයි වැඩ කටයුතු".
අපේ දුව දැන් මොන්ටිසෝරි යනවා. දැන් කෙල්ල හරි ම හුරතල්. බිස්නසුත් සරුයි. දුවගේ වාසනාව තමයි. ඉතින් අලුතෙන් තව තුන්දෙනෙක් දැන් අපේ ළඟ වැඩ".
"මට ආසයි දුවට කොළඹ පෙන්නන්න. සත්තු වත්ත වගේ ම තවත් තැන් තියනවා බලන්න. අලුත් අවුරුද්දෙන් පස්සේ බිස්නසුත් ටිකක් අඩුයි නේ. අප්‍රියෙල් කොළඹ එනවා. අප්‍රියෙල් විසිඑක තමයි අපි කොළඹ එන්න හිතාගෙන ඉන්නෙ සර්".
මාධවන්ගේ ස්වරයෙහි අමුතු ජවයක් ඇතැයි මට සිතෙයි. වසර ගණනාවක් තිස්සේ මාධවන්ගේ ජීවිතයෙහි අනේක විධ හැලහැප්පීම් ඔස්සේ ගලා ආ මාවතේ සතුටක සේයාවක් ජනිතවීම ගැන මම අපමණ සතුටු වූයෙමි. මාධවන් මෙන්ම

ඔහුගේ බිරිඳ රාජිනී ද, දියණිය කාදම්බරී ද පිළිගන්නට මම ආශාවෙන් සිටියෙමි.

"ඉතින් වෙන කොහෙවත් මොකටද මාධවන් නවතින්නේ ? අපේ ගෙදර නවතින්න පුළුවන්. දවස් කිහිපයක් ම නැවතිලා යන්න පුළුවන් නේ"

මම හදවතින් ම ඔවුන්ට ආරාධනා කළෙමි.

දින සති ගෙවී ගොස් අප්‍රියෙල් විසිඑක එළඹිණි. මාධවන්, රාජිනී මෙන්ම කාදම්බරී ද පෙර දිනයේ යාපනයෙන් පිටත් වීම මට දුරකතනයෙන් දැනුම් දුන්නේ ය. ඔවුන් කොළඹට ළඟා වන විට පසු දා පාන්දර වෙනු ඇතැයි මම අනුමාන කළෙමි.

"තනියම ද ඩ්‍රයිව් කරන්නේ මාධවන් ? "

"නෑ සර්, ඩ්‍රයිවර් කෙනෙක් ඉන්නවා. එයාට මහන්සි උණා ම මම ඩ්‍රයිව් කරනවා. අපි පරෙස්සමෙන් සර්. කොහොමත් සර් දුව නිසා මම පරෙස්සමෙන් ජීවත්වෙන්නේ".

මගේ බිරිඳ ද දින කිහිපයක් අප නිවසේ ගත කරන්නට එන මේ ආගන්තුකයින් පිළිගන්නට මග බලාගෙන සිටියා ය. මම විටින් විට ජංගම දුරකතනයෙන් මාධවන් ඇමතුවෙමි. ඔවුන් බොහෝ සතුටින් කොළඹට පැමිණ තිබුණි.

"දැන් අපි ගෝල්ෆේස්වලට ආවා විතරයි. දුවත් එක්ක ටිකක් ඇවිදින්න හැදුවේ. සර් එයා කැමතියි වගේ මෙතනට. මේ වේලාවේ සෙනගත් අඩුයි මෙතන".

මාධවන් සැහැල්ලුවෙන් කතා කළේ ය. ගෝල්ෆෙස් පිටියේ උදෑසන මිහිරියාව මට මැවී පෙනෙයි. මාධවන්ගෙත්, රාජිනීගේත්, ඔවුනගේ දියණිය කාදම්බරීගේත් සිනහව පැතිරුණු මුහුණු මම සිතින් මවා ගනිමි.

නොසිතු නොපැතු නිමේෂයකින් සියල්ල වෙනස්වුණි. පාස්කු ඉරිදා දේවමෙහෙයන් පැවැත්වෙමින් තිබූ දේවස්ථාන ඉලක්ක කරගනිමින් එල්ල වූ ප්‍රහාර මාලාවක රූප රාමු රූපවාහිනී තිරයේ ඇඳී යයි. මරණ බියක් සිතට නැගෙයි. බිරාන්ත ව රූපවාහිනී තිරය දෙස නෙත් දල්වා බලා සිටිමි. මගේ චිත්ත ඒකාග්‍රතාවය

මුළුමනින් ම බිඳී ඇති සේ ය. මම ක්ෂණිකව දුරකතනයට උත්තර දෙමි.

"හෙලෝ"

" ස..ර් මම මාධවන්, අපි තව ම ගෝල්ෆේස්. දැන් ෂැංග්‍රිලා හොටෙල් එකේ බ්ලාස්ට් එකක් උණා. සර් තවත් බ්ලාස්ට් වගයක් වෙනවා. මේ මොනවා ද වෙන්නේ සර් ?"

"මො....ක...ක් ? "

මම උච්ච ස්වරය අවදි කරමි.

"මේ මොකක්ද වෙන්නේ ? "


මම මගෙන් ප්‍රශ්න කරමි. රක්ත වර්ණය නෙත් අභියස මැවෙයි. මරුවිකල් වියරු කෑගැසීම්වලින් දෙකන් පිරී යයි. දුරකතනයෙන් ගලාඑන හඬ අපැහැදිලි ව යනු මට දැනෙයි.

"හලෝ, හලෝ හලෝ..... ".

මම මුරගාමි. හිරුරැස් ගිනි අඟුරු මෙන් බබලයි. හදවත ඉරී යන්නාක් මෙන් වේදනාවක් මතුවෙයි.

## කෙටි කතා ( රාජ්‍ය සේවයේ නියුතු )

**කුසලතා ස්ථානය**
එච්.සී.නිශ්ශංක
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
රත්නපුර



### කරත්ත ගොනා

ගිනි කාෂ්ටක අව්වේ පිච්චි පිච්චී ගෙදර ආ මගේ තොල කට වියැළී ඇත. පොත් කන්ද කර මත තියාගෙන මම මුළුතැන්ගෙය දෙසට දිව ගියෙමි.

"අද වේලපහම ඉස්කෝලෙ ඇරියද පුතේ....?

බලාපොරොත්තු නොවූ යමක් හදිසියේ දැකීමෙන් ඇතිවන වික්ෂිප්තභාවය අම්මගෙ දෑස පුරා පෙනෙන්නට ඇත. මා හැමදාම ඉස්කෝලෙ ඇරී ගෙදර එන්නේ මේ වෙලාවටය. අම්මාට එය අද අරුමයකි. අම්මා නිතඹ තෙක් දිගින් වැඩුණු මද රැලි ගැසුණු කොණ්ඩය කඩාගෙන සිටියි. ඇගේ මුහුණ විඩාබරය. දෙකම්මුල් රතුවී ඩාදියෙන් පෙඟී ඇත. මට මේ සියල්ල අරුමයක් විය.

පුංචි බාප්පාගේ මී හරක් අං තියෙන කරත්ත ගොනා ගෙයි ඉදිරිපස කජු ගසේ බැඳ දමා ඇත. උගුරු පාදමින් ගෙයි පිළිකන්නෙ පැත්තෙන් ආ පුංචි බාප්පා මැඳගිල්ලයි දබරැගිල්ලයි දෙතොලට තියා "සුරුස්" ගා කෙළ පාරක් මිදුලට ගැසුවේය. මිදුලෙ තණ බිස්සට වැටුණු කෙළ පාරට තණකොළ තැනින් තැන රතු පැහැ ගැනුණි.

"අද නම් වැව් මාළුත් තියෙනවා"

අම්මා බත් පිඟාන මා අත තැබුවාය. මා මෙන් ඇයද වැව් මාළු කන්න පෙරේතය. අපේ පෙරේතකම් තාත්තාට වඩා හොඳින් පුංචි බාප්පා දන උන්නේය. ඒ නිසාම ඔහු අපේ ගෙට ගොඩ වෙන හැමවිටම වැව් මාළු කිලෝවක් දෙකක් මරපු කුකුලෙක් රැගෙන එන්න අමතක නොකරයි. වැව් මාළු කැබලි දෙක තුන දිව නහර පිනවද්දී අම්මා මගේ හිස අත ගෑවාය. ඇය දන් නම් කොණ්ඩය පීරා කදිමට බැඳගෙන ඇත. පුංචි බාප්පාගේ හොර බළල් ඇස් දෙක මට ඇල්ලුවේ නැත.

මගේ තාත්තාගේ බාලම සහෝදරයා වන පුංචි බාප්පා කිසිම කෙනෙකුට බය නැති ගානය. ඕනෑම ජගතෙකු දණ ගස්සන මන්තර සාත්තර උන්දෑ දනියි. පුවක් ගෙඩියක් තරම් කොණ්ඩයක් බඳින ඔහු කිසිම දිනක කමිසයක් අඳිනවා මා දැක නැත. අත් කොට සුදු බැනියම් අඳින ඔහු ගමන් කරන විට පොළොව හෙල්ලෙන තරමට උස මහතය. ඇඟ පුරා කළු රෝම තාර පාටය. පොල් මුඩ්ඩක් සේ මුව දෙපසින් උඩු අතට නැමුණු පළල් උඩු රැවුල තේජාන්විතය.

වයස අවුරුදු හතළිස්පහක් වෙලත් පුංචි බාප්පා කසාද බැඳ නැත. ඔහු කරන්නේ කරත්ත රස්සාවය. තනි ගොනා බැඳි කරත්තය ගමේ කොයි කවුරුත් හඳුන්වන්නේ ජයපාලගේ කරත්තය කියාය. තැනින් තැන කළු සුදු පැල්ලම් වැටී ඇති නිසා ගමේ අය කරත්ත ගොනාට "කළු සුද්දා" යැයි කියති. ගෙජ්ජි හඬ නඟාගෙන කරත්තය ගම වටා යයි. ගමේ ඇයින් හරි හම්බ කරන දේවල් ටවුමෙ පොළට ගෙන යාමත් ඔවුන්ට අවශ්‍ය අඩුම කුඩුම පොළෙන් ගෙන ඒමත් පුංචි බාප්පාට පැවරෙන රාජකාරි අතර වේ.

අල්ලපු වැටේ ඉන්න ජයන්තලගෙ අම්මා සමග පුංචි බාප්පා සිනාසුණත් අම්මාට වැරදිය. ඉරිසියාව අම්මාගේ හිත පතුලටම ආ කල උඩු ඇහි බැමි ඉදිමී ඇස් යටට ගිලා බැස සිත නොසන්සුන්ව කෝපයට පත්වේ. "හැමදාම ඔහොම ඉඳලා පුළුවන්ද?" තාත්තා පුංචි බාප්පාගේ කසාදය ගැන කතා කරද්දී ඔහු කියන්නේ "තව ඕවට කල් තියෙනවා" කියාය. නැත්නම් " මෙහෙම හොඳයි" කියාය. ඒ මොහොතක අම්මා ළඟ පාතක

හිටියොත් කියන්නේ "මල්ලිට කරදර නොකර ඉන්නවා" යි කියාය. මෙසේ දවසින් දවස පුංචි බාප්පාගේ කසාදය කල් යද්දී ඔහු අපේ ගෙදර යාවජීව සාමාජිකයෙක් විය.

මම කෑම කා පිඟාන සෝදා කුස්සියේ පිඟන් රාක්කයේ තබන්නට යද්දී පුංචි බාප්පාගේ සහ අම්මාගේ හොර කසුකුසුව අතරමග නැවතීම මසිත තුළ ඔවුන් කෙරෙහි රහස් කෝපයක් ජනිත කළේය.

"ආ... උඹ ආවද කොල්ලෝ"

තාත්තාගේ ගොරෝසු කට හඬ ගේ පුරා දෝංකාර දෙයි. තාත්තා කොල්ලා කියා අමතන්නේ කරත්ත ගොනාටය.

"ඕං ගියා වත්ත පහළට තණකොළ කපන්න කියලා ඔහෙත් ගියා නං ඔය ගමන් නාගෙනම ආ හැකි"

තාත්තා ද පුංචි බාප්පා ආ දවසට සතුටින් ඉපිලෙයි. රසවත් පිලී කෑමක් ළිප උඩ තැම්බෙන වග ඔහු දනියි. එදාට ගෙදර මදි පාඩු අම්මාගෙන් නොකියැවෙයි. ඇගේ පුරුදු අඬවැඩියාව ද නවතියි. පුංචි බාප්පා ගල් අරක්කු බෝතලය කඩයි. අපේ ගෙදර පිළක් වෙනුවට ඇති එළියෙ ඇඳේ තාත්තා වාඩි වී උයපු මස් කෑල්ලක් මාළු කෑල්ලක් තලු මරයි. ඇඳ උඩ එහෙට මෙහෙට විසිවන කම්පලක් නැති වචන අතරේ මගෙ නමත් කියැවෙයි. අරක්කු ගඳ මගෙ නැහැයටත් එයි. බෝතලය අඩිටම හිස් වූ විට තාත්තා ජෝතිපාලගේ සින්දු කියන්න පටන් ගනියි. "සිරියමේ සාරා" ඔහුගෙ කටේ තියෙන එකම සින්දුව වේ.

පුංචි බාප්පා ගෙදර සිටින රෑ දිනවල දී තාත්තා කුඹුරේ පැලට යයි. පැදුරු කඩමල්ලක් කිහිල්ලට අරන් වැනි වැනී පැලට යන තාත්තාට එහි නිදාගන්නට හරි හමන් තැනක් ද නැත.

සුවඳ සබන් ගා සේදූ කොට්ට උරය පුංචි බාප්පා ඉහ තියන කොට්ටයට අන්දවන්නේ අම්මගේ දෑතිනි. අම්මගේ අලුත්ම චීත්තයක් පොරව ගන්නා ඔහු තාත්තාගේ එළිය ඇඳේ හොඳට නිදා ගනියි. අම්මා කුප්පි ලාම්පුව නිව්වද නින්ද මවෙත නොඑයි. කරත්ත ගොනා අඩ සඳ එළියේ දඟලන සද්දේ මට ඇහෙයි.

ගිය සතියේ දහම් පාසලේදී මා අපේ ගේ ගාව ජයන්තට ගැහුවේ මේ කරත්ත ගොනා නිසාය.

"ගොනා අද ගෙදර නේද?

ඔහු මගෙන් ඇසුවේය. මම හිස සලා පිළිතුරු දුනිමි.

"ගොනා දවසෙම ගෙදර නේද?"

ජයන්තගේ ඒ පැණයට මගේ කේන්තිය ඉවසීමේ සීමා රේඛාව ඉක්මවා යමින් තිබිණ.

"උඹ ගොනාගේ පිටේ ගිහින් තියෙනවද?"

ඒ මොහොතේ වූ මගේ සිරුරේ සියලු ශක්තිය ජයන්තගේ කම්මුල කරා ගිය බව මම දනිමි. කොහොමටත් වටින් පිටින් ඇවිත් කරත්ත ගොනාට අම්මා ගාව ගන්නවාට මා කැමති නැත.

මම ඒ සිදුවීම ගෙදරට නොකීවෙමි. ජයන්තගේ අම්ම ද රෙද්ද කරට ගෙන අපේ ගෙදරට ආවේ නැත. නමුත් ගොනාගේ කථාව එදායින් අවසන් වූයේ ද නැත. ගොනුන් සම්බන්ධ කතාවලදී මගේ සිත හැමවිටම අසරණ වේ.

කරත්ත ගොනා ළඟකදී ඉඳන් කුලප්පු වී ඇත. උගේ හැසිරීම අමුතුය. ජයන්තලගෙ ගෙදර වැස්සියක් ගෙනැවිත් ඇත. සමෘද්ධි වැඩසටහනෙන් ලැබුණ කියා ජයන්තලාගෙ අම්මා අපේ අම්මාට කියනවා මට ඇසුනේය. දුඹුරු පාට ලස්සන නාඹර වැස්සියකි. සැමවිටම කරත්ත ගොනාට පෙනෙන්නට වැට ගාවට එයි. උන්ගේ භාෂාවෙන් මොනවද කියා කෑ ගසයි. කරත්ත ගොනා ද කෑගසා ඊට පිළිතුරු දෙයි. දෙදෙනා බැඳ තබා තියෙන කඹ පත ඔවුනට ළංවෙන්න ඉඩ නොදෙයි. එහෙම නොවුණා නම් වැට කඩාගෙන ඔවුනොවුන් හමුවනු ඇත. උන්ගේ බලාපොරොත්තු බිම වැටුණු වීදුරුවක් මෙන් බිඳී තිබීම මගේ දැඩි අසතුටට හේතු විය.

"උන්ටත් ඕනෑ එපාකම් තියනවනේ එහා ගෙදර අයත්තෙක්ක කතා කරලා බැලුවොත් හොඳයි නේද?"

පුංචි බාප්පා වගක් නැති තැන අම්මා යටැසින් බලා හිනාවක් පා එසේ කීවාය.

"ඕන නෑ"

ඔහු ප්‍රශ්නෙන් කර හැරියේ හිතක් පපුවක් නැති ගානටය.

ජයන්තලාගේ තාත්තා පුංචි බාප්පා සමග හිත හොඳ නැති බව මම දනිමි. ඒ එසේ වුණත් තමන් ජීවත් කරන කරත්ත ගොනා ජයන්තගේ වැස්සිට ආදරය කිරීම වළකාලීම මානුෂීය වරදකැයි මට සිතේ. මගේ සිතෙහි කැකෑරෙන කෝපය දුම් දමන්නට විය. පුංචි බාප්පා තරමට මම උස මහත වූවා නම් ජයන්තට දුන් කම්මුල් පාර ඔහුට ද දෙන්නෙමි. බලෙන්ම කඹ පතය කපා ඔවුන්ට ආදරය කරන්නට නිදහස ලබා දෙන්නෙමි.

කඹ පතයෙන් බඳින ලද ගොනා ඔළුව සොලවමින් දිග අං කරකවමින් කජු මුලට පයින් අනිමින් සිටියි. කජු පුහුලන් කන්න එන දඬු ලේනා එළවන්න පුංචි බාප්ප ගල් ගසමින් සිටියි. මුළුතැන් ගෙය දෙසින් එන ආප්ප සුවඳට මගේ සිත ඉව අල්ලයි. මා ආ පිට හැරුණා පමණි.

"බුදු අම්මෝ"

පුංචි බාප්පාගේ මර ලතෝනියෙන් මගේ මුළු ඇඟම වෙවුලවාලීය. බාප්පා ගස මුල උඩබැලිව වැටී සිටියි. ගොනාගේ අං පහරින් පපුව පසාරු කරගෙන ගොස් ඇත. කඹ පතයේ කොටසක් කජු ගසෙහි බඳෙහි එල්ලෙමින් තිබේ. අම්මා දුන්නෙන් මිදුණු ඊතලයක් මෙන් දිව ආවාය.

"මගෙ රත්තරනේ.... මම ඔය ටික කිවුවා. කෝ ඉතිං ඇහුවායැ.... අනේ දෙයියනේ...."

අම්මා නැගූ විලාපය මගේ කන් අඩි රත් කරගෙන හිත පතුලටම කිඳා බැස්සේය. තාත්තා අම්මා වත්තන් කර ගත්තේය. මම වටපිට බැලීමි. වත්තේ ඉනිවැට කැඩී බිඳී ඇත. කරත්ත ගොනා ජයන්තලාගේ වැස්සී සමග එකතුවී ඉඳියි. උන්ට මේ සිදුවී තියෙන විත්නැහිය පිළිබඳව වගේ වගක් නැත.

අප නිවසේ විසූ පුංචි බාප්පා කෙරෙහි මේ අවස්ථාවේ ගෞරවණීයව කටයුතු කළ යුතු වුවද එසේ කිරීමට මගේ සිත නොනැමේ. එහෙත් හිස නමා ගරු කළ යුතු අයෙක් මා අවට ජීවත් වෙතැයි මට සිතේ. මම වෙනදා නැති ආදර හැඟීමකින් කරත්ත ගොනා දෙස බලමි.

## කෙටි කතා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



ප්‍රථම ස්ථානය
පී.බී.ධනපාල
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
පූජාපිටිය

### ගනුදෙනු

ඔහු සිටියේ පත්තරය දිග හැර ගත්ත ගමන්මය. මෙතෙක් වෙලා පත්තරය පෙරළමින් සිටියත් ඔහුගේ දෑස් යොමු වී තිබුණේ පත්තරය වෙත නොවේ. හිස් බිත්තිය දෙසටය. සිත යොමු වී තිබුණේ ඊටත් වඩා වෙනස් දෙයක් වෙතටයි. බැංකුවෙන් එවා තිබූ ලිපිය ඔහුගේ සිතිවිලි ලෝකය සමඟ ගැටෙමින් තිබුණි. වාරික ගණනාවක්ම මුදල් ගෙවා නැති නිසා අධිකරණ ක්‍රියා මාර්ගයක් වෙත යොමු කරන බව එහි සඳහන් වේ. මීට පෙර හිඟ වාරික ගැන මතක් කරමින් ලිපි දෙක තුනක්ම ආවේය. එයින් සමහර ලිපි කවරයවත් නොකැඩී කුණු කූඩයට ඉගිල ගියේය. ලියුමක් එන හැම විටෙකම ඔහු සිතුවේ ඊළඟ පඩියෙන් හිඟ මුදල පියවන බවය. එහෙත් පඩිය දවසින් දෙකෙන් වාෂ්ප වී යයි. ණය වාරිකය මතක් වන්නේ ඉන්පසුවය. තමා සන්තකයේ තිබූ සියලු දෙයම වියදම් කළේ මේ පර්චස් දහයේ ඉඩම ගෙන ගෙයක් හදා ගැනීම සඳහාය. ඒත් තවම ගෙයි වැඩ ඉවර කර ගැනීමට හැකිවූයේ නැත. කුස්සිය පැත්තේ බිත්ති බ්ලොක් ගල් පෙන්වමින් නිරුවතින් බලා සිටී. ඉටිරෙදි ගැසූ ජනෙල් බලා සිටින්නේ ඔලොක්කුවට මෙනි. ඒත් දැන් මේවා ගැන කල්පනා කරමින් ඉන්දීය සාගරය තරම් වූ කල්පනා සාගරයක කිමිඳුණත්

වැඩක් නැත. ඉක්මනින්ම මුදල් සොයා ගත යුතුය. ඒත් කොහෙන් කියා මුදල් සොයන්ටද ?
රාත්‍රී නින්දට ගිය විට බිරිඳ සමඟ කතාබහ කරන්නෙත් මේ ගැනය. ඔහුගේ ශෝකාකුල කටහඬ අසන ඇය තුළ ඇතිවන්නේ බියකි.
''ඕවා හිතන්න ගිහින් ඔයාට ප්‍රෙෂර්වත් හැදෙන්ට බැරි නෑ. මේ ළඟදී මම අහගෙන ටීවී එකේ සාකච්ඡාවක ඩොක්ටර් කෙනෙක් කිව්වා මානසික ආතතිය සීනි වැඩිවෙන්ට හේතු වනවා කියලා.''
ඇය පවසන්නේ තම සුරතින් ඔහුගේ හිස පිරිමදිමිනි. මාතෘකාව නිම වන විට ඔහුගේ අතද ඇගේ උරහිස හා පිට පිරිමදිමින් සිටී.
''මෙහාට හැරෙන්ට''
ඔහු හෙමින් කොඳුරයි. එතැනින් සියල්ල නිමවේ.
''මාලි...... මා....ලී''
ගේට්ටුව අතරින් මෙහා පැත්තට ගලා ගෙන ආ කටහඬ ගෙදර ඉස්සරහ දොර ළඟටම පැමිණෙන විට ඔහුගේ කල්පනා ලෝකය බිඳී ගියේය. මේ කටහඬ කාගේද යන්න පිළිබඳව ඔහු දෙසැරයක් සිතිය යුතු නැත. මොහොතකින් ඉස්සරහ දොර බරාස් ගා ඇරුණි.
අල්ලපු ගෙදර අරුණි එක් අතක් අඩවල් කළ දොරටත් අනෙක් අත උළුවස්සටත් තබාගෙන දොර අතරින් තම පංචස්කන්ධය ඔබාගෙන බලා සිටී. ඇය නැවත වතාවක් පෙරට වඩා හෙමින් ''මා....ලී'' යැයි හඬ නැගුවේ ඔහු වෙතට හැරවූ මුහුණින් යුතුවය. ඒ මුහුණේ හිනාවක් නොවීය. එහෙත් ඔහු දෙස බලාගෙන කට ඇද කොට දිව එළියට දමා එක් ඇසකින් ඉඟි මැරුවේ කුඩා දරුවෙකු බිය ගැන්වීමට මෙන් සාත්විකාභිනයක් පාමිනි.
දුව කාමරයෙන් එළියට ආවේ ''ආ.... ඇන්ටි'' කියමිනි. දුවගේ පැමිණීමත් ඔහු ගේ ඇස් අරුණිගෙන් ගැලවී පත්තරය වෙත යොමුවීමත් එකම මොහොතක සිදුවූයේ නොසිතූ ලෙසිනි.
අරුණි එබීගෙන සිටි දොර අතරින් හිරු එළිය ගෙතුළට ගලා ආවේ ඇය ඇඳි දුහුල් ගවුම විනිවිද යන ලෙසය. දුවගේ මෙන්ම

බිරිඳගේද ආගමනය විසින් ඔහුගේ දෑස ඉල්ලා සිටි එම දර්ශනය බැලීම තහනම් කෙරුණි.
දොරකඩට ආ මාලි අරුණි සමඟ මොනවදෝ කතා කරයි. අනතුරුව ඈ ඔහු පත්තරය බලමින් සිටි තැනට ආවාය. ඇය කතා කළේ හෙමිනි.
''රත්නෙ මම අරුණිත් එක්ක පොඩි ගමනක් යනවා''
''කොහෙද ?''
ඔහුගේ ශීර්ෂය පත්තරයෙන් එළියට පැන්නේය.
''අරුණිගේ දුව ඉෂා අද ගෙදර එන්ට පරක්කු වෙනවලු. එක්සැම් ළඟ හින්දා හවස් වෙනකම්ම ක්ලාස් තියනවාලු. අරුණි තනියම යන හින්දා මටත් යමු කියනවා.''
ඔහුගේ පිළිතුර ඇසීමට උවමනාවක් ඇයට නොවීය. ඔහු ආපසු හැරී බලන විට දුටුවේ ඇය ගමනට සූදානම් වීම සඳහා නිදන කාමරයට ඇතුළුවෙන ආකාරයයි. ඒ සමඟම ඔහුගේ දෑස් දිව ගියේ දොර දෙසටය. අරුණි උළුවස්සට හේත්තු වී පාර දෙස බලා සිටී. දැන්නම් ඉර අව්ව බැස ගොස් ඇත. ඔහු ඒ පැත්ත බලද්දී අරුණි ද මේ පැත්ත බැලුවාය. ඔහු මුහුණ සොලවමින් ඉංගිතයෙන් ගමන ගැන අසන විට අරුණි මුහුණින් පළ කළේ මාලිට මේ ගමන යාමට ඉඩ දෙන ලෙස කෙරුණු ඉල්ලීමකි. ඒ සමඟම ගමනට සූදානම් වූ මාලි පැමිණියාය. ඔහු දෙදෙනාම දෙස බලමින් ඇසුවේ,
''මොකේද යන්නෙ ? '' කියාය.
ඒ සමඟම අරුණි දෑතින් සුක්කානම කරකවන ආංගිකාභිනයක් ඉදිරිපත් කරමින් වාචිකාභිනයෙන්
''බ්රෑම්......'' යැයි හඬ නැඟුවාය.
බැංකුවෙන් ණය පිළිබඳව ආ ලියුමෙන් ඔද්දල් වී ගිය සිත මොහොතකට සොඳුරු සිතිවිලිවලින් පිරී එන බවක් ඔහුට දැනේ. ඔහු ජනේලය අසලට ගොස් පිටත බැලුවේය. මාලි සහ අරුණි පඩිපෙළ දිගේ පහළට යන අයුරු පෙනේ. අරුණිගේ දඟකාර ගමන් විලාසයත් යෞවන පෙනුමත් සමඟ මාලිගේ

රූපය සැසඳුණේ ඔහු නොසිතූ ලෙසිනි. පිටදිගේ වැක්කෙරුණු කොණ්ඩයත් කේඩෑරි වී ගිය ශරීරයත් මාලි වියපත් ගැහැනියක බවට පත් කර ඇත. අරුණිගේ යෞවනත්වය ඔහු තුළ ඇති කළේ අනුරාගී හැඟීමකි.

ඔහු ආපසු හැරී ගෙතුළ දෙස බැලුවේය. දෙකට නැමූ පත්තරය අසල තිබූ බැංකුවෙන් එවූ ලියුම දකින විට සොඳුරු සිතුවිලිවලින් පිරී තිබූ සිත ගැස්සී යයි. දැන් ඔහු තුළ මේ ලිපිය කෙරේ ඇත්තේ තරහකි. එය ගුලි කර විසි කිරීමට සිතේ. නැත්නම් ළිපට දමා අළුවන තුරු බලා හිඳ කුරිරු සතුටක් ලැබීමටද සිතේ. එහෙත් තමා සත්‍යයට මුහුණ දිය යුතුය. රුපියල් පනස් දහසක හිඟ මුදල කෙසේනම් සොයන්නද ? බැංකුවට ගොස් මැනේජර් හමුවී කතා කර සහනයක් ලබාගත හැකිවේද ? ඔහු මොහොතක් කල්පනා කළේය. ඒත් සහනයක් ලබා ගත්තත් එක වාරිකයක් රුපියල් පහළොස් දහසක්වත් වනු ඇත. එය මතක් වන විට ඇඟ කිළිපොලා යයි. මාලිගේ මාලය, වළලු දෙක, තමාගෙත් ඇගෙත් මඟුල් මුදු මේ සියල්ල අතට කරට නොවැටී බැංකුවේ සේප්පුවක් තුළට වී ආරක්ෂිතව සිටී. මේ වන විට කී වතාවක් පොළී ගෙවා ඇත්ද ? ඒ මදිවාට ඉන්න ගේ දොරත් අහිමි වන තත්වයක් උදාවී ඇත.

මාලි හා අරුණි මෙලාකට ඉෂාගේ පන්තිය නිමවන තුරු කාරෙකට වී කයිවාරු ගසමින් සිටිනවා ඇත. නැත්නම් අරුණි මාලි ද කැටුව රෙදි සාප්පුවක හෝ සුපර්මාර්කට් එකක සැරිසරනවා ඇත. එම සිතුවිලි සමඟම අරුණිගේ මුහුණ මැවී පෙනේ. එය ඔහු තුළ ඇති කළේ උත්තේජනාත්මක හැඟීමකි. ඔද්දල්ව තිබූ සිත ඒ සියලු ප්‍රශ්න බැහැර කරමින් කිසියම් සුන්දර හැඟීම් මාලාවකින් පිරීයයි. අරුණි හා මාලි කෙතරම් මිතුරු වුවද තමා ඇය හමුවීමට ගොස් ඇති වූ සිද්ධිය නම් නොකියනු ඇත. සමහරවිට එය තමාට ලොකු පුවතක් වුවත් අරුණිට සුළු දෙයක් වන්නට පුළුවන.

අරුණිගේ තරුණ පෙනුම, කෙළිලොල් බව නිසාම ඔහුට ඇය පිළිබඳව අවදිවූ සිතුවිලි පාලනය කර ගැනීම ඉතා අපහසු විය. මාලිත් දුවත් ගෙදර නැති අරුණි පමණක් ගෙදර සිටින දවසක් එනතුරු ඔහු බලා සිටියේය. එළැඹුණු එක් දිනයක ඔහු ඉරිදා පත්තරය ඉල්ලා ගැනීමේ මුවාවෙන් අරුණිලාගේ ගෙදරට ගියේ සිතේ සඟවා ගත් අදහසක් ද ඇතිවය. ඇය එවෙලේ සාලයේ පුටුවක වාඩිවී ස්මාර්ට් ෆෝනය සමඟ ඒකාත්මික වී සිටියාය. ඔහු දෙස බැලූ ඈ ''යූ ටියුබ් එකේ ෆිල්ම් එකක් බලනවා'' කීවේ නැවතත් ෆෝනය වෙත දෙනෙත් අලවා ගනිමිනි. ඔහු නිහඬව ඇය ඉදිරියේ වූ පුටුවේ වාඩිවිය. ඈ දැඩි උනන්දුවකින් චිත්‍රපටිය බලයි. ඔහු මොහොතක් නිහඬව සිටියේය.

''ඉරිදා පත්තරය තියනවාද?''

ඔහු ඇසුවේ තම දෙනෙතින් ඇගේ ගත ස්පර්ශ කරමිනි.

''ම්....ම්..... ඇති''

ඈ ෆෝන් එක මත රැඳුණු මුහුණින් යුතුවම ටීෆෝව වෙත අත දිගු කළාය. ඔහු ඉංග්‍රිසි පත්තරවලට යටවී තිබූ සිංහල පත්තරය අතට ගත්තේය. අරුණි වෙත පැමිණ ''තැන්ක් යූ'' කියමින් තමාගත් පත්තරයෙන් ඇගේ හිසට තට්ටුවක් දැම්මේය. ගැස්සී ගිය ඈ ඔහු දෙස රවා බැලුවාය.

''මළ කෝලම්'' කියමින් පුටුවෙන් නැගිට වේගයෙන් ගෙතුළට ගියාය.

ඔහු මොහොතකට ගල් ගැසුණි. තමා දෙනෝදාහක් ඉදිරියේ නිරුවත්වූවා සේ දැනුණි. උගුර කට වියළී ගිය ඔහු නිවසින් එළියට ආවේ අරුණි මෙය මාලිට කියනු ඇතැයි යන සිතුවිල්ලෙන් බියපත් වෙමිනි.

එදින හවස්වරුව ඔහු දුටුවේ තම පවුල් ජීවිතයේ ඉරණම විසඳන තීරණාත්මක කාලයක් ලෙසය. මාලි දැන් දැන් තමා වෙත කඩා පනිනු ඇත. පවුල් ජීවිතය නම් වූ ගිනි මැලය ඉන්පසු දැල්වෙනු ඇත. එහෙත් සිදුවන්නේ ඔහු සිතන දෙය නොවේ. මාලි අරුණිලාගේ නිවස පැත්තට යනු දුටු ඔහු ඊළඟ අවස්ථාවේ

ඇගේ ගිනි අවි ප්‍රහාරවලට මුහුණ දෙන්නේ කෙසේදැයි සිතුවේය. එහෙත් ඇගේ හැසිරීමේ කිසිදු වෙනසක් නැත. ඈ සුපුරුදු ලෙස තමාටත් දුවටත් අණදෙමින් එහෙමෙහේ යයි. ගේ අතුගායි. ඔහු සැනසුම් සුසුමක් හෙළීය.
පසුදින ඔහු වැඩට යාම සඳහා පඩිපෙළ බැස්සේ අරුණිලාගේ ගෙදර දෙස බැලීම තමා විසින්ම තහනම් කරගෙනය.
''හලෝ රත්නේ ගුඩ් මොනිං''
අරුණිගේ උද්‍යෑසන සුභ පැතුම ගලා ආවේ ඔහු තැතිගන්වමිනි. ඔහුගේ හිස ඉහළට හැරවුණි. අරුණි සුපුරුදු ලෙස බැල්කනියට වී සිය වරලස පීරමින් සිටින්නීය. ඈ ළහිරු රැසින් ප්‍රමුදිත වූ ස්වකීය පියුම් උවන විකසිත කරමින් සිනාසෙන්නීය.
''ආ මෝනිං..... අද ටිකක් ලේට් උනා''
ඔහු පියවි සිහිය එළවා ගත්තේය.
''ආ ඇත්ත ද බා.......යි''
ඈ සුරත ඔසවා ඔහුට ආචාර කළාය. ඔහුද සුරත ඔසවා සමාචාර දක්වමින් සතුටු සිතින් යුතුව පඩිපෙළ බැස්සේය.
ඔහු සිටියේ තමා සමඟ සංවාදයේ යෙදෙමිනි.
''මා සිතුවේ ඊයේ වෙච්ච දේට අරුණි මගෙත් එක්ක තරහ වෙලා ඇති කියලා. බලපුවම එහෙම එකක් නෑනේ. වෙනදා වගේම අදත් කතා කළානේ. එහෙනම් මෙයා ඊයේ අර විදිහට හැසිරුණේ මොකද? බොරු රඟපෑමක් කළා වද්ද? කාටද කියන්න පුළුවන් ගෑනුන්ගේ හැටි. ඊයේ ඇත්තටම තරහා ගියා නම් කිසිම දෙයක් නොවෙච්ච ගානට වෙනදා වගේම කතා කරයිද? මේක නම් රඟපෑමක්ම තමා. මාව ටෙස්ට් කරන්න කරපු වැඩක්. අපරාදේ මං බයවෙලා දුවගෙන ආවේ''
ඊයේ හා අද අරුණිගේ හැසිරීම විවිධ පැතිවලින් තේරුම් ගැනීමට ඔහු උත්සහ කළේය. මව්පිය යෝජනාව අනුව මාලි ආවාහ කර ගත්තා හැර ප්‍රේමය පිළිබඳ වෙනත් කිසිම අවබෝධයක් ඔහුට නොවිය. කන්තෝරුවට යන තුරුම ඔහු සිටියේ අරුණි පිළිබඳ කල්පනා ලොවේ සැරිසරමිනි. මේ සියල්ල

උභතෝකෝටිකයක් වුවත් අරුණි පිළිබඳව හිතේ දළුලමින් ඇති සොඳුරු අපේක්ෂාව දැන් මහා වෘක්ෂයක් සේ වැඩී එයි. ඇය හමුවීම කතාබහ කිරීම පමණක් නොව ඉන් එහාට යාමට තරම් වූ තරුණ ජවයක් ලැබී ඇත්තේ මහර්ඝ ඔසුවක් අනුභව කළ පරිද්දෙනි.

විසිර ගිය පත්තරයක් බැංකුවෙන් එවූ ලියුමත් බිම වැටී තිබියදී රත්නසිරි නම් වූ ඔහු හිටියේ අරුණි හීනයෙන් දකිමිනි. ඒ ඔහුගේ හිතේ අරුණි ගැන හටගෙන වර්ධනය වෙමින් පවතින සදාචාර විරෝධී වූ ද තහනම් වූ ද අනුරාගී ප්‍රේමය නිසාය. ඒ සිහිනයේ ඇය සිටියේ හැමදාම දකින ලෙස ගවුමකින් සායකින් හෝ කලිසමකින් සැරසී නොව මනාලියක් සේ හැඩවැඩ ගැන්වීමෙන් යුතුවය. ඈ ඔහුගේ සුරත ගෙන මීදුම ගලා ගිය සීතල සොඳුරු පරිසරයක ඇවිදිමින් සිටියාය. ඔහු ඒ හීනයේදී ඇයට වඩාත් ළංවූවා මෙන්ම ප්‍රේමයෙන් ආතුරව සිටියේය.

''අපි මෙහෙන් වාඩි වෙමුද ? '' ඔහු ගල්තලාවක් පෙන්වමින් ඇයට කීවේය. ඈ නිහඬව ගල්තලාව මත හිඳගත්තාය. ඔහුගේ උරහිසට බරවූවාය.

''මට හිතෙනවා අපි කරන්නේ වැරුද්දක් කියලා. මේක තහනම් ආදරයක්, එහෙමත් නැත්නම් නීති විරෝධී වැඩක්. කවුරුහරි දැක්කොත් ඒක අපි දෙන්නාට හොඳ නෑ. ඒත් මට ඔයා අමතක කරන්න බෑ. හැම වෙලාවෙම ඔයා මතක් වෙනවා. අනේ මන් දන්නනේ නෑ, මට තේරෙන්නේ නෑ. මොනවා කරන්ටද කියලා''

ඈ සිටියේ නිහඬවය. එහෙත් ඔහු සිටියේ ඇගෙන් පිළිතුරක් බලාපොරොත්තුවයි.

''ඇයි ඔයා කතා කරන්නේ නැත්තේ ''

ඔහු ඇගේ කනට මුව ළංකොට ඇසුවේය. ඈ එක් අතක් ඔසවා ලිපියක් ඔහු වෙත දිගු කළාය. එය දිග හරින විට ම ඔහු තුළ ඇතිවූයේ තිගැස්මකි.

''දෙයියනේ බැංකුවෙන් එවපු ලියුම කොහොමද ඔයා අතට ආවේ?''

දියණිය පැමිණ විදුලි බුබුළු දල්වන විට මුළු සාලයම ආලෝකවත්වීමත් සමඟ ම ඔහු ගැස්සී නින්දෙන් අවදි විය.

ඇ පැමිණ බිම වැටී තිබූ පත්තරයත් බැංකුවෙන් ආ ලිපියත් අහුලා මේසය මත තැබුවාය.

## කෙටි කතා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

දෙවන ස්ථානය
වී.වී.ඒ.එස්.ස්වර්ණලතා
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
කෑගල්ල



### හෘද සාක්ෂිය

සුපුරුදු අධ්‍යාපන කටයුතුවලින් මිදුණ දරුවෝ උපරිම නිදහසින් යුතුව කෙළි දෙලින් හැසිරෙති. පාසලට අලුතෙන් ඉදි වූ ගොඩනැගිල්ල අති උත්කර්ෂවත් අයුරින් විවෘත කිරීමේ සියලු කටයුතු සූදානමින් පවතී. පිළිගැනීමේ කටයුතු වල නිරත තූර්ය වාදක කණ්ඩායම හා නෘත්‍ය කණ්ඩායම මාර්ගය අසල රැඳෙමින් සිටින්නේ  මෙයට හෝරා දෙකකටත් වඩා අධික කාලයක සිට ය. අධික සූර්ය රශ්මියට හසු වූ දරුවන්ගේ කේඩෑරි අත් පා හා මුහුණු මැලවී ගොසිනි. මුව මත තවරා තිබූ විවිධ වත්සුනු දහදිය හා මුසුවී ඇඳුම් මතට කාන්දු වෙයි. හෙම්බත් වුණ දරුවන්ගේ මැසිවිලි  නඟන මුහුණු දුටු ගුරුතුමියද අසරණ වී ඇති වා සේය.

"මිස් වතුර ටිකක් බීලා එන්නද ............" එක් දරුවෙක් බැගෑපත්ව අසයි.

"එපා .... එපා ... තව ටික වෙලාවක් ඉන්න. එක්කෙනෙක් ගියොත් ඔක්කොම එහෙ මෙහෙ යයි. ලොකු සර් කෑ  ගහන්නේ මටයි". මුමුණන දරුවන් දෙස ද උදෑසන පටන් සුරතේ තබා ගත්

බුලත් අතද වියැළි වුවද සුරැකිව තබා ගෙන සිටින විදුහල්පති දෙස ද බලමින් ගුරුතුමිය දෙගිඩියාවෙන් පසුවෙයි.

කෙසේ වුවද තවත් හෝරාවක් පමණ පමාවී ආරාධිත අමුත්තා ළඟා වෙන ලකුණු පහළ වේ. ජංගම දුරකථනයට සවන් දෙන විදුහල්පතිවරයාගේ මුහුණ කලබලයට පත්වනු දුටු අවට සිටින්නෝ ආරාධිත අමුත්තා පිළිගැනීමට සූදානම් වෙති. මුලින්ම පැමිණියේ ආරක්ෂිත රථයයි. ගාම්භීර බැල්මෙන් දරුවන් හා දෙමාපියන් තල්ලු කර දමමින් ඔවුන් හැසිරෙන්නේ වෙනත් ග්‍රහ ලෝකයකින් ප්‍රාදුර්භූත අයවලුන් ලෙසිනි.

එහෙත් ආරාධිත අමුත්තා එනම් අමාත්‍ය උපුල් දේදුනුපිටිය මැතිතුමා නම් පැමිණියේ බොහොම සැහැල්ලුවෙන් හා සිනාසීමට හැකිතාක් උපරිම අයුරින් මුව පුරා සිනහ පුරවාගෙනය.

අධ්‍යාපන ලේකම්වරුන්, අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිතුමා, ආචාර්ය මණ්ඩලය හා ආරාධිත අමුත්තන් ඇමතිතුමාගේ මුහුණ බලා සිනාවක් නගන්නට හඳුනා ගැනුම් මතකයේ රඳවන්නට එකිනෙකා පරයා සැදී පැහැදී ඇති සේය. බුලත් හුරුල්ල රැගෙන දිව යන විදුහල්පතිවරයා එය ඇමතිතුමාට පිළිගන්වන්නේ ඉතාමත් යටහත් පහත් ලීලාවෙනි. මගුල් බෙර හඬ මැද සාම්ප්‍රදායිකව පොල් තෙල් පහන් සිළු දල්වන්නට ආරාධනා ලැබෙන තෙක් පුල පුලා බලා සිටින ආරාධිතයින් දෙස ආඩම්බර ලීලාවෙන් දෙනෙත් යොමු කළ ඇමතිතුමාට තම පාසල් සමය අමතක කළ නොහැකි සිතුවමක් සේ මැවී පෙනෙයි.

පිළිගැනීමේ කථාව පවත්වන විදුහල්පතිවරයා උඩගු ලීලාවක් ආරූඪ කරගෙන සිටියත් මුහුණේ ලියවී ඇති බැගෑපත් බව හා බියගුලු බව නිරීක්ෂණය කරන්නෙකුට පැහැදිලිව පෙනී යයි." මෙම විදුහලේම ශිෂ්‍යයෙකු ලෙස අධ්‍යාපනය හදාරා මෙතරම්

ඉහළ තානාන්තරයකට පත් වූ ඇමතිතුමා මෙම විදුහලට මෙන්ම ගම් ප්‍රදේශයටද සාඩම්බරයකි එතුමාගේ සානුකම්පිත අවධානය යොමු වීම නිසා මෙම රැස්වීම් ශාලාව ඇතුළු මෙම නව ගොඩනැගිල්ල අප වෙත ලබා ගැනීමට හැකි වුණා. මෙතුමා කවදා හෝ රටටම නායකත්වය ලැබිය හැකි තනතුරකට පත්වෙනවා නොඅනුමානයි”.

විදුහල්පතිවරයා තම පිළිගැනීමේ කතාවෙන් වැඩිපුර කාලයක් වැය කළේ ඇමතිතුමාට ප්‍රශස්ති ගායනය සඳහාය. එසේ නමුදු ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු නො කළ ඇමතිතුමා ශාලාව තුළ සිටින්නන් දෙස විමසිල්ලෙන් බලයි. ඉදිරි පෙළ අසුන්ගෙන සිටින නිලධාරීන් හා ව්‍යාපාරිකයින් කිහිප දෙනා හැරුණු විට දෙමාපියන් හා අනෙකුත් අවශේෂ මිනිසුන්ගේ මුහුණු පීඩාවෙන් හා දරිද්‍රතාවයෙන් පීඩාවට පත් වී සිටින බව පෙනෙයි. ඔවුහු උත්සවයේ වැඩ කටයුතු හා ඇමතිතුමා දෙස උපේක්ෂාවෙන් බලා සිටිති. දේදුනුපිටිය ඇමතිතුමා තමාට අතීතය මතක් කර දෙන කිසිවකු මෙම ශාලාව තුළ සිටීදැයි විපරමින් බලයි.

මම අන්තිමට ඉගෙන ගත්තේ පරණ ශාලාවේ අසවල් ස්ථානයේ යැයි දෑස වසාගෙන ආවර්ජනය කරයි. ඔහුට තම දුක්බර ළමා විය සිහියට නැගේ. කුඩා අවධියේම තම පියා අහිමි වූ උපුල්ට අධ්‍යාපනය ලබා දීමට තම මව වෙහෙස වූ අන්දම ඔහුට සිහිපත් වෙයි. ගමේ ධනවතුනගේ ගෙවල කුලී වැඩ කරමින් හා උදෑසන ගමේ කඩවලට විවිධ කෑම වර්ග සකස් කර දෙමින් ඇය වෙහෙස වූයේ තම දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දීමටයි. කිලිටි පාට චීත්තය හා කහ ගැහුණ හැට්ටය වෙනස් කරනු ලබන්නේ පාසල් සමිතියකට හෝ පන්සලට යාමට පමණි.

තාත්තා ඒ දවස්වල නිතරම කියනවා පුතාට හොඳ අනාගතයක් තියෙනවා හොඳට උගන්වන්න ඕන කියලා ඇයගේ නිරන්තර මැතිරිල්ලෙන් ඇය තම වෙහෙස මහන්සිය නිවා ගනී. වෙහෙස

අධික වීම නිසා මව අසනීප වන අවස්ථාවල පාසල් නොගොස් රැකියාවක් සොයා ගැනීමට ඔහුට සිතුණි. එනමුදු මවගෙන් ඊට කිසිදු අනුබලයක් නොවිණි.

පන්සලේ ලොකු හාමුදුරුවන් පුතා පුංචි කාලේ වේල පත් කඩේ බලලා තාත්තට කියලා තියෙනවා පුතාට හොඳට උගන්වන්න කවදහරි ඉහළ තැනකට ඒවි කියලා. පුතුගේ අනාගතය පිළිබද දකින සුභ සිහින මගින් ඇය තම දුක් කරදර හා වෙහෙස නිවා ගන්නට පුරුදුව සිටියාය.

උපුල් දේදුනුපිටියගේ ජීවිතයේ හැරවුම් ලක්ෂයක් වූ එක් සුවිශේෂී සිද්ධියක් ඔහුගේ මතකයෙන් කිසිදා ඉවත් නොවී ශේෂව පවතී.

"පුතේ මේ ආප්ප ටික කඩේට දීලා පුතා එන ගමන් සල්ලිත් ඉල්ලාගෙනම එන්න"

තම මව සුපුරුදු ලෙස අලුයම අවදිව සකස් කර දෙන ආප්ප කූඩය කඩයට රැගෙන යන්නේ කුඩා උපුල් විසිනි. එබැවින් ඔහුට තම පාසලේ සමහර ළමයින් ආප්පයා යන නමක්ද පටබැඳ තිබුණි. එක් උදෑසනක ආප්ප කූඩය එක අතකින් ද තම පොත් කිහිපය අනෙක් අතින්ද රැගෙන පාසල් යාමට පිටත් වූ උපුල්ට වෙල්යාය පසු කර මහ පාරට ගොඩනැගීමට ලැබුණේ නැත.

"ඒයි ආප්පයා ... ඔහොම හිටපන්" .......... ඒ හඬ ජගත්ගේ ය. ජගත් හා සුමිත් කවදත් තමා සමග සමීපතාවක් නැත්තේ ගුරුවරුන් පවා උපුල් පන්තියේ විෂයයන්ට දක්වන දක්ෂකම් කෙරෙහි වර්ණා කරන බැවිනි. උපුල් වගේ පාඩම් කරලා ලකුණු ගන්න", පන්තිභාර ගුරුතුමිය නිතර ජගත්ලාට අවවාද කරන්නීය. ජගත් ඇතුළු කිහිප දෙනෙකුට ඒ පිළිබද නොරිස්සුමක් ඇති බව උපුල් දනියි.

"ඒයි උඹේ කන ඇහෙන්නේ නැද්ද. ආප්ප ටිකක් දීලා පලයන් ..........." සුමිත් අණ කරන හඩින් විධානය කරයි.

"මේව කඩේට ............. ඔය ගොල්ලන්ට ඕන නම් කඩෙන් ගන්න .............."

"හා ............ කඩෙන් ගන්න නම් උඹට කියන්න ඕනද?, ආප්ප ටිකක් දීලා පලයන් " ජගත් උපුල්ගේ කොලරයෙන් අල්ලා ඇද්දේය.

"ඒයි ජගත් ...... අත හැරලා මට යන්න දීපන් ......." උපුල් අවධාරණයෙන් කීවද ඔවුහූ නැසු කන්ව හිදිති.

"ඇයි උඹ චණ්ඩියෙක්ද ... හිගන්නො ...." සුමිත් කියයි.

ජගත් ආප්ප කුඩයෙන් අල්ලා අදින අතර ඒය ලිස්සා කුඹුර පුරා විසිරී ගියේය. තම මව දහදිය පෙරමින් පිටි කොටන හැටි අලුයම අවදිව ආප්ප පුළුස්සන ඒ අහිංසක පෙනුම උපුල්ගේ සිතේ මැවී නොපෙනී ගියේය. ඔහුගේ දෙනෙත් කෝපයෙන් රත්වී සිරුර වෙව්ලා යනු දැනුණි. තම පංතියේ චණ්ඩි ලෙස නම් දරා තිබෙන ජගත් හා සුමිත් දැතින් ඇද කුඹුරට පෙරළා සිරුර මත නැගී පොරබදන්නට විය. තිදෙනාගේම සිරුරු මඩ වතුරෙන් නැහැවිනි. වෙනත් කුඹුරක වැඩ කරමින් සිටි ගොවියෙකුගේ හඬක් සමගම තිදෙනාම කුඹුරෙන් ගොඩට පැමිණි අතර විසිරී තිබූ පොත්පත් ටික අහුලාගත් උපුල් නිවසට ගියේය. අනික් දෙදෙනා නැවත තමන්ට පහර දෙන බවට සපථ කරමින් දිව යනු ඈතට යන උපුල්ට ඇසුණි. දෑස් කඳුලින් බරව නිවසට එන උපුල් මවට පැවසුයේ තමාගේ වරදකින් ලිස්සා ඇළට වැටුණ බවකි. මවට කිසිසේත්ම සැකයක් නොහිතුණි. කිසිදාක කිසිවකු හා අඩදබරයකට නොයන අහිංසක දරුවෙකු වන තම පුතා ගැන ඇයට සිහිනයකිනුදු අවිශ්වාසයක් ඇති නොවේ.

පසු දින උදෑසන පංතියට පැමිණි විගස උපුල්ට විදුහල්පතිතුමාගෙන් කැඳවීමක් ලැබුණි. විදුහල්පතිතුමාගේ කෝප දීප්ත දෑස් දෙසත් ජගත්ගේ පියාගේ ආඩම්බරකාර මුහුණ දෙසත් මාරුවෙන් මාරුවට බැලූ උපුල්ට ඊයේ ඇති වූ අරගලය ගැන සිහිපත් විය.

"මොකද අයිසේ ... මේ ළමයින්ට ගහන්නේ තමුසේ ඉස්කෝලෙ එන්නෙ ඉගෙන ගන්නද නැත්තම් චණ්ඩිකම් පෙන්වන්ටද?", විදුහල්පතිතුමාගේ ගොරනාඩුව හමුවේ උපුල් භීතියෙන් වෙව්ලා ගියේය.

"මේ ඉස්කෝලේ හදන්න ඉඩම පරිත්‍යාග කරලා තියෙන්නේ අපේ අප්පච්චි ... මේ වගේ උනහපුලුළුවෝ ලව්වා අපේ දරුවන්ට ගුටි අන්නවන්න නෙමේ , විදුහල්පතුතමා ...... මූ අදම ඉස්කෝලෙන් අස් කරලා දාන්න" ජගත්ගේ පියා විදුහල්පතිතුමාටත් අණ දෙන්නා සේය.

"හරි, හරි අපි මේක විභාග කරලා බලමු. මුදලාලි මහත්තයා.... කලබල වෙන්න එපා"

"නෑ ...නෑ විභාග ඕන නැහැ. දැන්ම මූ පන්නලා දාන්න ඕනෑ .."

"හරි, හරි .... මං මෙයාට හොඳ දඩුවමක් දෙන්නම් ........." විදුහල්පතිතුමා වේවැල අතට ගත්තේ වදකයෙකු සේ බැල්මකින් උපුල් දෙස බලමිනි.

"අනේ.... අනේ.... සර් ... මං ඒනකොට, ....මං එනකොට ........." උපුල්ට කිසිවක් කථා කර ගත නොහැකි විය.

විදුහල්පතිතුමා උපුල්ගේ හිස මුදුනින් අල්ලා පිට හරහා දිගට හරහට වේවැල් පහර දෙද්දී උපුල් වේදනාවෙන් ඒ මේ අත ඇඹරුණේය . අහම්බෙන් විදුහල්පතිතුමාගේ කාමරයට පැමිණි

රුක්මණී ගුරුතුමිය වහා උපුල් අල්ලා "මොකද ..... මේ ..... අනේ සර් මේ ළමයා පන්තියෙන්ම අහිංසක දරුවෙක්නෙ ...." ඇය පුදුමයෙන් ප්‍රශ්න කළේ ...., මෙතන කුමක් හෝ වැරදීමක් සිදුව ඇති බව වටහාගෙනය. ඒ නිමේෂයේ ලද අවසරයෙන් පැනගත් උපුල් නැවතුණේ පන්ති කාමරය තුළය.

උපුල්ගේ අසරණකම දුටු ඔහුගේ යහළුවෝ උපුල් වටකර ගත්හ. රුධිරය පිටට පැමිණීමට ආසන්න රතු පාටට පැල්ලම් ගැහුණ දෑත් දෙපා රත්වුණ දෙනෙත් දුටු මිතුරෝ විස්මයට පත් වූහ. සුමුත් හා ජගත් සිටියේ ඉතා ජයග්‍රාහී ලීලාවෙනි.

"අද ආප්පයට හොඳ කෑමක් හම්බවෙලා ..." ජගත් මහ හඬින් වහසි බස් දොඩයි.

"මේක මහා අසාධාරණයක් ..... හැමදාම වැරදි කරන එවුන්ට මොන දඬුවමක්වත් නැහැ....."

සඳමාලි පන්තියේ මැද්දට පැන මහ හඬින් කෑ ගැසුවාය. කෝපය වැඩිකමින් ඇගේ දෙනෙත් කඳුලින් පිරී යයි.

"ආ මේකිටනේ අමාරුව. හිටපන් උඹටත් ප්‍රින්සිපල්ට කියලා ...... ඉල්ලලා දෙන්නම්" "මේ අසාධාරණයට ... කවදා හරි මුන්ට දඬුවමක් දෙන්න ඕනෑ",

සඳමාලි නැවත කෑ ගසයි. දත්මිටි කෑ උපුල් කඳුළු දෙනෙතේම හිර කර ගත්තේය.

මේ අවනඩුව පන්තියේ සාමාන්‍ය ගැටලුවක් බවට පත් වෙද්දී සිසුන් බොහෝ දෙනෙක් උපුල්ට සහාය දක්වන්නට නිතැතින්ම යොමු විය. අධ්‍යාපන කටයුතුවලදී කැපී පෙනෙන ලෙස දස්කම් දැක්වූ උපුල් පන්තියේ බොහෝ දෙනෙකුට සහාය විය.

ක්‍රමයෙන් උසස් අධ්‍යාපනය ලද උපුල් බොහෝ දිළිඳු දරුවන්ට නොමිලයේ හවස් වරුව අධ්‍යාපනය ලබා දීමට තම හිත මිත්‍රයින් සමග එක්ව කටයුතු කළේය. ඔහු කෙමෙන් ගමේ පොදු ජන හිතවතා බවට පත්වෙද්දී සඳමාලි ඔහුගේ සෙවණැල්ල මෙන් සහාය වූවාය. ප්‍රදේශයේ සමිති සමාගම් වලට මඟුලට, මරණයට සියලු තරුණ කොටස් ඒකරාශී කරගෙන ශ්‍රමයෙන් දායකත්වය දෙමින් සාමාන්‍ය ජනතාවගේ ගැලවුම්කරුවෙකු බවට පත්වූයේය. කෙමෙන් ඔහු දේශපාලන වේදිකාවට ප්‍රවිෂ්ට කරවූයේ ප්‍රදේශවාසීන් විසිනි.

"මට ඕවට වියදම් කරන්න සල්ලි නැහැ". ඔහු පසුගාමී වූයේ ඔහුගේ අසරණකම දන්නා නිසාය.

"අපි සතෙන් සතේ හිගා කාලා හරි ඔයාව පාර්ලිමේන්තු යවනවා.... ඔයා ඊට පස්සේ අපි ගැන බලන්න..."

ඔහුගේ හිත මිත්‍රයින් මෙන්ම ප්‍රදේශයේ ජනතාවද ඔහුට හදවතින්ම ආශිර්වාද කරමින් ඔහු ඉහළට ඔසවා තැබීමට උත්සුක වූහ. ඔහු මුදල් එකතු කර එකා වන්ව දිවා රෑ නොබලා සිදු කළ වෙහෙස හා මහන්සියේ ප්‍රතිඵල ලැබුණි. සඳමාලි ඉතා කුඩා කල පටන් තැපැල් ඉතිරිකිරීම් පොතේ අන්තිම ශතය දක්වා ඔහුට පරිත්‍යාග කළාය.

"උපුල් ඔයා දිනනවාමයි. ඒක ඉර හඳ වගේ මට විශ්වාසයි", ඇය කර බැඳි මාලය ඔහුගේ දෝතට දුන්නේ අවශ්‍ය විටක මුදල් කර ගන්නා ලෙස ඉල්ලමිනි. ප්‍රදේශයේ ප්‍රබලයන්ගේ තරවටු හා තාඩන පීඩන බොහොමයකට මුහුණ දීමටත් පොලීසිවල ලගින්ටත් ඔහුට සිදු වුවත් අවසානයේදී ඔහු ජයග්‍රහණය කළේය. පාර්ලිමේන්තුවට පය ගැසූ ඔහු වැඩි කල් නොයවාම ජනප්‍රිය චරිතයක් බවට පත් විය. ඔහුගේ වදනින් රටම වසඟ කිරීමට සමත් වූ ඔහු අගමැතිතුමාගේ සමීප ඇසුර ලැබීමත් සමග වඩාත්

බලසම්පන්න චරිතයක් බවට පත්ව සිටියේය. කෙමෙන් නගරයට හුරු වීමත් සමගම තමා මේ දක්වා ඔසවා තැබූ දුප්පත් ජනතාව අමතක වීමට වැඩි කලක් ගත වූයේ නැත. ප්‍රබල ඇමතිවරයකුගේ දියණියක හා විවාහ වීමෙන් ඔහු ඉහළ පන්තියේ අභිෂේක ලැබීමට වාසනාවන්ත විය. එහෙයින් තව දුරටත් ගම සමග තිබූ එකම සබැඳියාව බිඳ දැමිණි.

"මිනිහා ........... දැන් අල්ලන්න බැහැ. උගෙන් වැඩක් නැහැ .....එයාට දැන් මතකවත් නැතුව ඇති. අපි උං වෙනුවෙන් ගුටි කාපු හැටි", ඔහුගේ සමීපතයින් කීවේ දෙනෙතේ කඳුළු පිස දමමිනි. "අපිට නම් මොනවා කළාම මොකද. අර අහිංසකීට නම් කරපු දේ නම් කවද හරි පලදෙන්න ඕනැ ............." උපුල්ගේ මිතුරෙකු සුසුම් ලෑවේ තවමත් අවිවාහකව සිටින සඳමාලි සිහිකරමිනි.

ප්‍රශස්ති ගායනයේ යෙදෙන ලේකම්වරුන් හා අධ්‍යක්ෂවරුන්ගේ හඬින් උපුල් දේදුනුපිටිය ඇමතිවරයා නැවතත් අතීතයෙන් මිදී පාසලේ උත්සව කුටියට පිවිසියේය.

ඔහුගේ සිතේ සියුම් පසු තැවිල්ලක් මෝදුවන බවට ඔහුට දැනේ. තමා අතීතය තුළ කිමිදී සිටි අයුරින් කිසියම් කෙනෙක් දුටුවාදැයි ඔහු වහා ශාලාව පුරා විමසිල්ලෙන් බලයි.

"මම නම් ජීවිතේ තියනකම් ඔය මිනිහගේ මූණවත් බලන්නේ නැහැ"යි තම සිතට සපථ කිරීම් කොතෙකුත් තිබියදීත් කලකින් ගමට ප්‍රවිෂ්ට වූ තම හිතවතාගේ ප්‍රතිචාරය බලා ගැනීමට අවසානයේ සඳමාලිට සිහි තිබුණි.

ශාලාව පිටිපස කුලුනකට මුවා වී ඇය උපුල් දෙස දෑස් හෙළුවාය. බොහෝ කලකට පසු ඔහු දකින්ට සිතුණේ ඇයි දැයි ඇයට නිශ්චිතව සිතා ගැනීමට නොහැකි වුවත් යටි සිතෙන් ඒ සඳහා යම් පෙළඹවීමක් ඇති වන්නට ඇත. පෙර තිබූ අහිංසක පෙනුම

වෙනුවට ඔහු වෙත ගාම්භීර පෙනුමක් ආරූඪ වී ඇතැයි ඇයට සිතුණි. ඔහු බෙහෙවින් පැහැපත් වී ඇතැයි යන සිතුවිල්ලෙන් ඇගේ සිත මෙහොතකට දැවී යයි. ඈත සිට වුවද අහම්බෙන් ඇය දුටු ඔහුට ඇගේ නෙත් ඊතල පහරින් මිදෙන්නට හැකියාවක් නොවිණි. ඔහුගේ ගාම්භීර දෙනෙත මොහොතකට අසරණ වන දුටු ඇයගේ සිතට සියුම් සතුටක් කාන්දු වෙයි.

තමා මෙම උත්සව භූමිය පුරා කිසිවකු විසින් හෝ නොසලකා හැරි කෙනෙක් වුවද ඔහු මෙම තත්වයට ගෙන ඒමට තමා මොන තරම් කැප කිරීමක් සිදු කරන්නට ඇත්දැයි ඇයට ක්ෂණිකව සිතුණි. ඇය නොසැලිව ඔහු දෙස බලා සිටියාය.

ඔහුටත් නොදැනුවත්ම ඔහු අත තිබුණ පෑන බිම පතිත විය. ඔහු හිස පහතට නැඹුර කර ගනිමින් පෑන සොයන්නට විය. මෙය දුටු විදුහල්පතිවරයා වහා ඔහු වෙත දිව ආවේය.

"සර් ...... මොකක්ද නැති වුණේ .........."

"මගේ හෘද සාක්ෂිය ...................."

එය පිටවූයේ ඔහුගේ දෙතොලින්ද හදවතින්දැයි විදුහල්පතිවරයාට නො දැනුණි.

## කෙටි කතා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**තෙවන** ස්ථානය
සුසිල් කුලතුංග
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
පූජාපිටිය

### අන්තෝජටා

''මනුෂ්‍ය පරම්පරාව සුමට විදියට ඉදිරියට යාමට අත්‍යවශ්‍ය සාධකයක් තමයි ප්‍රේමය, ආදරය. ඔය කියන ප්‍රේමය ඇති වෙන්න රූපය, ගුණවත් බව, සමාජශීලී බව, තව ගොඩක් දේ බලපානවා.''

''සර් ..... ඔය කියන කිසිවක් නැතිව පවා කෙනෙකුට ප්‍රේමයක් හට ගන්නට බැරිද?, සරෝජා ඇසූ ප්‍රශ්නයට මහාචාර්ය සේනානායක කුමන පිළිතුරක් දේදැයි කවුරුත් නෙත් දල්වා බලා සිටියහ.

''අපොයි පුළුවන් - ඒකට තමා සරසවි ප්‍රේමය කියන්නේ.''

ටියුට් ක්ලාස් එකේ සියලු දෙනාම එක හඬින් සිනාසුනහ. සිනාසුන සිසු සිසුවියන් අතර සඳලේඛාද දුටු මහාචාර්යවරයා ඇය දෙස විමසිලිමත්ව බලා සිටියේය.

''සඳලේඛට හිනාවෙන්නත් පුළුවන්. හැබැයි සඳලේඛයි තව දෙන්නෙකුයි මේ ක්ලාස් එකේ ඉන්නවා අවසාන නිබන්ධනය අවසන් කරල තාම නුදුන්න අය. මං නොකීවයි කියන්න එපා. මෙරිට් පාස් තියා ඕඩිනරි පාස් එකක්වත් ලැබෙන්නේ නැතිවෙයි නිබන්ධනය බාර නුදුන්නොත් මං හෙට උදේ ඉඳල අට වෙනකල් ක්වාටර්ස්වල ඉන්නවා. ඕනෑනම් ක්වාටර්ස්වලට ගෙනත් භාර දුන්නැහැකි. අටට ඉස්සර භාර

නුදුන්නොත් මං ඊට පස්සේ භාර ගන්නේ නෑ. හෙට අවසාන දවස.''

මාහාචාර්ය සේනානායකගේ ප්‍රකාශය සඳලේඛාට කිහිප වතාවක්ම මතකයට ආවේ බස් රථයේ ගමන් කරමින් සිටියදීය. බෝඩිමේ සිට කොළඹ මහ රෝහලට යාමට බසයට නැගුණු ඇය ඊට ගොඩවී ටික වේලාවකින් නිදි කිරා වැටුණාය. ඇයට මතක හැටියට නිබන්ධනය ලියා අවසන් කළේ ඊයේ පාන්දර දෙකට පමණය.

තම මිතුරියගේ මව බැලීමට උදයෙන්ම රෝහලට යා යුතුය. ඊට පසු උදේ අට වීමට පෙර ප්‍රොෆෙසර් හමුවී නිබන්ධනය භාර දිය යුතුය. නිබන්ධන මාතෘකාව අනුමත කරගෙන මාස දෙකක් ගතවන තුරු දත්ත එකතු කර සැලැස්ම සුදානම් කළා විනා එය අවසන් කිරීමට තමාට නොහැකි වූ බව ඇගේ මතකයට ආවේ කලකිරීමක්ද සහිතවය.

''මේ සති අන්තයේදී පටන් ගන්නවා'' ඇය කිහිප විටක්ම තීරණය කළාය. එසේ තීරණය කරන්නේද තම සගයින් නිබන්ධනය ගැන සාකච්ඡා කරන අවස්ථාවලදීය. ''අනිත් උන් ලියල භාරදීලත් ඉවරයි.''

බෝඩිමට වී සති අන්තයේ එය ලිවීම ආරම්භ කිරීමට සතිය පුරා සැලසුම් කළද, සිකුරාදා වන විට තම මව හා විසිමට නිවසට යාමට තම සිත විසින්ම කරන පෙළඹවීම ඉක්මවා යෑමට තමාට නොහැකි වූ බවද ඇයට සිහිපත් විය. ''කමක් නෑ - සෙනසුරාදා උදේ ඉඳලම පටන් ගන්නවා ලියන්න ගෙදරදී.''

නිවසට ගොස් ගතකරන දින දෙකේදී ලිවීම් වස් අවශ්‍ය පත පොත සහ සටහන් බෑගයට දමා ගන්නා සඳලේඛා කිසිම පරිහරණයකින් තොරව ඒවා සඳුදා ආපසු බෝඩිමට ගෙනෙන්නීය.

''ඇයි පුතේ අපි එපා කියද්දි හැම සතියේම ගෙදර දුවගෙන එන්නේ. කොච්චර මහන්සියක්ද ඒක?''

ගෙදරට යන සෑම අවස්ථාවකදීම අම්මාගේ මුහුණේ ඉපදෙන ප්‍රබෝධයත්, එතැන් සිට ඇය නියැලෙන කාර්යයන් වලදී දක්වන යුහුසුලුභාවයත් සඳලේඛා මෙනෙහි කරන්නේ, ඇගේ මව තමාගේ දර්ශනයෙන් මොනතරම් තෘප්තියට පත්වෙන්නේ දැයි සැලකිලිමත් වෙමිනි.

වකුගඩු රෝගයෙන් පෙළෙන මව ඒ සඳහා තෙවසරක සිට ප්‍රතිකාර ගත්තද නිෂ්ඵාවට සුවයක් නොදැක්කාය. තමාගේ රෝගය හේතුවෙන් තමා විඳින මේ වේදනාව තම දියණිය ඉදිරියේ ප්‍රදර්ශනය නොවීමට ගන්නා උත්සාහය සඳලේඛාට රහසක් නොවීය. තම පියාද මවගේ ඒ පරිශ්‍රමයට අනුබල දීමක් වශයෙන් රෝගය ගැන වදනකුදු තමා සමග නොදෙඩීමට වගබලා ගන්නා බවද සඳලේඛා ඒත්තු ගත්තාය.

''දැන් අම්මට හොඳයි - මගේ දුව ඔය විශ්ව විද්‍යාල වැඩ ටික හොඳට කරගන්නකෝ මං මෙහේ කටයුතු බලාගන්නම්.'' ඒ පියාගේ නිරන්තර ප්‍රකාශය විය. මෙහි තවත් විශේෂයක් වූයේ මවගේ රෝගයේ අවදානම් බව පිළිබඳව පියාගේ වේදනාව පියා තම මවගෙන් පවා වසන් කිරීමය. එහෙත් කොතරම් අයාසයක් ගත්තද කරන කාර්යය නවතා එක එල්ලේ බොහෝ වේලාවක් කල්පනා කිරීම, සුසුම්ලෑම ආදිය තුලින් පියාගේ හදවත පැහැදිලිව හඳුනා ගත හැකි බව සඳලේඛා අවබෝධ කර ගත්තාය.

එක් අතකින් බලන විට ඔහුගේ මෙම චර්යාවට හේතුව මවගේ රෝගය පමණක් විය නොහැක. එය ඉක්මවා ගිය තවත් ඛේදවාචකයක් ඔහු වෙළාගෙන තිබුණි.

උතුරේ යුධ සමයේ දී තම එකම සොහොයුරා අතුරුදහන් වීම ඊට බලපෑ තවත් ප්‍රධාන හේතුවක් බව කවුරුත් දත්හ.

එම අවාසනාවන්ත සිදුවීම වූ වකවානුවේ නිවසේ සියලු දෙනාම එකතුව හැකි පමණින් ඒ පිළිබඳව සොයා බැලූ බවත් විශේෂයෙන්, තම මව පේන බැලීම්, බාරහාර, ශාස්ත්‍ර ඇසීම්, දේවාල පුජා ආදි නොපෙනන බලවේග පසුපස නිරන්තරව ගිය බවද ආවර්ජනය කළ සඳලේඛා අවසානයේ ඇති වූ අපේක්ෂා භංගත්වය කෙළවර තම නිවසේ බිත්ති හතර තුළ ඒ පිළිබඳ වදනකුදු නොදෙඩීමට තිදෙනාම ස්වයං වාරණයක නියැළුණු බවද සිහි කළාය.

යුද්ධයේදී මිය ගිය හෝ අතුරුදහන් වූවන් සඳහා රජයෙන් ගෙවන වන්දිය හා විශ්‍රාම වැටුප් පිළිබඳව යුධ හමුදාව විසින් වරෙක නිවසට පැමිණ පරීක්ෂණයක් පවත්වා විස්තර රැගෙන යන ලදී.

කලෙක සිට තම කුඹුර ඉස්මත්තාවේ වනාත කෑල්ල අස්වැද්දීම පිළිබඳව තම ඥාතියෙකු වූ කරුණාදාස මාමා තම පවුල සමඟ ඇති කරගෙන සිටි හබය හේතුවෙන් පවුල් දෙක අතර ඇතිවූ විරසකය අවසානයේ ගැටුමක් දක්වා දුරගිය බවද ඇයට කල්පනා විය. අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් කරුණාදාස මාමා තම සොයුරා යුද්ධයේදී මිය නොගිය බවත්, හමුදාවෙන් පලා ගොස් විදේශ ගත වී ඇති බව සඳහන් කරමින් ඔහු විසින්ම නිර්මාණය කළ සාක්ෂි කීපයක්ද සහිතව පෙත්සමක් යැවීම හේතුවෙන් යුධ හමුදාවෙන් කරන ලද පරීක්ෂණය අවසාන වනතුරු විශ්‍රාම වැටුප හා වන්දිය ගෙවීම අත්හිටුවන ලදී. දැනට වසර දෙකකට වැඩියෙන් කාලය ඉක්මවා ගොස් ඇති නමුදු මේ දක්වා අවසන් තීරණයක් නොලැබුණු බවද සුසුමක් හෙළමින් මතකයට නගා ගත් සඳලේඛා, ගෙදරට ලැබුණු ආදායම නතරවීම හේතුවෙන් පවුල අනපේක්ෂිත තත්වයට පත් වුවත් තම පියා ඒ පිළිබඳව බැලුවේ වෙනත් දෘෂ්ටිකෝණයකින් බව ආවර්ජනය කළාය.

''මගේ කොල්ලා යුද්දෙට බයේ පැනල ගියේ නැහැ. උගෙ ඇඟේ දුවන්නේ මගේ ලේ. ඔය කතා හදන උන්ගේ කටේ ගෙඩි දාන්න ඕනෑ. අනික කොල්ලාගේ නම විකුණාගෙන සල්ලි අරන් කන්න අපිට උවමනාවක් නැහැ. මං මගේ බුලත් කොටුවෙන් මේ වියදං පිරිමහ ගන්නවා. මං දන්නවා උෟ ඉන්නේ කොටින්ගේ හිරබාරේ, කවදා හරි උෟ එනවා.''

''පුතාට වන්දියක් ගත්තොත් ඔය විශ්‍රාමෙ ලැබෙන කල් අක්කගේ ලෙඩේට වත් වියදං කොරන්න බැරිද?'' තම පුංචි අම්මා වරෙක කළ ප්‍රකාශයෙන් පසු ඇය නිහඬ වුයේ තම පියාගේ දැඩි ස්ථාවර ආවේගශීලී ඉහත ප්‍රකාශයෙන් පසුවය.

මේ සියල්ල සඳලේඛාගේ නෙතට මැවෙන්නේ, සවනට ඇසෙන්නේ සති අන්තයේ නිවසට පැමිණීම හේතුවෙනි. එහෙත් තම ආගමනයෙන් මව්පිය දෙදෙනාගේ සිත්වලට කිසියම් වූ සහනයක් වන බව පැහැදිලි වීම ඇයගේ සති අන්ත චාරිකාවට ප්‍රබල හේතුවක් විය. ගත වූ සියලු සංසිද්ධීන් පිළිබඳව අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සිතමින් ආ සඳලේඛාගේ පියවුණු නෙත් විවර වුයේ බස්රථය මහ රෝහල වෙත ළගා වුයේ දැයි සැක හැර ගැනීමටය. නැත තව දුර යා යුතුය.

''හය වෙනකොට හොස්පිටල් එකට යනවා. හතට කලින් ආපසු එන්න පුළුවන් හත වෙනකොට ඩියුටි එක සර්ට දෙන්න ඕන වැඩිම උනොත් හතයි කාල.''

''දුවේ ඔය නිකං ඉන්න වේලාවක අර පිහිල්ලේ ගෙදර නංගී බලන්න වතාවක් පලයන් මහ ඉස්පිරිතාලෙට, කොහොමත් ගමේ නැදෑයෙක්නේ අනික චතුරිකා දුව උඹෙත් යාළුවානේ. ඒක නෙවෙයි මං අහන්න හිටියේ උඹට ඔය ගමන් බිමන්වලට සල්ලි තියෙනවාද?

''ඔව් අම්මේ අපට හම්බෙනවානේ ශිෂ්‍යාධාර සල්ලි''

''ඒකත් එහෙමද, ඉගෙන ගන්නවාටත් පඩි ගෙවනවාද?

තමා කුඩා කල සිට එකට පාසල් ගිය චතුරිකා තමා සමඟ කොළඹ විශ්වවිද්‍යාලයට අතුළත් වුවද ඇය ඉන්නේ වෙනත් පීඨයක හෙයින් තම තමන්ට නිරන්තරව මුණ නොගැසෙන බව දෙදෙනාම දනී. ඇයගේ මව කලෙක පටන් පැවති ඇදුම රෝගය උත්සන්න වී තම ගමේ රෝහල වූ මාවනැල්ල රෝහලෙන් කොළඹ රෝහලට යවා දනට මාසයක පමණ සිට ප්‍රතිකාර ගන්නා බව සඳලේඛා දන ගත්තේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වන දොරටුව අසලදී චතුරිකා හමුවූ අවස්ථාවකදීය. දින ගණනාවක් ඇය බැලීමට රෝහලට යාමට පෙරුම් පිරුවද කුමන හෝ කටයුත්තක් ඉස්මතු වීම හේතුවෙන් එය ප්‍රමාද වූ බව සඳලේඛා දනී.

නිදිවරා හෝ පසුගිය සති අන්තයේ තම නිබන්ධනය ලියා අවසන් කිරීමට හැකිවීම පිළිබඳව සඳලේඛා මද අස්වැසිල්ලක් ලැබුවාය. තමාගේ නිබන්ධනය අරබයා සරසවි කැන්ටිමේදී තම මිතුරකු වූ ''සජීව'' කරන ලද ප්‍රකාශයක් සඳලේඛාගේ මතකයට නැගුණි.

''මොකක්ද බං හැමදාම ප්‍රොපාගෙන් බැනුම් අහන්නේ ඔය නිබන්ධනය හිංදා - යකෝ හොඳ පිටකවරයක් ප්‍රින්ට් කර ගනිං. පෙරවදනේ ලියපං ප්‍රොපාගේ උදව්වයි, එයාගේ විස්තරයි අරවා මේවා. ඉන්පස්සේ පටුන - ඔන්න ඊට පස්සේ අන්තර්ගතය, අන්න එතනදී ඔය ටියුට් පංතියක ප්‍රොපා කියපු දෙවල් ටිකක් දාලා ඉන් පස්සේ උඹට හිතෙන දෙයක් ලියපං''
අන්තිමට නිගමනයේදී ප්‍රොපා ලේකචර් එකකදී කියපු කරුණු දෙක තුනක් උඹේ විදිහට ලියපං ඕක අකුරක් නෑර කිවන්නේ

නෑ බං. හැබැයි ආශ්‍රිත ග්‍රන්ථ කීපයකට ප්‍රෝපාගේ පොත් දෙක තුනකයි තව සිංහල ඉංග්‍රීසි පොත් ගොඩකයි නම් ලියපං. ''

''ඒවා කියවයිද දන්නේ නැහැ''

''අනේ යකෝ තර්ඩ් ඉයර් ඉඳලවත් ඕක දන්නේ නැද්ද? ඕවා අකුරක් නැර කියවන්නේ නෑ. ඔන්න ඕකයි ක්‍රමේ. පලයං අදම ලියපං.''

''සජීව''ගේ එම කථාවට කැන්ටිමේ තේ බිව්ව සැවොම සිනා වුවත් සැබවින්ම තම නිබන්ධනය ලිවිමේ ලා අනුගමනය කළේ ඒ ක්‍රමවේදය බව මෙනෙහි කළ සඳලේඛාගේ මුවගට මදහසක් නැගුණි. බෑගයට අත දැමූ ඇය නිබන්ධනය බෑගයෙන් එළියට ගෙන බැලුවාය.

''සැබෑ මිනිස් සබඳතාවයන්ගේ ගාමක බලවේගය අන්‍යොන්‍ය ආදරයයි'' තමා අනුමතකරගත් ඉදිරිපත් කළ මාතෘකාව දෙස මොහොතකින් බලා සිටි ඇය පොත යළි බෑගයට තල්ලු කළාය.

''අම්මට කියන්න ඕනෑ මං අද හොස්පිටල් යනවා කියලා. අම්මා කී පාරක් කීවාද යන්න කියල.''

ඇය දුරකථනය ගැනීමට බෑගයට අත දැමුවාය. නැත, නැවත විමසුවද එය නැත.

''ෂහ්.. ෆෝන් එක මේසේ උඩ - මදෑ හදිසියට ආවා.'' හයයි පහට බස් රථයෙන් බට සඳලේඛා රෝහල වෙත ගියේ කඩිනම් ගමනිනි. රෝහල් දොරටුව අසල පෝලිමකි. ගේට්ටුවට පෙනෙන තෙක් මානයේ වූ කඩයක් තුළ විදුරුව තුළින් ඇය දුටුවේ උදෑසන ආහාර වර්ග කීපයකි. ඇයට උදේ ආහාර ගැනීමට තරම් කාලයක් නැත. හැකි ඉක්මනින් ආපනශාලාව වෙත ගිය ඇය සැන්ඩ්විච්ස් තුනක් ගෙන එය තම බෑගයට දමා ගත්තේ අවකාශයක් ලැබුණ විට කෑමේ අපේක්ෂාවෙනි.

වාට්ටුවට ගිය සඳලේඛා දෙපස ඇඳන් මත වැතිර හුන් රෝගීන් දෙස බලමින් ඉදිරියට ඇදුණේ චතුරිකාගේ මව හෙවත් පිහිල්ලේ ගෙදර නැන්දා දකිනු රිසියෙනි. ඇයට නැන්දා සොයා ගැනීමට නොහැකි විය.

''වාට්ටුව මාරු කළා වත්ද? ඊයේ පෙරේදා චතුරිකා හම්බුවුණේවත් නැහැනෙ.'' අත්බෑගයට අත දැමූ සඳලේඛා විවර වූ නෙතින් යුතුව අත ආපසු ගත්තාය. ''ආහ් ! ෆෝන් එක ...''

ඇය දෙපස ඇඳන් දෙස බලමින් වාට්ටුවේ කෙළවරටම ඇදුනේ වරින්වර අත් ඔරලෝසුව දෙස ද බලමිනි. වාට්ටුවේ අවසන් ඇඳ දක්වා ගිය ඇය අපේක්ෂා භංගත්වයෙන් යුතුව ආපසු හැරී ඉදිරියට ආවාය.

''දුවේ පොඩ්ඩි මම මෙහේ.''

තමා පසු කළ ඇඳක වැතිර හුන් වයෝවෘද්ධ මව ඇයට අතින් සන් කරන වග සඳලේඛා දුටුවාය. සඳලේඛාගේ මුවට මදහසක් නැගුණි. ඇය ඇඳ වෙත ගියා නොව ඇදුණාය. වහා අත දිගු කළ මව සිනාමුසු මුවින් යුතුව සඳලේඛාගේ අත තරයේ අල්ලා ගත්තාය.

''පොඩ්ඩි මං දනගෙන හිටියා උඹ කොයිවෙලේ හරි එයි කියල මං බලන්න. කෝ උඹේ මහ එකා? ඌ මං මෙහේ දාලා ගියාට පස්සේ කී දවස ද ආවෙ මං බලන්න. මං මතක නෑ ඌට''

මව එක අතක් සඳලේඛාගේ ඇඟිලි අතර සිරකරගෙන සිටි අතර අනිත් අතින් සඳලේඛාගේ බාහුවේ සිට පහළට පිරිමදින්න වුවාය.

''ආ ...අද සුමනාවතීගේ දුවත් ඇවිත් ඉන්නේ කාලෙකට පස්සේ'' අසලින් ගිය හෙදිය සිනාමුසු මුවින් යුතුව සඳලේඛා දෙසට හැරුණාය.

''මීසි මේ මගෙ මිණිබිරි - පොඩ්ඩි - මං හදාගත්තේ පුංචි සන්දියේ ඉඳලා. අපේ ලොකු පුතාගේ දූ- මගේ ලේලි අන්තා උනේ මේකී පුංචි සන්දියේ - දැන් ලොකු මහත් වෙලා ගාමන්ට් එකක වැඩ - ''

සඳලේඛාගේ අත අල්ලාගත් මව තව බොහෝ දෑ කීවාය. දෙදෙනාම සිනාසුණාහ.

''මේ... ඔයා යන්න කලින් මං පොඩ්ඩක් මුණ ගැහිලා යන්න.'' ආපසු හැරුණ හෙදිය පැවසුවාය.

''හොඳයි මිස්''

''උඹ මොනවාද ගෙනාවෙ පොඩ්ඩි මට කන්න. මං දන්නවා උඹ හිස් අතින් එන්නේ නැති බව.''

ඇය ප්‍රකාශ කළේ සඳලේඛාගේ අත් බෑගය දෙසට නෙත් යොමා ගෙනය. අනපේක්ෂිත ප්‍රශ්නයෙන් කැළඹුණ වගක් නොපෙන්වූ සඳලේඛා බෑගය හැර සැන්ඩ්විච්ස් සහිත පාර්සලය ඇය අත තැබුවාය.

''මං කීවේ.. මං කීවේ... උඹට මං අමතක නැහැ. උඹ අතින්ම කවපංකො'' ඇය සඳලේඛාගේ අත මඳක් ලිහිල් කළාය.

සඳලේඛා අත හරවා වෙලාව බැලුවාය. ''තව විනාඩි තිහයි තියෙන්නේ, ට්‍රයිෂෝ එකකින්වත් යනවා. කැම්පස් එකට විනාඩි පහළොවකින් යයි.''

''අත්තම්මේ වතුර ටිකක් පොවන්නද? ගිලින්න අමාරුයි නේද? ඇය අත්බෑගයෙන් තමාගේ වතුර බෝතලය අතට ගත්තාය.

''එපා පොඩ්ඩි උඹේ අතිං කවනවා නම් මට ගල් වුනත් ගිල්ල හැකි'' ඇය ප්‍රකාශ කළේ මහ හඬින් සිනාසෙමිනි.

කෑම කැවූ ඉක්බිති සඳලේඛා පිඟාන සෝදා ලොකරය තුළට දැම්මාය.

''පොඩ්ඩියේ - දවල්ට අඩුයි - හැන්දෑකරේ වෙන්න වෙන්න තමයි ඇදුම් දෙන්නේ පපුව රෑං රෑං ගානවා - තව කී දොහක් මං ජීවත් වෙයිද දන්නේ නැහැ. ''

''පිස්සුද අම්මේ දැන් වකුගඩු ලෙඩේ දොස්තරවරුන්ට ඒ තරම් දෙයක් නොවෙයි. හොඳ වුණ අය කොච්චර ඉන්නවාද? බලන්න අම්මාට ළඟදීම ගෙදර යන්න පුළුවන්.''

''වකුගඩු ලෙඩේ ? ඔහෙ පලයං ඒ පාර තව එකක්ද? දොස්තර මහත්වරු කිව්වේ පෙනහැල්ලේ පිළිකාවක් කියල - උඹ කියනවා වකුගඩු කියල - එතකොට මං ලෙඩ වාට්ටුවක්ද බං - ඒ මදිවට උඹ එක වෙලාවක අත්තම්මා කියනවා. ආයි අම්මා කියනවා - මං හිතන්නේ උඹ මේ දොඩවන්නේ උඹට වැඩට යන්න හදිසි ඇති. පලයං පලයං ඒවත් කෙරෙන්න එපායෑ.''

වහා වේලාව බැලූ සඳලේඛා යාමට සූදානම්ව අත් බෑගයට අතට ගත්තාය.

''අනේ පොඩ්ඩි යන්ට ඉස්සර වෙලා ඩිංගිත්තක් මගෙ කොණ්ඩේ අවුල් ටික කඩල දිපංකො - මට මේවා පිරාගන්න අත් උස්සන්න බැහැ - පපුව රිදෙනවා.''

ඇගේ කෙස් ටික පීරූ සඳලේඛා පහසුම ක්‍රමය වන කොණ්ඩය පසුපසට පීරා රෙදි පටියකින් ගැට ගැසුවේ කාල වේලාව ගැන සිතිමිනි. ඉන්පසු ඇඳෙන් ඈත්ව යලි මව දෙස බැලූ ඇය සිනාසුණාය.

"උඹ විච්චූරණයක් දැම්මා නේද කොණ්ඩෙට ? දැං මං ළමිස්සියක් වගේ".
සඳලේඛා ඇඳෙන් ඉවත්වීමට හැරෙන විට මව සඳලේඛාගේ බාහුව අල්ලා ගත්තාය. ටිකෙන් ටික ඇය ඇඳෙන් ඈත්වත්ම එය වැලමිට දක්වාත් අවසානයේ ඇඟිලි දක්වාත් ඇදී ගිය අතර පසුව මුදා හරියාය.

පැය කීපයකට සිට වර්ධනය වන ශාරීරික අපහසුවක් දැනුණ සඳලේඛා වාට්ටුව කෙළවර වූ වැසිකිළිය වෙත ගියේ කඩිනම් ගමනකි. හාර්පික් ගඳින් පිරී තිබුන එහි දොරකඩ අබියස රෝගීන් කීප දෙනෙක් රැඳී සිටිනු දුටු ඇය ආපසු හැරී යාමට සිතුණාය.

''බැහැ කීයට හරි වොෂ් රූම් යන්නම ඕනෑ - සර් ටියුට් එක බලන්න පරක්කු වුනොත් මේක තද කරගෙන කොච්චර වෙලා ඉන්න වෙයිද? ''

වැසිකිළියෙන් පිටතට ඒමට ඇය සිතුවාට වඩා කාලයක් ගතවිය. ''ආහ් විනාඩි විස්සක් විතර ගතවුණා ඒකට''

අධිවේගී ගමනකින් ඇය වාට්ටුවෙන් පිටතට පැමිණියා පමණි.

''ආ මේ ඉන්නේ ඔයා කොහෙද ගියේ - අපි හැමතැනම හෙව්වා - හෙදිය ඇයගේ අතින් අල්ලා ගත්තාය.''

''ඇයි මිස්''

''එන්නකෝ'' ඇය සඳලේඛා කැඳවාගෙන රෝගී මවගේ ඇඳ වෙත ගියාය. සිරුර ඇතිරිල්ලකින් වසා තිබුණි. රෝහලේ සේවකයකු ස්ක්‍රීනයකින් ඇඳ ආවරණය කරනු ඇය දුටුවාය.

''මං ඔයා මුණ ගැහෙන්න කිව්වේ සුමනාවතී ගෙදර එක්ක යන්න කියන්න. ඒත් දැං කියන්න වෙන්නේ වෙන පණිවිඩයක්''

''බලන්නකෝ'' හෙදිය ඉවත් කළ ඇතිරිල්ල තුළින් සඳලේඛා දුටුවේ රෝගීයාගේ අප්‍රාණික සිරුරයි. එහි මුහුණේ වූ මන්දස්මිතිය සඳලේඛා හොඳාකාර දැක්කාය.''

''ඔයා ගිය ගමන්ම වගේ නැතිවුණේ. අපිට ඇහුණා ලොකු හුස්මක් - ඒකයි බැලුවේ ඔයා ආවට පස්සේ මුණේ හිනාවක් නම් තිබුණා වෙනදා නැති විදිහට'' ඔයාට දැං තියෙනවා වැඩක් - මේ

පණිවිඩය ගෙදරට දනුම් දෙන්න ඕනෑ, කෝ දවස් කීපයක් කවුරුත් ආවේ නැහැනේ ඔයාගෙ ගෙදරින් ''

'' මට බැරි වෙයි මිස් '' වාට්ටුවෙන් පිටත බලා ... සඳලේඛා මිමිණුවාය.

''බැහැ ඇයි ඒ?''

''මං මෙයා අඳුනන්නේ නැහැ මිස්''

''මොනවා මේ ඔයාගේ අත්තම්මා නොවෙයිද - එහෙනං මෙච්චර වෙලා කථා කර කර හිටියේ?''

''ගොඩාක් ...... ගොඩාක් දෙවල්, කාගේ හරි අම්මෙක්නේ අයැම් සොරි මිස් මට ඉක්මනට යන්න ඕනෑ - මං යන්නං''

වාට්ටුවේ ගේට්ටුව ළඟට ආ සඳලේඛා ආපසු හැරී බැලුවාය.

''උඹ කවනවා නම් මට ගල් වුණත් ගිලින්න පුළුවන් පොඩ්ඩියේ '' ඒ රෝගියාගේ අවසන් වදන් විය හැක. මෘත ශරීරයේ මුවග වූ මන්දස්මිතියෙන් ප්‍රකාශ වූයේ තෘප්තියක්ද ආත්ම අනුකම්පාවක්ද යන්න තේරුම් ගැනීම උගහට විය.

ත්‍රී වීලයෙන් මඳ දුරගිය ගිය ඇය වෙලාව බැලුවාය. වෙලාව අට පසුව ඇත. ''හරියට අටට කලින්'' මහාචාර්ය වරයාගේ අවසන් විධානය ඇයට මතක් විය.

''අයියේ මං නැග්ග බස් හෝල්ට් එකටම ආපහු ගිහින් දාන්න''

ඇය බෑගයට අත දමා නිබන්ධනය එළියට ගත්තාය.

''සැබෑ මිනිස් සබඳතාවන්ගේ ගාමක බලවේගය අන්‍යොන්‍ය ආදරයයි. ''

නිබන්ධන මාතෘකාව තම කඳුළු අතරින් බොඳවී යනු ඇට දනුණි.

## කෙටි කතා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

**කුසලතා** ස්ථානය



රංජිත් මල්ලියාවඩු
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
හික්කඩුව

### කටු ඉඹුල

දවල් වරුව හොඳට ම පෑව්ව. වලාකුළුත් අඩු පැහැදිලි අහසක් තිබුණෙ. ඒත් දවාලෙන් පස්සෙ මෙන්න හිටි අඩියෙ ම හෙණ ගෙඩියක් පාත් වුණා. දරුවො හිටියෙ යුද්දෙ ආවර්ජනය කරන "සංහිඳියාව" වැඩසටහන නරඹමින්. වැහි බීරුම පරිසරය ම වෙලා ගන්න වැඩි වේලාවක් ගියේ නැහැ. පිට පිට අකුණු දෙකතුනක් ම පිපිරුව. නිර්මලා දුවල ගිහින් රූපවාහිනිය නිවා දැම්ම. දරුවන්ගෙ සංහිඳියාව නැරඹිල්ල එතැනින් ම නතර වුණා. ඒ අව් අස්සෙයි නිර්මලාට මේ දුරකථන ඇමතුම ලැබුණෙ.

මීට කලිනුත් නිර්මලාට දවස් දෙකතුනක් ම මේ විදියට ඇමතුම් ආව. සමාන ඇමතුම්. පිරිමියකුගෙන්.

ලෙෆ්ටිනන්ට් වීරරත්න ගෙදර ඉන්නව ද?

කවුරු ද කතා කරන්නෙ?

නුහුරු කටහඬ කාගෙ ද කියල අඳුනා ගන්න අසීරු වුණ නිසා නිර්මලා පෙරලා ඇහුව. මම ලෙෆ්ටිනන්ට්ගෙ යාළුවෙක්.

මහත්තයගෙ ළඟ ම යාළුවන්ගෙ කටහඬවල් නිර්මලාට ඒ තරම් ම නුහුරු නැහැ. ඒත් මේ ආගන්තුක කටහඬක්...?

ලෙෆ්ටිනන්ට් නිවාඩු ආව නිසා ගෙදර ඇති කියල හිතුවෙ? තව ම ගෙදර ආවෙ නැද්ද? කෑම්ප් එකෙන් ආවෙ නම් මහ රෑ පාන්දරනෙ. ම්...ම්...එහෙම නම් කටුඉඹුල පැත්තෙ වත් ගියා ද? කෝල් එකට වත් ආන්සර් කරේ නැහැ.

රිසිවරය අල්ලා ගෙන ඉන්නත් බය හිතෙන තරම්. දුරකථන සංවාදය අස්සෙත් දොරකඩ විදුලි අකුණු කීපයක් ම පිපිරුව. අකුණු එළි දහර ජනෙල් කවුළුව අතරින් ගේ ඇතුළතටත් රිංගුව. ඊතල වැස්සක් වගේ. තිගැස්සුමට නිර්මලා අතින් රිසිවරය අතහැරෙන්නත් ගියා. ඒත් එක්ක ම ඇමතුම ආ පැත්තෙන් දුරකථනය නිහඬ වුණා. නිර්මලා දුරකථනය මත රිසිවරය තිබ්බ නො වෙයි. තියවුණා.

අද දුරකථන පණිවිඩේ කලින් දවස් දෙකක ආපු ඇමතුම්වල ම දිගුවක්. ඒක ආවෙත් ලෑන්ඩ් ෆෝන් එකට. ෆෝන් එක අලුත් පන්නෙ එකක් වුණා නම්..., අඩු ගානෙ ඇමතුම දුන්නු පුද්ගලයගෙ අංකෙ වත් දැන ගන්න තිබුණ. ඇත්ත නැත්ත පස්සෙ හරි දැන ගන්න. කොහොම වුණත් ඇමතුම නිර්මලාට අරන් ආවෙ ලොකු චකිතයක්. ඒ නිසා ඈ ආරංචිය ඔස්සෙ දිග කල්පනාවකට වැටුණ.

වීරරත්න එමින් ගමන් මහගෙදරට ගොඩ වැදිල, අම්මගෙ දුක සැප බලල එන එක ඇත්ත. එහේ ගියා කියල අමුතු පරක්කුවක් වෙන්නෙත් නැහැ. නිර්මලාට කිව්වෙ අද හෙට ගෙදර ඇවිත් යන්න පුළුවන් වෙයි කියල. එහෙම නම් ඇයි තාම නැත්තෙ? මහ පාන්දර එන්න පිටත් වුණා නම්, දැන් ගෙදර එන්න හොඳට ම කල් ඇති. අම්ම බලන්න ගිහින් මහගෙදර නතර වෙනව නම්, ඒ ගැන නිර්මලාට නො කියා ඉන්නෙත් නැහැ. පොඩිවුන් බලන්න ඉස්පාසුවක් නෑ කිය - කිය, පුළුවන් තරම් ඉක්මනින් ගෙදර දුව ගෙන එන මනුස්සය.

යුද්දෙ තදින් ම තිබුණු කාලෙ නිර්මලා වගේ ම පවුලෙ එක මිනිහෙක් හරි යුද්දෙට ගිහිපු හැම ගෙදරක ම මිනිස්සු හිටියෙ දෙගිඩියාවෙ. බිරන්තට්ටු වෙලා. මීළඟට එන ආරංචිය මොකක් ද? තමන්ගෙ නෑයා, හිතවතා ඇත්තට ම ජීවතුන් අතර ඉන්නව ද? නැද්ද? මේව ගැන හරිහමන් ආරංචි මාත්‍රයක් වත් නැතිව

සමහර මළමිනී ගෙවල්වලට ආවෙ පෙට්ටි සීල් තියල. ඇතුළෙ තිබුණෙ තමන්ගෙ ම ඥාතියගෙ මළ සිරුර ද, එහෙමත් නැති නම් දේහ බරට සරිලන වෙනත් දෙයක් ද කියල බලන්න පුළුවන් විනිවිදින ඇහැක් තිබුණත්, එහෙම බලන්නවත් අවසරයක්, ඉඩ අවකාශයක් ලැබුණෙ නැහැ මිනිස්සුන්ට. එක අන්තරායක් අත් විඳල හුස්මක් - කටක් ගන්න කලියෙන් ඔන්න තව එකක්... තවත් එකක්... ත්‍රස්තයො ඕකට කතාවකුත් හදා ගෙන තිබුණ. මේ රටේ මිනිස්සුන්ට කොයි දේත් මතක තියෙන්නෙ හත් දවසයි කියල. ඒව යුද්දෙ කාලෙ කතා ගාණට දමල එක පාර අහක දමන්නත් පුළුවන් කමක් නැහැ. එහෙමයි කියල බාර ගන්නත් පුළුවන් කමක් නැහැ.

නිර්මලාගෙ හිත ඇතුළෙ නම් ඒ කාලෙ මේ වගේ දේවල්වලට ගොඩ වදින්න ඉඩක් නොතිබුණු තරම්. එපමණ දුක් - පීඩා, සැක - සංකා ඒ හිත අරක් ගෙන තිබුණෙ. පිරිල - ඉතිරිල තිබුණෙ. කන්තෝරු ඇරෙන වෙලාවට සෙනඟ පිරුණු කෝච්චියක්, බස් එකක් වගේ.

මේ යුද්දෙත් කාලයක් ම තිබුණෙ තරාදියක් විදියට. එක පැත්තකට ප්‍රහාරයක් එල්ල වුණාම ඒකට සරිලන්න අනෙක් පැත්තටත් ප්‍රහාරයක් එල්ල වෙනව. මේ පැත්තෙන් මැරුම් කෑවම ඒ පැත්තෙනුත් මරා දානව. දවසකට - දෙකකට, සතියකට - හමාරකට තරාදිය සමබර වුණා වගේ දැනෙනව. ඔන්න එතකොට හිටි අඩියෙ ම ආයෙත් ප්‍රාහාරයක් එල්ල කරල පලා ගියා කියනව. මරා ගෙන මැරෙන උත්සාහයක් ව්‍යර්ථ කරා කියනව. නිරායුධ මිනිස්සු ඉන්න තැනක් ඉලක්ක කර ගෙන බෝම්බයක් පිපිරුව කියනව. ඒත් එක්ක ම තරාදිය සමබර කරන්න ආයෙත් සටන පටන් ගන්නව. හරියට කාඩ් සෙල්ලම වගේ.

නිර්මලාගෙ හිත කටුඉඹුලට ඇද ගෙන ගිය නාඳුණන කටහඬට එරෙහිව තවත් කවුරු හරි අතීතයටත් ඇද ගෙන යනව. මතක් වෙන්නෙ ම හුණුවටයෙ කතාව. මේ ඇදිල්ල දැන් ම නැවතුණේ නැති නම් හිත දෙකට ඉරිල යන්නත් ඉඩ තියෙනව. පපුව ඉතිරි වුණත් එතකොට පලක් තියේයැ? මිනිස්සුන්ට

හිතකුයි, පපුවකුයි දෙකක් ම දෙන්න ඇත්තෙ දෙක ම වුවමනා නිසානෙ. ලෝකෙ මැවුම්කාරය සත්තුන්ට නො දීපු දෙයක් මිනිස්සුන්ට දෙන්න ඇත්තෙත් මොකක් ම හරි හේතුවකට වෙන්න ඇතිනෙ. එහෙව් එකේ ඇයි මගේ හිත මේ විදියට ඉරන්න හදන්නෙ? අනේ දෙපැත්තෙන් ම අත හරින්න. නිර්මලා බැගෑපත් වුණා හොඳට ම. දරුවන්ට වත් නො දැනෙන්න.

විදුලි කොටල, අකුණු ගහල පටන් ගත්තු වැස්ස හද්ද අනෝරාවක් වෙන්න වැඩි වෙලාවක් ගියේ නැහැ. "සංහිඳියාව" වැඩසටහන බලන්න පොඩිවුන් තුන් දෙනා හැමදාම පොරේ. උන්ගෙ ශරීරවල දුවන්නෙත් තාත්තගෙ ම ලේ නිසා ද මන්ද? දූගෙයි, පුතාල දෙන්නගෙයි වයසෙ ළමයි "සංහිඳියාව" ඔස්සෙ රූපවාහිනියෙන් රැට රැට වීරරත්නගෙ ගෙදරටත් ආව. යුද්දෙන් පස්සෙ. දරුවො තුන්දෙනා උන් එක්ක හිනා වුණා. සෙල්ලම් කළා. හැබැයි හැබෑ ලෝකෙ නම් නො වෙයි. පුංචි හිත්වලින්. ඒ අතරෙ අඬපු දවසුත් තිබුණ. එහෙම දවසක නිර්මලා දූගෙ කඳුළු පිස දැමුවෙ ඇගේ කඳුළුවලින්. හිතක් පපුවක් නැති වුණාම ඇස් තිබුණත් මොකට ද? නිර්මලාට සැකයක් ඇති වුණා. ඈ මොහොතකට දූයි, පොඩි පුතයි තුරුල්ලට අරගෙන පපුවට අත තියල බැලුව. මේ හද්ද අනෝරාව අස්සෙත් උන්ගෙ පපුවල උණුසුම හිම මිදෙන්න වගේ කැටි ගැහෙමින් තිබුණු නිර්මලාගෙ ආත්මයට ඒ උණුසුම හොඳට ම දැනුණ.

යුද්දෙ බරපතළෙට ඇවිළිච්ච දවස්වල වීරරත්නම කතා කරනකම් බලා හිටිය මිසක්, නිර්මලා නොවෙයි රත්නෙට දුරකථන ඇමතුමක් වත් දුන්නෙ. කරදර කරන්න. දරුවන්ගෙ එදිනෙදා ඕනෑ එපාකම්, අවශ්‍යතා සියල්ලක් ම ඈ ඔහුට නො දන්වා ම විසඳා ගන්න උත්සාහ කළා. මරු කටක ඉන්න මනුස්සය ගෙදර සංග්‍රාම බරින් නිදහස් කිරීමයි බිරියකගෙ යුතුකම. එහෙමයි නිර්මලාගෙ අම්ම - වීරරත්නගෙ නැන්දම්ම - දෝණියන්දැට උගන්වල තිබුණෙ. බෑනණ්ඩියට නැන්දම්මගෙ තිබුණු ආදරේ - මාතෘ ප්‍රේමය - ආඩම්බරයක් කර ගත්ත මිසක්, හිත රිදවීමක් කර ගත්තෙ නැහැ නිර්මලා කොයියම් ම දවසක වත්. ඒත් වැරදිලාවත් රිසිවරය ඉස්සුවෙ අම්ම නම්...? වීරරත්නගෙ යාළුව මේ ආරංචිය තියන්නෙ අම්මගෙ කනේ.

මිසයිලයක් වගේ මතු වුණු ඒ සිතුවිල්ල නිර්මලාගෙ සැරිසරන සිතුවිලි යානයෙ බඳටමයි වැදුණෙ. අම්ම දැන ගත්තත්, කාත් කවුරු වත් එක්ක ඒ ගැන වචන මාත්‍රයක් වත් එළියට දාන එකක් නැහැ. ඒ වුණාට මේක දැන ගත්තොත් වීරරත්න ගැන අම්මගෙ හිතේ තියෙන හැඟීම් සමුදායට මොනව වේවි ද? දෙයියනේ... දෙකෙන් එකක් වෙනකම් මේ කතන්දරේ අබිරහසක් ම වෙන්න ඕන. කාලයේ වැලි තලාව මට අනුකම්පා කරාවි. මේ කිරි සප්පයො තුන් දෙනාගෙ මූණු බලල... වැඩි ඈතක නොවුණට කටුඉඹුලට යන්න බස් දෙකක යන්න වෙනව. රට කොච්චර දියුණු වුණත් කටුඉඹුල තවම පරණ කටුඉඹුල ම තමයි.

දුවේ ගෑනු ළමයෙක් වුණාම යන - එන ගමන් - බිමන්, වේලාව - අවේලාව ගැන පවා හිතන්න වෙනව. මඟතොට මිනිස්සු ඇහැ ගහගෙන ඉන්නෙ... අපි මොනව ද කරන්නෙ කියන්නෙ කියල බලන්න. ඒ අතින් තාත්තගෙ ගම් පළාත වෙච්චි මේ පැත්තෙ කවුරුවත් හෙම නෙවෙයි අද වෙනකම් අපට 'උඹ නො දකින්' කියල තියෙන්නෙ. තාත්තත් ගෙදර නැතිව මං දවස් ගණන්, සති ගණන් ඉඳල තියෙනව තනියම. උඹලත් බලා කියා ගෙන. රෑ පානෙ ගමන් - බිමන් යන්න වෙච්චි දවසුත් ඒ අතරෙ තිබ්බ. වෙද ගෙදරට උඹල උස්සන් දුවන්න, ගුරුන්නාන්සෙ මාම එක්කන් එන්න මං කී දවසක් නම් ගිහිල්ල තියෙනව ද කට්ට තනියම. මහ රෑ පානෙත්. හැබැයි අවේලාවෙ යන්න තියා පය ගහන්න බැරි තැනුත් තියෙනව රටේ - තොටේ. දූ අහල තියෙනවනෙ. ඔය කටුඉඹුල කියන්නෙ කවුරු, කවර දා දාපු නමක් ද මන්ද? තාත්ත මට වත් තනියම යන්න දීල නෑ ඒ පැත්තට. කීමටත් කියන්නෙ, ලම්ස්සියෙක් තියා ඉලන්දාරියෙක් වත් ඒ පැත්තෙ යවන්න එපා කියල. හැමදාම ගෝරි - බෝරි. සද්ද - බද්ද. එහේ ගෑනු පිරිමින්ට දෙවෙනි නැතිලු. එවුන් බුදුහාමුදුරුවන්ගෙ කාලෙ හිටපු ජනපද කල්‍යාණියො වගේ කියල තමයි ගමේ මිනිස්සු එකට එකතු වුණාම ආරලු, බූරලුත් එක්ක කියන්නෙ.

අම්ම දැනට අවුරුදු කීපයකට උඩදි හඳුන්වා දීපු ඒ කටුඉඹුල අද හොල්මනක්. දෙපැත්තට ඇදල ඉරා දාන්න සැරසෙන නිර්මලාගෙ හිතේ හොල්මන් කරන. නිර්මලාට මුල් ම දුරකථන ඇමතුම ආවෙ යුද්දෙ ඉවර වෙලා වැඩි දවසක් යන්න ඉස්සර. ඒ උණුසුම පිට ම. යුද්දෙකින් බැට කන පිරිසක් වගේ ම, ජීවත් වෙන පිරිසකුත් ඉන්නව හැම කාලෙම. යුද්දෙට කෙලින් ම මැදිහත් වෙන දෙපාර්ශවයෙ නො වෙයි, තුන් වෙනි පාර්ශවයක.

උෟරො කැකුණ තලන කොට ජය මඟුල් කන්නෙ මේ තුන්වෙනි පාර්ශ්වයෙ හබන් කුකුළො. ඒරොප්පෙන් අහසෙන්, මූදෙන් ආවෙ නැති අපේ රටේ කරිජ්ජ පාගපු ඇත්තන්ගෙ, අම්ම කියපු මේ කතා තමයි එදා නිර්මලාගෙ තනි නො තනියට ළඟ හිටියෙ. ආරක්ෂක සේනාංකයක් වගේ.

යුද්දෙන් පස්සෙ, යුද්දෙ නිසා ම ඇරපු කඩ සාප්පු සමහරක් දැන් වැහිල ගිහින්. ඒව වැහිල ගියා වුණාට ඒවයෙ සෙවණැලි, අත්තිවාරම් මහ පොළොව උඩ තවමත් තියෙනව. කොයියම් ම දවසක හරි ආයෙත් ඔළුව උස්සන නැකත එනකම් බලා ගෙන. හැබැයි නැකත උදා වෙනතුරු ඒව නිකම් ම ඔහේ උඩ බලා ගෙන හිඳියි කියල හිතන එක නම්, ඒ තරම් හොඳ නුවණක්කාරකමක් වෙන එකක් නැහැ මේ යන විදියට. එහෙම ඉඳීමත් ඒක දහසක් දෙනාගෙ ජීවිත පූජාවන්ට කරන නිගරුවක්. නිර්මලා එදා දුරකථනය මත රිසිවරය තිබ්බ සැහැල්ලුවෙන් ම හෝඩුවාව සුළඟට අත හැරල දැම්මෙ ඒ අධිෂ්ඨානයෙන්. අම්ම උගන්වපු පති ප්‍රේමයෙන්. හබන් කුකුළන්ට ජය මඟුල් ගන්න ඉඩ නොදී.

ඇරත්, වීරරත්නගෙ ලේ, මස්, ඇට, නහරවල කැවිච්ච කිති කවන සුවඳ මිසක් වෙන සුවඳක් ඇට දැනුණෙ නැහැ, ඒ ආරංචිය ලැබුණට පස්සෙත්, ඔහු ගෙදර ආපු එක ම දවසක වත්.

වැහි අනෝරාව අඩුවක් වෙන පාටක් ඇත්තෙ ම නැහැ. නිර්මලා වැඩ ඇරිල ගෙදර එනකොට අත්තම්ම මුණුබුරන්ටයි, මිණිබිරියටයි පිට්ටු හදන්න සූදානම් කරල. රෑ කෑමට. ඇන්නෑවයි කිව්වලු. අත්තම්මගෙ කෑම - බීම කිව්වම උන්ගෙ ඉස්වල මල් පිපිල. නිර්මලාට ඒ ගැන අමුතු වෙහෙසක් ගන්න නැති තරම්. දරුවන්ගෙ බඩ - කට පිරිල. පුංචි හිත් තුනත් පිරිල. එතකොට අත්තම්මගෙ හිත පිරිල විතරක් නතර වෙන්නෙ නැහැ. උතුරල දෝරෙ ගලනව. උන්දැගෙ රුධිර පීඩනෙත් සාමාන්‍ය ගණනට තියෙනව කියල තමයි, කලාතුරකින් හරි දොස්තර මහත්තය ළඟට ගිහින් ආපු දවසට හිනා වෙවී කියන්නෙ. මේ හුරතලය නිසා.

අහස කළ අතවරය දරුවන්ට ඒ හැටි දැනුණෙ නැති තරම්. " සංහිඳියාවෙ" රසය වෙනුවට දරුවො අත්තම්මගෙ ආදරය විඳල ටික වේලාවකින් නින්දට වැටුණ. වැස්සෙ තද වැඩිකමට කවුළුවල බීරලු අතරින් හිරිකඩ ගෙට අත දානව. වැස්ස තද වුණාට පස්සෙ අකුණු සැර තරමක් අඩු වුණා. පොල් අත්තක් හරි, සමාන වෙන දෙයක් හරි හඬ දීගෙන ඒ අතරෙ වහල උඩට වැටුණ. හරියට දරුවන් නිදන කාමරයට උඩින් වගෙයි සද්දෙ ඇහුණෙ. සෙවිලි තහඩු වහල නිසා බරපතළ දෙයක් වුණේ නැහැ. උළු වහළක් නම් මහ ජරමරයක් වෙන්නෙ.

අම්මට නින්ද ගියාම සැහැල්ලුවෙ නිදා ගන්නව. අනම් - මනම් හීන දකින්නෙ නැතිව. සංසාර ඔලොගුවෙ ඒ හැටි බරක් නැති ජීවිතයක්. නිර්මලා ප්‍රාර්ථනා කළෙත් ඒ වගේ ජීවිතයක්. අතිනත ගත්තු දවසෙ ඉඳල නිර්මලාගෙ ඒ ප්‍රාර්ථනාවට වීරරත්න ආශීර්වාදයක් වෙලයි හිටියෙ.

ගෙදරට එන පටුමඟ දැන් වැහි වතුරෙන් යට වෙලා ඇති...? සාමාන්‍ය වැස්සකට ඔරොත්තු දුන්නට මෑතක ඉඳල තද වැස්සට පාර යට වෙනව. තාප්ප බැඳල. ඉඩම් ගොඩ කරල. වැහි වතුර නිදහසේ බැහැල ගිය පරවේණි මංපෙත් ඇහිරිල. අහසෙන් වැටෙන වතුර පොළොවෙන් නැතිව කොහෙන් කියල බැහැල යන්න ද? මිනිස්සු සොබා දහමත් එක්ක තියෙන ගනුදෙනුවෙදිත්

පොට වරද්ද ගෙන. වැස්ස නැති වුණාමත් බණිනව. වැස්ස වැඩි වුණාමත් බණිනව. හැමදාම අහස හැසිරෙන්නත් ඕන මිනිස්සු හිතන - පතන විදියට. හැබැයි වැහි වතුර ටිකට මනාප මංපෙත් ඔස්සෙ ගලා යන්න ඉඩ දෙන්න සූදානමක් නැහැ. වාසිය, ලාබය තිබිය යුත්තෙ මිනිස්සුන්ට ම විතරයි.

කිසි ම හේතුවක් නැතිව වැරැදි පාරක ගිහින් එන මිනිහෙකුට මඟ පියවිලි අතුරල තියන්න වුවමනා නැහැ. එයාගෙ ලේවලින් හැදිච්ච එක දරුවෙක් ගැන හරි කැක්කුමක් තියෙනව නම්, එළි වෙන ජාමෙ පිටත් වෙච්ච මනුස්සයට ගෙදර එන්න වෙලාව හොඳට ම ඇතිනෙ. ඔන්න ඔහේ ගලනකන් වැහැපුදෙන්.

එහෙම හිතුණට ඒ සිතුවිල්ලට නිර්මලාගෙම හිත රිදුණ. ඈ ඒ ක්ෂණයෙන්ම පපුවට අත තියල බැලුව. පපුව ගල් වෙන්න හදනව ද කියල. ඈ ඇගේ ම අතින් පපුව අල්ලපු තදට පියයුරුවලටත් රිදුණ.

ජීවිතයත් වැහි වතුරක්. අහසෙන් වැටෙන්නෙ නොයිඳුල් වැස්ස. රොන් මඩ, දූවිලි කුණු මේ කිසිවක් නැහැ. ඒත් පොළොවට වැටිල මොහොතකින් ඒ වැහි වතුර මඩ වතුරක් වෙනව. මඩ වතුර ඇළකට, දොළකට වැටුණත් ඇළ, දොළත් බොර වෙනව.

මහ රෑ එළඹිලත් නැවතුමක් නැතිව ඇද හැලෙමින් ගලා යන්නෙ ආදර නදියක් බොර කරන මඩ වතුරක්. කොහොම වුණත් අම්මටත් නින්ද ගිහිපු වෙලාවෙ දොර ඇරල පටුමඟ දිහා බලන්න තරම් එඩිතරකමක් තිබුණෙ නැහැ නිර්මලාට. ඈ ඒ සිතුවිල්ලත් ගලා යන වැහි වතුරටම එකතු වෙලා ගලා යද්දෙන් කියල හිත හදා ගන්න උත්සාහ කරමින් බිත්ති ඔරලෝසුව දිහා බැලුව. මිනිත්තු කටුව එකම ලක්ෂ්‍යයක් මත ගැස්සෙනව. ගොඩට දමපු හැටියෙ මාළු කුරියෙක් වගේ. ගමනක් නැහැ. බැටරියෙ ආයු කාලෙ ඉවර වෙලා ද? ඔරලෝසුවෙ ආයු කාලෙ ඉවර වෙලා ද? මඟුල් දවසෙ යාළුවෙක් තිළිණ කරපු ඔරලෝසුව. වයස අවුරුදු දහයකටත් වැඩියි.

අම්මලගෙ, තාත්තලාගෙ කාලෙ ඔරලෝසු තාමත් හොඳට ම වැඩ. මහ ගෙදර ඔරලෝසුව එහෙම එකක්. අක්ක කැමැති නම් ගෙනියන්න කියල මල්ලි බල කරල කියද්දිත්, නිර්මලාගෙ හිත එදා ඒකටවත් ඉඩ දුන්නෙ නැහැ. ඒක වටින්නෙ මහ ගෙදරට. පරම්පරාවෙ උරුමක්කාරයා වන මල්ලිට. වීරරත්න ඒ වෙලාවෙ කිව්වෙ යමක් තියෙන්න ඕන ඊට සුදුසු ම තැන කියල. ඒව එයාගෙ මිනුම් දඬු. ඒ ආකල්පය එයා අද දවසටත් තියා ගත්ත නම් කොයි තරම් වටිනව ද? කල්පනාවට ගන්නව නම් හොඳයි, එයා මේ රාත්‍රියෙ ඉන්නෙ සිටිය යුතු ම තැන ද කියල? ඒ මදිවට මේ වැහි වරුසාවෙ. පපුව පාෂාණීභූත වෙලා තියෙද්දිත් ඒ එක්කම නිර්මලාට මතක් වුණේ ලූෂන් බුලත්සිංහල කපුගේටයි, මාලිනී බුලත්සිංහලටයි ලියල දීපු ගී පද රචනාව. නෙලුම් පතක රැඳි පිනි බින්දුව.

ජීවිතේ බොහොමයක් විඳුම් සොඳුරු මතකයන් බව ඇත්ත. ඒක එහෙම වුණත් ඒ සොඳුරු බව තීරණය කරන තීරකය වෙන්නෙ ආවර්ජනය කරන දවස... වේලාව. නිර්මලාගෙ පිනි බින්දුවට අද නෙලුම් පත අමතක වෙලා ඇති. සාංකාවෙන් හිරි වැටුණු ඒ මතකයන් එක්ක ඇය දූ සිඟිත්ති තුරුලු කර ගත්තෙ නැවතුමක් නැති ඒ ආවර්ජනයන් නවත්ත ගන්න. හයක් හතරක් නො දන්න මේ පුංචි ම පුංචි නෙලුම් පතටත් අනාගතයෙ එහෙම දවසක් උදා වේවි ද? එසේ නො වේවා

සාලෙ ඔරලෝසුවෙන් හරි වෙලාව දැන ගන්නවත් මොන ම උවමනාවක් වත් නැතිව, නිදි දෙව්දුවටත් ආරාධනය නොකරම, දූට තුරුලු වූ නිර්මලාට ඊළඟ මොහොතෙ ඒ ප්‍රාර්ථනයෙ රැඳෙන්නවත් ඉඩක් තිබ්බෙ නැහැ පරිසරය. ඉදිරිපස දොරත් වෙවුලුවා ගෙන හෙණ පතයක් පාත් වුණා ආයෙත්. එවර නම් ඈ හොඳට ම තිගැස්සුණා. මේ වැස්ස කාලයක් තිස්සෙ සැඟ වී වරින් වර, නැවත නැවතත් හමුදාවට අභියෝග කළ ත්‍රස්තවාදීන්ට දෙවෙනි නෑ. ගැලවෙන්න ඉඩක් දෙන්නෙ ම නෑ.

නිර්මලා...නිර්මලා...

දොරේ වෙවුලුම් කෑමයි, අකුණු හඬයි මැද්දෙ අපැහැදිලි කටහඬක් නිර්මලාට ඇහුණෙ ඒ අව් අස්සෙ. ඒත් එක්කම එක්වනම ඇගේ මතකයට රිංගුවෙ වනිගරත්නගෙ යාළුවගෙ දුරකථනයෙන් ඇහුණු කටහඬ. මේ රෑ දෙගොඩ හරි ජාමෙ මිනිහ ගෙදරත් හොයා ගෙන ඇවිල්ල ද? කතාවෙදි කිසි ම ඉඟියක් නො දුන්නට මොහොතකට ඈ නිරුත්තර වුණා. දැන් මොකද කරන්නෙ? අම්මගෙ කාමරේට ගිහින් ඇගේ නින්ද බිඳිනව ද? තමාටත් නින්ද ගිය ගාණට ඉන්නව ද? දෙගිඩියාව ඇගේ දෙපාවලටත් විලංගු දාපු විත්තිය තේරුණේ නයිටියත් හදා ගෙන කෝකටත් කියල ටිකක් හරි - බරි ගැහෙන්න හැදූ වෙලාවෙ.

එක අතකින් ගෙදර දුරකථනයක් නො තිබුණා නම් මේ වගේ ඇබැද්දිවලට මුහුණ දෙන්න වෙන්නෙ නැහැ. අද ඒකත් මාරාවක් වෙච්චි එකනෙ කරුමෙ ඒ අතරෙ පොඩි උන් සීතලේ තවත් ගුලි ගැහි උණුසුම හොයනව. උන්ට ඇහැ නෑරෙන එකමයි මේ වෙලාවෙ හැටියට ලොකු ම දේ.

නැති නම් අම්මගෙ අසරණකම පුංචි එවුනුත් දකීවි.

අවේලාවෙ අම්ම කුද්දවන්න නො සිතුවත්, වීරරත්න ගෙදර නැති දවසට මේ ගෙදර ලොකු ම රැකවරණය අම්ම. වෙලාවකට ඈ යකඩ ගැහැනියක්. සෑහෙන්න අසීරුවකින් වුණත් අම්මගෙ නිදන කාමරයට යන්න ඒ විලංගුවෙන් දෙපා මුදා ගන්න ගමන් නිර්මලා සිහිපත් කළා.

නිර්මලා... නිර්මලා...

දොර අරින්න...

මම රත්නෙ.

ලේ වතුරක් වෙන්න නිමේෂයක් ඇති. ඒත් වතුරක් ලේවලට හරවන්න නිමේෂයකට පුළුවන්කමක් නැහැ. දැන් නම් විශ්වාසයි. කටහඬ වීරරත්නගෙම තමයි. වැස්සෙ තදකමට කාමරයට පැහැදිලි නැති වුණාට කාමරෙන් එළියට ආවම හොඳටම පැහැදිලියි. ආලින්දෙ විදුලි පහන දල්වනව ද...? නැද්ද...? ඈ

විදුලි පහනෙ බොත්තමට අත තියා ගෙන දෙවරක් ම කල්පනා කරල අවසානයෙ කෝකටත් කියල බොත්තම එබුව. කළුවර කොන්ක්‍රීට් වෙච්චි හීතල අන්ධකාරෙක වෙඬරු වුණත් කොහොම ද එක පාරට උණු වෙන්නෙ.

මට සමා වෙන්න නිර්මලා..., මෙච්චර රෑ වුණාට... දවල් සුමේ කරල ඔයාට නින්ද ගිහින් තියෙන්න ඇත්තෙ...?

මඳක් ප්‍රමාදව නමුත්, විවර වුණු දොරෙන් ඇතුළු වුණු වීරරත්න හමුදා නිලයෙන් මිදී වහා සහකරුවාගෙ භූමිකාවට මාරු වෙමින් කිව්ව. වීරරත්නට එහෙම කරන්න පුළුවන් වුණාට නිර්මලාට ඕනෑ වුණේ අම්මි කියා දීපු පතිනියගෙ චරිතයෙන් මිදිල, කවර දාක වත් නැති විදියට, ගෙදරට ආපු මනුස්සයගෙ මුහුණට කඩා පනින්න. නපුරු බැල්ලියක් වෙන්න. ඒත් වීරරත්නගෙ මූණ දැකපු හැටියෙ, නාට්‍යයෙ පෙළ අමතක වෙච්චි නිළියකට වගේ ඇයට ඒ රංගනය අසීරු වුණා.

නිර්මලාට මතක ද පුදුකුඩුඉරිප්පු මහ සටනෙදි මාත් එක්ක එකට ම හිටිය මාතලේ හාදය, ජයවීර බණ්ඩාර...? අපි එකට ඉදිරි වළල්ලෙ සටන් මෙහෙයවද්දි එයාගෙ ඉස්සරහට ම එල්ල වුණු මෝටාර් ප්‍රාහාරයකට ලක් වෙලා කොන්ද පණ නැති වුණේ...? එයා කාලයක්ම හිටියෙ රණවිරු සෙවණෙ. එයාගෙ නෝන - චේතනා - රණවිරු සෙවණට ගිහින් - ගිහින්, අඬල - දොඩල බණ්ඩාර ගෙදර එක්ක ගෙන ආව. ඒ නම් මහ පුදුම චරිතයක්. ජයවීර බණ්ඩාර ගොඩ ගන්න ඇවිද්දෙ නැති තැනක් නැහැ. ඇවිදල, ඇවිදල කිසා ගෝතමී වගේ හිස් අතින් ආවෙත් නැහැ. පාරම්පරික වෙද මහත්තයෙක් හොයා ගත්තනෙ අනුරාධපුර පැත්තෙන්. පෙරියන්කුලම කියන හරියෙන්. එතුමා වෙද මහත්තයෙක් නෙවෙයි... ඉසිවරයෙක්. අන්න දවසෙ විසිහතර පැයේ ම මළමිනියක් වගේ හිටිය මනුස්සය දැන් ඇඳේ වාඩි වෙනව.

මාතලේ ගමන - බිමන ටිකක් දුෂ්කරය කියල කටුඉඹුලෙනෙ බණ්ඩාර ගේ හැඳුවෙත්. ඒ වෙලාවෙ සමහරු ඇහුව 'උඹ

කටුඉඹුලෙ බින්න බහින්න තියා ගත්තෙ ඔළුව හොඳ නැද්ද' කියල.

ටික දවසකින් පොඩිවුන් දැක්කෙ නැති සාංකාව හිතේ තද කර ගෙන ම මං එමින් ගමන් කටුඉඹුලෙ ගියා. යුද්දෙන් පස්සෙ බණ්ඩාර බලන්න ගිය තුන්වෙනි දවස අද. මේ තොරතුරු අහල ඔයා හැමදාමත් අඬන නිසා ඔයාට මේ ගැන කලින් කියන්න හිතුවෙ නැහැ. මම ගෙනිච්චෙත් පලතුරු ටිකක් විතරයි. වැඩි වෙලාවක් කතා කර - කර නොඉඳ මං බණ්ඩාරගෙම පරණ සරමකට මාරු වෙලා, බණ්ඩාර වඩා ගෙන වගේ උස්සන් ළිඳ ළඟට ගියා. වැල් පුටුවක වාඩි කරවල මගේ මේ අත් දෙකෙන් ම බණ්ඩාර නැව්ව. වැඩේ ඉවර වෙනකම් බණ්ඩාරගෙ පුංචි එකා නෙවෙයි ළිඳ ළඟින් හෙල්ලුණේ. මේ බලන්න නිර්මලා... මගේ අත් දෙකේ ම වෙනද නැති සුවඳක් තියෙනව වගේ මට දැනෙනව. මේ බලන්න.

එහෙම කියන ගමන් වීරරත්න සිය අත් දෙක නිර්මලා දෙසට දිගු කළේ, ඇගේ මුව මඬලේ සුපුරුදු පහස, සුපුරුදු විදියට, පළමුව දෑතින් විඳින්න බලා ගෙන. ඒ වුණාට ඒ දෑත එක පාරට ම එලෙසින්ම පිළිගන්න බැරිකමක වගේ නිර්මලා හිර වුණා. වීරරත්නටවත් ඉඩක් නො තබා ඈ කපා හෙළූ ගසක් වගේ ඔහුගෙ දෙපා මුල ඇද ගෙන වැටුණෙ ඒ මොහොතෙ. වැටිල හිතේ ගැවුණු කහට හේදිලා යන තුරු වීරරත්නගෙ දෙපා බදා ගෙන හොඳට ම ඇඬුව. තමා ගෙදර එන්න රෑ වෙච්චි දුක නිර්මලා කැමැති විදියට තුනී කර ගන්න ඉඩ දීල වීරරත්න ඇගේ මේ ඉරියවුව දිහා ටික වෙලාවක් බලා ගෙන හිටිය. ඒ තමන් ගෙදර එනතුරු ම ධාරානිපාතෙට ඇද හැලුණු වැස්ස හෙමින්, හෙමින් තුරල් වෙන හඬට කන් දීගෙන.

## කෙටි කතා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

**කුසලතා** ස්ථානය



නාලනී හෙට්ටිආරච්චි
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
කොටපොල

### විරසකය නිමා විය

" ලොකු අප්පච්චි මළා. අවසන් කටයුතු හෙට......"

සිසිල් මල්ලිගෙ හඬ, කවදාවත් අමතක නොවෙන තාලෙන් හදවත ඇතුළටම කිඳා බැස්සෙව්ව ඒ අසුබ ආරන්චිය, තර්කනීගෙ හදවත නතර කළා. මහා වේදනාවක් නොදැනුණත්, දරාගන්න බැරි කම්පාවක් තර්කනීගෙ සරුවාන්ගෙම අප්‍රාණික කළා. සිසිල් මල්ලිගෙ ලොකු අප්පච්චි.....තර්කනීගෙ අප්පච්චි අවුරුදු 77ක ජීවිතෙ මොනවද ලබා ගත්තෙ? සතුට හොයාගෙන මිරිගුවක් පස්සෙ දිව්ව අප්පච්චි නිවසට හෙවණ දෙන නුග රුකක් නොවී නිවස මතට ඇද හැලුණු ගල් වරුසවක් වුණේ ඇයිද කියල තර්කනීට හිතා ගන්න බැහැ. ඒ මහා ගල් වරුසාව අපූරු පවුලක විනශය ගෙන ආ හැටි හීනයක් වගෙ.

" මැඩම් "

සුසන්තගෙ හඬින් තර්කනී ගැස්සුණා.

"මැඩම් ප්‍රශ්නෙකවත්ද?

"අද මම කලින් යනව"

"දෙවෙනි මහත්තයට කියන්න"

සුපුරුදු හිනා මූණෙන් සුසන්ත අණ භාරගත්ත.

අප්පච්චී.... අප්පච්චී.... අප්පච්චී.... මෙතුවක් හදවතෙ මහා ලොකු තැනක නොහිටියත්, අද ඔහු හදවත පුරාම ඔහු බර අඩි තියමින් ගමන් කරනවා. දෑස් පියාගත් තර්කනී, අප්පච්චිට රිසි සේ හදවත පුරා සැරි සරන්නට ඉඩ දුන්නා. විමල් ප්‍රතාපසිංහ.... අප්පච්චිගේ ප්‍රතාපවත් දේහධාරී දේහයටම ගැළපෙන නම..." අම්මා සුදශනී

දුනුගොඩ... අහිංසක ඇස් දෙකක හිමිකාරිය... තර්කනීට අහිමි ඒ දෑසේ උරුමය රතු මල්ලි දේවින්දට.
පුංචි කාලෙ ඉඳලම දෙමව්පියන් අතර සමීප බවට වඩා දුර බවක් තමයි තර්කනී දැක්කේ. ඒකට හේතුව අවබෝධ වෙද්දී අම්ම අප්පච්චිගෙන් ,අප්පච්චි අම්මගෙන් ඈතින් ඈතට ගිහිල්ල. රජයේ කාර්යාලයක ලිපිකරුවෙකු වුණ අප්පච්චිට මහ වැටුපක් නොලැබුණත්, ලැබුණ වැටුප ගෙදර නඩත්තුවට මදි වෙන්න විදිහක් නැහැ. මොකද අම්මා අනවශ්‍යය වියදම් කරන කෙනෙක් නෙවෙයි. ගුප්ත හදවතක හිමිකාරයෙක් වුණ අප්පච්චි, සුරා සූදුවට ඇබ්බැහි වෙච්ච කෙනෙකුත් නෙවෙයි. ඒ වගේම අක්කර භාගයක මහ ගෙයි ඉඩම තර්කනීලට ඇති පමණට ගඩා ගෙඩි ලබා දුන්නා. "කිරියා" කලට වේලාවට කිරි ටික දුන්නා. ඒත් තර්කනීලගෙ ගෙදර නැතිබැරි කම් දෝරෙ ගලාගෙන ගියා. තුන්වේල කෑවත් අලුත් ඇඳුමක් පැලඳුමක, ගමන බිමනක, ගේ දොර අලුත්වැඩියාවක අයිතියක් නිවැසියන්ට ලබුණේ නැහැ.
කාලය ගෙවුණා. ශිෂ්‍යත්වේ පාස් වුණ තර්කනී බලෙන්ම වගේ ටවුමෙ ඉස්කොලෙට දාල නේවාසිකාගාරයේ නතර කළා. මල්ලි ගෙදර තනි වුණා. අම්ම සතියකට වතාවක් මල්ලි එක්කලා නේවාසිකාගාරයට ආවත් අප්පච්චි ආවෙම නැහැ. තර්කනී අප්පච්චිව දැක්කෙ ඉඳල හිටල ගෙදර ආවම. ඒ දවසටත් අප්පච්චි තර්කනීගෙන් ඇහුවේ ප්‍රශ්න තුනයි.
"හොස්ටල් එක හොඳයිද?"
"අඩුපාඩු තියනවද?"
"හොඳට පාඩම් වැඩ කරන්න."
ඒ ප්‍රශ්න සහ ප්‍රකාශන අතරතුරදී තර්කනී අප්පච්චිගෙ ඇස් දිහා බලන්න පුරුදු වෙලා හිටිය. ඒ ඇස්වල ආදරයක සටහනක් හැංගි නොහැංගී තිබෙනව කියල ඇය දැක්ක. ඒ අස්සෙ රතු මල්ලි තර්කනීගෙ ඇගේ දැවටි දැවටි මොකද්දෝ කතාවක් කියන්නයි උත්සාහය. ඒත් ඒ කතාවෙ මුල මැද අග ගැටගහන්න තර්කනීට වඩා වසර 5ක් බාල මල්ලියට පුළුවන් වුණේ නැහැ. හාර අවිස්සල කතාවෙ මුල මැද අග ගැට ගහගන්න තර්කනීටත් වුවමනාවක් තිබුණෙ නැහැ. ඇය තේරුම් ගත්තෙ එකම දෙයයි. තර්කනී නැති දවසට රතු මල්ලි ඉන්නෙ පොඩි අප්පච්චිලගෙ ගෙදර බොහෝ

රාත්‍රීන්හි අප්පච්චි ගෙදර එන්නෙ නෑ.... අම්ම තනියම. ඒ වගේම මේ දෙන්නගෙ හැසිරීමෙ වෙනසට අකමැති පොඩි අප්පච්චිල මහගෙදර හතර මායිමට එන්නෙ නෑ.
ඇත්තටම ඒ දවස 9 වසරෙ හිටිය තර්කනීට මේ කාරණා පිළිබඳව අම්මගෙන් අහන්න හිතුණෙ නැත්තෙ, වයසටම හරියන පුංචිකම ඇයගෙ හදවත තුළ තිබුණ හින්දමයි.
කාලය ගෙවුණා. තර්කනී 10 වසරෙ. එක මාසයක....මුළු මාසය පුරාම තර්කනී, අම්ම නේවාසිකාගාරයට එනතුරු බලා හිටියත් ඇය ආවෙ නැහැ. දවසක පොඩි අප්පච්චි ඇවිල්ල නේවාසිකාගාර ගාස්තුත් ගෙවල, කෑම බීම මල්ලකුත් තියල ගිහින් තිබුණත්, තර්කනී හමුවෙන්න ආවෙ නැහැ. දුක හිතුණත් අමුතු ජීවන රටාවකට හුරු වෙච්චි තර්කනී හිත පාලනය කර ගත්ත. එකෝමත් එක සිකුරාදා හවසක අම්මා නේවාසිකාගාරයට ආව. ගෙදර යන්න මහ ලොකු ආසවක් නැතත් මල්ලිව තුරුලු කරගන්න කෑදරකමක් තර්කණීගෙ හදවතේ තිබුණා. ඒ නිසාම දෙමසකින් රතු මල්ලිගෙ මුහුණ නොදැක්ක තර්කනීගෙ ඉහෙ මලක් පිපුණා. ඒත් අම්ම වෙනද වගේ නෙවෙයි. තර්කනී දිහා කෙලින් බැලුවෙත්... වැඩි වෙලා හිටියෙත් නැහැ.
"අම්මේ.... මං ඇඳුම් අරන් එන්නම්....."
තර්කනීගෙ වචන අම්මගෙ මූණ අඳුරු කළා.
" පස්සෙ දවසක යමු."
අම්ම කෙඳිරුව. තර්කනී අම්ම දිහා බැලුව. අම්ම සුදු වෙලා, මහත් වෙලා, මොකද්දෝ වෙනසක්... සිරුර පුරාම. අම්ම ගියාට පස්සෙ යකිනාරං ගහ යට බංකුවෙ වාඩි වෙලා තර්කනී ගොඩාක් හිතුව. අන්තිමේ ඇය ප්‍රශ්නයට උත්තරේ හොයා ගත්ත.
" අම්මයි අප්පච්චියි අතර ප්‍රශ්නයක්....."
ඒ උත්තරේ තර්කනීගෙ හදවතට නිවනක් නැතත්, සැනසීමක් ළඟා කරල දුන්න. පොත පතට වැඩි වැඩියෙන් ඇලුණු තර්කනීගෙ ඇස් තෙමුනෙ රතු මල්ලි මතක් වුනාම විතරයි.
වාර අවසන් විභාගෙන් පස්සෙ නිවාඩුවට ළමයි ගෙදර යන්න ලෑස්තිය. හැමෝම එක්කගෙන යන්න ඇවිත්. තර්කනීත් ලෑස්ති වුණා. එකිනෙකා ගෙදර යන්න නේවාසිකාගාර දොරින් පිට වුණා. ඉතුරු වුණේ තර්කනී විතරයි. "සෙක්ෂන්" එකේම පළවෙනිය

වෙච්ච තර්කනී "රිපෝට් පොත" අතේ තියගෙන බලා හිටිය. අම්මට කියන පළවෙනි ආරංචිය, තාත්තට කියන එකම ආරංචිය තමයි ඒ අතේ රැඳුණේ. ගේට්ටුව දිහා බලාගෙන ඇස් රිදෙද්දි ඔරලෝසුව වේගයෙන් දිව්ව.
"ගෙදරින් එන්නෙ නද්ද තර්කනී? "
මැඩම් අහද්දි තර්කණී අහිංසකව හිනාවුණා. කවදාවත් නැති දුකකින්, තනිකමකින් හදවත රිදෙනව ඇයට දැනුණ. තවත් අඩ හෝරා අඩකට පස්සෙ පොඩි අප්පච්චි ගේට්ටුවෙන් ඇතුළට පියමන් කළේ දිව්‍ය ලෝකෙන් දිව්‍ය කුමාරයෙක් වඩිනව වගේ. තර්කනී දුවල ගිහින් පොඩි අප්පච්චිගෙ අතේ එල්ලුණා.
"ගෙදර යමු පුතේ "
පොඩි අප්පච්චි මිමිණුව. තර්කනී තමා අත තිබූ මහාර්ඝ වස්තුව ඔහුට දික් කරා. පොඩි අප්පච්චිගෙ මූහුණෙ සතුටකුත්, දුකකුත්, ඇහේ කඳුළකුත් එකවර පෙනී නොපෙනී ගියා.
"බුදු සරණයි මගෙ දරුවට...."
"සතුටට පොඩි අප්පච්චිට කඳුළු ආව...."
තර්කනී හිතුව.
"අම්ම ආවෙ නැහැ...?"
තර්කනීගෙ වචන පොඩි අප්පච්චිට අහුණෙ නැහැ වගේ. කොහොමින් කොහොමහරි තර්කනී ගමේ ආව. හැබැයි පොඩි අප්පච්චිලගෙ ගෙදරට. සිසිල් මල්ලි නිසාවෙන්ම පමණක් අම්මෙක් වෙච්චි පොඩි අම්මට තර්කනීත් රතු මල්ලිත් එයාගෙම දරුවො වගේ. ඒක තමයි තර්කනී මේ ජීවිතේ ලබපු මහම මහ පින.
" පැටියෝ... ඇඟ හෝද ගන්නකො.. මං තේ හදන්නම්.."
" ගෙදර ගිහින්ම සෝදගන්නම් පොඩි අම්මෙ. "
පොඩි අම්ම නිහඬයි. තර්කනීව බදාගෙන හිටි මල්ලියා කටහඬ අවදි කළා.
" අපි ගෙදර යන්නෙ නෑ. "
" ඇයි? "
" අම්ම ගෙදර නෑ..."
" අම්ම ගෙදර නෑ...? "
" ඔවු, දැන් ගොඩක් කල්. මන් ඉන්නෙ මෙහේ.."

තර්කනීගෙ කකුල් පණ නතිවුණා. බරපතල යමක් සිදුවී ඇති බවක් තර්කනීට තේරුම් ගියා. ඒ නිසාම තමයි අම්ම තමාව බලන්න ආවෙ නැත්තෙ කියල තර්කනීට දැන් දැනෙනව. පොඩි අම්ම හැලප පිඟානකුත් එක්ක තේ කෝප්පයක් තර්කනී ළඟ කනප්පුවෙ තිබ්බ.

"තේ බොන්න පුතේ....

" අම්මට කරදරයක්ද පොඩි අම්මෙ?

"නෑ පව් ඒ ගෑනි.. ඔය ඉන්නෙ..."

"එතකොට... අප්පච්චි.... ?"

"එයාටත් ඔය හැමතැනම ගෑනු ඉන්නෙ.. "කියාගෙන පොඩි අම්ම ගේ දිහාවට හැරුණ

"මොනවද මේ කියවන්නෙ...?"

"උඹලට ඕව ඕන නෑ.. අපි ඉන්නෙ හොඳට ඉගෙනගෙන මනුස්සයො වෙයල්ල. අපිට උඹල බර නෑ...."

පොඩි අප්පච්චිගෙ හඬ තර්කනීගෙ පවුල එකිනෙකාගෙන් සදහටම වෙන් වෙලා කියල අඟවන සීනු හඬක් වගේ.

කාලය ගෙවුණ. වියපත් වෙද්දී අම්ම, අප්පච්චි ගැන නොදැන හිටි බොහෝ දේ තර්කනී දැනගත්ත. අම්ම අප්පච්චිව හඳුනගෙන තියෙන්නෙ යෝජනාවකින්. දෙපාර්ශවයෙ ආශිර්වාදය මැද විවාහ වුණ ඔවුන්, විවාහයට පෙර තනිව හමුවෙලා කතා කරලවත් නැහැ. විවාහයෙන් පස්සෙ වුනත් අප්පච්චි අම්ම එක්ක ලොකුවට කතා බහ කරල නැහැ. සොබාවෙන්ම අහින්සක අම්ම අප්පච්චිට සලකලා තියෙන්නෙ දෙවි කෙනෙක්ට වගෙ. ඒත්... ඒ කිසිම දෙයකට ඇගයීමක් අප්පච්චිගෙන් ලැබිල නෑ.. හිතේ හැටියට වියදම් කරන්න... අම්ම තාත්ත බලන්න යන්න.. නෑ ගෙදරක යන්න ඇයට අවස්ථාව ලැබිල නැහැ. ඇත්තටම ඇය ගෘහස්ත කායික හිංසනයට ලක් නොවුණත් ගෘහස්ත මානසික හිංසනයට ලක්වෙලා තිබුණා. ඉඳල හිටල ඇය දුක බෙදාගෙන තිබුණෙ පොඩි අම්ම එක්ක. කොහොම වුණත් විවාහයට පෙර ඉඳලම අප්පච්චි තුන්වෙනි සිල්පදය කඩපු කෙනෙක්. තනිපන්ගලමෙ අප්පච්චි ඉන්න තැනට පොඩි අම්මවත් යවන්න පොඩි අප්පච්චි කැමති වෙල නෑ. අහිංසක සුන්දර ගැමි ළඳක් වෙච්චි අම්මව බන්දල දුන්නම අප්පච්චි වෙනස් වෙයි කියල හිතුවත්, එහෙම වෙලා

නැහැ. තමාට උරුම මහ ගේ හා ඉඩම ලෝබ කමක් නැතුව අප්පච්චිට දෙන්න පොඩි අප්පච්චි එකඟ වුණෙත් තමන්ගෙ එකම අයිය පිළිවෙළක් වෙයි කියන බලාපොරොත්තුවෙන්. ඒත් ඒ හැම පැතුමක්ම සුන්නත් දූලි වුණේ අප්පච්චිගෙ ජීවිතය වසාගත් එකම එක දුර්වලතාව පාලනය කරගන්නට ඔහුට නොහැකිවීම නිසා.

රජකුගෙ වගෙ ප්‍රතාපවත් පෙනුම, ඕනෑ හැටියට මුදල් කඩා වඩා ගන්න හැකි වීම, වැදගත් චරිත නැති ගෑනුන්ගෙ ආකර්ෂණය ඔහු වෙත ඇදගෙන ආව. ඇත්ත යුක්තිය පසඳලන්නට බැරි තරමට ඔහුව මෝහනය කරගන්න, පොඩි අම්මගෙ වචනෙන් නම් "ඒ පාදඩ ගෑනුන්ට" පුළුවන් වුණා. හැමදෙයක්ම නිහඬව දරා ගත්ත අම්ම... නොදැනීම ගෙදරට ලියුම් ගේන පියල්රත්න එක්ක ඇයි හොඳැයියක පැටලැවිල. ආදරයක,සෙනෙහසක ,ආරක්ෂාවක හවුහරණක් නොමැතිව සිටි අම්ම රාගයෙන් නෙවෙයි ආදරයෙන් මුසපත් කරගන්න පියල්රතනට ඒ තරම් අපහසු වෙලා නැහැ. එහි අවසන් ප්‍රතිඵලය වෙලා තිබුණෙ දවසක රහසෙම අම්ම පියල්රත්න එක්ක පලා යාම. එදායින් පස්සෙ පියල්රත්න ලියුම් බෙදන්න ඇවිත් නැහැ. ඔහු වෙනත් ප්‍රදේශයකට මාරුවීමක් හදාගෙන. අද තවත් දෙදරු මවක් වෙච්ච අම්ම ප්‍රශ්නයට උත්තරයක් විදියට හොයාගෙන තිබුණෙත් ප්‍රශ්නයක්. සුරාවට ඇබ්බැහි වෙච්චි පියල්රත්න අම්මට ආදරෙ උනත් ඒ ගෙදර දෝරෙ ගලා ගියෙත් දුකම විතරයි. පියල්රත්නගෙ අම්මත්, අවිවාහක අක්කත් දෙන වධහිංසා පියල්රතනටත් නොකියාම... අම්ම උහුලන්නෙ ඇඬූ කඳුළින්.

" මැඩම්... දුලාන් සර් ඇවිල්ල"

"ආ...ඇඟට හරි නෑ සුසන්ත. පොඩ්ඩක් නින්ද ගියා දන්නෙම නැතුව.."

තර්කනීට කියවුණා.

"ඇයි මං මෙයාට කවදාවත් නැතුව නිදහසට කාරණා කිව්වෙ... තර්කනීට මදි පුංචිකමක් දැනුනා.

සුසන්ත පසුගමන් එද්දි වටපිට නොබලාම ඇවිත් මෝටර් රථයේ ඉදිරි අසුනේ වාඩි වුණ තර්කනී, දුලාන් දිහා බැලුවෙ අසරණ විදියට. මේ ආදරණීය, ගෞරවනීය, වැදගත් දොස්තර මහත්තය අප්පච්චිගෙ මළ ගෙදරට අරගෙන යන එක හරිද...? එයාට මදි

කමක් වේද...? අපේ පවුලෙ අතීතය එයාගෙ හිත රිද්දයිදන්ව? තර්කණී හිතුව. දුලාන්ට ඒ හැමදෙයක්ම තේරුණා වගේ ඔහු හිනාවුණා.
"අම්මලත් හෙට මළ ගෙදර එයි. අම්මල අගය කරන්නෙ ඔයාව. ඔයාගෙ වටපිටාව නෙවෙයි. මානසික වෛද්‍යවරයෙක් හැටියට අපේ ඩැඩීට හොඳටම තේරෙනව ඔයාලගෙ අම්මගෙ...අප්පච්චිගෙ මානසික මට්ටම...... අම්මගෙ ආදරේ..... සහෝදරියකගෙ ආදරේ.... ළඟම මිතුරියකගෙ ආදරේ විඳ ගන්න පින නැතිවෙච්ච ඔයාගෙ අප්පච්චි ගැහැනියකගෙ ආදරය හඳුනාගෙන තිබුනෙ නෑ තර්කි... එයා අත්දැක්කෙ ගැහැනියකගෙ ආදරේ, සෙනෙහසේ, කරුණාවෙ උණුහුම නෙවෙයි රාගයෙ ගින්දර විතරයි. එයා ඒ ලෝකෙම අතරමං වුනා. පවු... අම්මත් ඒ ගින්දරට පිච්චුණා... තර්කි... ඒ චරිත දෙකම සමාජයේ අතරමං වෙච්ච අහිංසක චරිත දෙකක් විතරයි... අපි ගරහන්න ඕනෙ නෑ... උගත් අය විදියට එයාල දිහා දයාවෙන් බලන්න අපිට පුළුවන්. අප්පච්චිට, අම්මට සමාව දෙන්නත් පුළුවන්... "තර්කනීට අදහගන්නත් බැහැ.
"දෙවියනේ දුලාන් ඔයාල නම් දෙවිවරු..." ඇය හදවතින් මිමිණුව.
"තර්කි... ප්‍රශ්න ඕන නෑ.... අපි ඔයාලගෙ අම්ම ඉන්න තැන දන්නවනෙ...අපි එයාවත් මළ ගෙදර ගෙනියමු...."
තර්කනී "ඔයාගෙ කැමැත්තක් " කියන බැල්මෙන් දුලාන් දිහා බැලුව. පැය දෙකක නිහඬ චාරිකාවකින් පස්සෙ තර්කනී අම්මලගෙ ගෙදර දොරකඩින් බැස්ස. හෝදපු රෙදි වැලට දමමින් හිටි අම්ම තර්කනී දැක්ක බැල්මටම හඳුනා ගත්ත. ඇය ඉදිරියට දුවගෙන ආවෙ තර්කනී වැළඳ ගන්න වුණත් එකවරම විදුලි සැරයක් වැදුණ වගේ නැවතිල අඩියක් පස්සට ගත්ත. අයිතියක් නැති මහාර්ඝ වස්තුවක් දිහා බලන්න වගේ අම්ම තර්කනී දිහාත්, දුලාන් දිහාත්, බැලුවෙ ඇස් වල කඳුළු පුරවගෙන. අවස්ථාව තේරුම් ගත්ත දුලාන් ඉස්සරහට ඇවිත් අම්මගෙ හීතල දෑත අල්ලගත්ත...
"අම්මෙ...මම තමයි තර්කිගෙ මහත්තය. මෙච්චර දවස් අපි ඔයාව බලන්න ආවෙ නැති එකට සමාවෙන්න..."

තර්කනීගෙ අම්මගෙ දෑසින් සට සට ගාල කඳුළු කඩා වැටුණා. දුලාන් අනුගමනය කළ තර්කනීත් අම්ම ළඟට ඇවිත් ඇයව වැළඳ ගත්ත.

"අම්ම.... අඬන්න එපා..."

දිගු නිහැඬියාවක් අවසානයේදී දුලාන් අප්පච්චිගෙ මළගම ගැන අම්මට කිව්ව. ඒත් අම්ම ගැස්සුනේ නැහැ. ඇය ඒ මොහොත වෙන විට ඒ ගැන දැනගෙන හිටියා.

"අම්ම අපිත් එක්කම යමු. අපි ආපහු එක්කගෙන එන්නම්..."

තර්කනීට සුව පහසුව ගෙනදෙමින් හැමදෙයක්ම සැලසුම් කරන්නෙ දුලාන්. පොඩි අප්පච්චිගෙන් , පොඩි අම්මගෙන්, රතු මල්ලිගෙන් පස්සෙ තමන්ගෙ ජීවිතයට අහම්බෙන් හමුවුණ යෝධ ශක්තිය.

"මම මළ ගෙදර එන්නෙ නැහැ...මෙහේ අය කැමති නෑ..."

ඇහෙන නෑහෙන බිඳුන හඬින් අම්ම මිමිණුව. ඇගේ ඇස් කාටත් හොරා වටපිටට යොමු වුණ හේතුව හොයන්න දිව්ව තර්කනීගෙ ඇස්වලට හසුවුණේ බිඳුණු ජනෙල් වීදුරු අස්සෙන් එබිකම් කරන ඇස් හතරක්. ඒ ඇස් තර්කනීට අම්මගෙ කතාව සම්පූර්ණ කරගන්න දුන්න ඉඟියක් වගේ.

"කමක් නෑ අම්ම... අපි මළ ගෙදරින් පස්සෙ අම්මව බලන්න එන්නම්...."

දුලාන් දණ බිම ඇණල අම්මට වැන්දා.... තර්කණී එහෙම කරන්න හිතාගෙන නොහිටියත් නොහිතාම දුලාන්ව අනුගමනය කළා. ඔවුන් ආපහු හැරෙද්දි අම්ම හඬ අවදි කළා ඉකිබිඳුම අස්සෙන්.

"පොඩ්ඩක් ඉන්න..."

තර්කනීට "දුව" කියල අමතන්න අම්මගෙ දිව පැකිලෙනව කියල තර්කනීට වගේම දුලාන්ටත් දැනුණා. ඔවුන් හිටිතැනම නතර වෙද්දි අම්ම ඉක්මන් ගමනින් ගෙට ගියා. ඒ එක්කම කැඩුණ වීදුරු අස්සෙන් එබුණ ඇස් අතුරුදහන්. ගිය සැණෙන් අම්මඑළියට දුවගෙන ආවෙ අර ඇස් හතරට වැලි ගහල.


"මේ කොළ කැල්ලයි....මේ පාර්සලෙයි කාටවත් නොපෙනෙන්න අප්පච්චිගෙ පෙට්ටියට දාන්න..."

තර්කනී උඩ බිම බැලුවා. "මේ මොන බොළඳ ඉල්ලීමක්ද...." දුලාන් දෑතම දිගු කරල ඒ දේ අතට ගත්ත. තර්කණී වික්ෂිප්තව බලා ඉඳිද්දී දුලාන් රියදුරු අසුනේ හරි බරි හැහුණෙ නිහඬව.
"යන්නම් අම්මෙ..."
තර්කනීගෙ හඬ අම්මට අහෙන්න ඇත්තෙ එහා ලෝකෙක ඉඳල ආව වගේ. සුපුරුදු නිහැඬියාව මැදින් ගමන ඇරැඹුණා. දෙදෙනාම හදවත් එක්ක බර කතාවක්. දෙදෙනාටම දනුණෙ මැරුණ අප්පච්චි ගැන නෙවෙයි, ජීවත් වෙන අම්ම ගැන දුකක්. එකවරම තර්කනීට මතක් වුණේ අම්මගෙ අමුතු ඉල්ලීම.
"දුලාන්... මොකද්ද අම්ම දුන්නෙ...?
"තර්කි අපි බලමු. අම්මගෙයි අප්පච්චිගෙයි ජීවිත ගැන තේරුම් ගන්න අපිට ඒ කොළකෑල්ල උදවු කරාවි."
වාහනය නතර කළ දුලාන් අම්මගෙ රහස තර්කනීට දිගු කළා.ඒ රහසට අත තියන්න දිරියක් තර්කනීට නැහැ. ඔහු හෙමින් සැරේ කොළ කෑල්ල දිග හැරිය. පුංචි පදවැලක්....
පතා ආ සැනසුම
නොලබුණි මට...
පැතූ සැනසුම
නොලැබිණි ඔබටද....
එන අත් භවයෙහි
මම ඔබ සොයමි...
අපේ ජීවිත සුන් කළ
එකම වරදට සමු දී....
ඔබද මා සොයනු මැන...
ආදරයෙන් හමුවී
ආදරයෙන්ම මියයන
භවය එළැඹෙන තුරා....
ඔබට නිවන් සුව නොපතමි.....
එදා පැළැඳූ
කනක මුදුවද රැගෙන
යනු මැන....
නැවත නැවතත්....
භවයෙන් භවය

සොයනු මැන මා....
පළඳින්නට මේ මුදුවම.....

දැන් ඉතින් පාර්සලයේ තියෙන දේ රහසක් නොවුණත් වෙව්ලන දෑතින් දුලාන් පාර්සලය ඇරිය. රතු පාට පුංචි පෙට්ටිය ඇතුළෙ රන් මුදුවක්. ඒ අප්පච්චි අම්මව කරකාර බැන්ද මොහොතෙ සිහිවටනය.
"දෙවියනෙ... මේ තරම් දුක් විඳගෙනත් මේ මනුස්සය මේක රැකගෙන තියෙන හැටි..."
දුලාන්ගෙ දෑසට කඳුළු පිරුණා.
"අනේ....අපේ අම්මයි.....අප්පච්චියි....."
තර්කනීට ඊට වඩා දෙයක් කියාගන්න බැරි වුණේ දුලාන්ගෙ ලෙන්ගතු දෑත් අතරෙ හිරවුණ නිසා. නිතරම සමබරව සැපදුක දරාගන්නා දුලාන් හැඟීම්බර වෙලා. හෝරා කිහිපයක ඇවෑමෙන් අප්පච්චි බලන්න ආව තර්කනී අප්පච්චිගෙ මුහුණ, දිහා ආදරයෙන් බැලුව. ඇස් දෙකෙන් කඳුළු ගලා හැලෙද්දි ඇය සෙමින් අප්පච්චිව ඇමතුව.
"අම්මයි....අප්පච්චියි ආදරෙන් එකතුවෙන භවයක මමයි රතුයි ඔයාලගෙම දරුවො වෙලා එනවාමයි අප්පච්චී...."
නිල ඇඳුමෙන්ම තමා ළඟ ඉන්න, O.I.Cදේවින්ද, රතු මල්ලිගෙ සුරත පපුවට තුරුළු කරගනිමින් තර්කනී කෙඳිරුව.

## කෙටි කතා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**කුසලතා ස්ථානය**

ජයතිලක කරුණාරත්න
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මධ්‍යම නුවරගම් පළාත

**රතනපාල සහ රත්නපාල**

යන එන අය පෙනෙන නොපෙනෙන තරමට පාර පුරාම අඳුර ගනකං වෙමින් තිබිණි. රත්නපාල වැඩ ඇරී ගෙදර යමින් සිටියේ බයිසිකලයෙනි. පඩි දිනය නිසා වෙනදාට වැඩියෙන් මත් පැනින් සප්පායම් වී සිටි රත්නපාල පාර පුරාම බයිසිකලය පැද්දේය. පයින් ගමන් කරන අයෙකු ඉදිරියට එන බවට ඔහුට පෙනුනේ ඡායාවක් මෙනි.

''බ්..ර්..රේක් නෑ..බැල්...නෑ... ආයින් වෙන්ඩ...ඕන් කිවුවා... හැප්පු...න්...නාට පස්සෙ ම.....ට්.....ට දොස් නෑ ඕන්....''

රත්නපාල වචන පැටලි පැටලී දිගටම කියාගෙන ගියේය. බයිසිකලය දෙපසට වැනි වැනී ගොස් ඉදිරියෙන් පැමිණි තැනැත්තාගේ හැප්පි නොහැප්පී යාන්තමින් බේරුණේය. රත්නපාල බයිසිකලයෙන් බැස්සේය.

''කවුදෝ...යි මේ... රෑ වෙල්ලා... බැර්රිද... ටිකා...ක් අයින් වෙල්ලා... යන්ඩ ....ඕයි ඈ...''

රත්නපාල එසේ කියමින් ඉදිරියෙන් සිටි තැනැත්තාගේ මුහුණට මුහුණ ළං කළේය.

'' මම මෙ හාමුදුරු කෙනෙක්''

''හාම්මුදුරු කෙනෙක්...? ආ... හාම්මුදුරු කෙනෙක්...''

ඒ වචන දෙක කිහිප වතාවක් දෙතොල් අතරින් සෙමින් උච්චාරණය කළ රත්නපාල මොහොතක් නිහඬව සිටියේය.

ඔහුගේ සිතට අමුතු හැඟීමක් පහළ වී සන්සුන් ආකාරයකින් කතා කරන්නට පටන් ගත්තේය.

''සමා..ව් වෙන්ඩ අපෙ හාදුරුවනේ...මේ...මේ ර්...රෑ වෙලා කොහෙ ද් ද...''

''මම මේ ළඟ තියෙන පන්සලට යනවා... හන්දියට බස් එක එනකොට ටිකක් රෑ උණා...''

ඒ වචනවල තිබුණ විනීත බව, සන්සුන් බව රත්නපාලගේ යටපත් වී තිබුණ හොඳ සිහිය යළිත් උලුප්පා ඉහළට ගත්තේය.

''උපාසක මහත්තයට අද ටිකක් වැඩියෙන් හම්බ වෙලා වාගේ...එහෙම තියෙද්දී ඔය විදියට කරුවලේ යන එක හොඳ මදි නේද?... තමන්ටම නේද අනතුර...ඩිංගක් ඒ ගැන කල්පනා කරන එක වටිනව... මං එහෙම කිවුවට අමනාප වෙන්ඩ එපා... හොඳයි එහෙමනං පරිස්සමින් යන්ඩ...මමත් යනව...''

අවුල් වියවුල් මැද ගිනිගෙන දැවෙන තම සිතට මල් වැස්සක් වැටුණා සේ රත්නපාලට දැනිණ. කැලඹිල්ලෙන් ගෙවී යන තමන්ගේ ජීවිතය පිළිබඳව අලුත් සිතිවිල්ලක් සිතට ගොඩවුණාක් සේ හැඟී ගියේය.

මෙ තරම් නිවුණ ආකාරයකින් යමෙකු තමන්ගෙන් සිදු වූ වරදක් ඉවසූ දිනයක් ඔහුට මතක නැත. පුදුම ඉවසීමක්... රත්නපාලගේ සිත තුළ දිගු කලක් නිදා සිටි මතක ගොන්නක් කෙමෙන් කෙමෙන් දෙනෙත් විවර කරන්නට පටන් ගත්තේය. රත්නපාල බයිසිකලය පසෙකින් නවතා හාමුදුරුවන් අසල දණින් වැටුණේය.

''සුවපත් වේවා...''

ඒ වචන දෙක රත්නපාලගේ දෙසවනෙන් ඇතුල්ව සිත ඇතුළට කිඳා බැස්සේ අමුතුම සැනසිල්ලක් සිතට දනවමිනි. එහෙත් ඒ සමගම තම ජීවිතය ගැන සිහින් වේදනාවක් ද ඔහුගේ සිතට එකතුවන්නට පටන් ගත්තේය. රත්නපාල නැවතත් බයිසිකලයට නැංගේය. රත්නපාලගේ දෑතටත් දෙපයටත් බයිසිකලය බාරදුන් සිත අතීතයේ සැරිසරන්නට පටන් ගත්තේය.

''සුවපත් වේවා...''යන වචන දෙක රත්නපාලගේ සිත රැගෙන ගියේ ඔහුගේ ජීවිතය නිවී සැනසිල්ලේ ගෙවුණ යුගයක මතක සටහන් වෙතය.

තමා පැවිදිව සිටි කාලයේ කී දෙනෙකු වෙනුවෙන් මේ වචන දෙක කියා ඇත්දැයි රත්නපාලට සිතිණි. තමා ඉදිරියේ දණ නමා දෑත් එක් කළ හැම කෙනෙකු වෙනුවෙන් ම මෙ ප්‍රාර්ථනාව කළ බව ස්ථිරය.

''පින්වතුනි, අපි ඔක්කොම දුවන්නෙ මහා මිරිඟුවක් පස්සෙ කියන එක තේරුම් ගන්ඩ මහන්සි වෙන්ඩ ඕනෑ... හොඳ ජීවිතේකට පුරුදු උනහම ඒක තේරුම් ගන්ඩ ලේසියි... හොඳ ජීවිතේකට අත්තිවාරම තමයි පස්පව්වලින් වැළකීම... පාණාතිපාතා... අදින්නාදානා...''

ඒ ආකාරයෙන් තමා අන්‍යයන්ට දේශනා කළ බණ පද පිළිබඳව රත්නපාලට සිහි විය. රතනපාල උන්නාන්සේ යනුවෙන් අමතමින් තමනට ගරුබුහුමන් දැක්වූ , ආදරය කළ, තමා ඉදිරියේ හිස නමමින් අතපය හකුළාගෙන සිටි වැඩිහිටි දායකයින් ගැන සිහි වෙද්දී ඔවුනට තමාගෙන් සිදු වූයේ මහත් අසාධාරණයක් යැයි රත්නපාලට දුකක් හා පසුතැවිල්ලක් දැනිණ. එවන් වටිනා ජීවිතයක් ගත කළ තමා පහන් සිළක දැවටුණ පළගැටියෙක් වූ අයුරු සිහිවෙද්දී ඔහුගේ දෑසට කඳුළු පිරුණේය. පන්සලේ ගත කළ ජීවිතය කොතරම් නිදහස් සැහැල්ලු එකක් දැයි පසක් වූයේ ගිහි ජීවිතයේ අනේකවිධ රැහැන්වලින් බැඳෙන්නට වූ පසුවය. විහාර ගෙය තුළින් ගලා ආ තෙල්,මල්, හඳුන්, කපුරු සුවඳ සිතට ගෙනා සැනසිල්ල වචනවලින් කිව නොහැකි තරම්ය. මල් පිපුණු සල් ගසේ සෙවණෙහි වූ ගල උඩ වාඩි වී, නිවී සැනහිල්ලේ බණ පොතක් දිගහැර ගන්නට යළිත් හැකි වේ නම්... එහෙත් එය යළි කිසිදාක නොහැකි වනු ඇත. රත්නපාලගේ සිත උහුලාගන්නට බැරි තරම් වූ පසුතැවිල්ලට හේතුවන කාරණා එකතු කළේය.

තමා ගත කළ ඒ නිස්කලංක ජීවිතය වෙනස් කළ පහන්සිළ සුමනලතා.... පන්සලේ කලා හවුල මූලික වී පුහුණු කළ සූවිසි විවරණ නැටුම් කණ්ඩායමේ හැඩකාර දඟකාර නැට්ටුක්කාරි.... ඇස්දෙකට දරාගන්නට බැරුව ගිය ලස්සන කෙස් කලඹ .... පුළුල් උකුළ.... සිහින් ඉඟටිය ....සුදුම සුදු දෑත් දෙපා .... මේ සියල්ල එක් වී කෙලෙස් රැහැනින් තමා වෙළාගත් අයුරු සිතට නැගුණේ සිහින් වේදනාවක පැටලෙමිනි.

එක් දිනක් හෝ සුමනලතා නොදැක ඉන්නට බැරි තරමට තම සිත රාග කුණු කන්දල්වලින් වැසී ගිය ආකාරයත්, කිළිටි වී වල්මත් වූ සිත හදාගන්නට උත්සාහ නොගෙන උවමනාවෙන් ම මග හැරිය ආකාරයත්, සිත යන අතටම යන්නට ඉඩ හැර තව තවත් මග එළි කළ ආකාරයත් පෙළ ගැසෙමින් රත්නපාලගේ මතකයට නැගිණ.

ලොකු හාමුදුරුවන්ට රහසින් සුමනලතා සමග සබඳතාවය පවත්වාගෙන යන්නට තමා විසින් යෙදූ විවිධාකාර උප්පරවැට්ටි රත්නපාලට සිහි විය. තමා ලොකු හාමුදුරුවන්ට ද්‍රෝහි වූයේ ඉතාම පහත් අරමුණක් නිසාම බව එදා නොසිතුණේය. තමාගේ දියුණුවට අතහිත දුන්, තමා විශ්වාස කළ ලොකු හාමුදුරුවන්ට කෙතරම් බොරු කළේ ද?... සිවුරු ගලවා දමා පන්සලෙන් පිට වී ආ දවසේ ලොකු හාමුදුරුවෝ දෑසෙහි කඳුළු පුරවාගෙන දුක් වූ බව ආරංචි වුවද, තමාට කිසිදු දුකක් ඇති නොවූ අයුරු සිහි වී රත්නපාලගේ සිත කීරි ගැසී යන්නාක් මෙන් දැනිණ. දහසක් දෙනා දණ බිම ගැසූ විහාර ගෙය පවා සුමනලතා මුණගැහෙන්නට යොදාගත් තමා මහ පව්කාරයෙක්ය යන හැඟීමක් ඔහුට ඇති විය. තමා විසින් සුමනලතා පොළඹවා ගත්තේ ද එසේ නැතිනම් සුමනලතා විසින් තමා පොළඹවා ගත්තේද යනුවෙන් වැරැද්ද දෙපසට දමා කිරා බැලූ රත්නපාලට සුමනලතා පිට වැරැද්ද පැටවීම අපහසු විය.

සුමනලතා හැකි තරම් මග හරිද්දී තමා විසින් ඇය කොටු කරන්නට දැල එළූ ආකාරය සිතේ පසෙක ලියවී තිබිය දී ඔහුට වරදෙන් නිදහස් වන්නට නොහැකි විය. සුමනලතාගේ හීන් දිගටි ඇස් දෙක, මුතු ඇට වගේ දිලිහුණ දත් දෙපෙළ, දිගු කෙස් කලඹ තමා සන්තක කරගන්නට උපන් අප්‍රමාණ ආශාව.... ලස්සන කඩා හැලෙන ඒ රුව කෙරෙහි උපන් ආශාව... අන් සියල්ල අමතක කොට ඉදිරියට එද්දී, තමා ඊට අවකාශ ලබා දුන් අයුරු, මැදියම් රැය පසුවන තුරු කාමරයට වැදී සුමනලතාට ලිපි ලියමින්, කවි ගොතමින් නිදි වැරූ අයුරු රත්නපාලගේ සිතෙහි දොරගුළු හැර එළියට ආවේ පසුතැවිල්ලක වෙළීගෙන ය.

පැවිදි දිවිය අතහැර මාස කිහිපයකට පසු හිතවතෙකුගේ මාර්ගයෙන් මෙම කොන්ක්‍රීට් වැඩපොළෙහි රැකියාව ලබාගෙන ඉන් අනතුරුව සුමනලතා සමග මෙම ප්‍රදේශයේම පදිංචි වී අලුත්

දිවි පෙවෙත ඇරඹූ ආකාරයත්, වසර කිහිපයක් තමාටත් නොදැනී බලාපොරොත්තු මගහැර ඉක්මනින්ම ගෙවී ගොස් ඇති ආකාරයත් රත්නපාලට සිහිවිය. එසේ ගත වූ කාලය කොපමණදැයි ඔහු ගණන් හදා බැලුවේය.

සුමනලතා මැදිකොට එදා තම සිතෙහි මැවූ ලෝකය අද සිහිනයකි. එදා දුටු සුමනලතාගේ හැඩරුවෙන් අඩක්වත් අද ඇය සතුව නැත. ඒ හැඩරුව සැඟව ගියේ කොහේදැයි ඇය හෝ තමා හෝ නොදනී. රත්නපාලගේ හිත ඇතුළෙ විසිරිලා තිබුණ සුමනලතාගේ දිගු පිල් කලඹ අද වියතකට වඩා දිග නැත. ඇගේ මුහුණෙහි තිබූ පැහැපත් බව දුක් කරදර වලින් සේදී ගොස් ඇත. දරු දෙදෙනාගේ කටයුතුත් ගෙදර වැඩපළත් නිසා දවස පුරා මහන්සි වීමෙන් ඇඟපත ඇදී ගොසිනි. කොන්ක්‍රීට් වැඩපළෙන් ලැබෙන සොච්චම් වැටුප අතේ ගෑවෙන්නටත් මදිය. දරුදෙදෙනාටත් සුමනලතාටත් අලුතෙන් රෙදි ඇඳුම් කිහිපයක් ගන්නට මාස දෙක තුනක සිට වලි කෑවද තවමත් නොහැකි විය.

ගත වූ කාලයට වඩා වැඩියෙන් තමාත් සුමනලතාත් වයසට ගොස් ඇතැයි රත්නපාලට සිතුණේය. උදේ හිස පීරද්දී කැඩපතෙන් දුටු තමාගේ මුහුණේ අලුත් හැඩ රුව ඔහු මතක් කර ගත්තේය.

ඒ කාලේ හිටියට වඩා කොයි තරම් වෙනස්වෙලාද?... හිස පීරීම, රැවුල කැපීම, දත් මැදීම දැන් කෙරෙනුයේ ඕනෑවට එපාවටය. ඒ කාලේ දවසගානේ රැවුල කැපුවා, මූණ පිරිල තිබුණා, අත් දෙක සිනිඳුයි, අද සියල්ල වෙනස්ය.

පන්සල් බිමේදීත් විහාර මන්දිරයේදීත් උදේ හවා සිතට ලැබුණ සැනසිල්ල අද කොහේ පාව ගොස් දැයි රත්නපාලට සිතිණි. උදෙන් ම රැකියාවට යාමට දරන වෙහෙස... වැඩපළේදී ඉස්පාසුවක් නැතිව ගල්, වැලි, සිමෙන්ති, යකඩ කම්බි සමග කරන යුද්ධය... සවස් වී ගෙදර පැමිණි විට සිතට ඇතුල්වන්නට පොරකමින් සිටින ඉමක් කොනක් නොමැති ප්‍රශ්න... ගෙදර දොර අඩුපාඩු...ලෙඩ දුක් කරදර... ඒ සියල්ලත් ඇගේ පතේ වෙහෙසත් මදක් තුනී කරගන්නට වැඩපළේ අයගෙන් හුරු පුරුදු වූ අඩි ගැහිල්ල... එයට සුමනලතාගෙන් ලැබෙන දුක්බර ප්‍රතිචාර... මේ

සියලු දේ පිළිබඳව සිතිවිලි ඇතිවී නැතිවී ගොස් නැවත එකිනෙක පැටලෙමින් රත්නපාලගේ සිත යකාගේ කම්මල විය. පිරිහීමේ දොරටුවක් වූ මත්පැන් පානයට තමා ඇබ්බැහි වූ අයුරු ඔහුට ම අදහා ගත නොහැකි විය. එක් යුගයකදී තමා විසින් අන් අය පස්වැනි පන්සිල් පදයෙහි පිහිටවූ අයුරු ඔහුට මැවී පෙනිණ. එහෙත් සෑහෙන කලකින් තමා ඒ සිල් පද පහ නිකමට කියූ දිනයක් හෝ ඔහුට සිහි කර ගත නොහැකි විය.

තමා මෙතරම් වේලාවක් කළුවරේ ම බයිසිකලය පැදගෙන ආවේ කෙසේදැයි රත්නපාලට බයක් සිතුණේ ගෙදර මිදුලේ බයිසිකලය නැවතුණ විට ය. මෙතරම් කලක් ජීවිතේ පුරා වෙළී පැටලී තිබුණ දුක, වේදනාව, පසුතැවිල්ල වැනි සියලු දේ එක් කොට කිරා මැන බලා සාදාගත් අලුත්ම සැනසිලිදායක තීරණයක් සිතෙහි ඉතිරිකරගෙන ඔහු ගෙට ගොඩ විය. ඔහු බයිසිකලය ගෙට ගනිද්දී සුමනලතා කුප්පි ලාම්පුවත් රැගෙන ඉදිරියට ආවාය. රත්නපාලගේ සිත පුරා ගිනි බෝලයක් කැරකී ගියේය.

එදා..ගිනි සිළුවක් වාගෙ නැටුම් කණ්ඩායම බබළවපු ලස්සන කඩා හැලුණ සුන්දර නැට්ටුක්කාරි.... සුමනලතා ....එදා වෙල යාන්තමට ගැටගහගෙන ජීවත් වෙන දුප්පත් පවුලක දුක් විඳින ගෑනියෙකුගෙ දුක වසන් කරගත් අහිංසක බැල්ම..... සිතට ගලාගෙන එමින් තිබූ දහසක් දේ අපහසුවෙන් යට කර ගත්ත ද සුමනලතාගේ මුහුණ දෙස කෙලින්ම බැලිය නොහැකි ගතියක් රත්නපාලට දැනිණ.

" අද හොඳටම රෑවෙලා... පුතාගෙ ඇඟ රත්වෙලා අනේ.... "
සුමනලතා සෙමින් කීවා ය.
" ආ..ඒ මොකද... මොකුත් දුන්නෙ නැද්ද..? "
රත්නපාල ඇසුවේ අහක බලාගෙන ය.
" කොත්තමල්ලි ටිකක් තම්බල දුන්නා... දත් මතුවෙන හින්ද ද දන්නෑ "
" ආ..එහෙමනං අඩුවෙලා යයි. "
රත්නපාල එසේ කියමින් සුමනලතා මගහැර යන්නට හැරෙද්දී ඇගේ බැල්මට හසුවිය. වෙනදා නැති සානුකම්පිත බැල්මක් ඔහුගේ දෑසෙහි උතුරා යමින් තිබිණ.

" මොකද අප්පේ ...අද අමුතුම තාලෙකට බලන්නෙ...? හැබැයි ඔන්න අදත් සප්පායං වෙලා තියෙනව.. බිච්ච නේද....? "

සුමනලතා එසේ ඇසුයේ මඳ සිනහවක් මුසු වූ අහිංසක ලීලාවකිනි. ඇගේ දෑස දෙස මඳ වෙලාවක් බලා සිටි රත්නපාලගේ සිත කියා නිම කළ නොහැකි ආදරයකින් හා අනුකම්පාවකින් පිරී ගියේය. මොන තරං ලස්සනට හිටපු ගෑනියෙක්ද දෙයියනේ... එක අතකින් පුදුම වෙන්ඩ දෙයක් නෑ... රූපං පීරති... තමා ඉගෙන ගෙන සිටි බොහෝ දේ රත්තපාලගේ සිතට නැගුණේය.

" ජීවිතේ ගැන කලකිරෙන්ඩ ඕනෙ නෑ... සුමනලතා ...ලොකු දුව ... පොඩි පුතා... මං හරි වාසනාවන්තයි.... "

සෑම වරදකින්ම සුමනලතා ව නිදහස් කළ රත්නපාලගේ සිත තමන්දෙට දඬුවම් නියම කරගත්තා.

"ලතා.... මගෙ රත්තරං... සහතිකයි....මං ආයෙ බොන්නෙ නෑ නෑ මයි.... "

රත්නපාල එසේ පැවසුවේ සුමනලතාගේ දෙකම්මුල් දෑතින් හිරකරගෙන මුහුණට මුහුණ ළං කරමිනි. කලකින් නොදැනුණ ඉම්හිරි සුවඳක් ඔහුට දැනිණ.

ꩡꩡꩡꩡꩡ

## කෙටි කතා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )



**කුසලතා ස්ථානය**

ඩබ්.ආර්.ඒ.එස්.එල්.රණසිංහ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ගම්පහ

### සිරකරුවෝ නිදහස්

පියසීලි වැට මායිමේ වූ වතුසුදු ගස වෙත ළං වූයේ සතුටිනි. එහි සෑම අතු රිකිල්ලක් පාසා ම ලෝබ කමක් නැතිව මල් පිපී තිබිණ. හැමදා ම බුදු පුදට මල් නෙළුවත් කිසි කන්කෙදිරියක් නොනගා මල් පුබුදුවන්නට තරම් මේ වතුසුදු ගස පරිත්‍යාගශීලී විය. සුදු මලින් වට්ටිය පිරෙන විට පියසීලිගේ සිතත් සතුටින් පිරිණ. ගෙමිදුලෙහි තවත් කෙතරම් විසිතුරු මල් පිපී තිබුණද හැමදාමත් බුදුන් පාමුල පිදෙන පින් ලද්දේ වතුසුදු මල් ම පමණි. පැළ තවාන්වලින් මිල දී ගත් පැළවල පිපෙන රෝස ඕකිඩ්, බාබන්ඩේසි මල්වලට නම් මල් අසුනට වඩින්නට පින් මඳ විය. පියසීලි කිසිවිටෙකත් ඒවා නෙළා නොගත් බැවිනි.

" උදේට පිපිලා හවහට පරවෙලා වැටෙන මල් මිසක් මාසයක් හමාරක් ගහේ තියෙන මල් මොකට කඩනව ද?අනිත්‍ය උනත් තියෙන්නෙ එතනනවැ" . ඈ රෝස මල්වලට කරුණු පැහැදිලි කළාය.

ගුරු දිවියෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ඈ ඇගේ විවේකය බෙදාහදා ගත්තේ ඇගේ කුඩා ගෙවත්තේ ගහකොළ සමගිනි. පර්චස් විස්සකට විසිපහකට වඩා වැඩි නොවූ ගෙමිදුලෙහි ඉදිරිපස පෙදෙස මල් වගාවට වෙන් විය. ගෙයි දකුණු පස මිදුලත් පිටුපස තීරුවත් බටු මිරිස් පලා ආදියෙන් තොර නොවීය. උදේ කාලයේ පැයක් දෙකක් මේ කුඩා ගෙවත්ත වෙනුවෙන් මිඩංගු කිරීමට පියසීලි පුරුදු ව සිටියාය.

" මොන එහෙකට ද ඔයාකාර නැහෙන්නෙ. කඩවල්වල ගන්න එළවළු නැතුවයැ "

වැඩට යාමට සූදානම් වන අතරේ ගෙමිදුලට එබෙන දියණිය කියන්නේ නොරිස්සුම් හඬකිනි.එවේලෙහි පියසීලි සිටියේ මාළු මිරිස් පැළයක කොඩ වූ කොළයක දුක විමසමිනි.
" ඔව් ඉතිං උඹල දන්නවයැ ගෙදර හැදෙන ගහකින් කඩා ගන්න මිරිස් කරලක, බටු ගෙඩියක අගේ . හිතාන ඉන්නෙ උඹලවත් අපි සුපර් මාකට් එකෙන් ගෙනාව කියලනෙ"
දියණියට තවත් යමක් කීමට ඉඩ නොතබමින් ඇය වචන අහුරකින් දමා ගැසුවාය. ඒ සමගම යමක් සිහිවූ පියසීලි දියණිය දෙස හෙළුවේ දයාබර බැල්මකි.
"මේ ඒක නෙවෙයි දුවේ. ඊයෙ රාත්තිරියෙත් මේ මිරිස් පාත්තිය පුරහම ගොළු බෙල්ලො හිටිය. ඕං මං උන් ටික අහුලල සිලි උරේකට දාලා....."
"හපෝ හපෝ මේ මටනං කියන්න එපා ඔවුන් ගිහින් දාන්න කියල. මටනං බෑ. අනෙක මේ උදේ පාරෙ මිනිස්සුත් එක්ක" පියසීලිට කියන්නට ආ දෙය අවසන් කරන්නටවත් දියණිය ගෙන් ඉඩක් ලැබුණේ නැත. ඇය අවසන් වරටත් මාළු මිරිස් පැළයේ කොඩ වූ කොළය ඇඟිලි තුඩින් පිරිමැද හුන් තැනින් නැගී සිටියාය.
"අනේ දරුවො ඒ උරේ ඩිංගක් කට ඇරල ඔය පාරෙන් ටිකක් එපිටහට වෙන්න දමල පලයංකො. නැත්තං ඉතිං මං එපායැ ඕකට යන්න තකහනියක්ම"
"මට බෑ අම්මෙ . මොන වදයක් ද මංදා උදේ පාන්දරම හිරිකිතේ බෑ" එවර නම් දියණියගේ හඬෙහි වූයේ යම් තරමක බැගෑපත් බවකි.
"උඹලට ඒකවත් කරන්න බෑ.අර මිරිස් පැළවල කරටි මේ සත්තු ඔක්කොම කාලා දානව. මං රෑට රෑට මොන වදයක් විඳල ද ඔවුන් එක්කහු කරන්නෙ."වැඩට යාම සඳහා හැඩවැඩ වී දොරට බසින දියණිය ගොළුබෙලි මල්ල ඇඟිලි තුඩින් එල්ලා ගන්නේ මහත් අප්‍රසන්න බැල්මක් දෑසෙහි රඳවා ගනිමිනි.
"ඕක ඔය පේන මානෙම අතාරින්න එපා. අනේ දුවේ ඩිංගක් ඈතින් දමල පලයං. වැඩිපුර ගෙවල් නැති අර වෙල් මංඩිය හරියෙන්වත්."

දියණියගේ දෑසෙහි රැඳුණු අප්‍රසන්න බැල්ම ද පියසීලි බටු පැළය මුලට එකතු කරන පස්වලින් ම වසා දැමුවාය. 'මං කවරෙ පිටින් ම අතාරින්නංකො ඇළට .එතකොට ගොඩක් දුර යයි."
"මෙන්න මෙහෙ තියපං ඕක. සතුන් මරල පව් ගන්න මට ඕනකමක් නෑ. මං ම ගිහින් දාන්නං දවල් වෙලා.'

පියසීලි වේගයෙන් තවත් බටු පැළයක් වටේ පස් බුරුල් කළාය.ඉන් විසිරුණු සියුම් පස් ඇගේ මුහුණට ද විසිරිණ.අත් මුල්ලුවෙහි ඇමිණී ආ ගැඩවිලෙකු දුටු ඈ වහ වහා ඌ පස්වලින් වසා දැමුවාය.දියණිය හඬනගා ගේට්ටුව වසන හඬ ඇයට ඇසිණ.ඒ ගොළුබෙල්ලන් සමග උපන් කෝපයේ සංඥාව බව ඇය වටහා ගත්තාය. "කෙල්ලට දොස් කියන්ඩත් බෑ ඉතිං" ඈ බටු පැළයට කීවාය.
යාබද වත්තෙහි වූ විසල් කොස් ගසෙහි අතු පතරින් බේරී ආ උදා හිරු රැස් පියසීලිලාගේ මිදුලෙහි පතිත වෙමින් තිබිණ. කොස් ගහේ සෙවණ නිසාදෝ ඒ ප්‍රදේශයේ කුමන බෝගයක් ඉන්දුව ද වැඩි සාරවත් බවක් නොපෙන්වයි. සමහර තැනෙක සීතල පොළවේ ගැඩවිලි පස් මතු වී ඇත.
"මේ කොස් ගහේ වදුලට තමා මෙයාකාර ගොළුබෙල්ලො බෝ වෙන්නෙ. "
ඈ කොස් ගස දෙස නුරුස්නා බැල්මක් හෙළුවාය.
" මේ පැත්තට තියෙන අතු ටිකවත් කපල දාන්නෙයි කියල දැන් කී වංගියක්නං ජයසේනට කිව්ව ද?"
අඩක් බිඳී ගිය මුනින් හැරවූ මල් පෝච්චියක් දුටු ඈ එය උඩු අතට හැරවූවාය. එය මෙතෙක් දවස් තම ඇස නොගැටුණේ මන්දැයි ඈට සිතිණ. මල් පෝච්චියේ ඇතුළත බඳෙහි සුවිසල් ගොළුබෙලි ජනපදයක් විය.හොඳින් වැඩුණු රට පුවක් ගෙඩි තරම් වූ ගොළුබෙල්ලෝ දෙතුන් දෙනෙක් ම ඒ අතර වූහ.

ඒ වටා ඇලී සිටි පැටව් රොත්ත ගණන් කිරීමට පියසීලි උත්සාහා නොකළාය.ඇයට ගොළුබෙල්ලන් ගැන පමණක් නොව අල්ලපු වත්තේ ජයසේන ගැන ද ඇති වූයේ කෝපයකි.

"මේ කොස් ගහක් හන්දා තියෙන වදයක්. පුරහම ගොළුබෙල්ලො බෝ වෙලා. ඇයි ඉතිං ඉර එළිය බිංදුවක් වැටෙන්න ඉඩ නෑ නොවැ."

ඇගේ උස් හඬට නොඅඩු කෝපයක් මුසු ව තිබිණ.කොස් ගහේ අතුපතරින් යන්තමින් බේරී ආ හිරු කිරණ මුව හයා ගත් ගොළුබෙලි ජනපදයටත් එබී බලන්නට විය.වැඩිහිටි ගොළුබෙල්ලෝ ඉන් මඳක් කලබලයට පත් ව නිදි ගැට බිඳින්නට සූදානම් වන බවක් පෙනිණ.

"මොකද හැබැට මේ උදේ ම ටකේ හොලවන්න ගත්තෙ?" දයානන්ද කියවමින් සිටි පත්තරයද අතැතිව ම මිදුලට බැස්සේය. ලිපිකරු සේවයෙන් ඉසුඹු ලබා සිටින ඔහුගේ දවසේ ප්‍රධාන රාජකාරිය වන්නේ දිනපතා පුවත්පත කියවීමයි. ගෙවත්තෙහි වැඩවලට තම බිරිඳට හැකි පමණින් උදව් කළ ද ඔහු ඇය මෙන් එය දිනචරියාවක් කර ගත්තේ නැත.

"ගොළුබෙල්ලො වඳ කරන්න වෙන්නෙ නෑ මේ කොස් ගහේ වදුල තියෙනකං ඔයාවත් කියන්නකො ජයසේනට මේ පැත්තට තියෙන අතු ටිකවත් කපන්න කියල."

දයානන්දගේ දෑස් පලබරින් නැමුණු කොස් ගහේ අතු දිගේ ඇවිද ගියේය.කොස් පැහෙන කාලයට දයානන්දලාටත් කොස්වලින් හිඟයක් නැත්තේ මේබත් ගසට පින් සිදු වන්නටය.කොස් පමණක් නොව ඉදුණු පැණි වරකා ඉරුවක් දෙකක් ඉඳහිට තාප්පය උඩින් එබී බලන්නේ අසල්වැසියන්ගේ හොඳහිත ද සමගිනි.

"මේ පහු ගිය සතියෙත් මං දුටුව අර වෙල ළඟ ගෙදර ගුණපාලය කොස් ගෙඩි දෙකක් ම කඩා ගෙන යනව.අනේ ඉතිං පැටව් කී දෙනෙක්ගෙ බඩ පිරෙනව කියලද? මේ කොස් වාරෙ අහවර උනා ම මං හීන් සැරේ ජයසේනට කියන්නං.නිකං කෑ කෝ ගහල මිනිස්සු තරහ කර ගන්න ඕනෙ නෑ."

දයානන්ද පහත් හඬින් එසේ කියමින් ගේ දෙසට හැරුණේය.ලේන් ලැල්ල මත වසා බත් ගිල දමමින් සිටි

ඇටිකුබ්බෙක් ඔහුගේ පියවර හඬින් තැතිගෙන මල් පඳුරකට මුවා විය.

"මොකෝ උඹටත් ඇති උණා ද ගොළුබෙල්ලො කාලා"

ඔහු ඇටිකුබ්බා සඟවා ගත් මල් පඳුර දෙස බලා මිමිණුවේය. උණුසුම් හිරු එළිය බිංදු විසින් හදිසියේ නින්දෙන් ඇහැරවන ලද ලොකු ගොළුබෙල්ලෙක් මල් පෝච්චියේ ගැට්ටට ම නැග ඇන්ටෙනා දෙක මානමින් පාර සොයන්නට විය.තවත් එකෙක් මල් පෝච්චි බඳ දිගේ ඉහළ නගිමින් උන්නේය. පියසීලි වහ වහා පෝර හැන්දත් සිලි උරයකුත් රැගෙන ආවේය. සැණෙකින් අඬුපඬු හකුලා ගෙන පරාජය බාර ගත් ගොළුබෙල්ලෝ සිලි බෑගය තුළ සිර ගත වූහ. දං ඇට තරම් වූ උන්ගේ ළමා පෙළට ද අත් වූයේ ඒ ඉරණමමය.

"ඊයෙ රෑ අහුලපු උන් නම් යන්තං කොහොම හරි කෙල්ල අතේ යැව්ව. දැන් ඉතිං මුන්ට මොනවද කරන්නෙ ?"

පියසීලි සෙවණැකි තැනෙක බෑගය තබා එහි විවරය පැත්තට ගඩොලක් බර තැබුවාය.

"හෙට උදේ වෙන තුරු නං තියල බෑ. මුන් මැරේවි. හපොයි එහෙම උනොතින් මම තමා අපා ගත වෙන්නෙ."

"අද හවස නේද පංසලේ දායක සභාව රැස් කරනව කිව්වෙ. කඨිනෙ ගැන කතා බහ කරන්ඩ."

දිවා ආහාරයෙන් පසු දයානන්ද පුරුදු සාකච්ඡා වටය ආරම්භ කළේය.

"හැබෑ නෙන්නං තව ඩිංගෙන් ඒකත් අමතක වෙනව."

"මං හිතුවෙ අර උගුරැස්ස ගහෙන් ගෙඩි ටිකක්වත් කඩා ගෙන යන්න කියල. පොඩි උන්නාන්සෙලට"

"ඒක හොඳයි . මොකෝ ඕවා ඔයාකාර කන්න අපේ දිහා පොඩි ඇයො ඉන්නව කියලයැ."

පියසීලි ගෙමිදුල කෙලවරෙහි තිබූ උගුරැස්ස ගස දෙස බලමින් කීවේය.

"හවස තුනට රැස්වීම තියෙන්නෙ. එහෙනං මල් පහන් එහෙමත් සූදානම් කර ගත්තනං බුදුන් වැඳල එන්නත් එක්ක."

දයානන්ද මල් වට්ටියත් උගුරැස්ස උරයත් අතින් ගෙන මිදුලට බැස්සේය. පියසීලි පහන් තිරත් තෙල් බෝතලයත් දැමූ බෑගය දකුණතින් ගත්තාය. උදේ සිට ම අත් අඩංගුවේ සිටි ගොළුබෙල්ලන් දැමූ බෑගය ඇගේ වමතෙහි විය.

"ඔය මොනවද ?"

දයානන්දගේ විමසුම් බැල්ම පියසීලිගේ වමතෙහි අතැඟිලි ළඟ නතර විය.

"ගොළුබෙල්ලො"

"පන්සලට පූජා කරන්ඩද ?" පියසීලි සිය සැමියා දෙස නොපහන් බැල්මක් හෙලුවාය. "හාමුදුරුවො ඔව්ව බාර ගනියිද මංදා". දයානන්ද ගේට්ටුවෙහි කොක්ක දැමුවේ සිහින් සිනාවක් මුවඟ රඳවා ගනිමිනි.

"අපි උඩහ පාරෙන් යමු. ටිකක් දුර උනත් කාරි නෑ."

පියසීලි එසේ යෝජනා කළේ ඇයිදැයි දයානන්ද විමසුවේ නැත. වැඩිපුර සෙනඟ නොගැවසෙන රබර් වත්ත ඉසව්වේදී ගොළුබෙල්ලන් නිදහස් කළ යුතු යැයි පියසීලි සිතා ගත්තාය. පටුමග පියමං කළ ඔවුහු අතුරු පාරට අවතීර්ණ වූහ.
"පන්සල් යනවැයි ඉස්කෝලෙ හාමිනේ ? බරට ම උස්සන් යන්නෙ මොනවැයි මේ"
උඩ ගෙදර උන්දෑ එසේ කියමින් පියසීලිගේ වමත ඩැහැ ගත් මල්ල දෙස විමසුම් බැල්මක් හෙළුවාය.
"මේ උගුරැස්ස ගෙඩි වගයක්. පොඩි උන්නාන්සෙලට"
පියසීලි මලු කට තදින් අල්ලා ගනිමින් හතර වන සිල් පදය බිඳ දැමුවාය.

"අනේ සාදු සාදු අපටත් පින් සිද්ධ උනාවෙ එහෙනං"

උඩ ගෙදර උන්දෑ දෙකට නැමී ගොළුබෙලි මල්ලට අත ගසා දෝත එකතු කර ගත්තාය. දයානන්දගේ මුවඟට සිහින් සිනාවක් නැගිණ. ඒ සිනහව දුටුවේ ඔහුගේ අත රැඳි උගුරැස්ස මල්ල පමණි.

"ඕන්නැති උලව්වක් නෑ මේ ගෑනිටත්"
උඩ ගෙදර උන්දෑ පියමං වූ සැණින් පියසීලිගේ වචන පිපිරුණේ වෙඩි උණ්ඩ මෙනි. තවමත් දෙතාලඟින් මැකී නොගිය සිනහවෙන් යුතුව දයානන්ද තම බිරිඳ දෙස බැලුවේය.
"තව කවුරු හරි පිං අනුමෝදන් වෙන්න ඉස්සර දැන්වත් ඕක ඔය අකුලකට ඇල කෙරුවොත් නරකද ?"
"අපොයි මේ හරියෙ කොච්චරවත් වාහන යනව. මුං පාරට ආවොත්. අනේ අපොයි මට නං බෑ අපාගත වෙන්න "
"එහෙනං ඉතිං අරුන්දැත් අත ගහපු එකේ පන්සලට ම අරන් යං".
"නෑ නෑ අර රබර් වත්ත හරියෙ දමල යං. ඒ ඉසව්වෙ ගෙවලුත් නෑ.සත්තුන්ට කරදරේකුත් නෑ"
දෙදෙනා ම ප්‍රධාන පාර පියමං කොට රබර් වත්ත මැදින් වැටුණු අඩි පාරට සේන්දු වූහ. වියළි රබර් කොළ පලසක් සේ බිම ඇතිරුණු ඒ අඩි පාර දහවල් කාලෙයහි වුව ගුහාවක් සේ අඳුරුය. පියසීලි වටපිට බලා තෙල් බෝතලය සහිත අනෙක් මල්ල තම සැමියා අත තැබුවාය.

"අනේ ඉස්කෝලෙ හාමිනේ මං මේ යනව දැකල දුව ගෙන ආවෙ. අපේ කෙල්ලො දෙන්නත් පන්සල් යන්න ඕනැයි කියල නාහෙන් අඬ අඬා උන්නෙ මට යන්න වෙන්නෙ නෑ හාමිනේ අර කිරි සප්පය දාලා. තනියම යවන්නත් බෑ මේ රබර් මණ්ඩිය මැදින් "

රබර් වත්ත බලා කියා ගන්නා නන්දෝරිස්ගේ බිරිඳ නැවතිල්ලක් නැතිව කියවා ගෙන ගියේ හති දමමිනි. ඒ වන විටත් තුෂාරිත් කමලිනීත් ඔවුන් වෙත එමින් සිටියහ. වැඩිමලී වූ කමලිනීගේ අතේ ලොකු සුදු අරලිය මල් පොකුරක් විය.

"යං යං එහෙනං අපිත් එක්ක"

දයානන්ද තෙල් බෝතලය සහිත මල්ල යළි පියසීලි අතට දෙන ගමන් කීවේය. රබර් මණ්ඩිය තරමට ම අඳුරු වූ තම බිරිඳගේ මුහුණ දෙස නොබැලීමට ඔහු ප්‍රවේශම් විය. "කෝ දෙන්න ඉස්කෝලෙ හාමිනේ ඔය මල්ල මං අරන් යන්න"

පියසීලි දෙන්නටත් පෙර කමලිනි තෙල් හඳුන් කූරු සහිත මල්ල උදුරා ගත්තාය. තුෂාරි අනෙක් මල්ලට කුරුමානම් අල්ලන බව පියසීලිට දැනිණ.

"නෑ නෑ මං ඒක ගන්නං. ඔයා අර මහත්තයගෙ අතේ තියෙන මල් වට්ටිය ගන්නකො."

තුෂාරි දයානන්ද අත වූ මල් වට්ටිය දෝතින් ගත්තාය. පෙරහැර නිහඬවම අඳුරු රබර් හේඩාව මැදින් ගමන් ගත්තෝය. ගොළුබෙල්ලෝද මේ සුවදායී සීතල සෙවණෙහිවත් ඉසුඹුවක් ලබන පින් නොලද්දෙන් අකමැත්තෙන් වුවත් පෙරහැරට එකතු වී සිටියහ.

පන්සල් බිමට ඇතුළු වන විට පියසීලිගේ වමත හිරිවැටී තිබිණ. එහි රැඳුණු සිලි බෑගය එතරම් බර නොවූවත් එහි බරින් තම අතැඟිලි කැපී ඇතුවාක් මෙන් ඇයට දැනිණ. අකැප දෙයක් පන්සල් බිමට ගෙන එන්නාක් බඳු වරදකාරී හැඟීමකින් ඇගේ සිත මහත් සේ විපිලිසරව තිබිණ.

"අපි දැන් දායක සභා රැස්වීමට ඉන්නව. එහෙනං ඔය දරුවො ඔය බෝ මළුව එහෙම අතුපතු ගාලා හවස මල් පූජාවට සුදානම් වෙන්නකො."

දයානන්ද එසේ කියමින් ම තුෂාරි අතේ තිබූ මල් වට්ටිය ඩැහැගත්තේ ඔවුන්ගෙන් නිදහස් වීමේ චේතනාවෙනි. කමලිනීද එය වටහා ගත්තාක් මෙන් ඇය අත තිබූ මල්ලද පියසීලි වෙත පෑවාය.

"අර බෝධියට පල්ලෙහා පැත්තෙ තියන කරාමෙ ගාවට යං"

දැරියන් දෙදෙන බුදු ගෙය පැත්තට යන තුරු මඳක් නිහඬ ව සිටි දයානන්ද ඒ වන විටත් අනදමන්ද වී සිටි තම බිරිඳ දෙස බලා

කීවේය. දෙදෙනාම බෝධියට පහළින් වූ වතුර කරාමය වෙත පල්ලම් බසින්නට වූහ. කරාමය අසල වූ සිමෙන්ති ආසනය මත මල් වට්ටියත් උගුරැස්ස මල්ලත් තැබූ දයානන්ද ඒ ආසන්නයේ ම වූ කසළ වළ දෙස බැලුවේය. පර මල් සහ බෝ පත් හැරුණු කොට එහි දක්නට ලැබුණේ ඉවත ලූ හිස් හඳුන් කූරු පෙට්ටි පමණි.

"දැන්වත් ඔය සත්තු නිදහස් කරමුද ? "

"පංසලේ "

පියසීලි විමතියෙන් මෙන් තම සැමියාගේ මුහුණ බලා ගොළුබෙල්ලන් සහිත මල්ල පසෙකින් තැබුවාය. ඒ සමගම තවත් කවුදෝ දෙදෙනෙක් බෝධිය අසලින් පහළට බසින්නට සූදානම් වන බව දයානන්දට පෙනිණ.

"අන්න තව කට්ටිය එනව. ඊට ඉස්සර මෙන්න මෙහෙ දෙන්න ඕක"

දයානන්දගේ හඬට නො අඩු කෝපයක් මිශ්‍ර වී තිබිණ. පියසීලි පහළට බසින පඩිපෙළ දෙස බලමින් ම මල්ල රැගෙන දයානන්ද වෙත පෑවාය. වයසක උපාසිකාවන් දෙදෙන පහළට බසින්නට වූයේ ඉතා සෙමිනි. ඔවුන් එන්නට පෙර මේ වදකාර සිරකරුවන්ගෙන් නිදහස් විය හැකි බව දයානන්දට වැටහිණ. ඔහු මල්ලෙහි යට දෙකොනෙන් අල්ලා එය කසළ වළට හැලුවේය. පදමට ඉදී දම්පැහැ ගෙන තිබූ උගුරැස්ස ගෙඩි සියල්ල සැණෙකින් පර මල් පලස මත විසිරී ගියේය.

"හපොයි උගුරැස්ස ටිකනෙ."

පියසීලිගේ මුවින් වචන ගිලිහිණ. සැණෙකින් ආපසු හැරුණු දයානන්ද පසෙක වූ ගොළුබෙලි මල්ල ද ගෙන කසළ වළට හැලුවේය. කසළ වළෙහි විසිරීගිය දම් පැහැති උගුරැස්ස ගෙඩිත් අන්දමන්ද වී සිටින දුඹුරු පැහැති ගොළුබෙල්ලනුත් අතර ලොකු වෙනසක් නැතැයි සිතූ දයානන්ද ලොකු හුස්මක් හෙළා ළය සැහැල්ලු කර ගත්තේය.

## කෙටි කතා ( විශ්‍රාමික රාජ්‍ය සේවකයින් )

**කුසලතා ස්ථානය**

කේ.එල්.නාරංගොඩ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
දොඩම්ගොඩ



### ජීවිතේ අරුමයකි.

වෙනදා මෙන්ම කලබලකාරීව ගෙවුණු දවසක් නිමාකරමින් අද දවසෙත් හිරු බැස යාමට අඩ හෝරාවකට වඩා නැත. ජනෙල් කවුළුව තුළින් ගලා ආ මළානික හිරු රැස් මේසය මත මැවූ පිටතින් ඇති ගස්කොළන්වල සෙවණැලි රූ රටා එන්න එන්නම බොඳ වෙමින් යන අරුමය දිහා වෛද්‍ය සිරිමෙවන් ගුණසේකර බලාසිටියේ වෙනදා පුරුද්දට මෙනි. වාට්ටුවේ තමාට නියමිත රාජකාරිය අවසන් වූ පසු ටික වෙලාවක් විවේකයක් ලබා ගැනීමට තේ කෝපයක් බොමින් මනස සන්සුන් කරගැනීම ඔහුගේ සිරිත ය.

වාට්ටුව භාර වෛද්‍යවරයා පැමිණෙන තෙක් ඔහු වාට්ටුවේ රැඳී සිටින්නේ එය රාජකාරියේ නියමයක් බැවිනි. තමාට පිටවීමට කාලය ඉක්මවා ඇති බැවින් ඔහු බලා සිටියේ වෛද්‍ය යොගේෂ් කාමරයට කොයි මොහොතේ එබිකම් කරයිදෝ යන බලාපොරොත්තුවෙනි. අද වෙනදාට වඩා ඒ බලාපොරොත්තුව වැඩි උදෑසන තම බිරිඳ උදේනි..... ගෙයින් පිට වෙද්දී දුන් පනිවිඩය සිහිපත් වීමෙනි.

" වරද්දන්න එපා.....අපි රෑ හතටවත් හෝටලයට යන්න ඕන. කොරෝනා නීති රීති නිසා විසිපහටයි ඉන්වයිට් කරල තියෙන්නෙ. සහභාගීවෙයිම කියල හිතපු අයට විතරයි. "

" ඉතින් ඇයි දෙයියනේ අපටත් කරදර කළේ.? "

සිරිමෙවන්ට එහෙම කියන්න හිතුණත් ඔහු වචන ගිල ගත්තේ මේ උදේ පාන්දර රෝහලට යන මොහොතේ ඈ සමඟ ආරෝවක් ඇති කර ගැනීම සුදුසු නොවන බව සිතුණ බැවිණි.

අද ඇයගේ මිතුරියකගේ විවාහ සංවත්සර උත්සවයකි. මනස්ගාත......මිනිසුන් රෝහලකට බෙහෙත් ගන්න නාවත්, හැදෙන ලෙඩ තමයි මේව. ඒ දවසත් වෙනදා විදියටම ගෙවිල යන හැටි මේ අයට තේරෙන්නෙ නෑ. සල්ලි වැඩි වුණාම කර ගන්න දෙයක් නැතිව කෙරෙන උත්සව.

තේ කොප්පයෙන් නැගී උඩට විහිදී යන වාෂ්පය දිහා බලාගෙන සිරිමෙවන් කල්පනා කළේය.

"ට්‍රීන්...... ට්‍රීන්......ට්‍රීන්....."

සිරිමෙවන් රිසිවරය අතට ගත්තේ දෙගෙඩියාවෙනි. එකත් එකටම යෝගේෂ් අද නිවාඩු ඇති.

"හෙලෝ... සිරි..... මේ කතා කරන්නෙ ....සාලිය. අයි. සී.යූ....ඇඳක් හිස්ව තියෙනවද?"

"දෙකක්ම තියෙනවා...."

" ගොඩක් අමාරු දරුවෙක් ඉන්නවා. දෙබරු ඇනල ගෙනාපු. ළමයට අමාරුයි. රෑ කොහොමටවත් මෙහේ තියා ගන්න බෑ..."

"එවන්න."

සිරිමෙවන් වහාම කාමරයෙන් පිට වී වාට්ටුව භාර හෙදිය දැනුවත් කිරීමෙන් අනතුරුව පෙරමග බලා සිටියේ කොයි මොහොතේ හෝ රෝගියා පිළිගැනීමේ අරමුණ ඇතිවය.

ඒ අතර ආ දුරකථන ඇමතුම වෛද්‍ය යෝගේෂ්ගෙනි. ඔහු ගේ ඇමතුමෙන් කියවුණේ රෝහලට පැමිණීමට පැය භාගයක්වත් ගතවනු ඇති බවයි.

වෛද්‍ය සිරිමෙවන් දුරකථනයේ සටහන් වූ වෙලාව බැලුවේ කනස්සලු සිතෙනි. උදේනිට කේන්තියාවි ගොඩක් ප්‍රමාද වුණොත්.?

මිතුරු යෝගේෂ් ගේ ප්‍රමාදයටත් වඩා තවත් මිනිත්තු කීපයකින් වාට්ටුවට රැගෙන එන කුඩා සිඟිත්තියගේ තත්වය කෙසේ විය හැකිද? ඔහු ගේ මනස දැන් පෙරටත් වඩා නොසන්සුන්ය.

තවත් අඩ හෝරාකින් අඩක් ගෙවී යද්දී රෝහල් සේවකයින් දෙදෙනෙක් තල්ලු කරගෙන ආ ට්‍රොලිය වාට්ටුවට ඇතුලු විය.

රෝහල් කාර්ය මණ්ඩලය කඩිසරව අවශ්‍ය දෑ යුහුසුව සම්පාදනය කළහ. සිඟිති දියණිය පරීක්ෂා කළ වෛද්‍ය සිරිමෙවන් වහාම ඇයට ඔක්සිජන් සපයන යන්ත්‍රය සම්බන්ධ කර, කාඩ්පතෙහි ලබාදිය යුතු ප්‍රතිකාර සටහන් කර නැවත කාමරයට ආවේය.

ඔහුට රෝගී සිඟිත්තිය පිළිබඳව ඇති වූයේ කවදාවත් නොමැති තරම් දුකකි. රෝස පැහැ දෙකොපුල් දෙබර විසට තරමක් ඉදිමී ඇතත් ඇය අඟපසඟ පිරිපුන් බවින් යුත් ප්‍රිය මනාප හුරුබුහුටි ගැහැනු දරුවෙකි. දැනට වසර හත අටකටකට පෙර තම දියණියත් මේ වගේ ම නේද? ඇගේ තනියට පැමිණ තිබුණේ අසල්වැසි කාන්තාවකි. පියාද මල්ලීද දෙබරු ඇන රෝහල් ගත කර ඇත. ඇගේ මල්ලී ළඟ අම්මා නැවතුණ බව ඇය පැවසුවාය. ඔහු මේ තොරතුරු දැන ගත්තේ එම කාන්තාවගෙනි. වෛද්‍ය යෝගේෂ් පැමිණියෙන් සිරිමෙවෙන් සිඟිත්තියගේ තත්වය පහදා දී කාමරයෙන් පිට වූයේ හැකි ඉක්මනින් නිවසට යාමේ අවශ්‍යතාවය තිබූ හෙයිනි.

උදේනිගේ මුහුණේ වෙනදා තමන් පිළිගන්නා සිනාව අතුරුදහන්වීමට ඔන්න මෙන්න කියා තිබියදී සිරිමෙවන් ගෙට ගොඩ වුණේ යන්තමට බේරුණා....සිතුවිල්ල ඇතිවය.

"දැන් හතට විස්සයි....හොඳටම පරක්කුයි.."

"තව විනාඩි පහකින් යන්න පුළුවන්. ඉක්මනින්ම පිරිසිදු වී ඇඳුමක් දාගත් ඔහු මෝටර් රථය ළඟට පැමිණෙන විටත් උදේනි එතන නොසිටියාය. ඔහු ඇයගේ කාමරයට එබිකම් කරනවිටත් ඇය තොල් ආලේපන ගල්වමින් සිටියාය.

"පරක්කු වෙලා නම් ඉක්මනට එන්න. මාස්ක් දාගෙන යන හින්ද ඕව පේන්නෙ නැහැ."

"ඒ වුණාට කෑම කනකොට ගලවනවනේ."

"සමයං... ගා ගන්න දෙයක් ගාගෙන ලෑස්ති වෙලා ඉන්න තිබුණනේ" සිතට ආ වචන පිට නොකරම ඔහු කාමරයෙන් පිටවුණේ කේන්තියෙනි. වාද විවාදවල පටලැවෙන සිරිතක් ඔහුට නැත. නිහඬියාව ඔහු ජන්මයෙන්ම උරුම කරගෙන ආ පුරුද්දකි.

" අද ගොඩක්ම හිතට වද දුන්න දවසක් උදේනි...මේ ගමන නිසා නෙමෙයි නම් මං තව ටිකක් ඉඳල එන්නෙ." සිරිමෙවන් එසේ පැවසුවේ වාහනයේ ගමන් වේගය වැඩි කරමිනි.

"ඇයි ඒ."
"දැන් හවස පොඩි ගෑනු ළමයෙක් ගෙනාව දෙබරු ඇනල. ළමයට අමාරුයි වගේ. ලස්සන රෝස මලක් වගේ. මට අපේ දුවගෙ පුංචි කාලෙ ....මතක් වුණා ඒ ළමය දැක්කම."
"අමාරුද.?
"ඒ වගේ..."
"යෝග එන්නත් පැය භාගයක් පරක්කු වුණා. දරුවගෙ ප්‍රතිකාර ටික අවසන් කරල ඉවරවෙනකොට තමයි යෝග ආවෙ."

උදේනිගේ ළඟම හිතවතියන් කිප දෙනෙක් සහභාගි වී සිටි බැවින් සිරිමෙවන්ට ඇයගෙන් මිදී විවේකීව සිටීමට ලැබීම සිතට සහනයක් විය. ඔහුගේ ලෝකයේ සැරි සැරුවේ හවස රෝහලට ඇතුළත් කළ පුංචි සිඟිත්තියයි. හෙට උදේම රෝහලට යා යුතුයි.
ඔහු ගේ නිගමනය විය.

හැමදෙනාම මුහුණු ආවරණ පැළැඳ සිටින බැවින් බොහෝ දෙනා පහසුවෙන් හඳුනා ගැනීමට අපහසුය. සිරිමෙවන්ගේ සිතට නම් එය මහත් සහනයකි. එසේ නොවුණානම් කවුරුන් හෝ පැමිණ අසල පුටුවට බරදී සාකච්ඡාවකට මුල පුරනු ඇත.

සාදය අවසන් වී පැමිණෙන විටත් රෑ දහයට ආසන්න වී තිබුණි. කොවිඩ් නීති රීති අනුව රාත්‍රී දහයට ප්‍රථම උත්සව හමාර විය යුතුය.
පොද වැස්සත් සමඟ විදුලි පහන් කණුවල ආලෝකය වැටී පරාවර්තනය වන ආලෝකය සිරිමෙවන්ගේ නිදිමතත් විඩාවත් මුසු වූ දෑසට මහත් අපහසුවකි. ඔහු රිය පැද වූයේ සෙමින්ය.
" මොකක්ද අනේ...ටිකක් ඉක්මන් කරල යං...."
උදේනිගේ වචනවලට සිරිමෙවන් පිළිතුරු නොදීම, වේගයේ වෙනසක් නොකරම ඉදිරියට ඇදුණේය.
පාරේ අනෙක් පස රිය අනතුරකි. යතුරුපැදි දෙකක් එකට ගැටී ඇත. කීපදෙනෙක් අසල වටවී ඇත. සිරිමෙවන් කෙදිනකවත් හිතට විරුද්ධව වැඩ නොකරන කෙනෙකි. වෛද්‍යවරයෙකු වශයෙන් මනා සංයමයක් ඇත. ඔහු රියෙහි වේගය බාල කර වීදුරුව පහත් කර පාර අයිනේ සිටි මිනිසෙක් සමඟ කතා කළේය. ඒ

රෝගියෙකුට තමාගෙන් යම් උදව්වක් අවශ්‍ය වුණොත් යන යහපත් සිතුවිල්ල පෙරදැරිවය.
" දෙන්නම ඉස්පිරිතාලෙ ගෙනිච්චා...සර්."
"සිරිමෙවන් යළිත් රථය පණගැන්වූයේ.....ඔන්න දැක්කනේ මේ වැස්සෙ වේගයෙන් ගියාම වෙන දේ."
උදේනි පිළිතුරක් නොදුන්නාය.

පසුදා රෝහලට ගිය සැණින් ඔහු කඩිනමින් ගියේ සිඟිත්තිය ප්‍රතිකාර ලබන ඇඳ වෙතය. වෛද්‍යවරුන් දෙතුන් දෙනෙක් හා හෙදියන් ඇය වටකරගෙනය.
"අපට කරන්න දෙයක් ඉතිරි වෙලා නැහැ.....යෝගා...."විශේෂඥ වෛද්‍ය සමන්තිලක පැවසුවේ හැඬුම්බරවය.
"යන්ත්‍රවලට සවිකර ඇති ඇගේ සිරුර වේගයෙන් උස් පහත් වේ. ඇය වැතිරී සිටින ඇඳ ගැස්සෙන තරම්ය. දෙබර විසට වඩා මෙයාට අසාත්මිකතාවක් තියෙනවා. ඒක නිසා පෙණහලු වේගයෙන් අක්‍රිය වෙනවා. අපට බලාපොරොත්තු තියා ගන්න බැහැ."විශේෂඥ වෛද්‍යවරයාගේ නිගමනය විය.
වෛද්‍ය යෝගා වෙනදාට මා එනතුරු මඟ බලා සිටියත් අද ඔහුට ගෙදර යාමට අවශ්‍යතාවක් නැතුවා සේය.
"ඩොක්ටර් ඊයෙ රෑ විනාඩියක්වත් විවේකයක් ගත්තෙ නෑ. මේ දරුව ළඟටම වෙලා සෝදිසියෙන් හිටියෙ. හෙදිය නිරූපමා සිරිමෙවන් දිහා බලා පැවසුවාය.
ඇත්තටම ඊයෙ රෑ මටත් ඉන්න තිබුණා. සිරිමෙවන් සිතුවේය.
ගතවූයේ තවත් සුළු වෙලාවකි. වාට්ටුව භාර වෛද්‍යවරුන් දෙදෙනා අභියසදීම රතු රෝස කැකුළිය නිසල නින්දකට සදහටම දෑස් පියා ගත්තාය.

මුළු වාට්ටුවේම සේවක පිරිසගේ දෑස්වලට කඳුළක් එකතු කළ මෙවන් දිනයක් නැති තරම්ය. ඇය ළඟ සිටි කාන්තාවගේ විලාපය රෝහල් බිත්ති මත වැදී තවත් දෝංකාර දුන්නේය.

මෙවන් සංවේදී මරණවලින් වාට්ටුවේ රෝහල් සේවක පිරිසගේ හදවත් කම්පනයට පත් කළේ අද පමණක් නොවේ.ඒත් මේ තරම්ම ශෝකී අත්දැකීමක්....... මේ රෝස සිඟිත්තියගේ වයස අවුරුදු නවයකි. ඇය මල්ලීත් පියාත් සමඟ අසල කැළයට ගොස් ඇත්තේ දරකැඩීමටය. පියා දර කඩන තෙක් ඔවුන් දෙදෙනා දං

ගෙඩි කඩමින් සිට ඇත. අකුලේ තිබූ දෙබරයක් ඇවිස්සී අනින විට පියා ඇවිත් දරුවන් බේරා ගැනීමට යාමේදී පියාටත් දෙබරුන් දෂ්ඨ කර ඇත.

දරුවා ළඟ සිටි කාන්තාව පැවසුවාය. දහවල් වෙද්දී ඇයගේ නිසල දේහය අපේ හිත් සසල කරමින් වාට්ටුවෙන් රැගෙන ගියේ සියල්ලන්ගේම දෑස් තෙත් කරමිනි.

වෛද්‍ය යෝගේෂ් පැවසුවේ ඇය ගේ නිවසට ගොස් අවසන් මොහොතට සහභාගී වියයුතු බවයි.

ඒ අනුව හෙදියන් දෙතුන් දෙනෙකු හා වෛද්‍යවරු දෙදෙනා රුවන්මලීගේ නිවසට ගියහ. ඇය දුප්පත් දැරියක් බව දැන ගත් බැවින් නිවසට අවශ්‍ය වෙන කළමනා රැගෙන යාමට ඔවුන් අමතක නොකළහ.

ඔවුන් නිවසට යන විටත් කීපදෙනෙක්ම එහි රැස්වී සිටිනු දැකිය හැකි විය. සිදු වී තිබුණේ ඔවුන් කිසිවිටකත් අපේක්ෂා නොකළ දෙයකි. රුවන්මලීගේ නිසල දේහය අසල තම එකම සහෝදරයාගේ නිසල දේහය ඒ අසලම තැන්පත් කර තිබුණි.

තම හිතවත් වෛද්‍යවරයා පෙරදා හවස පැවසුවේ ඇයගේ සහෝදරයාට එතරම් අමාරුවක් නොමැති බවය. එහෙත් රුවන්මලීගේ මල්ලීත් ඇය සමඟම අවසන් ගමන් ගොස් ඇත.

දුප්පත්කම දෝත දරාගෙන නිවසට ආලෝකයක් දුන් පහන් සිළු දෙකම නිවීගොස් ඇත. සමහර විට ඔවුන් මේ අතුපැලේ විඳි දුක් අවසන් වීමෙන් මේ දේ සිදුවන්ට ඇතැයි සිරිමෙවන් කල්පනා කළේය. විවාහ වී වසර හත අටක් ගතවීත් දරු සම්පතක් නැතිවීමෙන් වේදනා විඳින වෛද්‍ය යෝගේෂ්ට මෙය දරාගත නොහැකි තරම්ය.

දේහයන් දෙක තැන්පත් කර ඇති අසල කටු මැටි බිත්තියේ එල්ලා ඇති දරුවන්ගේ හපන්කම් සිරිමෙවන්ගේ දෑස් තව තවත් තෙත් කළේය. විවිධාකාර වූ නිර්මාණ ඒ අතර විය. ඒ විසිතුරු නිර්මාණ පාසලේදීත් ගෙදරදීත් කළ නිර්මාණ බව අසල සිටි යුවතියක් කීවාය.

රුවන්මලී චිත්‍ර ඇඳීමට උපන් හපන්කමක් දක්වන බවත් ඉදිරිපත් වන හැම තරගයකින් ම ජයග්‍රහණ ලබා ඇති බවත් ඇය පැවසුවාය.

ඉස්තෝප්පුවේ කණු දෙකේම එල්ලා තිබූ සරුංගල් දෙදෙනා කැලයට ගොස් බට කපාගෙන ඇවිත් සෑදූ නිර්මාණ බවත්, අසල පුටුවක වාඩි වී සිටි වයස්ගත පුද්ගලයා පැවසුවේය.
"ඔය කැලේට ගියේ පුරුදු වෙන්න ගිය ගමනක් නෙමෙයි මහත්තයෝ.....මොනව කරන්නද කරුමෙට."
රුවන්මලීගේ අම්මාට හරියට සිහි කල්පනාවක් නැත. කාන්තාවෝ දෙදෙනෙක් ඇය වත්තන් කර ගෙන ඇවිත් වෛද්‍යවරුන් දෙදෙනා හඳුන්වා දුන්හ. දරුවාගේ තාත්තා තවමත් රෝහලේය.
"අනේ ඇයි ....බුදු දොස්තර මහත්තයෝ මගේ දරුවො දෙන්න බේර ගන්න බැරි වුණේ?"
" අපි පුළුවන් හැම උත්සාහයක්ම ගත්ත අම්මෙ...හිත හදාගන්න. අපිට කරන්න දෙයක් ඉතිරිවෙලා තිබුණෙ නැහැ."වෛද්‍ය යෝගා පැවසුවේය.
දුප්පත් පවුලක් වුවද පිරිසිදුවට පිළිවෙළට ජීවත්වන පවුලක් බව වත්ත පිටිය ගේ දොර දිහා බැලූවිට පෙනෙන බව නිරූපමා තවත් හෙදියකට පවසනු සිරිමෙවන්ට ඇසුණේය.
මළ ගෙදරට සහභාගී වූ හය දෙනාගේම එකඟතාව අනුව අතේ තිබූ මුදල් එකතුකර, ඒ දුප්පත් මවට මේ අවස්ථාවේ පිළිසරණක් වීමට යෝජනා කළේ වෛද්‍ය යෝගේෂ්ය. එම මුදල් ප්‍රමාණය දරුවන් දෙදෙනාගේ අවසන් කටයුතු සඳහා ප්‍රමාණවත් මුදලක් විය. රාජ්‍ය සේවයෙන් සිරිමෙවන් ඇතුළු පිරිස ලැබූ සතුට ට තවත් එක් අත්දැකීමකි ඒ. මෙවන් පිහිටවීම් ජීවිතයේ ඕනෑ තරම් කර ඇත. යෝගේෂ් ද්‍රවිඩ වෛද්‍යවරයෙකු වුවද සිරිමෙවන්ටත් වඩා කෙනෙකුගේ දුකේදී සංවේදී තැනැත්තෙකි.
සිරිමෙවන් ඇතුළු පිරිස මේ පරව ගිය රෝස කැකුළු දිහා අවසන් වරට බලා, සමුගෙන පිටත් වුයේ තවත් නම් මෙවන් අමිහිරි අත්දැකීමක් නොවේවා යන ප්‍රාර්ථනාවෙන්ය.
ඕනෑම අමිහිරි හෝ මිහිරි අත්දැකීමක් කාලයත් සමඟ වියැකීයාම ස්වාභාවික සංසිද්ධියකි. සිරිමෙවන්ගේ ද ඒ අමිහිරි අත්දැකීම ජීවිතයේ මතකයන් තුළින් ගිලිහෙමින් තිබිණි.

දිනක් මැදිරිගිරිය රෝහලේ සේවය කරන වෛද්‍ය සාලියගෙන් ලැබුණ දුරකථන ඇමතුම වෛද්‍ය සිරිමෙවන් ගේ සිතේ ඇති කළේ අප්‍රමාණ සතුටකි. සැනසිල්ලකි.

"සිරි...ඔයාට මතකද මීට මාස හය හතකට උඩදි දෙබරු ඇනල මැරුණ දරුවො දෙන්න."

"ඔව් ඉතින්..?"

"ඒ අම්ම දැන් ක්ලිනික් එනව...ළමයි දෙන්නෙක් ....ස්කෑනින් කළාම."

"මොනව...හරිම සුබ ආරංචියක්නෙ."

"සමහර විට ඒ ළමයි දෙන්න වෙන්න බැරිද."

" ඒක තමයි මටත් හිතුණෙ."

ඒ සංවාදයෙන් මාස ගණනකට පසු යළිත් සාලිය, සිරිමෙවන් අමතා සඳහන් කළේ ඒ දරුවන් දෙදෙනා සෑම අතින් ම පෙර මළවුන් අතරට ගිය දරුවන් දෙදෙනාට සමානකම් දක්වන බව ඒ අම්මා පැවසූ බවය.

"සිරි මං කැමතියි සම්පූර්ණයෙන්ම ඒ දරුවන් දෙන්නගෙ සියලු වියදම් දරන්න...කවදහරි ඉගෙනගෙන අවසන් වෙනතුරුම. ඊට කලින් මට ඕන ඒ අයට හොඳට ඉන්න ගෙයක් හදල දෙන්න."

"ඔව් මමත් උපරිමයෙන් ඔයාට උදව් කරන්නම්...." සිරිමෙවන් කීවේය.

වෛද්‍ය යෝගේෂ් ගේ කාරුණික හදවතේ ඇති වූ ඒ ළතෙත් හැඟීම් සමුදාය සිරිමෙවන්ගේ කනට මිහිරිම වදන් පෙළක් විය.

ළමා නිර්මාණ ජයග්‍රහණය කරන ලද්දෝ



ප්‍රථම ස්ථානය
යාළුකමයි කළු දොදොළුයි
සී.එන්.සරෝජනී
පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,
කුලියාපිටිය



දෙවන ස්ථානය
සඳ තරු නැයෝ
එස්.වික්‍රමාරච්චි
කො/ තර්ස්ටන් විද්‍යාලය



තෙවන ස්ථානය
කඩදහි කුරුල්ලා
ටී.ඩබ්.එස්.කේ.සේනානායක
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
අම්බලන්ගොඩ

**ළමා නිර්මාණ කුසලතා ඇගයීම් ලද්දෝ**



ලොකුම පිනක්
වී.ජී.එස්.ජේ.කුමාර
ශ්‍රී ලංකා ටෙලිකොම්,
කොළඹ 1



වචන නෑ
ඒ.ඒ.එස්.පී.සමරසිංහ
දිසා ගණාධිකර්යාලය,
මහනුවර




ප්‍රාර්ථනා රන්තරුවේ
ඩී.එම්.ඩී.කේ.විජේරත්න
රාජ්‍ය උකස් හා ආයෝජන
බැංකුව,කොළඹ 3



කඳුළු අරන් වැස්ස වහිනවා
ඒ.ඩී.ඩබ්.එස්.එන්.ද සිල්වා
ජාතික තරුණ සේවා සභාව,
බදුල්ල

## චිත්‍ර නිර්මාණ ජයග්‍රහණ ලද්දෝ



ප්‍රථම ස්ථානය
භාග්‍ය මන්දිර නරසිංහ
සමෘද්ධි ප්‍රජා මූල බැංකුව,
නව නුවර පාර,
වැලිවේරිය.


## ජයග්‍රාහී ඡායාරූපය ඇතුළත් කල යුතුය

දෙවන ස්ථානය
මොහොමඩ් තස්ලීම් අම්ජාත් මොහොමඩ්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
අක්කරෙයිපත්තුව



**ජයග්‍රාහී ඡායාරූපය ඇතුළත් කල යුතුය**

තෙවන ස්ථානය
එන්.එස්.එච්.බෝගහවත්ත
ජාතික කෘෂිකර්ම තොරතුරු හා
සන්නිවේදන මධ්‍යස්ථානය,
ගන්නෝරුව,
පේරාදෙණිය



**ජයග්‍රාහී ඡායාරූපය ඇතුළත් කල යුතුය**

**චිත්‍ර නිර්මාණ කුසලතා ඇගයීම් ලද්දෝ**

යූ.ජී.ඩී.ඩී.අබේසේන
ර/නිවි/ඇල/ඇලපාත මහා විද්‍යාලය




එච්.එම්.අයි.එම්.ජයමිණී මැණිකේ
ගොඩනැගිලි දෙපා,
2වන මහල,
සෙත්සිරිපාය



යූ.ජී.කේ.පුර්ණිමා ගුණවර්ධන
බප/මතු/ආනන්ද ශාස්ත්‍රාලය ජාතික පාසල,
මතුගම



එම්.ඩී.උදයංග
බප/හෝ/වග ශ්‍රී රතනසාර මහා විද්‍යාලය,
තුම්මෝදර,
වග



යූ.කේ.ඩී.එස්.සෙනෙවිරත්න

කු/මහින්ද විද්‍යාලය



## කෙටි නාට්‍ය තරගාවලිය ජයග්‍රහණය කරන ලද්දෝ

### හොඳම පසුතල නිර්මාණය



**මාව එම්බාම් කරන්න**
ජේ.ඩී.එන්.කේ.ජයසිංහ
ජාතික යොවුන්
සේනාංකය,
පඬුවස්නුවර

### හොඳම රංගවස්ත්‍ර නිර්මාණය



**එකේ පන්තියේ වැඩක්**
එම්.බී.ආර්.චේතනී මනිමේඛලා
කෑ/පින්දෙණිය ජාතික පාසල,
කෑගල්ල

### හොඳම සංගීත නිර්මාණය



**මට වැඩ තියෙනවා**
උපාලි සිරිපාල
ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**හොඳම රංග වින්‍යාසය**



**මාව එම්බාම් කරන්න**
ටී.එම්.එන්.වීරසිංහ
ජාතික යොවුන් සේනාංකය,
පඬුවස්නුවර

**හොඳම අංග රචනය**



**එකේ පන්තියේ වැඩක්**
එම්.බී.ආර්.චේතනී මනිමේබලා
කෑ/පින්දෙණිය ජාතික පාසල,
කෑගල්ල

**හොඳම වේදිකා පරිපාලනය**



**මාව එම්බාම් කරන්න**
ඒ.ආර්.ගුණසේකර
ජාතික යොවුන් සේනාංකය,
පඬුවස්නුවර

**හොඳම රංගාලෝකකරණය**

**මාව එම්බාම් කරන්න**
කේ.එම්.ඩී.එස්.කරුණානායක
ජාතික යොවුන්
සේනාංකය,පඬුවස්නුවර




**හොඳම සහය නිළිය**

**සේපාලිකාවෝ**
හර්ෂනී විතානආරච්චි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
ගාල්ල



**හොඳම සහය නළුවා**

සේපාලිකාවෝ
එන්.පී.එන්.එල්.රත්නායක
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව



**හොඳම නිළිය**

**මාව එම්බාම් කරන්න**
ජී.ආර්.ශෂිකා වික්‍රමසිංහ
ප්‍රාදේශීය සභාව,
පඬුවස්නුවර



**හොඳම නළුවා**

**මාව එම්බාම් කරන්න**
එම්.ඩබ්.කුමාර
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
හෙට්ටිපොල



**පිටපත් රචනය තෙවන ස්ථානය**

**මට වැඩ තියෙනවා**
ප්‍රියංක ගුණසේකර
ශ්‍රී ලංකා වරාය අධිකාරිය



**පිටපත් රචනය දෙවන ස්ථානය**

**එකේ පන්තියේ වැඩක්**
ඩබ්.එච්.අයි.කේ.දිසානායක
රාජකීය විද්‍යාලය, කෑගල්ල



**හොඳම රචනය**

**මාව එම්බාම් කරන්න**
ටී.එම්.එන්.වීරසිංහ
ජාතික යොවුන්
සේනාංකය,පඬුවස්නුවර



**අධ්‍යක්ෂණය තෙවන ස්ථානය**

**එකේ පන්තියේ වැඩක්**
ඩබ්.එච්.අයි.කේ.දිසානායක
රාජකීය විද්‍යාලය,
කෑගල්ල



**අධ්‍යක්ෂණය දෙවන ස්ථානය**

**මට වැඩ තියෙනවා**
ප්‍රියංක ගුණසේකර
ශ්‍රී ලංකා වරාය අධිකාරිය



**හොඳම අධ්‍යක්ෂණය**

**මාව එම්බාම් කරන්න**
ටී.එම්.එන්.වීරසිංහ
ජාතික යොවුන් සේනාංකය,
පඬුවස්නුවර



**උළෙලේ විශිෂ්ඨතම නාට්‍ය**

**මාව එම්බාම් කරන්න**
ටී.එම්.එන්.වීරසිංහ
ජාතික යොවුන්
සේනාංකය,පඬුවස්නුවර



**ජූරියේ විශේෂ සම්මාන**

**එකේ පන්තියේ වැඩක්**
ඩබ්.එච්.අයි.කේ.දිසානායක
රාජකීය විද්‍යාලය,
කෑගල්ල




**ජූරියේ විශේෂ සම්මාන**

**මහ රැජිණ වෙත ආදරයෙණි**
ඒ.ඩී.විරාජ් නිරෝෂන්
රජයේ කර්මාන්තශාලාව
කොළොන්නාව



**කෙටි නාට්‍ය තරගාවලිය කුසලතා ඇගයීම් ලද්දෝ**

**මහ රැජිණ වෙත ආදරයෙණි**
ඒ.එම්.රණසිංහ අධිකාරි
මහින්ද විද්‍යාලය,
ගාල්ල




**මට වැඩ තියෙනවා**
ප්‍රියංක ගුණසේකර
ශ්‍රී ලංකා වරාය අධිකාරිය



**මට වැඩ තියෙනවා**
ප්‍රබුද්ධිකා අමරතුංග
ර/විද්‍යාරාජ විද්‍යාලය



**මට වැඩ තියෙනවා**
කේ.ගුණසේන
ශ්‍රී ලංකා වරාය අධිකාරිය



**ලා ඉස්ලා**
තාරක වෙලගෙදර
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කෑගල්ල



## කෙටි නාට්‍ය තරගාවලිය සඳහා සහභාගී කෙටි නාට්‍යකරුවන්

**පට්ටපල් ඇත්තක්**
ඩී.තරිඳු ලක්මාල් වනිගසූරිය
ලංකා බැංකුව අලෙවි අංශය,
කොළඹ 01



**මට වැඩ තියෙනවා**
ප්‍රියංක ගුණසේකර
ශ්‍රී ලංකා වරාය අධිකාරිය



**මහ රැජිණ වෙත ආදරයෙණි**
පී.අරුණ ප්‍රියන්ත
රජයේ කර්මාන්තශාලාව
කොළොන්නාව




**එකේ පන්තියේ වැඩක්**
ඩබ්.එච්.අයි.කේ.දිසානායක
රාජකීය විද්‍යාලය,
කෑගල්ල



**සේපාලිකාවෝ**
ඩබ්.හිරාන් සෙනෙවිරත්න
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගාල්ල



**ලා ඉස්ලා**
කෙනත් රෝහණ පෙරේරා
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
කෑගල්ල



**කෙටි නාට්‍ය තරගාවලිය උළෙලේ විශිෂ්ඨතම කෙටි නාට්‍ය පිටපත් රචනය**

ටී.එම්.එන්.වීරසිංහ
ජාතික යොවුන් සේනාංකය,
පඬුවස්නුවර



**මාව එම්බාම් කරන්න**

වේදිකාවේ මල්ශාලාවක මිනී එම්බාම් කරන ස්ථානයක් මේසයක් මත එම්බාම් කිරීම සඳහා සූදානම් කර ඇති කාන්තා දේහයකි. ඇය චූටි මැණිකේ ලෙස හැදින්වේ. දේහය අසල එම්බාම්කරු දලි පිහියක් අතැතිව බලා සිටී. ඔහු නමින් සේනය. දේහය දෙස එක එල්ලේ බලා සිටින ඔහු වෙතින් කම්පනය සහ වේදනාකාරි ඉරියව් දිස්වේ. දේහය ඉහළින් දලි පිහිය ගෙන යන ඔහුට එම කාර්යය කළ නොහැකි ලෙසින් ''වේදනාබර හැඟීම් දක්වමින් දලි පිහිය මේසය මතම තබා ඉදිරියට පැමිණෙයි. එහි තිබෙන බංකුව මත පරාජිත ලෙස හිඳගෙන හිස බිමට නැඹුරු කරගෙන කල්පනා සහගත වෙයි. එවිට මල්ශාලාවේ මුදලාලි පැමිණ සේන දෙස විමතියෙන් බලා සිටී. මේසය මත වූ දේහය දෙස හොඳින් බලා යළි සේන වෙතට එයි.

මුදලාලි - මොකද සේනයො? (සේන නිහඬයි. )

මුදලාලි - යකෝ තවම අත තියලවත් නැනෙ?

(සේන කෝපයෙන් මෙන් මුදලාලි දෙස බලයි. )

මුදලාලි - ඇයි බැට්රිය බැහැලද? අන්න බාගයක් තියෙනව චාජ් කරගනිං
(සේන නිහඬය. )

මුදලාලි - වලව්වක මැණිකෙ කෙනෙක් වහ බීල ( සේන නිහඬය. ) ඇහුනෙ නැද්ද උඹට?
සේන - මොකක්ද?
මුදලාලි - වලව්වක මැණිකෙ කෙනෙක් වහ බීල ලු
සේන - මං දන්නව
මුදලාලි - දන්නව නං වැඩේ හරියට කරපං වැදගත් තැනක් (යන්නට ගොස් ආපසු හැරෙයි) තව බොඩිස් දෙකක් මග එනව ඉක්මන් කරපං )
දැඩි බැල්මක් හෙළා මුදලාලි පිටව යයි. සේන යළි සෙමෙන් සෙමෙන් දේහය වෙතට හිසේ සිට පාදාන්තය දක්වා බලා වේදනාවෙන් නැවත බංකුව වෙතට එයි. බංකුව මත හිඳ ගනී. ඉකිබිඳින බව පෙනෙයි. ඊළඟ මොහොතේ දැඩි වේදනාවෙන් යුතුව බංකුව මත උඩුකුරුව දිගාවෙයි. )

වේදිකාව අඳුරු වී යළි ආලෝකමත් වෙයි. එවිට මැණිකේ මේසය මත තිබූ දේහය) බංකුව මත නිදා සිටි සේන අසල සිටගෙන සිටිනු පෙනෙයි. සේන දෙස ආදරයෙන් බලා සිටින ඇය බංකුව මත හිඳ ගනී. අනතුරුව සේනගේ හිස ඔඩොක්කුවට ගෙන අත ගාන්නට වෙයි. සේන එලෙසම සිටී. )

මැණිකේ - සේන....

සේන - හ්ම්...

මැණිකෙ - මාව එම්බාම් කරන්න...

සේන - මට බෑ..

මැණිකේ - මාව එම්බාම් කරන්න

(සේන නැගිට මැණිකේ දෙස බලා සිටී. )

මැණිකේ - ඇයි ආස නැද්ද?

සේන - (කල්පනාකාරිව සතුටු සුසුමුක් හෙළමින් ) චූටි මැණිකේ අපි කොච්චර දවසක් පෙරුම් පිරුවද මේ වගේ දවසක් එනකම්...
මැණිකෙ - මොන වගේ දවසක්ද?

සේන - කාගෙන්වත් බාධාවක් නැතුව තනිවෙලා...
මැණිකේ - තනිවෙලා...
සේන - තනිවෙලා ලංවෙලා කතා කර කර ඉන්න..

මැණිකේ - දැන් ඉතින් හරිනේද

සේන - ඒත් මට හිතාගන්න බෑ කොතනින් පටන් ගන්න ද කියල ...

මැණිකේ - අපි නවත්වමු තැනින් පටන් ගමු.

සේන - කොතනින්ද අපි නැවතුනේද

මැණිකේ - ඒකවත් මතක නැද්ද අනේද

සේන - වත්ත පහල කුඹුක් ගහ යට මේ වගේම තනිවෙලා හිටපු දවසක

මැණිකේ - එහෙම වෙලාවට නිතරෝම ඔයා අහනව. මං ඔයාට කොච්චරක් ආදරේද කියල ..

සේන - ඒව මට බර වැඩියි හිතට දැනෙන්න ආදරේ කලානම් ඒ ඇති.

මැණිකේ - පිස්ස. මගේ හදවතේ ඔයාට මොන තරම් ආදරයක් තියෙනවද කියල බලාගන්න පුලුවන් ඔය පිහියෙන් මගේ පපුව පැලුවට පස්සේ-

සේන - (උස් හඬින්) නෑ.
මැණිකේ - ඇයි

සේන - මට ඒක කරන්න බෑ ..
මැණිකේ - බට ගුල්ල ඔයා බයයි මට රිදෙයි කියලා..

සේන - නෑ මට බයයි ඔයාට රිදෙයි කියල මැණිකේ ආදරයෙන් සේනගේ අත අල්ලා ගනි)

මැණිකේ - ඔයා ඉස්සරත් බය වුනා.

සේන - කාටද

මැණිකේ - මගේ අයියටයි .අම්මටයි..

සේන - නෑ..

මැණිකෙ - එහෙන ඔයට මාව අරගෙන යන්න තිබුනනෙ

සේන - හොරෙන්..

මැණිකේ - ඔව් අපිට හොරෙන් පැනල යන්න තිබුණා...

සේන - විකාරද..

මැණිකේ - මං හිතුව ඔයා එහෙම කරයි කියල

සේන - ඔයා වලව්වෙ චූටි මැනිකෙ මං ඔයාලගෙ වත්තේ මුරකාරයගෙ කොල්ල ..

මැණිකේ - ඒක නිදහසට කාරණාවක් නෙමෙයි ඔයා එහෙම නොකලෙ බයට...

සේන - ඔව් බයට.. කටුමැටි පැලක පැඳුරු කඩමාල්ලක දැලි කුණු පිරුණු ජීවිතයක් .උරුම නෑ ඔයාට ..ඔයාට දුක් විඳින්න වෙයි කියල බය හිතුන මට

සේන - නෑ ඒක කොහොමවත් සිද්ධ වෙන්නෙ නෑ එදා ඔයාගෙ අයිය මගේ අතතුයි කකුලකුයි කඩල කානුවකට ඇදල දැම්මෙ නැත්තං

මැණිකේ - (විමතියෙන් ) ම් ඒක දැනගෙන හිටියෙ නෑ සේන...

සේන - කොහොම දැනගන්නද.. එදා ඉඳල ඔයා හිරකාරියක් උනාලු...

මැණිකේ - (වේදනාවෙන් ලංවේ) අනේ දෙයියනේ...

(මොහොතක නිහැඬියාවක් පවතී)

සේන - කමක් නෑ ඔයාගෙ ජීවිතය ලස්සන උනානෙ- ජයට මගුල් කාල කුමාරියක් වගේ සැරසිලා. තවත් වලව්වක

කුමාරිහාමි කෙනෙක් උනානෙ. ඒක අහල මං හුගාක් සතුටු වුනා..

මැණිකේ - හැමෝටම පේන්න එහෙම ගියා ඒක මගුලක් නෙමෙයි උගුලක් සතුට කියන දේ මගේ ජීවිතේ අහලකවත් තිබුනෙනෑ.

සේන - ඇයි ඔයාගෙ නිලමෙතුමා..

මැණිකේ - උං මහ බේබද්දෙක් වලත්තයෙක් අරක්කු බෝතලෙයි රසිතායාදුකාර යාලුවොයි දහ ජරා හොර වැඩයි විතරයි උංට ඕන උනේ. මගෙන් වැඩක් නෑ උංට ගම වටේම ගෑණුන්ට උගෙන් දරුවොලු.

(සේන විමතියෙන් මැණිකේ දෙස බලා සිටී)

මැණිකේ - ඉස්සෙල්ලම මට මගේ ආදරය නැතිඋණා ඊට පස්සේ හීන බලාපොරොත්තු බොඳ වුණා ඊලඟට මුලු ජීවිතේම විනාශ උනා මොකටද මෙහෙම ජීවිතයක් ...කරන්න ඕන දේ මං කලා. මං දැන් නිදහස් මං දැන් නිදහස් හිතේ සතුට පිරිල ඉතිරිලා

(උස් හඬින් සිනාසෙයි) සැහැල්ලු ලෙස සේන අසලට එයි)

මැණිකේ - බාධක වැට කඩුලු ඔක්කොම ඉවරයි. මට දැන් පුලුවන් ඔයා ලගටම වෙලා ඉන්න (ආදරයෙන් ) අපි නැවතුන තැනින් ජීවිතය පටන් ගමු සේන... හාද.

(සේන එකගවු ලෙසින් හිස වනයි. දෙදෙනා පිටට පිට දී වාඩිවී දෙපස බලා සිටිති ඔවුන්ගේ මුහුණුවල සතුට පිරි ඉතිරි යයි)

මැණිකේ - ඉතින් අනේ මොනව හරි කියන්නකෝ...
සේන - මොනවාද..
මැණිකේ - මෙච්චර කාලයක් හිතේ තද කරගෙන හිටපු හැම දෙයක්ම

සේන - ඔයා තාමත් මට ආදරෙයිද

මැණිකේ - ඔව්..

සේන - කොච්චරක්..

මැණිකේ - (මැණිකේ පපුවේ සිට දෑත් දෙපසට විහිදුවා පෙන්වයි) මේ මං ඔයාගෙන් චූටි දෙයක් අහන්නද

සේන - අහන්න ඕන එකක්...

මැණිකේ - අනේ ඔයා කා එක්කවත් යාලු උනේ නැද්ද...

සේන - මම මුලු ජීවිතේටම ආදරෙයි කිව්වෙ ඔයාට විතරයි

මැණිකේ - අනේ... ඔයා බොරුැමයි කියන්නේ

සේන - නෑ... ඇත්ත

මැණිකේ - ඔය බොරු. කාටහරි ආදරේ කරන්න ඇති..

සේන - (මොහොතක් කල්පනා කර සිට ) ම් .... ම් ... ඇත්තම කියන්නම්කො කීප දෙනෙක්ම හිටිය

මැණකේ - (නුරුස්සනා ලෙස ) මං හිතුව කවුද ඒ...

සේන - මාලනීගීතා ....සුමනා ....නීටා.... ස්වර්ණා.... ශීයානි

මැණිකේ - අම්මේ එච්චර ගොඩක්ද?

සේන - එක්කෙනෙකුට එක්කෙනෙක් පරාද නෑ ලස්සන..

සේන - අහන්ඩකො ඒ කාලෙ ...

මැණිකේ - අහන්ඩ දෙයක් නෑ... මං දන්නව ඒ කාලෙ නලුව වගේනෙ කෙල්ලො පෝලිමේ එන්ඩ ඇති.

සේන - අහන්ඩකො මං කියන දේ...

මැණිකේ - මොනව අහන්ඩද තවත්...

සේන - ඒ කාලෙ මං පිච්චර් බලන්න යන්නෙ මැටිනි ෂෝ එකටමයි මොකද රෑ මුර රස්සාවනෙ

(මැණිකේ නොරිස්සුම් ලෙස හැසිරෙයි)

සේන - මට හොඳට මතකයි ගැලරියෙ ටිකට් එක ශත පනයි මං කලින්ම ගිහිල්ල ඉසිසරහම බංකුවෙ වාඩි වෙලා බලා ඉන්නව එතකොට තමයි එයාල එන්නෙ සුරංගනාවියො පරාදයි හිනාව නැටුම දගලිල්ල මාර ලස්සනයි මට දැනුත් මැවිල පේනව

මැණිකේ - (තේරුම් ගත්තාක් මෙන් ) හොරා මාව බය කරා

(70 දශකයේ ජනප්‍රිය චිත්‍රපට ගීයක දෙකක කොටස් අනුවාදනය වේ. ඒ අනුව අනුකරණාත්මක රංගනයක් )

මැණිකේ - අනේ අපිත් යමු ලස්සන පළාතකට ගංගා ගලා යන දිය ඇලි කඩා හැලෙන පාට පාට මල් පිපිච්ච..

සේන - කඳු ගැටයක් උඩ පුංචි පැල් කොටයක් හදාගෙන

මැණිකේ - කැකුලු හාලෙ බතට පරිප්පු උයල කරවල කෑල්ලක් බැඳල ගත්තාම ඇති

සේන - ඕක ඉතින් මහ වැඩක්යැ...

(දෙදෙනාගේ ශෘංගාරාත්මක හැසිරීම් දැක්වෙන රංගනයක් සංගීතයද සමඟ ඊලග මොහොතේ මැණිකේ ශාරීරික අපහසුතාවයක් දක්වයි. වමනය කරන්නට උත්සාහ කරයි ... වමනය දමයි ... සේන තේරුම් ගත නොහැකි ලෙස බලා සිටි මැණිකේ මේසය මත හිඳගෙන දඟකාර ලෙස කතා කරයි)

මැණිකේ - ඔන්න මම ආස දේවල් ගේනකම් මෙහෙමම ඉන්න

සේන - මොනවද ආස..

මැණිකේ - අමු අඹ ගෙඩියක්..

සේන - අමු අඹ ඇඹුල්ලනේ...

මැණිකේ - ඇඹුල් හින්ද තමයි ඉල්ලන්නේ

( සියල්ල තේරුම් ගත් ලෙස සේන මැණිකේ වෙත ගොස් සෙනෙහසපායි අනතුරුව සතුටින් හැසිරෙමින් වේදිකාවෙන් ඉවත් වෙයි. මැණිකේද ගැයෙන ගීයකට අනුව සතුටින් රංගනයක යෙදෙයි.

ගීතය

හිරු ගිලුණු තාලෙට

සඳ වැසුණු තාලෙට මල් හැලුණු තාලෙට

ගීත හඬපු තාලෙට

ශිතුවෙ නෑ හිනැහෙන්න

ආයෙ කවදාවත්ම

ඉඩෝරය හමාරයි

නැවුම් සුවඳක් දැනෙනවා

හීනයක් දෝ සැකයි

හිත හොරෙන් අහනවා දරාගන්නට ඇත්තමයි බෑ

හැඟුම් දඟ කරනවා පලායන්නට දෙන්නෙ නම් නෑ

නුඹව හිරකරනවා

අනේ මේ සොඳුරු අරුමය

බොඳවෙන්නෙ නම් එපා හීනයක් විතරක් වෙලා...

( සේන යලි වේදිකාවට පැමිණේ ඔහු වෙතින් බීමත් පුද්ගලයෙකුගේ හැසිරීමක් දක්නට ලැබේ. කඩදාසියකින් මිනිස් රුවක් සඳමින් සිටි)

සේන - ( වෙරිමතින් මෙන් ) චූටි මැණිකේ (නිහඬතාවයකි ) චූටි මැණිකේ (නිහඬතාවයකි උස් හඬින් කතා කරයි ) චූටි මැණිකේ (නිහඬය) කෝ යකෝ මේ ගෙදර ගෑනි (වැනි වැනී ඉදිරියට එමින් විපරම් කරයි)

සේන - යකෝ ගෑණියේ කොහෙද බොල මකබෑ උනේ.

(තව තවත් මොනවාදෝ මුමුණමින් බංකුව මත හිඳ ගනී )

මැණිකේ - (උස් හඬින් ) ඇයි මොකද

සේන - (හිස ඔසවා බලයි) සැමියා එනකොට බිරිඳ නෑ බොහොම වැරදියි සැමියා බිරිඳගේ

දෙවියාය එහෙමයි පඬිවරු කියල තියෙන්නේ

මැණිකේ - වෙන මොනවද දන්නෙ නෑ කියලා තියෙන්නේ

සේන -තව කියලා තියෙනවා පුරුෂයාගේ දෙපා දෝවනය කරල ආදර වදන් තෙපලලා ගෙට කැන්දන්න කියලා

මැණිකේ - තෙලනව මම අතේ කොස්සක් තිබුණානම් පස්ස පැත්ත හිරි වැටෙන්ඩ

සේන - ආයිස් අම්ම ගුංඩු මට කොස්සෙන් ගහන්ඩ

මැණිකේ - ඇයි බැරිද
සේන - පුළුවන් පුළුවන් ඔහේ ඩයන කුමාරිනෙ
මැණිකේ - ඩයන කුමාරි නොවුනට මම පිල්ලෑව වලව්වෙ කුමාරිහාමි

සේන - අනේ තමුසෙගෙන කසිකබල් වලව්ව අපි නොදන්න මල ඉලව්ව ඔහෙගෙන මව් කුමාරිහාමියි චන්ඩි නිලමෙ අයියන්ඩියා ගමටම වසංගතයක් ඕයි
මැණිකේ - මගේ වලව්වට කඩප්පුලි කතා කියන්ඩ තමුසෙ කවුද
සේන - මම ඇවිල්ල පිල්ලෑව වලව්වෙ මුරකාරයගෙ එකම පුත්‍රරත්නය සේනාධීර කොහොමද නමේ ගැම්ම සේනාධීර
මැණිකේ - (එක්වරම හඬන්නට පටන් ගනී) අනේ දෙයියනේ මගේ කරුමෙ මේ කඩප්පුලි බේබද්දට රැවටුනානෙ..
සේන - මේ කණ පැලෙන්ඩ බිව්වත් අපි වැදගත් හරි ..
මැණිකේ - වැදගත් රෙද්ද අනේ යනව ඕයි යන්ඩ...
සේන - ඒ උනාට ජීවිතේ හරිම සුන්දරයි නැද්ද මං කියන්නෙ

මැණිකේ - සුන්දරයි සුන්දරයි මට අම්මත් කිව්ව අයියත් කිව්ව මේක

සේන -
(උපහාසයෙන් ) ජීවිතේ සුන්දරයි කියල . ඊඅනේ උන් දන්න බම්බුව

මැණිකේ - තමුසෙ විතරනෙ දන්නෙ බේබද්ද

සේන - (කෝපයෙන් ) වහගන්නව කට

මැණිකේ - වහනව බලන්ඩ...

සේන - වහන්නෙ නෑ.. තලනව ඔය හැකර කට

(පහර දෙන්නට මෙන් ලංවේ. දෙදෙනාම කෝපයෙන් බලා සිටිති මොහොතකින් දෙදෙනාගේ මුහුණුවල සැහැල්ලු බවක් නිරූපණය වේ. ඊලගට උස් හඬින් සිනා සෙති දෙදෙනා අතර ආරවුලක් නොවුනාසේය )

මැණිකේ - ඒක මරු නේද..
සේන - මරේ මරු..
මැණිකේ - ඔයා හිතුවද මං ඇත්තටම බැන්න කියල ..
සේන - ඔයා හිතුවද මං ඇත්තටම බැන්න කියල ..
මැණිකේ - සමහරු නං ඇත්තටම රංඩු වෙනව ඔහොම

සේන - අපට නං බෑ කවදාවත්ම එහෙම වෙන්ඩ..

මැණිකේ - කවදාවත්ම එහෙම වෙන්නෙ නෑ

(දෙදෙනා ආදරයෙන් ලංවෙති )

සේන - මං ඇත්තම කියන්ඩද
මැණිකේ - ඒ පාර මොකක්ද
සේන - මං චුට්ටක් බිව්වා...
මැණිකේ - මොකක්
සේන - අනේ මැණිකෙ චුට්ටක් බිව්ව හිතේ සතුටට..
මැණිකේ - මොන සතුටටද

සේන - (සඟවා සිටි කඩදාසි රූපය පෙන්වයි) මං තාත්ත කෙනෙක් උන සතුටට

මැණිකේ - නෝක්කාඩුවෙන් ) දරුවො කැමති නෑ බේබදු තාත්තලාට

( සේන නිහඬය )

මැණිකේ - ඔයා ඇත්තටම බිව්වද ඖ ( සේන සිනා මුසුව බලා සිටි මැණිකේ සැකයෙන් මෙන් සේනගේ මුවට ලංවී පරික්ෂා කර බලයි ඇයගේ මුහුණේ සතුටක් දක්වේ)

මැණිකේ - ඔයා බොරුමයි කියන්නේ.

සේන - ආයෙත් ඖවටුනා නේද

මැණිකේ - අපි දරුවො ගැන හුගාක් හිතන්න ඕනෑ

සේන - ඇත්තටම මං දුවව බලා ගන්නව ඇස් දෙක වාගෙ

මැණිකේ - කෝ දුවෙක්

සේන - මැණිකේ ගේ කුස පෙන්වා මේ ඉන්නේ

මැණිකෙ- ඔයාට පිස්සු මේ ඉන්නෙ පුතෙක්

සේන - නෑ දුවෙක්ඖ

මැණිකේ - නෑ පුතෙක්..

සේන - නෑ දුවෙක්

මැණිකේ - නෑ පුතෙක්

සේන - ගෙදරට වාසනාව සිරියාව අලංකාරය තමයි දුව දුව තමයි උයල පිහල දෙන්නෙ අපි වයසට ගියාම ගෙදරට එලියක් ඕනෑ..

මැණිකේ - ගෙදරට අභිමානය ගේන්නෙ පුතා අපිව ඖක බලා ගන්නෙ කන්ඩ ටිකක් හොයා දෙන්නෙ පුතා ගෙදරට හයියක් ඕනෑ (දෙදෙනා මොහොතක් එකිනෙකා දෙස බලා සිටිති )

මැණිකේ - අනේ අපි රංඩු වෙනවා

සේන - රංඩු වෙන්න ඕන නෑ අපි දුවෙකුයි පුතෙකුයි දෙන්නෙක්ම (දෙදෙනා සතුටින් සිනාසෙති)

මැණිකේ - පිස්සා

(මැණිකේ සතුටින් පිටුපසට දිව ගොස් මේසය මතට නගී සේන ඉතා දැඩි සතුටින් පොඩි එකෙකු සේ පෙරලෙමින් කරණම් ගසමින් හැසිරෙයි අවස්ථානුකූල සංගීතයක් )

(මේසය මත සිටි මැණිකේ වේදනාවෙන් කෑ ගසයි සේන එදෙසට දිව යයි මේසය වටා කැරකී ගොස් බලා සිටි මුහුණ සතුටින් පිරි යයි මොහොතකින් මැණිකේ අපහසුවෙන් හිඳගනී ඇය අත දරුවෙකි සේන දරුවා රැගෙන දැඩි සතුටින් ඉදිරියට එයි

සේන - (දැඩි සෙනෙහසින් දරුවා තුරුලු කර ගනී ) මට මට ජීවිතය ලැබුණා

(මොහොතකින් මැණිකේ වේදනාවෙන් කෑ ගසනු ඇසේ
මැණිකේ - සේනයියේ..

(සේන කලබලව දිවයයි මේසය වෙතට ගොස් මැණිකේ දෙස පරීක්ෂාවෙන් බලයි ඔහුගේ මුහුණේ ඉරියව් වෙනස් වේ වේදනාත්මක වෙයි

සේන - (වේදනාත්මක උස් හඬින් ) චූටි මැණිකේ

(පරාජිත ලෙස දැඩි කම්පනයෙන් වේදනාවෙන් ඉදිරියට එයි මේ වන විට දරුවා අතෙහි නැත වේදනාවත්මක සංවේදි රංගනයකි)

සේන - (ඉතා උස් හඬිකින් කෑගසයි චූටි මැණිකේ මගේ දරුවා

(බංකුව මත කඩා වැටී හිස ගසාගෙන මුණින් තලාවේ ඔහු ඉකි බිඳින බව පෙනෙයි මෙවිට මල්ශාලාවේ මුදලාලි කලබලව පැමිණේ සේන සිටින ඉරියව්ව දැක එක්වරම නවතී මොහොතක් ඔහු දෙස බලා සිට මේසය වෙත ගොස් දේහය දෙස බලයි කෝපයෙන් යලි සේන වෙතට එයි

මුදලාලිල - යකෝ සේනයෝ ...

(සේන හිස ඔසවා බලයි පියෙව් සිහියට පත්වෙයි

මුදලාලි - උඹ මේකට තාම අත තියලවත් නෑ...ඊ

(සේන එක එල්ලේ මුදලාලි දෙස බලා සිටී මේසය අසලට යයි දේහය අසල

තිබූ පිහිය ගෙන මුදලාලි වෙතට ආපසු එයි යලි මොහොතක් මුදලාලි දෙස බලා සිට පිහිය මුදලාලි අත තබයි..)

සේන - (ආවේගාත්මක ස්ථිර හඬකින්) මට මගේ මැණිකෙට රිද්දන්න බෑ

ඏඏඏඏඏඏ

**කෙටි චිත්‍රපට තරගාවලිය ජයග්‍රහණ ලද්දෝ**

ප්‍රථම ස්ථානය
සුසුම් සුළි

කේ.පාලිත පේම කුමාර
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
කුරුණෑගල



දෙවන ස්ථානය
Research
එස්.අයි.සමරක්කොඩි
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඉංගිරිය



තෙවන ස්ථානය
පාඩම් ( දමිළ කෙටි චිත්‍රපටිය )
ජේ වහබ්දීන්
හම්රා මහා විද්‍යාලය,
අක්කරෙයිපත්තුව



### කෙටි චිත්‍රපට තරගාවලිය කුසලතා ඇගයීම් ලද්දෝ



පියාඹන හීන
ප්‍රේමචන්ද්‍ර ලියනපතිරණ
මාර/දෙමටපිටිය මහා විද්‍යාලය

## ඡායාරූප තරගාවලිය ජයග්‍රහණ ලද්දෝ

ප්‍රථම ස්ථානය
සමිත හරින්ද දළදාවත්ත
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය





දෙවන ස්ථානය
ජයන්ත ලක්මාල් සේනාරත්න
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මධ්‍යම නුවරගම්පළාත,
අනුරාධපුරය





තෙවන ස්ථානය
ආර්.පී.ඩී.කේ.රන්දෙණිය
කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,
කෑගල්ල





## ඡායාරූප තරගාවලිය කුසලතා ඇගයීම් ලද්දෝ

කේ.ඒ.ඩී.එස්.එල්.පෙරේරා
රාජ්‍ය සේවා පලාත් සභා හා පලාත්
පාලන අමාත්‍යාංශය



කේ.පී.අනුර පතිරණ
පාංශු සහ ශාක පෝෂණ අංශය,
පොල් පර්යේෂණ ආයතනය



සමිත හරින්ද දළදාවත්ත
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය



කේ.පී.අනුර පතිරණ
පාංශු සහ ශාක පෝෂණ අංශය,
පොල් පර්යේෂණ ආයතනය



ආර්.එම්.ඩී.එම්.හසන්තිකා
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

